# වාර්ෂික වාර්තාව

## (පාලන හා ගිණුම්)

# 2014

(2014 ජනවාරි 01 - 2014 දෙසැම්බර් 31)

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වාර්ෂික වාර්තාව තුළින් විශ්වවිද්‍යාලය අදාල වාර්ෂයේදී අත්කර ගත් ජයග්‍රහණයන්ගේ ආයතනික දළ විශ්ලේෂණයේ සාරාංශයක් ඉදිරිපත් කෙරේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශිත පිළිගත් ආකෘතියකට අනුව මෙම වාර්ෂික වාර්තාව සකස් කරනු ලබයි. අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මෙහි අන්තර්ගත වන අතර එම තොරතුරු කැටි කොට සංඛ්‍යාලේඛන හා තොරතුරු අංශය විසින් සම්පාදනය කරන ලදී.*

*සම්පාදක : ඒ.ඒ.කේ.යූ. අතපත්තු මිය*

*ඉංග්‍රීසි පිටපතෙහි සංස්කාරක : ආචාර්ය වරුනදත්තා එදිරිසිංහ*

## දැක්ම

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කළාපයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැක්ම වනු ඇත.

## මෙහෙවර

සමාජීය වශයෙන් සංවේදීවූත්, සදාචාරාත්මක හා සුසංවර බවින් පිරිපුන්වූත්, අධ්‍යාපනය හරහා ආර්ථිකමය වශයෙන් සෞභාග්‍යමත්වූත් සහ පර්යේෂණ, දැනුම ව්‍යාප්ත කිරීම, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය හා කාර්යක්ෂමව සැලසුම් කරනු ලැබූ සංවර්ධනය යන කර්තව්‍යයන් කෙරෙහි ක්‍රියාශීලි ලෙස සහභාගි විය හැකිවූත්, බුද්ධිමය වශයෙන් ප්‍රබෝධමත් හා වාදභේද රහිතවූත්, විශ්වවිද්‍යාල පරිසරයක් තුළින් දැනුම පාදක කරගත් සමාජ වටපිටාවක් ගොඩනැගීම සඳහා උරදීම විශ්වවිද්‍යාලයේ කාර්යභාරය වනු ඇත.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

# පටුන


1. උපකුලපතිතුමන්ගේ සමාලෝචනය 1
    1.1 කෙටි හැඳින්වීම 1
    1.2 පාලක සභාව හා සනාතන සභාව 4
    1.3 අත්කරගත් ජයග්‍රහණ සහ පිළිගැනීම් 12
    1.4 බාධක සහ පිළියම් 32
    1.5 අනාගත සැලසුම් 32
2. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර 33
3. දේශීය සිසුන් පිළිබඳ විස්තර 34
4. විදෙස් සිසුන් පිළිබඳ විස්තර 35
5. (අ) අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර 35
    (ආ) අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල විස්තර 37
6. අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර 38
7. පර්යේෂණ, නව නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර 39
8. ලද සම්මාන පිළිබඳ විස්තර 40
9. ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර 46
10. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 47
11. මූලධන වියදම් විස්තර 47
12. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) 2014 48
13. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) 2014 48
14. මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (සාමාන්‍ය ආදායම) 48
15. 2014 වසරේ මුදල් කාර්ය සාධන විශ්ලේෂණය 48
16. 2014 යටිතල පහසුකම් පිළිබඳ විස්තර 49
    (අ) 2014 වසර සඳහා ක්‍රියාත්මක වන සියලු පුනරුත්ථාපන ව්‍යාපෘති 49
    (ආ) 2014 වසරේ අවසන් කළ පුනරුත්ථාපන ව්‍යාපෘති 50

***17.* උපග්‍රන්ථ**

**උපග්‍රන්ථ *A* - පීඨ වාර්තා**

A1 කෘෂිවිද්‍යා පීඨය 53
A2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය 55
A3 ශාස්ත්‍ර පීඨය 60
A4 දන්ත වෛද්‍ය පීඨය 63
A5 ඉංජිනේරු පීඨය 65
A6 වෛද්‍ය පීඨය 67
A7 විද්‍යා පීඨය 71
A8 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය 74
A9 පශ්චාත් උපාධි ආයතන 77
    A9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA) 77
    A9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS) 82

**උපග්‍රන්ථය *B* - විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථාන**

B1 කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය 86
B2 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය 89
B3 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 91
B4 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය 92
B5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය 94
B6 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 97
B7 හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය 99

**උපග්‍රන්ථය *C* - උපස්ථම්භක සේවාවන්**

C1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය 101
C2 තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය 103
C3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය 104
C4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය 106

## උපග්‍රන්ථය *D* - උපස්ථම්භක සේවාවන්


| | | |
|---|---|---|
| D1 | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 108 |
| D2 | සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන් | 111 |
| D3 | 21 වැනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය (HETC Project) | 114 |
| D4 | ශාරීරික අධ්‍යාපන අංශය | 116 |
| D5 | ශිෂ්‍ය සේවා අංශය | 118 |
| D6 | ශිෂ්‍ය නේවාසිකාගාර අංශය | 119 |
| D7 | ආරක්ෂක සේවාවන් | 121 |
| D8 | විනයාරක්ෂක අංශය | 122 |
| D9 | උද්‍යාන අංශය | 123 |
| D10 | වැඩ දෙපාර්තමේන්තුව | 125 |


## උපග්‍රන්ථය *E* - ව්‍යාපෘති පිළිබඳ විස්තර


| | | |
|---|---|---|
| E1 | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දෙස්/විදෙස් ආධාර කළ) | 127 |
| E2 | ව්‍යාපෘති වැය පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්) | 131 |


## උපග්‍රන්ථය *F* - මුදල් ප්‍රකාශනය *2014*


| | | |
|---|---|---|
| F1 | 2014 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්ව ප්‍රකාශනය | 135 |
| F2 | 2014 දෙසැම්බර් 31 දිනට මුදල් කාර්ය සාධන ප්‍රකාශනය | 137 |
| F3 | 2014 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 139 |
| F4 | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම් | 140 |
| F5 | 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාන අගය වෙනස්වීම | 141 |


## උපග්‍රන්ථය *G* - විගණන කමිටු වාර්තාව *2014*

142

## උපග්‍රන්ථය *H* - විගණන වාර්තා


| | | |
|---|---|---|
| H1 | විගණකාධිපති වාර්තාව 2014 | 143 |
| H2 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර | 164 |



# 01 උපකුලපතිතුමන්ගේ සමාලෝචනය

## 1.1 කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට පසුව 1942 වසරේ ජූලි මස පළමු වැනි දින කොළඹදී ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙරට අනෙකුත් විශ්වවිද්‍යාල අතරින් පැරණිම හා විශාලතම විශ්වවිද්‍යාලයයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය 1952 වසරේ ඔක්තෝබර් මස 06 වැනි දින පේරාදෙණියට ගෙන ඒමත් සමඟම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ස්ථාපිත කිරීම නියමාකාරයෙන් සනිටුහන් කරන ලදි. මධ්‍යම පළාතේ මහනුවර නගරයේ සිට කිලෝමීටර අටකට (08) පමණ ඈත ස්වභාවික සෞන්දර්යයෙන් හෙබි ප්‍රදේශයක පිහිටි විශ්වවිද්‍යාලය අක්කර 1947 ක් පුරා පැතිර යන භූමි ප්‍රමාණයකින් යුතු, අධ්‍යාපන, නේවාසික පහසුකම්, ක්‍රීඩා හෝ සංස්කෘතික යන කුමන කරුණකින් වුවත්, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලයන් අතරින් අද්විතීය අත්දැකීමක් දායාද කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි.

පසුගිය වසර 72 ක කාලය පුරාවට විශිෂ්ඨ ගණයේ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ව්‍යාප්තවී ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව පවතින අතරම, මෙරට එකම කීර්තිමත් විශ්වවිද්‍යාලයද වෙයි. 1942 වසරේ හතරක්ව පැවති පීඨ සංඛ්‍යාව වර්තමානය වනවිට අට (08) දක්වා ඉහළ ගොස් ඇත. කෘෂිවිද්‍යා, සමසෞඛ්‍ය, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා හා පශු වෛද්‍ය යන පීඨ ඒ අතරවේ. ආරම්භයේදී අධ්‍යයන අංශ 18කට සීමාවූ අතර, එම සංඛ්‍යාව

වර්තමානය වනවිට ක්ෂේත්‍ර රාශියකින් සමන්විත අධ්‍යයන අංශ 74 ක් වේ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යන පශ්චාත් උපාධි ආයතන දෙකකින් ද මෙම විශ්වවිද්‍යාලය සමන්විත වේ.


අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයකටත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් නේවාසික පහසුකම් සපයන විශ්වවිද්‍යාලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සැලසුම් කරන ලදි. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 80% කට වැඩි පිරිසකට නේවාසික පහසුකම් සපයන නේවාසිකාගාර 17 ක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් විශ්වවිද්‍යාලයේ විවිධ ජන කොටස්වල අභිරුචීන් පිරිමසාලන සිද්ධස්ථාන, සංගම් රාශියකින් ඉටු කෙරෙන ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම්වලින් යුතු සිසුන් මෙන්ම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඇතුළත්වීමට අපේක්ෂා කරන්නන් අතරෙහිද මෙරට වඩාත් දැකුම්කළු විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 10,000 ක් පමණ වන අතර, අධ්‍යයන, පරිපාලන හා සේවා අංශ හරහා පැතිර යන මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව ආසන්න වශයෙන් 3300 කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කලා, නීතිය හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සිට භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ඉංජිනේරු හා පරිගණක විද්‍යාව, කෘෂි විද්‍යාව, දන්ත වෛද්‍ය, වෛද්‍ය, සමසෞඛ්‍ය විද්‍යාව, පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩ සටහන් 58 ක් ප්‍රදානය කරනු ලබයි. සමසෞඛ්‍ය විද්‍යා පීඨයත්, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයක් හා භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයක් පවතින මෙරට එකම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි සිසුන්ද ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 6416 කි.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පැරණි හා මාර්ගගත (Online) යන ක්‍රමයන් භාවිතා කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උපාධි මට්ටමේ සුදුසුකම් ලබා දෙන බාහිර පුහුණු අවස්ථාවන් සැලසුම් කොට පිරිනැමීමේ කාර්ය භාරය උසුලයි. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කලා හා විද්‍යා බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 25000 ක් පමණ වන අතර, සිසුන් 500 ක් පමණ වෙනත් අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා හදාරති. විශ්වවිද්‍යාල මධ්‍යම පරිපාලනය පරිපාලන අංශ අටකින් (සාමාන්‍ය පරිපාලන පද්ධතිය) මුදල් අංශය, අභ්‍යන්තර විගණන අංශය, සේවා අංශ නවයකින් (සාමාන්‍ය සේවා පද්ධතිය) හා මධ්‍යස්ථාන/ ඒකක 22 කින් යුක්ත වේ. මධ්‍යම පරිපාලන සැලැස්ම පිටු අංක තුනෙහි (03) දැක්වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන වැඩසටහන්වලට සහය වන වැදගත් ඉගෙනුම් සහයක සේවාවන් හතරකි. ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ලෙස හැඳින්වේ. විශේෂිත පුහුණු හා සේවා කෘත්‍යයන් ඉටු කිරීම සඳහා වෙනත් මධ්‍යස්ථාන හා ඒකක කිහිපයක් ස්ථාපිත කොට ඇති අතර, එම මධ්‍යස්ථාන හා ඒකක විසින් ඩිප්ලෝමා හා සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හා විවිධ තාක්ෂණික හා වෘත්තීය සේවාවන් මූලිකවම ගාස්තු අය කිරීමේ පදනම මත සැලසුම් කොට පිරිනමනු ලබයි. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකකවල ජයග්‍රහණයන් හා සාමාන්‍ය විස්තර උපග්‍රන්ථ 'B' හි විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

# Organization Chart



## 1.2 පාලක සභාව සහ සනාතන සභාව

### 1.2.1 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්ති ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2014 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| උපකුලපති | මාහාචාර්ය අතුල සේනාරත්න |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හෙන්නායක |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | මහාචාර්ය කේ. සමරසිංහ |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඒ.එම්. නවරත්න බණ්ඩාර |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය යූ.බී. දිසානායක |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය එල්. රාජපක්ෂ |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය එම්.ඩී. ළමාවංශ |
| විද්‍යා පීඨය | මහාචාර්ය ඒ. වික්‍රමසිංහ |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න |

**පහත සඳහන් සාමාජිකයන් දෙදෙනා 2015.02.25 දින සිට වසරක කාලයක් සඳහා පාලක සභාව නියෝජනය කිරීම පිණිස සනාතන සභාව විසින් පත් කරන ලදි.**

මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය එස්.කේ. පින්නවල

**පහත සඳහන් සාමාජිකයන් 2011..07.01 දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදි.**

මහාචාර්ය එම්.එල්.ඒ. කාදර්
ආර්. චන්ද්‍රසේකර මයා
ආචාර්ය ඒ.යූ. ගමගේ
එච්.ඒ. හේවගේ මයා
එම්.එස්. ප්‍රේමවංශ මිය
එස්. රත්වත්තේ මයා
එච්.එම්. ගාමිණි සෙනෙවිරත්න මයා

} 2014.07.01 සිට ධූර කාලය අකවසන් විය

**පහත සඳහන් සාමාජිකයන් 2011..07..01 දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලදි.**

<table>
<tr><td>ආචාර්ය එල්. වීරසිංහ<br>එම්. අබේගුණසේකර මිය<br>එම්. සමරනායක මයා<br>යූ.ඩබ්.බී. අත්තනායක මයා<br>බී.එම්.එන්. බාලසූරිය මයා<br>ගාමිණී එස්.ජේ. දිසානායක<br>අඹලියද්දේ සංඝරතන හිමි</td><td>නැවත පත් කරන ලදී</td></tr>
</table>

මහාචාර්ය ජී.එච්. පීරිස්
ආචාර්ය වී. නන්දකුමාර්
ඩී.එම්. නන්දසේන මයා
එම්.පී. ජයසිංහ මයා
මොහාන් සමරකෝන් මයා

### 1.2.2 සනාතන සභාව සහ එහි සාමාජිකත්වය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (1985 අංක 07 දරණ පනතින් සංශෝධිත) 46 වැනි කොටසේ වගන්ති ප්‍රකාරව සංයුක්ත වූ සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වේ.

එහි සාමාජිකයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| **උපකුලපති** | මාහාචාර්ය අතුල සේනාරත්න |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය එච්.එම්.එස්.කේ. හෙන්නායක |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පීඨය | මහාචාර්ය කේ. සමරසිංහ |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඒ.එම්. නවරත්න බණ්ඩා |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය යූ.බී. දිසානායක |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය එල්. රාජපක්ෂ |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය එම්.ඩී. ළමාවංශ |
| විද්‍යා පීඨය | මහාචාර්ය ඒ. වික්‍රමසිංහ |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න |

**අධ්‍යක්ෂවරුන්**

| | |
|---|---|
| කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය බී.සී.එන්. පීරිස් |
| | මහාචාර්ය එස්. සමිත (2014.08.04 සිට) |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එච්.එම්.බී. නාමල් ප්‍රියන්ත |

| | |
|---|---|
| **පුස්තකාලයාධිපති** | ආචාර්ය කේ.ජී.පී.ජී. විජේතුංග |

**අංශ ප්‍රධානීන්**

**කෘෂිවිද්‍යා පීඨය**

| | |
|---|---|
| කෘෂිජීව විද්‍යා අංශය | ආචාර්ය ඩී.එම්. ද කොස්තා (2013.09.14 සිට) |
| කෘෂි ආර්ථික විද්‍යා අංශය | මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා |
| කෘෂි ඉංජිනේරු අංශය | ආචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන |
| කෘෂි ව්‍යාප්ති අංශය | ආචාර්ය ජේ.ඒ.එස්. ද සිල්වා |
| සත්ව විද්‍යා අංශය | මහාචාර්ය එච්.ඩබ්. සිරිල් |
| බෝග විද්‍යා අංශය | ආචාර්ය එච්.එම්.ජී.එස්.බී. හිටිනායක |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි |
| | පී.සී. අරම්පත් මයා (2014.07.25 සිට) |
| පාංශු විද්‍යා අංශය | ආචාර්ය ඩබ්.ඒ.යූ. විතාරණ |

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර අංශය | වෛද්‍ය එම්.පී.එස්. මුදලිගේ |
| හෙදවේද අංශය | මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි (වැ.බ) |
| භෞතවේද අංශය | වෛද්‍ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහක (වැ.බ) |
| විකිරණ හා විකිරණ චිකිස්තක අංශය | වෛද්‍ය එම්.එල්. ජයතිලක |
| ඖෂධවේද අංශය | එම්.එච්.එෆ්. සකීනා |

**ශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය | ආචාර්ය එම්.ඉසඩ්.එම්. නෆීල් |
| පුරාවිද්‍යා අංශය | ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න |
| සම්භාව්‍ය භාෂා අංශය | ආචාර්ය වී. එදිරිසිංහ |
| ආර්ථික විද්‍යා අංශය | ආචාර්ය ජේ. නිජල් |
| අධ්‍යාපන අංශය | ආචාර්ය එස්.බී.කේ. විජේසුන්දර |
| | ආචාර්ය එස්. ඇම්බැක්කේ (2014.04.14 සිට) |
| ඉංග්‍රීසි භාෂා අංශය | ආචාර්ය එස්. සිවමෝහන් |
| | මහාචාර්ය ඒ. පරාක්‍රම (2014.07.06 සිට) |
| ලලිත කලා අංශය | එස්.එම්.ඒ. සමරකෝන් |
| | ආචාර්ය එම්.ඒ.ජී.එම්.එස්.බී. අලවතුකොටුව (2014.06.02 සිට) |
| භූගෝල විද්‍යා අංශය | මහාචාර්ය පී. වික්‍රමගමගේ |
| ඉතිහාස අංශය | මහාචාර්ය එච්. ධීරානන්ද හිමි |
| | මහාචාර්ය එම්. සෝමතිලක (2014.02.10 සිට) |
| නීති අංශය | ආචාර්ය එන්.ඩී. උඩගම (2014.08.01 සිට) |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ් |
| | ජේ.බී. දොඩංකොටුව මයා (2014.03.26 සිට) |
| දර්ශනය හා මනෝ විද්‍යා අංශය | ආචාර්ය ඩී.ඩී.කේ.එස්. කරුණානායක |
| දේශපාලන විද්‍යා අංශය | ආර්.ඒ.ඩබ් රණසිංහ |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | මහාචාර්ය පූජ්‍ය එම්. ඤාණානන්ද හිමි |
| | ආචාර්ය බී. ශාන්තවිමල හිමි (2014.07.10 සිට) |
| සිංහල භාෂා අංශය | ඊ.එම්.එම්.ආර්.පී.එල්. නුගපිටිය |
| සමාජ විද්‍යා අංශය | මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් |
| දෙමළ භාෂා අංශය | මහාචාර්ය වී. මහේෂ්වරන් (2014.10.01 සිට) |

**දන්ත වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| මූලික විද්‍යා අංශය | වෛද්‍ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක |
| | මහාචාර්ය ඒ.කේ.එස්. අරඹවත්ත (2014.02.24 සිට) |
| සමාජ දන්ත සෞඛ්‍ය අංශය | වෛද්‍ය වී. විජයකුමාරන් |
| මුඛ සෞඛ්‍ය හා පරිදන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය ආර්.ඩී. ජයසිංහ |
| මුඛ ව්‍යාධිවේද අංශය | මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග |
| කෘතිම දන්ත වෛද්‍ය අංශය | වෛද්‍ය අයි.පී. තිලකුමාර |
| දන්ත සංරක්ෂණ අංශය | වෛද්‍ය ඩී.අයි. අමරතුංග |
| | වෛද්‍ය එම්.සී. ෆොන්සේකා (2014.02.07 සිට) |
| මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය | වෛද්‍ය ඒ.එම්. ආටිගල |
| | වෛද්‍ය පී.එස්.කේ. නානායක්කාර (2014.07.01 සිට) |

**ඉංජිනේරු පීඨය**

| | |
|---|---|
| රසායනික හා සැකසුම් ඉංජිනේරු අංශය | ආචාර්ය සී.එස්. කල්පගේ (2014.01.01 සිට) |
| සිවිල් ඉංජිනේරු අංශය | ආචාර්ය ඒ.එල්.එම්. මහරූෆ් |
| | මහාචාර්ය පී.බී.ආර්. දිසානායක (2014.02.07 සිට) |
| පරිගණක ඉංජිනේරු අංශය | ආචාර්ය කේ.ඩබ්.එච්.එම්.ආර්.ඩී. ඇල්කඩුව |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය | ආචාර්ය ඒ. අත්පුතරාජා |
| ඉංජිනේරු ගණිත විද්‍යා අංශය | ආචාර්ය ඩී.එස්.කේ. කරුණාසිංහ |
| යාන්ත්‍රික ඉංජිනේරු අංශය | ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී. ගුණවර්ධන |
| නිෂ්පාදන ඉංජිනේරු අංශය | ආචාර්ය ආර්.ඒ. ඒකනායක මිය |
| ඉංජිනේරු කළමනාකරණ අංශය | ආචාර්ය පී.බී.ජී. දිසානායක |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| කාය ව්‍යවච්ඡේද අංශය | වෛද්‍ය එස්.බී. අධිකාරි |
| | වෛද්‍ය එච්.එම්.ඒ. සොම්නාන්ද (2014.04.23 සිට) |
| නිර්වින්දන වෛද්‍ය අංශය | වෛද්‍ය එම්.වී.ජී. පින්ටෝ |
| ජෛව රසායන විද්‍යා අංශය | වෛද්‍ය පී.එච්.පී. ප්‍රනාන්දු |
| | මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ (2014.03.31 සිට) |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය | මහාචාර්ය පී.වී.ආර්. කුමාරසිරි |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු |
| | වෛද්‍ය ඒ.එන්. වෛද්‍යසිංහ (2014.07.31 සිට) |
| වෛද්‍ය විද්‍යා අංශය | වෛද්‍ය ඩබ්.ඒ.ටී.ඒ. ජයලත් |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය | වෛද්‍ය එෆ්. නූර්දීන් |
| ප්‍රසව හා නාරිවේද අංශය | වෛද්‍ය එස්.ඒ. කරුණානන්ද |
| | වෛද්‍ය ඊ.ඩබ්. සමරකෝන් (2014.01.15 සිට) |
| ළමා රෝග අංශය | වෛද්‍ය ආර්.එම්. මුදියන්සේ |
| පරපෝෂ විද්‍යා අංශය | වෛද්‍ය දේවිකා ඉද්දවල |
| | වෛද්‍ය ආර්.පී. මොරල් (2014.07.01 සිට) |
| ව්‍යාධිවේද අංශය | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක |
| භිෂග්වේද අංශය | වෛද්‍ය යූ. දන්ගහදෙණිය |
| භෞතවේද අංශය | වෛද්‍ය එස්.ඒ. රාජරත්න |
| | වෛද්‍ය එස්.ඩී.අයි. නානායක්කාර (2014.01.01 සිට) |
| මනෝ වෛද්‍ය අංශය | වෛද්‍ය ටී.එන්. රාජපක්ෂ |
| ශල්‍ය වෛද්‍ය අංශය | වෛද්‍ය ඒ.යූ.බී. පෙතියාගොඩ |
| විකිරණ විද්‍යා අංශය | මහාචාර්ය පී.බී. හේවාවිතාරණ |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| උද්භිත විද්‍යා අංශය | ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා |
| රසායන විද්‍යා අංශය | මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා |
| භූගර්භ විද්‍යා අංශය | ආචාර්ය ඒ.ඒ.ජේ.කේ. ගුණතිලක |
| අණුක ජීව විද්‍යා හා ජෛව රසායන අංශය | ආචාර්ය ඩී.එස්.ඩී.එන්.එන්. සූරියපතිරණ |
| ගණිත විද්‍යා අංශය | ආචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා |
| | මහාචාර්ය ඩබ්.බී. දවුන්දසේකර (2014.01.01 සිට) |
| භෞතික විද්‍යා අංශය | ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර |

| | |
|---|---|
| සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අංශය | ආචාර්ය වයි.පී.ආර්.ඩී. යාපා |
| සත්ව විද්‍යා අංශය | ආචාර්ය ආර්.එස්. රාජකරුණා |

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

| | |
|---|---|
| පශු චිකිත්සක අංශය | මහාචාර්ය ඉන්දිරා සිල්වා |
| | වෛද්‍ය ඒ. දංගොල්ල (2014.03.01 සිට) |
| පශු ව්‍යාධිවේද අංශය | වෛද්‍ය අරුල්කාන්තන් (2014.08.01 සිට) |
| පශු මූලික විද්‍යා අංශය | වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ |
| ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශය | වෛද්‍ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර් |
| පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අංශය | වෛද්‍ය ආර්.එස්. කළුපහන |

**අංශ ප්‍රධානීන් නොවන වෙනත් මහාචාර්යවරුන්**

**කෘෂිවිද්‍යා පීඨය**

මහාචාර්ය ඩී.සී. බණ්ඩාර
මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක
මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. කොස්තා
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව
මහාචාර්ය යූ.ජී. ද ඒ. එදිරිසිංහ
මහාචාර්ය එල්.එච්.පී. ගුණරත්න
මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන
මහාචාර්ය ඩී.සී.කේ. ඉල්ලපෙරුම
මහාචාර්ය එස්.පී. ඉන්ද්‍රරත්න
මහාචාර්ය ඒ.එන්. ජයකොඩි
මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු
මහාචාර්ය ආර්.බී. මාපා
මහාචාර්ය ඩබ්.පී.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය කේ.එන්. නන්දසේන
මහාචාර්ය බී.සී.එන්. පීරිස්
මහාචාර්ය එස්.ඊ. පීරිස්
මහාචාර්ය ඒ.එන්.එෆ්. පෙරේරා
මහාචාර්ය ඊ.ආර්.කේ. පෙරේරා
මහාචාර්ය එස්. ප්‍රේමරත්න
මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර
මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ
මහාචාර්ය එස්. සමිත
මහාචාර්ය යූ. සංගක්කාර
මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා
මහාචාර්ය ඩබ්.පී.ආර්.පී.ඩී. ද සිල්වා
මහාචාර්ය වී.ඒ. සුමනසිංහ
මහාචාර්ය ආර්.ඕ. තිල්
මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී. වනිගසුන්දර
මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
මහාචාර්ය අයි.පී. වික්‍රමසිංහ
මහාචාර්ය එම්.පී.බී. විජේගුණවර්ධන

**ශාස්ත්‍ර පීඨය**

මහාචාර්ය ඒ.එස්.පී. අබේරත්න
මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර
මහාචාර්ය එම්.එස්. එම්. ඇන්ස්
මහාචාර්ය එච්. ධීරානන්ද හිමි
මහාචාර්ය එම්. ඥානානන්ද හිමි
මහාචාර්ය ඩී.එන්.ඒ. ගුණවර්ධන
මහාචාර්ය එස්.එච්. හිස්බුල්ලා
මහාචාර්ය එස්.ඒ. කරුණාතිස්ස
මහාචාර්ය පී.බී. කීරවැල්ල
මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ
මහාචාර්ය එස්.ඩබ්. පෙරේරා
මහාචාර්ය එස්.කේ. පින්නවල
මහාචාර්ය කේ. රාහුල හිමි
මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න
මහාචාර්ය එස්. සෙනෙවිරත්න
මහාචාර්ය කේ.ටී. සිල්වා
මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ

**දන්ත වෛද්‍ය පීඨය**

මහාචාර්ය එස්.එල්. ඒකනායක
මහාචාර්ය එස්.පී.එන්.පී. නාගරත්න
මහාචාර්ය සී.ඩී. නානායක්කාර
මහාචාර්ය පී.එස්. රාජපක්ෂ
මහාචාර්ය එම්.ඒ.එම්. සිතීක්
මහාචාර්ය ඒ. තිලකරත්න
මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න
මහාචාර්ය ජේ.යූ. වීරසිංහ
මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ
මහාචාර්ය කේ.එම්. විජේරත්න
මහාචාර්ය ආර්.එල්. විජේවීර

**ඉංජිනේරු පීඨය**

මහාචාර්ය එස්.බී.එස් අබයකෝන්
මහාචාර්ය එම්.ඒ.ආර්. එම්. ප්‍රනාන්දු
මහාචාර්ය යූ. ද එස්. ජයවර්ධන
මහාචාර්ය කේ.එම්. ලියනගේ
මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල්
මහාචාර්ය කේ.පී.පී. පතිරණ
මහාචාර්ය එස්.ඩී. පතිරණ
මහාචාර්ය කේ.ජී.එච්.සී.එන්. සෙනෙවිරත්න
මහාචාර්ය ආර්. ශාන්තිනි
මහාචාර්ය කේ.එස්. වල්ගම
මහාචාර්ය එස්.බී. වීරකොන්

**වෛද්‍ය පීඨය**

මහාචාර්ය ඒ. අබේගුණවර්ධන
මහාචාර්ය සී.කේ. අබේසේකර
මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර
මහාචාර්ය අයි.බී. ගවරමාන්න
මහාචාර්ය ඩබ්.එම්.සී.ජේ. ජයසිංහ
මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
මහාචාර්ය ආර්. සිවකානේෂන්
මහාචාර්ය වී. තෙවනේසම්
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය ඒ.එස්.බී. විජේකෝන්

**විද්‍යා පීඨය**

මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම්
මහාචාර්ය බී.එම්.ආර්. බණ්ඩාර
මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්
මහාචාර්ය යූ.එන්.බී. දිසානායක
මහාචාර්ය ජේ.පී. එදිරිසිංහ
මහාචාර්ය බී.එස්.බී. කරුණාරත්න
මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න
මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න
මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු
මහාචාර්ය ඒ.අයි.ඒ. පෙරේරා
මහාචාර්ය කේ. ප්‍රේමරත්න
මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
මහාචාර්ය කේ.බී. රණවන
මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්.පී. විජේකෝන්
මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

මහාචාර්ය එච්. අබේගුණවර්ධන
මහාචාර්ය පී. අබේනායක
මහාචාර්ය එස්. පී. ගුණරත්න
මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ
මහාචාර්ය අයි.ඩී. සිල්වා

**පීඨ නියෝජිතයන්**

**කෘෂිවිද්‍යා පීඨය**

අචාර්ය ඩබ්.එම්.ටී. මධුජිත්
මහාචාර්ය ඩී.පී.එන්.පී. විජේසිංහ

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

වෛද්‍ය එච්.එම්.ටී.යූ. හේරත්
වෛද්‍ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර

**ශාස්ත්‍ර පීඨය**

ආචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම
ආචාර්ය ඩබ්.එල්.පී. පෙරේරා

**දන්ත වෛද්‍ය පීඨය**

වෛද්‍ය කේ.එස්.එන්. ආරියසිංහ
වෛද්‍ය ආර්.ඩබ්. පල්ලේගම

**ඉංජිනේරු පීඨය**

ආචාර්ය පී.බී.බී. හේරත්
ආචාර්ය අයි.එම්.එස්. සත්‍යප්‍රසාද්

**වෛද්‍ය පීඨය**

වෛද්‍ය ඩී.එස්. දිසානායක
වෛද්‍ය කේ. මාරඹේ (2014.02.24 සිට)

**විද්‍යා පීඨය**

මහාචාර්ය ඒ.එන්. නවරත්න
ආචාර්ය එම්.පී.බී. මීගස්කුඹුර (2014.02.22 සිට)
ආචාර්ය ඒ.ඒ.එස්. පෙරේරා (2014.02.22 සිට)

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

ආචාර්ය ඩී.ඩී.එන්. ද සිල්වා
ආචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර (2014.09.21 සිට)
ආචාර්ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය
ආචාර්ය කේ.එන්.ඒ. විජයවර්ධන (2014.09.21 සිට)

## 1.3 අත්කරගත් ජයග්‍රහණ සහ පිළිගැනීම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ, පශ්චාත් උපාධි ආයතන, මධ්‍යස්ථාන හා ඒකකවල සාමාන්‍ය විස්තර හා ජයග්‍රහණ උපග්‍රන්ථ 'A' හි විස්තරාත්මකව දැක්වේ.

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයීය සංවර්ධනයේ සෑම පැතිකඩකින්ම අත්කරගත් ජයග්‍රහණයන් පහත දැක්වෙන කොටසින් පිළිඹිඹු කෙරේ.

**සාමාන්‍ය**

### 1.3.1 උපාධි ප්‍රදානෝත්සවය 2013



පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි 76 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2014 මැයි මස 29 වැනි දින පවත්වන්නට විය. උපාධි ප්‍රදානෝත්සවය යනු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අති උත්කර්ෂවත් අවස්ථාවන්ගෙන් එක් අවස්ථාවකි. මෙවර පීඨ අටෙහි හා පශ්චාත් උපාධි ආයතනවලට අයත් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් 3179 දෙනෙකු මෙම විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය ඊ.ඩබ්ලිව්. ඇපාසිංහයන්ගේ සුරතින් උපාධිය ලබාගත්හ.

කෘෂිවිද්‍යා, කලා, සමසෞඛ්‍ය, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා, පශු වෛද්‍ය යන පීඨ සහ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි යන ආයතනයන් විසින් පිරිනමනු ලබන විවිධ පශ්චාත් උපාධි හැදෑරූ උපාධි අපේක්ෂකයන් අතරට දර්ශනශූරී උපාධි 16ක් හා පශ්චාත් උපාධි 754ක් දෙනෙකු අයත් වූහ. උපාධි අපේක්ෂක සංඛ්‍යාව විශාල වූ හෙයින් මෙවරද පසුගිය වසරේදී මෙන් උපාධි ප්‍රදානෝත්සවය සැසි දෙකකට පවත්වන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශාලතම පීඨය වන ශාස්ත්‍ර පීඨය මෙවර 76වැනි උපාධි ප්‍රදානෝත්සවය සංවිධානය කිරීමේ වගකීම දරනු ලැබීය. උපාධි ප්‍රදානෝත්සවයේ සංවිධායක කමිටුවේ සභාපතිත්වය දරන ලද්දේ ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය නවරත්න බණ්ඩාර මහතා විසිනි.

**නීති උපාධිලාභී ප්‍රථම සිසු කණ්ඩායම**

ශාස්ත්‍ර පීඨයේ නීති අධ්‍යයන අංශයට බඳවාගත් ප්‍රථම සිසු කණ්ඩායම 2014 මැයි මාසයේදී ඉතා සාර්ථක කාර්ය සාධනයක් සහිතව උපාධි ලබා ගත්හ. මෙසේ උපාධි ලබාගත් 44 දෙනා අතුරෙන් හත් දෙනෙකු දෙවන පන්තියේ ඉහළ ගෞරව උපාධිය ද දස දෙනෙකු දෙවන පන්තියේ පහළ ගෞරව උපාධිය ද ලබා ගත්හ. නීතිවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පිරිනැමීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුවේ. මෙම සිසුන් අතරින් බොහෝ දෙනෙකු නාගරික නොවන පාසල්වල සිසුන් වූ අතර ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වනවිට ඔවුන්ගේ ඉංග්‍රීසි දැනුම සාමාන්‍ය මට්ටමේ පැවතිණ.

### 1.3.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසිය (iPURSE)




පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි වාර්ෂිකව පවත්වනු ලබන පර්යේෂණ සැසිවලින් විවිධ පීඨවල විද්වතුන්ට හා පර්යේෂණ සිසුන්ට ඔවුනගේ පර්යේෂණ සොයා ගැනීම් එකම ස්ථානයක සිට විද්වතුන් ඉදිරියේ ඉදිරිපත් කිරීමේ අවස්ථාව උදාකර දෙනු ලබයි. මෙම පර්යේෂණ සැසිවලින් පර්යේෂකයෙකු අත්කර ගන්නා සාරගර්භ ප්‍රතිපෝෂණය පර්යේෂණ කාර්යයෙහි නියැලෙන නව පර්යේෂකයන්ට මංමාවත් විවෘත කර දෙනු ලබයි. 1996 වසරට පෙර පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සැසි පවත්වන ලද්දේ පීඨ මට්ටමිනි. විශ්වවිද්‍යාලය මට්ටමින් වාර්ෂික පර්යේෂණ සැසි පැවැත්වීම 1996 වසර ආරම්භවීමත් සමගම විවිධ පීඨවල විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කාර්යයන්හි නියැලී සිටින්නන් අතර පුළුල්ව අන්තර්ක්‍රියා කිරීමේ අවස්ථාව උදාකර දෙනු ලබයි. මෙවර පැවැත්වූ 18 වැනි වාර්ෂික පර්යේෂණ සැසියට පුළුල් හා ජාත්‍යන්තර සහභාගිත්වයක් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව තුළ හා ඉන් පරිබාහිර සංවිධානවල සාමාජිකයන්ට ද සහභාගි විය හැකි පරිදි ව්‍යාප්ත කරන ලදි.


මෙවර මෙම ජාත්‍යන්තර පර්යේෂණ සැසිය 2014 ජූලි 04-05 යන දිනවල පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදි.

2014 පර්යේෂණ සැසිය තේමාවන් දහයක් එනම් කාලගුණය සහ පරිසරය, ආර්ථික හා කළමනාකරණය, අධ්‍යාපනය, ඉංජිනේරු විද්‍යාව තුලින් ගොඩනැගූ පරිසරය හා පෘථිවි විද්‍යාවන්, ආහාර පෝෂණය හා පශු සම්පත්, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, තොරතුරු තාක්ෂණය, ගණිතය හා සංඛ්‍යානය, ස්වභාවික විද්‍යාවන්, පැලෑටි විද්‍යාවන් හා වනාන්තර සහ මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යාවන් යන අංශ ආවරණය වන පරිදි ව්‍යුහගත කොට තිබිණ. මෙම පර්යේෂණ සැසියේදී වාචික ඉදිරිපත් කිරීම් 566 ක් හා පෝස්ටර් 156ක් ඇතුළත් මුළු ඉදිරිපත් කිරීම් 722ක් ඉදිරිපත් කරන ලද අතර එම ඉදිරිපත් කිරීම් සියල්ල සම සමාලෝචකයන් විසින් පුළුල්ව විමර්ශනය කරන ලදි. පර්යේෂණ සැසියේ කටයුතු කෙරී ගෙන යන කාලය තුළ මෙම ඉදිරිපත් කිරීම් ඊට සමගාමී සැසි 18කින් ඉදිරිපත් කරන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ව්‍යාප්තව පවතින ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියට මෙය කදිම සාක්ෂියකි. විවිධ ක්ෂේත්‍රයන්ගෙන් හා වෘත්තීය පසුබිමක් සහිතව මෙම සැසියට සහභාගි වූවන් නව සොයා ගැනීම් හා නව නිර්මාණ හුවමාරු කර ගැනීම තුළින් පෝෂණයක් ලබනු ඇතැයි අපේක්ෂා කෙරිණ. එමෙන්ම මෙම සැසිය පර්යේෂණ ඉහළනැංවීම සඳහා සබඳතාවයක් හා සහයෝගීතාවන් ගොඩනගා ගැනීමට ද ඉවහල් වන අවස්ථාවකි.

ඇමෙරිකාවේ හවාඩ් විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය හා තුලනාත්මක සත්ව විද්‍යා කෞතුකාගාරයේ අධ්‍යක්ෂ මහාචාර්ය ජේම්ස් හැන්කන් මෙම සැසියේ ප්‍රධාන අමුත්තා විය. මෙම සැසියේ සමාරම්භක උත්සවයේ ආගන්තුක කථිකයා ලෙස කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හා SLINTEC පර්යේෂණ හා නව නිපැයුම් අංශ ප්‍රධානී මහාචාර්ය ගිහාන් අමරතුංග සහභාගී විය. ඊට අමතරව ප්‍රධාන කථිකයන් දෙදෙනෙකුගෙන් හා ආරාධිත කථිකයන් හය දෙනෙකුගේ දෙසුම්වලින් මෙම වැඩසටහන පෝෂණය විය.

### 1.3.3 ගෝලීය ශ්‍රේණිගත කිරීම

2014 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය පර්යේෂණ අංශයෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් ප්‍රථම ස්ථානය හිමි කර ගන්නා ලදි. එම වර්ෂයේදී අධ්‍යයන කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින් සිදුකරනු ලබන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගතකරණයට අනුව 1426 වැනි ස්ථානයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය රැඳී සිටී. අධ්‍යයන කාර්ය සාධනය යටතේ ශ්‍රේණිගතවූ ශ්‍රී ලංකාවේ එකම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.




### 1.3.4 විශ්වවිද්‍යාල දිනය – ඔක්තෝබර් 09




ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය දැනට පිහිටා තිබෙන පේරාදෙණියෙහි නිල වශයෙන් විවෘත කිරීමේ 60 වැනි සංවත්සරය සැමරීම මහත් උත්සවකාරයෙන් පවත්වන ලදි. මෙම උත්සවයට සමගාමීව මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ සියවැනි ජන්ම ශත සංවත්සරය සැමරීමට ද කටයුතු කළ අතර එහිදී ඔහුගේ නාට්‍ය පහක් සරත්චන්ද්‍ර එළිමහන් රංග පීඨයේදී ප්‍රදර්ශනය කරන ලදි.

### 1.3.5 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීම



2014 අයවැයෙන් මුදල් වෙන් කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2014 ජනවාරි තුන්වැනි දින විවෘත කරන ලදි. මෙම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් ඉදිකෙරෙන සත්මහල් ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ සැලසුම් මේවනවිටත් අවසන් කොට ඇත. මෙම ගොඩනැගිල්ල වෛද්‍ය පීඨ පරිශ්‍රයෙහි ස්ථාපිත කෙරෙනු ඇත.

### 1.3.6 කළමනාකරණ පීඨය ස්ථාපිත කිරීම



දීර්ඝ කාලයක සිට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අළුතෙන් එකතුවීමට නියමිතව තිබූ කළමනාකරණ පීඨය මේ වනවිට විවෘත කිරීමට සූදානම්ව පවතී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අප්‍රේල් මස 14 වැනි දින මේ සඳහා අනුමැතිය ලබාදුන් අතර එය හැකි විගස විවෘත කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. කළමනාකරණ පීඨය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ පළමු අදියරේ කටයුතු මේ වනවිට අවසන්වී ඇති අතර එය පරිහරණය සඳහා සූදානම්ව පවතී. මේ පිළිබඳ ගැසට් පත්‍රය නීති සැලසුම්කරුවෙකු විසින් සකස් කෙරෙමින් පවතී.

### 1.3.7 සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීම

2014 වර්ෂයේ මුල් කාලයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පශ්චාත් උපාධි ආයතනය සම්බන්ධයෙන් ගැසට් කරන ලදි. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර සම්බන්ධ මේ වනවිට ශාස්ත්‍ර පීඨය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් ද ඇතුළත්ව සෑම පශ්චාත් උපාධි වැඩසටහනක්ම මෙම ආයතනය මඟින් පවත්වනු ලබයි. ශාස්ත්‍ර පීඨයේ උසස් උපාධි සඳහා බලපැවැත්වෙන නීති රෙගුලාසිම මෙම ආයතනයේ උසස් උපාධි වැඩසටහන් සඳහා ද විශ්වවිද්‍යාලයේ සනාතන සභාව හා පාලක සභාව සමඟ එක්ව ආයතනය විසින් වෙනස් කළහොත් හෝ සංශෝධනය කළහොත් හැර එලෙසින්ම බලපැවැත්වෙනු ඇත.
සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර විෂයයන් හා සම්බන්ධ පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා අධ්‍යයන මණ්ඩපයක් ආයතනය විසින් පිහිටුවනු ඇත.

සමාජ විද්‍යාවන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
ආර්ථික විද්‍යා කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය
භාෂා හා සාහිත්‍ය අධ්‍යයන මණ්ඩලය
මනෝ විද්‍යාව, දර්ශනය හා අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය
ආගමික හා සංස්කෘතික අධ්‍යයන මණ්ඩලය

### 1.3.8 ශිෂ්‍ය නේවාසික පහසුකම්




සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍ය සුබ සාධනය කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවයක් දක්වන ලදි. මෙම වර්ෂයේදී සිසුන්ට විශ්වවිද්‍යාලය තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයීමටත් සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% කට නේවාසික පහසුකම් ලබා දීමටත් හැකි විය. එමෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් සිසුන් 2180 දෙනෙකුට නේවාසික පහසුකම් සපයෙන නව නේවාසිකාගාර හයක් සඳහා ස්ථාන ද සහිතව ලබාගැනීම පිණිස මුදල් අත්කර ගැනීමට අපට හැකිවිය. මෙම නේවාසිකාගාරවලින් හතරක් මේ වනවිටත් සිසුන්ට නේවාසික පහසුකම් සැපයීමට සූදානම් කර ඇති අතර ඒවා 2015 මාර්තු මාසයේදී විවෘත කිරීමට අපේක්ෂිතයි. අනෙක් නේවාසිකාගාර දෙක (02) 2015 සැප්තැම්බර් මාසය වනවිට විවෘත කිරීමට හැකිවනු ඇත.

### 1.3.9 පේරාදෙණිය විශ්වවිද්‍යාලය ලද ස්කෑනිං ඉලෙක්ට්‍රෝන් අන්වීක්ෂය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි සිදුකරන පර්යේෂණ පහසු කරවීම සඳහා ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් උසස් තත්ත්වයෙන් විශ්ලේෂණාත්මක උපකරණයක් මිලදී ගන්නා ලදි. මෙම උපකරණ නව භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලේ සවි කොට ඇති අතර එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා කාර්මික නිලධාරින් දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර සම්පත්දායකයන්ගේ සහභාගිත්වයෙන් යුතුව වැඩමුළු මාලාවක් 2014 සැප්තැම්බර් 10-13 දින දක්වා පවත්වන ලදි. එම උපකරණයේ විවිධ යෙදුම් විස්තර කිරීමට විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු සඳහා එය උපයෝගි කරගනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත් කිරීම සඳහා ද වැඩමුළුවක් පවත්වන්නට විය.

### 1.3.10 න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකයට ලබාගත් SPECT ගැමා කැමරාව



න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකයේ පහසුකම් ඉහළනැංවීම සඳහා තාක්ෂණික සමාගමේ IAEA නිත්‍ය වැඩ සටහන යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මේ සඳහා සහය ලැබිණ. මෙම ව්‍යාපෘතියේ සමස්ත පරමාර්ථය වනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකයේ තාක්ෂණය හා මිනිස්බල සංවර්ධනය දියුණු කරමින් න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකයේ තාක්ෂණය හා මිනිස්බල සංවර්ධනය දියුණු කරමින් න්‍යෂ්ඨික වෛද්‍ය මූර්තනය හා විකිරණ න්‍යුක්ලයිඩ චිකිත්සක (Imaging and Radionuclide therapy ) පහසුකම් ඉහළනැංවීමයි. මෙම මූර්තන (imaging) තාක්ෂණය රෝගි සත්කාරයේදී විශේෂයෙන්ම පිළිකා , වකුගඩු හා හෘද රෝගවලින් පෙළෙන රෝගින්ට ඉතා ප්‍රයෝජනවත් වේ. මෙම පහසුකම් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි චිකිත්සක න්‍යෂ්ඨික වෛද්‍ය ඉගැන්වීම් දියුණු කිරීම පිණිස යොදා ගනු ඇත. වෛද්‍ය පීඨය තුළ බහු ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රියාකාරකම් පැවැත්වීමටත් අනෙකුත් පීඨවල වෛද්‍ය භෞතික විද්‍යාව, ජෛව වෛද්‍ය විද්‍යාව හා මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි මූර්තන විශ්ලේෂණය (image analysis) සඳහා අපහට උසස් තාක්ෂණවේදය මංපෙත් විවෘත කරදෙනු ලබයි.

### 1.3.11 සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ ශිෂ්‍ය නොසන්සුන්තාවය

සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන් 3+1 උපාධි පාඨමාලාව වෙනුවට සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ඉල්ලා අරගල කිරීම නිසා වර්ෂයේ සැලකිය යුතු කාලයක් ශිෂ්‍ය නොසන්සුන්තාවයක් පැවතුණි. මෙම කරුණ පිළිබඳ නිසි අවධානය යොමු කොට අදාළ පාර්ශවයන් සමඟ ඉහළ පෙළේ සාකච්ඡා වට කිහිපයක්ම පැවැත්වූ අතර ඒ අතරට විශේෂ සනාතන සභා රැස්වීම් දෙකක් ද පවත්වා සාකච්ඡා කොට දීර්ඝ කාලයක් තිස්සේ විශ්වවිද්‍යාලයට බාධකයක්ව පැවති එම ගැටළුවට පිළිගත හැකි මට්ටමේ විසඳුමකට ළඟාවීමට හැකි විය.

### 1.3.12 විශ්වවිද්‍යාලය "හරිත මණ්ඩපයක් " බවට පත් කිරීම

මෙම විශ්වවිද්‍යාලය හරිත මණ්ඩපයක් බවට ප්‍රකාශයට පත් කොට පොළිතින් භාවිතය අවම කිරීමට පියවර ගන්නා ලදි. එමෙන්ම හරිත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ද නිසි පියවර ගන්නා ලදි.


### 1.3.13 ශිෂ්‍ය ලියාපදිංචිය 2014

පසුගිය අවුරුදු අටක කාලය තුළ ප්‍රථම උපාධි ශිෂ්‍ය සංඛ්‍යාව 8469 සිට 10814 දක්වා 45% කට වැඩි ප්‍රමාණයකින් ඉහළ යෑම හා 2007 සිට 2014 වසර දක්වා වාර්ෂිකව සිසුන් බඳවා ගැනීම 16% කින් ඉහළ යෑම අපගේ උපාධි වැඩසටහන්වලට වැඩිවන ඉල්ලුම පිළිඹිඹු කරන්නක් බව සඳහන් කළ යුතුවේ.

| පීඨය | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| කෘෂි විද්‍යා | 811 | 804 | 839 | 875 | 925 | 712 | 690 | 1100 |
| සමසෞඛ්‍ය | 307 | 453 | 570 | 711 | 685 | 670 | 578 | 831 |
| කලා | 2883 | 2905 | 3186 | 3616 | 3730 | 3717 | 3580 | 4530 |
| දන්ත වෛද්‍ය | 375 | 374 | 383 | 388 | 380 | 378 | 416 | 508 |
| ඉංජිනේරු | 1374 | 1468 | 1533 | 1585 | 1655 | 1241 | 1307 | 2129 |
| වෛද්‍ය | 955 | 977 | 995 | 1018 | 1222 | 1222 | 1064 | 1277 |
| විද්‍යා | 1398 | 1565 | 1697 | 1696 | 1725 | 1707 | 1692 | 2108 |
| පශු වෛද්‍ය | 366 | 371 | 402 | 362 | 388 | 338 | 294 | 386 |
| **එකතුව** | **8469** | **8917** | **9605** | **10251** | **10710** | **9985** | **9621** | **12869** |

**සටහන:**
ශිෂ්‍ය ලියාපදිංචිය අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගණනය කරන ලදි.


**මුළු ශිෂ්‍ය ලියාපදිංචිය 2007-2014**




### 1.3.14 ශිෂ්‍ය ප්‍රවේශය 2014

| පීඨය | 2013/2014 | 2012/2013 | 2011/2012 | 2010/2011 | 2009/2010 | 2008/2009 | 2007/2008 |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා | 220 | 211 | 208 | 241 | 246 | 228 | 221 |
| සමසෞඛ්‍ය | 182 | 141 | 195 | 152 | 141 | 125 | 150 |
| කලා | 894 | 976 | 1095 | 894 | 916 | 973 | 1008 |
| දන්ත වෛද්‍ය | 82 | 79 | 100 | 80 | 81 | 82 | 74 |
| ඉංජිනේරු | 416 | 406 | 477 | 415 | 415 | 411 | 414 |
| වෛද්‍ය | 211 | 207 | 241 | 204 | 207 | 207 | 205 |
| විද්‍යා | 464 | 467 | 475 | 489 | 444 | 516 | 495 |
| පශු වෛද්‍ය | 76 | 82 | 80 | 83 | 78 | 78 | 68 |
| මුළු එකතුව | 2545 | 2569 | 2871 | 2558 | 2528 | 2620 | 2635 |

**ශිෂ්‍ය ප්‍රවේශය 2007-2014**




**පීඨ මට්ටමින් මුළු ශිෂ්‍ය ලියාපදිංචිය 2007-2014**




### 1.3.15 කාර්ය මණ්ඩල සංඛ්‍යා ලේඛන 2007-2014

**නව බඳවා ගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල (ස්ථිර) 2007-2014**

| වර්ෂය | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 2007 | 34 | 67 |
| 2008 | 25 | 59 |
| 2009 | 30 | 75 |
| 2010 | 24 | 90 |
| 2011 | 26 | 75 |
| 2012 | 35 | 56 |
| 2013 | 59 | 148 |
| 2014 | 52 | 77 |

**2007-2014 දක්වා කාලය තුළ කාර්ය මණ්ඩල බඳවා ගැනීම**



අධ්‍යයන කටයුතු

**1.3.16 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගත් සම්මාන ප්‍රදාන**

- **CVCD විශිෂ්ටතා සම්මානය**



ආචාර්ය ජේ.ජේ. විජේතුංග
ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, ප්‍රමාණාත්මක සමීක්ෂණ හා තොරතුරු තාක්ෂණය ඇතුළත් තාක්ෂණය හා සම්බන්ධ විද්‍යා ක්ෂේත්‍රයන්හි වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂක සම්මානය ලබා ගත්තේය.

මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
භෞතිකවිද්‍යා ක්ෂේත්‍රයෙහි වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයාට හිමි ත්‍යාගය ලබා ගත්තේය.

මහාචාර්ය ඩබ්ලිව්.එම්. තිලකරත්න
වෛද්‍ය, දන්ත, පශු වෛද්‍ය හා සමසෞඛ්‍ය යන විද්‍යාවන් ඇතුළත් සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රයෙහි වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා සම්මානය ලබා ගත්තේය.

වෛද්‍ය එච්.ඒ. සුරවීර
ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, ප්‍රමාණාත්මක සමීක්ෂණ හා තොරතුරු තාක්ෂණය ඇතුළත් තාක්ෂණවේදය හා සම්බන්ධ විද්‍යා ක්ෂේත්‍රයෙහි වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා සම්මානය දිනා ගත්තේය.

- ඔහියෝ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටින රංග කලුගම්පිටිය මහතාට එම විශ්වවිද්‍යාලයේ කලා අන්තර් ක්ෂේත්‍ර පාසැල විසින් "Inter Arts Excellence and Diversity Fellowship 2014/15" සම්මානය පිරිනමන ලදි. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයෙකි.

- සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ විකිරණ හා විකිරණ චිකිත්සක අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බිමාලි විරකෝන් මහත්මියට ජපානයේ චිබා විශ්වවිද්‍යාලයේ ඇගේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ජපන් රජයේ අරමුදලින් 'මොන්බුක්කාකුෂෝ' ශිෂ්‍යත්වය පිරිනමන ලදි. ප්‍රථම උපාධිය හදාරන අවධියේදී දක්ෂතා දක්වා විශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ පළමු සිසු කණ්ඩායමට අයත් උපාධිධාරිණියෙකි.

- මහාචාර්ය මිස්සක විජයගුණවර්ධන ''ඕස්ට්‍රේලියානු විද්‍යාර්ථීන්ගේ විශිෂ්ටතා සම්මානය- 2014'' ලබාගත් අතර ඕස්ට්‍රේලියානු ශ්‍රී ලංකා තානාධිපතිණි රොබින් මුඩයි විසින් කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේ පැවති උත්සවයකදී ඔහුට මෙම සම්මානය පිරිනමන ලදි.




- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ විද්‍යා අධ්‍යාපන ඒකකයේ ආචාර්ය ඩබ්ලිව්.ඩී. චන්ද්‍රසේකර මහතාට 2014 ආසියා පැසිපික් අධ්‍යාපන පර්යේෂණ සංගමයේ හා හොංකොං අධ්‍යාපන පර්යේෂණ සංගමයේ ජාත්‍යන්තර සමුළුවේදී "Young Scholar Best Paper Award"




සම්මානය ප්‍රදානය කරන ලදී. මෙම ප්‍රදාන උත්සවය හොංකොං අධ්‍යාපන ආයතනයේදී 2014 නොවැම්බර් 19 සහ 21 යන දිනවලදී පවත්වන ලදී. හොංකොං ඩොලර් 2000ක් මෙම ප්‍රදානයට ඇතුළත් විය. රටවල් 38ක් මේ සඳහා සහභාගි වූහ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ආචාර්ය චන්ද්‍රසේන මහතාට මෙම සමුළුවට සහභාගිවීම සඳහා අර්ධ අනුග්‍රහය දැක්වීය.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය සුදේස් මන්තිලක මහතාට මේරිලැන්ඩ් විශ්වවිද්‍යාලය විසින් ඉගැන්වීම පිළිබඳ ''ජාත්‍යන්තර සහෘදත්ව සම්මානය'' ප්‍රදානය කළේය. ඔහු එම විශ්වවිද්‍යාලයේ ඔහුගේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන කටයුතුවල නිරතව සිටී.



- විද්‍යා පීඨයේ පීඨාධිපති හා රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර වික්‍රමසිංහ ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමියේ සාමාජික ලෙස 2014.03.21 දින තෝරා පත් කර ගන්නා ලදී.

- ජාතික විද්‍යා පදනම යනු 1976 වසරේදී ස්ථාපිත කළ ඉහළ මට්ටමේ රාජ්‍ය නොවන ආයතනයක් වන අතර එය 1988 පාර්ලිමේන්තු පණතින් නීතිගත කරන ලදී. අදාළ විද්‍යාත්මක/තාක්ෂණික ක්ෂේත්‍රයන්හි විශිෂ්ටතාවයන් අත්කර ගත් විද්‍යාඥයන්ට එහි සාමාජිකත්වය ලබාදීම සළකා බැලීම පිණිස ඇකඩමියේ බලධාරීන් විසින් නම් කරනු ලබයි.

- මහාචාර්ය සී.කේ. අබේසේකර (ළමා රෝග අධ්‍යයන අංශයේ ළමා රෝග පිළිබඳ මහාචාර්ය) ජාතික පර්යේෂණ සභාව විසින් සංවිධානය කොට 2014 ඔක්තෝබර් 31 දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ්හිදී පැවැත්වූ සම්මාන ප්‍රදාන උත්සවයේදී විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය ලබා ගත්තාය.



- මහාචාර්ය සී.කේ. අබේසේකර ජාතික පර්යේෂණ සභාව විසින් සංවිධානය කළ 2011 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජාතික පර්යේෂණ සභාවේ දක්ෂතා සම්මානය ලබා ගන්නටද සමත් වූවාය.



- මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන (ළමා රෝග අධ්‍යයන අංශයේ ළමා රෝග පිළිබඳ මහාචාර්ය) ජාතික පර්යේෂණ සභාව විසින් සංවිධානය කොට 2014 ඔක්තෝබර් 31 දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ්හිදී පැවැත්වූ සම්මාන ප්‍රදාන උත්සවයේදී විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මානය ලබා ගන්නා ලදි.

- මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන ජාතික පර්යේෂණ සභාව විසින් සංවිධානය කළ 2011 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජාතික පර්යේෂණ සභාවේ දක්ෂතා සම්මානය ද ලබා ගත්තේය.

- **අන්තර් වෛද්‍ය පීඨ ළමා රෝග ප්‍රශ්ණ විචාරාත්මක තරඟය 2014 දෙවන ස්ථානය**



ශ්‍රී ලංකා ළමා රෝග වෛද්‍යවරුන්ගේ විද්‍යා පාසල විසින් පිළිවෙලින් 8 වැනි වරටත් පවත්වන ලද වාර්ෂික අන්තර් වෛද්‍ය පීඨ ළමා රෝග ප්‍රශ්ණ විචාරාත්මක තරඟය 2014 ඔක්තෝබර් 19 වැනි දින කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදි.

පේරාදෙණිය වෛද්‍ය පීඨය නියෝජනය කරමින් ඉදිරිපත් වූ කණ්ඩායම ඉහළ දක්ෂතා දක්වමින් අනෙකුත් වෛද්‍ය පීඨ අට පරාජය කරමින් දෙවන ස්ථානයට පත්ව එම කීර්තිමත් ත්‍යාගය ලබා ගන්නට සමත් විය. මෙම කණ්ඩායම වෛද්‍ය එච්.එම්.එල්.වයි. හේරත්, වෛද්‍ය කේ.එම්.අයි.එස්.කේ. ජයසුන්දර (මිය), වෛද්‍ය ඒ.පී. දිනරත්න (මිය), වෛද්‍ය ජේ.එම්. එච්.ඩී. ජයසුන්දර (මිය), හා වෛද්‍ය පී.ඒ. බණ්ඩාර (මිය) යන වෛද්‍යවරුන්ගෙන් සමන්විත විය.

### 1.3.17 සිසුන් විසින් ලබා ගත් ත්‍යාග

- කෘෂිවිද්‍යා පීඨයේ තෙවන වසරේ ආහාර විද්‍යා හා තාක්ෂණවේද විද්‍යාවේදී උපාධි අපේක්ෂිකාවක් වන එච්. සෙනෙවිරත්න මිය හා දෙමුහුන් තාක්ෂණවේදය හදාරන මන්ජු ගුණවර්ධන යන දෙදෙනා ඔවුන් සංවර්ධනය කළ නව නිපැයුම් දෙකක් වෙනුවෙන් 2014 අප්‍රේල් 2-6 වැනි දින දක්වා පැවැත්වූ ජිනීවා නව නිපැයුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනයේදී රන් පදක්කම් දෙකක් හා විශේෂ ජූරියේ ත්‍යාග දෙකක් ද දිනා ගන්නා ලදි. මෙම කාර්යය ස්විස් ෆෙඩරල් රාජ්‍යයේ හා ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ අනුග්‍රහය යටතේ සංවිධානය කරන ලදි.

- **සංඛ්‍යානය පිළිබඳ හොඳම ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රන් පදක්කම් හා රිදී පදක්කම් ලබාගත් ජයග්‍රාහකයෝ**




පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයෙහි සංඛ්‍යාන හා පරිගණක අධ්‍යයන අංශයේ එස්.ජී.ජේ. සේනාරත්න මහතා හා එම්.ඒ. පතන්ගොඩ මිය ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනය විසින් පිරිනමන සංඛ්‍යානය පිළිබඳ හොඳම ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා පිළිවෙළින් රන් හා රිදී පදක්කම් දිනාගන්නට සමත් විය.

මෙය වාර්ෂික ත්‍යාගයක් වන අතර ඒ සඳහා ඉල්ලුම් කරන්නන් ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාලයන්වල උපාධි අපේක්ෂකයන් විය යුතු සේම ඔවුන් විසින් පෙර වසරවල පර්යේෂණ පත්‍ර, උපාධි නිබන්ධන සාර්ථකව අවසන් කොට බාර දී තිබිය යුතුවේ. මෙම ත්‍යාගය සඳහා බාර දෙන ලද පර්යේෂණ පත්‍ර ආදියෙන් සංඛ්‍යාන යෙදුම් පිළිඹිඹු විය යුතු අතර පිළිගත් ප්‍රමිතීන්ගෙන් යුක්ත විය යුතුවේ. මෙහි ප්‍රථම හා දෙවැනි, තෙවැනි ස්ථාන තෝරාගනු ලබන්නේ ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනයේ විධායක සභාව විසින් පත්කළ විශේෂඥ මඩුල්ලක් විසිනි. ජයග්‍රාහකයන්ට සහතික පත්‍රයක් හා පදක්කමක් පිරිනමන ලද්දේ කොපල් අඹ පර්යේෂණ ආයතනයේ මෙරට ප්‍රධානී හා අධ්‍යක්ෂ චානක දිසානායක විසිනි. 2014 නොවැම්බර් 22 වැනි දින පැවැත්වූ ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනයේ වාර්ෂික මහ සභා රැස්වීමේදී මෙම ප්‍රදානයන් පිරිනමන ලදි.

මෙම රැස්වීමේ අධ්‍යයන සැසි වාරයෙදී ඔවුනගේ පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කළ අතර ජයග්‍රහණය කළ පර්යේෂණ ව්‍යාපෘතිවල තේමාවන් පහත සඳහන් පරිදිය.


1. මහාචාර්ය පී. විජේකෝන් විසින් අධීක්ෂණය කළ එස්.ජී.ජේ. සේනාරත්න විසින් සිදුකළ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීමේ ක්‍රමය යන පර්යේෂණ ව්‍යාපෘතියන්,
2. සී. මනෝජ්, මහාචාර්ය පී. විජේකෝන් හා මහාචාර්ය අයි.ඒ.යු.එන්. ගුණතිලක විසින් අධීක්ෂණය කළ එම්.ඒ. පතන්ගොඩ මහත්මිය විසින් සිදුකළ සිංහරාජ වනාන්තරයේ වෘක්ෂලතාවල ලක්ෂණ විමර්ශනය කිරීම යන පර්යේෂණ ව්‍යාපෘතීන්ය.

මීට අමතරව මෙහි ජයග්‍රහකයන්ට 2014 දෙසැම්බර් 28-30 යන දිනවල කොළඹ ගලධාරි හෝටලයේදි පැවැත්වීමට නියමිත සංඛ්‍යානය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගිවීම සඳහා අනුග්‍රහය ද ලැබුණු අතර මෙම සමුළුවේ දායක පර්යේෂණ පත්‍ර ලෙස ඔවුන්ගේ උපුටන ද පිළිගන්නා ලදි. ශ්‍රී ලංකාවේ ව්‍යවහාර සංඛ්‍යාන ආයතනය හා ඇමෙරිකාවේ ලුයිස්විලි විශ්වවිද්‍යාලයේ ජෛව තොරතුරු හා ජෛව සංඛ්‍යාන අධ්‍යයන අංශය එක්ව මෙම සමුළුව සංවිධානය කරනු ලබයි.

- **අන්තර් විශ්වවිද්‍යාල තරඟ ශූරතාවයන් -2014**

අවුරුදු හතකට පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාන්තා කණ්ඩායම මෑතකදී පැවැත්වූ අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරඟාවලියේදී ඉහළ දක්ෂතා දක්වා සමස්ත කාන්තා ශූරතාවය දිනා ගැනීමට සමත් වූවාය. ඔවුන් ලකුණු 137ක් රැස් කර ගනිමින් සමස්ත කාන්තා ශූරතාවය දිනාගත් අතර ඔවුන්ගේ ආසන්නතම තරඟකරුවන් වූ කොළඹ විශ්වවිද්‍යාලය ලකුණු 135ක් රැස්කර ගනිමින් දෙවන ස්ථානයද ලකුණු 132ක් රැස්කර ගත් කැළණිය විශ්වවිද්‍යාලය තෙවන ස්ථානයද දිනා ගත්හ.

මේ අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමස්ත ලකුණු 307ක් රැස්කර ගනිමින් මෙම අති උත්කර්ෂවත් ක්‍රීඩා උළෙලේ පිරිමි හා කාන්තා අංශ දෙකෙන්ම දෙවන ස්ථානයට පත්විය. කොළඹ සහ මොරටුව විශ්වවිද්‍යාලයන් ලකුණු 311 බැගින් ලබා ගෙන සම ශූරයන් බවට පත් වූහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලකුණු 162ක් ලබාගෙන තරඟාවලිය නිමාවන විට සිව්වන ස්ථානය අත්කර ගත්තේය. අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරගාවලියේ 2014 පේරාදෙණිය විශ්වවිද්‍යාලය අත්කරගත් ජයග්‍රහණ පහත පරිදි වේ.



අත්පන්දු - තෙවන ස්ථානය
කැරම් (කාන්තා)- තෙවන ස්ථානය
බර ඉසිලීම - ශූරයන්
බැඩ්මින්ටන් (කාන්තා)- තෙවන ස්ථානය
එල්ලේ (කාන්තා)- දෙවන ස්ථානය
මල්ලවපොර - ශූරයන්
මාර්ග ධාවනය - සමස්ත දෙවන ස්ථානය
පිහිනුම් (කාන්තා)- ශූරයන්
පිහිනුම් (පිරිමි) - දෙවන ස්ථානය
මලල ක්‍රීඩා(පිරිමි හා කාන්තා)-සමස්ත තෙවන ස්ථානය
හොකී (කාන්තා)- තෙවන ස්ථානය
කරාටේ (පිරිමි) - තෙවන ස්ථානය
කරාටේ (කාන්තා)- සිව්වන ස්ථානය
බේස් බෝල් - දෙවන ස්ථානය
දැල් පන්දු - දෙවන ස්ථානය

### 1.3.18 මධ්‍යම පරිපාලනය

මධ්‍යම පරිපාලනයට සම්බන්ධ සංවිධාන ව්‍යුහය, කෘත්‍යයන් හා රාජකාරි කටයුතු පුළුල්ව සමාලෝචනය සහ සංශෝධනය කිරීම ආරම්භ කොට ඇත. නව අංග හා ඒකක ස්ථාපිත කොට ව්‍යාප්ත වූ නව පද්ධතියක් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදි.

රාජකාරින්හි සුමට ගලනයක් ලබාදීම සඳහා විවිධ පරිපාලන තනතුරු හා සම්බන්ධ වූ වගකීම් කෙරෙහි නිසි සැලකිල්ල යොමු කොට ඉහළ නිලධාරි තන්ත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස ද කටයුතු සූදානම් කොට ඇත. සාමාන්‍ය කළමනාකරණය හා මැදිහත්ව කටයුතු කරන අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ප්‍රයෝජනවත් වැඩමුළු රාශියක් පවත්වන ලදි. රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයෙන් ඉටුකිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සම්බන්ධයෙන් පවතින අඩුපාඩු හඳුනා ගැනීමට ද හැකියාව ලැබිණ.

### 1.3.19 මුදල් හා ගිණුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මුදල් අංශයේ ක්‍රියාපටිපාටීන් සංවිධාන කොට අඩුපාඩු නිවැරදි කිරීම පිණිස එම අංශය ප්‍රතිසංවිධානය හා සංශෝධනය කිරීම සඳහා ප්‍රගතිශීලී පියවර කිහිපයක් ගෙන ඇත. මේ තුළින් මුදල් අංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දියුණුවනු ඇත.

මුදල් කළමණාකරනයේ හා පාලනයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශ කළ පරිදි විගණන කමිටුව ස්ථාපිත කරන ලදි. යෝග්‍ය නිවැරදි හා නිසි පිළියම් නිර්දේශ කිරීම පිණිස විගණන කමිටුව විසින් අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා සමාලෝචනය කරනු ලබයි. 2014 වසරේ විගණන කමිටු වාර්තාව උපග්‍රන්ථ Gහි ඇතුළත් වේ.

### 1.3.20 උපස්ථම්භක සේවාවන්

උපස්ථම්භක සේවාවන්ගේ විස්තර හා ජයග්‍රහණ උපග්‍රන්ථ Dහි ඇතුළත් වේ.

### 1.3.21 තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි භාෂා නිපුණතා, පුස්තකාල සේවාවන්, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය හරහා පිරිනමනු ලබන විවිධ මට්ටමේ ඉංග්‍රීසි භාෂා නිපුණතා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවන් ලබා දෙන පුළුල් පරාසයක පාඨමාලාවන් ප්‍රදානය කරනු ලබයි. සියලුම පීඨවල ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දිශානුයෝජන වැඩසටහනක් සහ පාඨමාලා මොඩියුල පවත්වනු ලබයි. සියළුම ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ඔවුන්ට අදාළ උපාධි ලබා ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා යෝග්‍යතා පරීක්ෂණයෙන් "A" සාමාර්ථයක් ලබා ගත යුතුවේ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සහ පුස්තකාල සේවා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවාවන් ඇතුළත් වෙනත් ඉගෙනුම් සහයක සේවාවන්ගේ සමහර අදාළ විස්තර උපග්‍රන්ථය "C"හි දැක්වේ.

### 1.3.22 පර්යේෂණ සහ ජාත්‍යන්තර කටයුතු

- **පර්යේෂණ**

ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී ලංකාවේ වඩාත් පුළුල්ම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය වර්ෂ 60ක කාලයක් පුරාම පර්යේෂණ පවත්වන ලද්දේ එහි පීඨ හා අධ්‍යයන අංශ සීමාවන් තුළය. පරිපාලනයේ වර්තමාන අරමුණ වනුයේ අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ සංවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ පවතින අති විශාල වූ සම්පත් ව්‍යාප්ත කරලීමයි. මෙම අරමුණ සහිතව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම වැනි මූලික පියවර කිහිපයක් දියත් කරන ලදි. මෙම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වනුයේ ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමයි. ස්කෑනිං ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය හා ගැමා කැමරා වැනි උසස් තත්ත්වයේ උපකරණ මිලදී ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරන අතර එතුළින් එම උපකරණ විශ්වවිද්‍යාලය තුළ හා ඉන් පරිබාහිර පර්යේෂකයන්ට ලබා ගැනීමට හැකිවන පරිදි ඉඩකඩ සැළසීම අපේක්ෂාවයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි විද්වතුන් පසුගිය වර්ෂ කිහිපය තුළ "**Science**" සහ "**Nature**" වැනි ලෝකයේ ප්‍රසිද්ධ වාර සඟරාවල පර්යේෂණ පත්‍ර ප්‍රකාශනය කරන ලද බව සඳහන් කිරීම ඉතා වැදගත් වේ.

- **ජාත්‍යන්තරකරණය**

**ජාත්‍යන්තර සමුළු හා ජාත්‍යන්තර සහයෝගිතා**

ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ පිපාසයෙන් පෙළෙන පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2014 වර්ෂයේදී ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් කිහිපයක් ද අත්සන් කරන ලදි.

2014 වර්ෂයේ පැවැත්වූ සමුළු හා අත්සන් තැබූ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් පහත වගුවෙන් දැක්වේ.



## 2014 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය දරණ ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු

| පීඨය | තේමාව | සංවිධානය (පීඨය/අංශය/මධ්‍යස්ථානය /ඒකකය) | පැවැත්වූ දිනය | ඉලක්කගත කණ්ඩායම | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිවිද්‍යා | එකම සෞඛ්‍යයක් | වෛද්‍ය,දන්ත, වෛද්‍ය පීඨ විසින් සංවිධානය කරන ලදි | | | 200 |
| | SLJCR -2014 | | 14/12/15 | | |
| | කාලගුණික අනාවැකි පළ කිරීම පිළිබඳ වැඩමුළුව | කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය | 2014 සැප්. | රටවල් 17කින් සහභාගි වූවන් | 42 |
| සමසෞඛ්‍ය විද්‍යා | - | - | - | - | - |
| කලා පීඨය | iPURSE | විද්‍යා පීඨය | ජූලි 4,5 | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය | 200 |
| | පේරාදෙණිය ආර්ථික විද්‍යා පර්යේෂණ විශේෂ සමුළුව - 2014 (PERS-2014) | ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය | 2014.09.11 | පර්යේෂකයන්/ආචාර්යවරුන්/සිසුන් | 350 |
| දන්ත වෛද්‍ය පීඨය | මුඛ පිළිකා දුමෙන් තොර දුම්කොළ හා පුවක් | කෘතිම දන්ත වෛද්‍ය අංශය | අගෝස්තු 8, 9 | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් | 200 |
| | මුඛ පිළිකා පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, දුමෙනක් තොර දුම්කොළ හා පුවක් | මුඛ පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය | 2014 අගෝස්තු 08, 09 | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ප්‍රථම උපාධි අපේක්ෂකයන් | 300 |
| | Aesthetic Restoration of Anterior Teeth Using Invasive to Non- invasive Technique. (Dr. V.Vijayakumaran) | Foshan Academic Of Aesthetic Dentistry | 2014 දෙසැම්බර් 4-06 | 500 | 500 |
| ඉංජිනේරු පීඨය | එක් සෞඛ්‍යයක් ජාත්‍යන්තර සමුළුව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය (සියළුම පීඨ) | 2014 සැප්තැම්බර් 4-6 | සෞඛ්‍ය අංශයට සම්බන්ධ සියලුම දෙනා (වෛද්‍යවරුන්, පශු වෛද්‍යවරුන්, ජෛව වෛද්‍ය, ඉංජිනේරුවන්, ජීව විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් ,සිසුන් ආදීන්) | 400 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | චිරස්ථායිව ගොඩනැගූ පරිසරය | ඉංජිනේරු පීඨය | 2014 දෙසැම්බර් 12 -14 | පර්යේෂණ සිසුන් | 400 |
| | වාර්ෂික හරිත සමුළුව | ඉංජිනේරු පීඨය | 2014 දෙසැම්බර් 14 | පර්යේෂණ සිසුන් | 300 |
| | ශ්‍රී ලංකා ජපන් සහයෝගිතා පර්යේෂණ | SLJRC | 2014 දෙසැම්බර් 15- | පර්යේෂණ සිසුන් | 200 |
| වෛද්‍ය පීඨය | සන්නිවේදන කුසලතා ඉගැන්වීමේ වැඩමුළුව ගිනිකොණ දිග ආසියානු කලාපයේ වෛද්‍ය අධ්‍යයන සමුළුවෙන් පසු 3 වැනි වැඩමුළුව | වෛද්‍ය අධ්‍යාපන ඒකකය | නොවැම්. 15 | සෞඛ්‍ය වෘත්තික පුහුණු ආයතනවල ගුරුවරුන් | 22 |
| | වෛද්‍ය විද්‍යා පැවරුම- ගිණිකොණ දිග ආසියානු කලාපයේ වෛද්‍ය අධ්‍යාපන සමුළුවෙන් පසු 3වැනි වැඩමුළුව | | නොවැම්. 15 | සෞඛ්‍ය වෘත්තික පුහුණු ආයතනවල ගුරුවරුන් | 38 |
| | න්‍යෂ්ඨික හෘද විද්‍යාව දියුණු කිරීම පිළිබඳ IAEA/RCA කලාපීය පුහුණු පාඨමාලාව | න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකය | 2014 ජූලි 7, 11 | ජාත්‍යන්තර දේශීය සහභාගිවූවන් | 29 |
| | Elective cadaveric Dissection | කාය ව්‍යවච්ඡේද අංශය | 2014.05.19- 2014.05.30 | විදෙස් විශ්වවිද්‍යාලවල සිසුන් | 3 |
| | | | 2014.07.07- 2014.08.15 | විදෙස් විශ්වවිද්‍යාලවල සිසුන් | 1 |
| | | | 2014.11.24- 2014.12.15 | විදෙස් විශ්වවිද්‍යාලවල සිසුන් | 1 |
| | | | 2014.12.01- 2014.12.12 | විදෙස් විශ්වවිද්‍යාලවල සිසුන් | 1 |
| | ජාත්‍යන්තර ආයුර්වේද සමුළුව-ඉන්දියාව | | 2014 දෙසැ.06 - 09 | විද්‍යාඥයන් | 5000 |
| | චිකිත්සක පුහුණුවේ වෛද්‍යවරයා හා රෝගීන් අතර සන්නිවේදනය | ළමා රෝග අංශය | 2014-නොවැ. 12 නොවැ. 18 | වෛද්‍යවරුන් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය | 400 |
| විද්‍යා පීඨය | ජාත්‍යන්තර පර්යේෂණ (i PURSE) | විද්‍යා පීඨය | 2014 ජූලි 4 සහ 5 | අධ්‍යන කාර්ය මණ්ඩලය | 850 |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය | පිස්සු බලු රෝගය හඳුනා ගැනීම පිළිබඳ වැඩමුළුව | පිස්සු බලු රෝග පාලන ඒකකය, පශු ව්‍යාධ ජීව අධ්‍යයන අංශය | 06.02.2014 | මියැන්මාරයේ වෛද්‍ය හා පශු වෛද්‍ය නිලධාරීන් | 6 |
| | පිස්සු බලු රෝගය හඳුනා ගැනීම පිළිබඳ වැඩමුළුව | පිස්සු බලු රෝග පාලන ඒකකය, පශු ව්‍යාධ ජීව අධ්‍යයන අංශය | 28.10.2014 | ජපානයේ වෛද්‍ය සිසුන් | 6 |
| | අලින් පිළිබඳ වැඩමුළුව | ගොවිපල සත්ව හා සෞඛ්‍ය අධ්‍යයන අංශය | ජූලි-14 | | 35 |
| | විදෙස් පාර්ශවයන් සමඟ සාකච්ඡාව | පශු සායනික විද්‍යා අධ්‍යයන අංශය | 2014.11.25 | කාර්ය මණ්ඩලය / උපකුලපතිවරුන් | 10 |

## 2014 වර්ෂයේ අත්සන් කළ ජාත්‍යන්තර ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් වගුව

| අංකය | ආයතනය | පීඨය/අධ්‍යයන අංශය/මධ්‍යස්ථානය/ඒකක ය/පේ.වි.වි. | තේමාව | අත්සන් කළ දිනය |
|---|---|---|---|---|
| 25 | සනාතන මන්දිරයේ පළමු මහලේ පුස්තකාලය දෙසට කෙලවරේ පවතින කැසිකිලියේ යෝජිත වැඩිදියුණු කිරීම | ඉසිරි බිල්ඩර්ස් | 1,453,956.00 | 1,163,164.80 | 100% |
| 26 | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා යෝජිත පැරණි නඩත්තු ගොඩනැගිල්ලේ යෝජිත නවීකරණ කටයුතු | සෙන්ට්‍රල් සප්ලයර් පුද්.සමාගම | 10,214,799.82 | 4,613,334.25 | 70% |
| 27 | යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ තර්මෝඩයිනමික් විද්‍යාගාරයේ යෝජිත නවීකරණ කටයුතු | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 8,241,499.62 | 3,840,368.87 | 98% |
| 28 | කෘෂිවිද්‍යා පීඨයේ පවතින සූකර ඒකකයේ යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ඉසිරි බිල්ඩර්ස් | 2,686,908.00 | 2,081,488.04 | 100% |
| 29 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ සංචාරක බංගලාව සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | විකෝ ඉලෙක්ට්‍රිකල්ස් | 1,285,956.00 | 992,190.36 | 100% |
| 30 | විද්‍යා පීඨයේ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණ විද්‍යාගාර ගොඩනැගිල්ලේ යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ඩැඩ් කන්ස්ට්‍රක්ෂන් | 244,063.96 | 208,832.10 | 100% |
| 31 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ පොදු ශාලාව සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 1,539,916.00 | 1,117,562.84 | 100% |
| 32 | මහඉලුප්පල්ලමේ උප මණ්ඩපයේ පවතින මුළුතැන්ගෙය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 2,621,043.60 | 2,096,834.40 | 100% |
| 33 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාර්ය මණ්ඩල නිල නිවාස B-3 සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 1,469,199.20 | 1,391,873.20 | 100% |
| 34 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ කාර්ය මණ්ඩල නිල නිවාස B-2 සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 1,476,759.20 | 1,370,483.83 | 100% |
| 35 | මහඉලුප්පල්ලම B-1 නිල නිවාස සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 1,397,659.20 | 1,271,617.54 | 100% |
| 36 | A-2 වර්ගයේ කාර්ය මණ්ඩල නිල නිවාස සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ස්පාන් කන්ස්ට්‍රක්ෂන් | 1,595,350.40 | 1,033,983.12 | 100% |
| 37 | කෘෂිවිද්‍යා පීඨයේ පාංශු විද්‍යා අංශයේ භෞතික විද්‍යා විද්‍යාගාරය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | කැන්ඩි බිල්ඩර්ස් | 672,000.00 | 581,131.93 | 100% |
| 38 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පිරිමි හා ගැහැණු කැසිකිළි සංකීර්ණය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ස්පාන් කන්ස්ට්‍රක්ෂන් | 2,730,892.08 | 2,182,505.72 | 100% |
| 39 | A-01 කාර්ය මණ්ඩල නිල නිවාස සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | ස්පාන් කන්ස්ට්‍රක්ෂන් | 1,483,076.00 | 1,088,167.44 | 100% |
| 40 | ඉංජිනේරු පීඨයේ හයි වෝල්ටේජ් විද්‍යාගාරයේ යෝජිත නවීකරණ කටයුතු | ගාමිණී ඉංජිනිටරින්ග් වර්ක්ස් | 2,383,981.32 | 419,710.95 | 92% |
| 41 | දන්ත වෛද්‍ය පීඨය සඳහා ලීබඩු සහිත දේශනාගාරයක් | ගාමිණී ඉංජිනිටරින්ග් | 7,966,784.00 | 6,473,220.32 | 100% |
| 42 | දන්ත වෛද්‍ය පීඨයේ ආපන ශාලාව සඳහා යෝජිත දීර්ඝ කිරීම් | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් | 13,689,636.49 | 6,675,341.31 | 92% |
| 43 | පශු වෛද්‍ය පීඨයේ සිසුන් 150ක් සඳහා යෝජිත විභාග ශාලාව | ලුමිනෙක්ස් (පුද්.) සමාගම | 9,182,745.32 | 5,134,285.20 | 100% |
| 44 | ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අංශයේ පුහුණු මධ්‍යස්ථානය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | විකෝ ඉලෙක්ට්‍රිකල්ස් | 4,758,808.32 | 1,751,512.50 | 80% |
| 45 | සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු | සෙන්ට්‍රල් සප්ලයර් පුද්. සමාගම | 17,450,906.21 | 4,804,789.77 | 55% |
| 46 | ජේම්ස් පීරිස් ශාලාවේ නැවත විදුලි රැහැන් ඇදීම | චාන්ස් ඉලෙක්ට්‍රික් | 4,068,540.00 | 3,604,033.44 | 100% |
| 47 | කෘෂිවිද්‍යා පීඨයේ මහඉලුප්පල්ලම උප මණ්ඩපය සඳහා යෝජිත ගරාජය හා ගබඩා කාමරය | කැන්ඩි බිල්ඩර්ස් | 1,830,080.00 | - | 90% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 48 | කෘෂිවිද්‍යා පීඨයේ සත්ව විද්‍යා අංශය සඳහා යෝජිත දේශන ශාලාව | ICC | 18,149,163.09 | 15,295,053.85 | 100% |
| 49 | සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ දේශණ ශාලාව සඳහා යෝජිත අර්ධ ස්ථිර ගොඩනැගිල්ල | ICC | 16,482,706.24 | 12,305,187.80 | 100% |
| 50 | එම පීඨයේ විද්‍යාගාර සඳහා යෝජිත අර්ධ ස්ථිර ගොඩනැගිල්ල | ICC | 11,681,449.47 | 9,929,232.05 | 100% |
| 51 | පශු වෛද්‍ය පීඨයේ පශු ව්‍යාධ ජීව විද්‍යා අංශයේ ජලභීතිකාව පාලන ඒකකය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු | කැන්ඩි බිල්ඩර්ස් | 814,026.13 | - | 100% |
| 52 | ප්‍රථම උපාධි ඉගැන්වීම් හා පර්යේෂණ සඳහා යෝජිත විද්‍යාගාරය | කැන්ඩි බිල්ඩර්ස් | 501,138.51 | - | 100% |
| 53 | ඉංජිනේරු පීඨය සඳහා යෝජිත කොරිඩෝව ඉදිකිරීම | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් | 36,379,168.91 | 18,057,498.66 | 90% |
| 54 | ඉංජිනේරු පීඨයේ සැලසුම් කාර්යාලය සඳහා යෝජිත නවීකරණ කටයුතුවල දෙවන අදියරේ පළමු කොටස | සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් | 15,068,844.31 | 4,438,736.47 | 85% |
| 55 | මහනුවර ශික්‍ෂණ රෝහලේ ශිෂ්‍ය ආපන ශාලාවේ යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු (කැසිකිළි වැඩි දියුණුව) | කෙන් ඉංජිනියරින් | 3,205,092.80 | 640,480.91 | 65% |
| 56 | එම රෝහලේ ශිෂ්‍ය ආපන ශාලාවේ යෝජිත ප්‍රතිසංස්කරණය (වර්ණාලේප ගැල්වීම හා පිඟන් ගඩොල් ඇතිරීම) | කෙන් ඉංජිනියරින් | 3,289,068.27 | 1,340,900.54 | 50% |
| 57 | විද්‍යා කර්මාන්ත අන්තර් ක්‍රියා සංසද කාර්යාලයේ පිළිසකර කිරීම් | හාවඩ් ඉංජිනියරින් | 1,945,753.60 | 767,040.70 | 100% |
| 58 | කෘෂිවිද්‍යා පීඨයේ සත්ව විද්‍යා අංශයේ මාවලවත්ත ගොවිපලේ යෝජිත මීගවහල | ජයරුවන් කන්ස්ට්‍රක්ෂන් | 4,180,783.60 | 2,031,571.76 | 80% |
| 59 | විද්‍යා පීඨයේ වහලේ ජල කාන්දු වැළැක්වීම | අජිත් කන්ස්ට්‍රක්ෂන් | 3,806,320.00 | - | |
| 60 | විද්‍යා පීඨයේ යෝජිත උපකරණ විද්‍යාගාරය | වික්ටෝ ඉලෙක්ට්‍රිකල්ස් | 3,802,568.00 | - | 30% |
| 61 | ඉංජිනේරු පීඨයේ ව්‍යුහ විද්‍යාගාරයේ වැඩිදියුණු කිරීම් | වික්ටෝ ඉලෙක්ට්‍රිකල්ස් | 1,733,260.70 | - | |
| 62 | මීවතුර ගොවිපලේ යෝජිත ශිෂ්‍ය වැසිකිළි ඒකකය | වික්ටෝ ඉලෙක්ට්‍රිකල්ස් | 2,655,184.00 | - | 95% |
| 63 | පශු වෛද්‍ය පීඨයේ ගොවිපල සත්ව නිෂ්පාදන අංශය සඳහා යෝජිත පිඟන් ගඩොල් ඇතිරීමේ කටයුතු | MBR කන්ස්ට්‍රක්ෂන් | 1,971,760.00 | 1,597,378.14 | 100% |
| 64 | අනධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස පළමු ඒකකයේ යෝජිත ප්‍රතිසංස්කරණ (C1 හා C2). | ජයරුවන් කන්ස්ට්‍රක්ෂන් | 1,397,340.00 | 279,468.00 | 90% |
| 65 | අනධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස දෙවන ඒකකයේ යෝජිත ප්‍රතිසංස්කරණ කටයුතු (C3 හා C4). | ජයරුවන් කන්ස්ට්‍රක්ෂන් | 1,678,264.00 | 335,652.80 | 90% |

මහාචාර්ය අතුල සේනාරත්න
උපකුලපති
2014 පෙබරවාරි

## උපග්‍රන්ථ A – පීඨ වාර්තා

### A1 කෘෂිවිද්‍යා පීඨය

(පීඨාධිපති මහාචාර්ය කේ. සමරසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය කෘෂිවිද්‍යා පීඨයේදී හා එවකට පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් යුතුව 1948 වසරේදී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලදි. ආරම්භයේදී තුන් අවුරුදු අධ්‍යයන වැඩ සටහනක් ලෙස හඳුන්වා දුන් අධ්‍යයන පාඨමාලාව 1968 වසරේදී අවුරුද්දක ගොවිපල පුහුණු පාඨමාලාව ඇතුළත් කිරීමත් සමඟම සිව් අවුරුදු උපාධියක් බවට පත් විය. මෙම පුහුණු පාඨමාලාව 1968 වසරේදී මහඉලුප්පල්ලම උප මණ්ඩපයේදී පවත්වන ලදි. පීඨය මඟින් පිරිනමන කෘෂිවිද්‍යා උපාධි වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම පිණිස එම වසරේදීම කුණ්ඩසාලේ දොඩංගොල්ල ප්‍රදේශයෙන් හෙක්ටයාර 79.06ක භූමි ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය විසින් අත්කර ගන්නා ලදි. 1972 වසරේදී අධ්‍යයන අංශ හයකින් සමන්විත වෙනමම වූ පරිපූර්ණ කෘෂිවිද්‍යා පීඨයක් ස්ථාපිත කළ අතර, පසු කාලීනව එය අධ්‍යයන අංශ අටක් බවට ව්‍යාප්ත විය.

මෑත අතීතයේ දී පීඨය නූතන ලෝකයේ ඉල්ලුමට සරිලන පරිදි විෂයමාලා සංවර්ධනය හා නව උපාධි පාඨමාලා සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිසුන්ට විෂය කරුණු පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීමට අමතරව සන්නිවේදන කුසලතා, නායකත්ව ගුණාංග හා කණ්ඩායමක් ලෙස වැඩ කිරීම වැනි සිසුන්ගේ විවිධ කුසලතාවයන් දියුණු කළ හැකි ලෙස කෘෂිකර්ම විෂයමාලාව කෘෂිකර්ම තාක්‍ෂණවේදය හා කළමනාකරණ උපාධියක් බවට සම්පූර්ණයෙන් සංශෝධනය කිරීමට පීඨයට හැකි විය. අනතුරුව පීඨය සිව් අවුරුදු නව උපාධි වැඩ සටහන් දෙකක් හඳුන්වා දුන් අතර, ඒවා ආහාර විද්‍යා හා තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධිය යන නම්වලින් හැඳින්වේ. මෙම උපාධි සඳහා වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ මුළු සිසුන් 300 ක් ඇතුළත් කර ගනු ලැබේ. ඊට අමතරව පීඨය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ මිනිස් බලය පුහුණු කිරීමට දක්වන අනුග්‍රහයක් ලෙස විශේෂ ප්‍රතිපාදන යටතේ වාර්ෂිකව උපරිම සිසුන් 18 දෙනෙකු ඇතුළත් කරගනු ලබයි. නව ක්‍රියාමාර්ග ගැනීම හා සාමාජිකයන්ගේ කැපවීම හේතුකොට ගෙන වාර්තමානය වනවිට මෙම පීඨය කලාපයේ විශිෂ්ඨ ගණයේ මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය වී ඇත.

**ජයග්‍රහණ**

2014 වසර තුළදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ පරිවාස කථිකාචාර්යවරුන් නව දෙනෙකු බඳවා ගැනීමට පීඨයට හැකි විය. විදෙස් අධ්‍යයන නිවාඩු ලබා සිටි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ තිදෙනෙකු ඔවුන්ගේ ආචාර්ය උපාධි සාර්ථකව අවසන් කොට පැමිණ නැවත රාජකාරි ආරම්භ කළ

අතර, එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු දක්‍ෂතා පදනම මත මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. විශ්‍රාම ලබා සිටි මහාචාර්යවරුන් දෙදෙනෙකුට යාවජීව මහාචාර්ය තනතුර ප්‍රදානය කරන්නට විය. මෙම වර්ෂයේදී පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු හයක් පිරවීමටද හැකි විය.

ගෙවී ගිය වසර තුළදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 35 දෙනෙකු හා කාර්මික කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු ඔවුන්ගේ පර්යේෂණ ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මාන ලබා ගත් අතර, එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු රන් පදක්කමක් ලබා ගන්නට විය.

පීඨයේ තෙවන වසරේ උපාධි අපේක්‍ෂක සිසුවෙකු ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පැවැත්වූ "නව නිපැයුම්කරුවන්ගේ 42 වැනි ජාත්‍යන්තර ප්‍රදර්ශනයේදී "ඔහුගේ නව නිපැයුමක් වෙනුවෙන් රන් පදක්කමක් දිනා ගන්නා ලදි. මෙරට විශ්වවිද්‍යාල පද්ධතියට දෙපාර්තමේන්තු ක්‍රියාකාරකමක් ලෙස මීට වසර 20කට පෙර ශිෂ්‍ය පර්යේෂණ සැසියක් හඳුන්වා දෙන ලද්දේ කෘෂිවිද්‍යා පීඨය විසිනි. මෙම කටයුත්තෙන් නොනැවති තවදුරටත් ඉදිරි පියවරක් තැබූ කෘෂිවිද්‍යා පීඨය ප්‍රථම වතාවට "කෘෂි විද්‍යා පීඨ ප්‍රථම උපාධි අපේක්‍ෂක සිසුන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණයක්" 2014 වසරේ දෙසැම්බර් මාසයේදී සාර්ථකව පවත්වන ලදි. මෙම කාර්ය ඉදිරියේදී නොනවත්වා පැවැත්වෙනු ඇත. එමෙන්ම මෙම පීඨය අවසන් වසර සිසුන් අතරින් හොඳම නව නිපැයුම්කරුවා තෝරා රුපියල් 295,000ක් වටිනා රන් පදක්කමක් පිරිනමන ලදි. මෙම කාර්යයන් දෙකටම සහයෝගය දැක්වූ අනුග්‍රහකයන්ට කෘතඥතාවය පළ කිරීමට පීඨය පසුබට නොවේ. 2014 වසරේ දෙසැම්බර් මාසයේදී පීඨය සිදුකළ තවත් සුවිශේෂී කාර්යයක් වූයේ "Meet the Leaders" "නායක හමුව " නම් වූ නවතම අදහසක් ක්‍රියාත්මක කිරීමයි. මෙම කාර්යය සංවිධානය කොට අනුග්‍රහකත්වය දරණ ලද්දේ මෙම පීඨයේ කෘෂි අධ්‍යාපන ඒකකය විසිනි.

පීඨයේ පර්යේෂණ හැකියාව ශක්තිමත් කරනු පිණිස දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් පර්යේෂණ ප්‍රදාන ලෙස රුපියල් මිලියන 135ක මුදලක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ලැබිණ. පීඨ සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් ප්‍රදානය කරනු ලබන රුපියල් මිලියන පනහක වටිනාකමින් යුතු විශාල මුදල් ප්‍රදාන පහෙන් එකක් ලබා ගැනීමට සමත් විය.

පීඨයේ ප්‍රධාන සැලසුමට අනුව යටිතල පහසුකම් සංවර්ධනයට සමගාමීව නව ගොඩනැගිලි ඉදිකිරීම සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද රුපියල් මිලියන 892 ක වියදමින් ඉදිකෙරෙන නව සත්ව විද්‍යා ගොඩනැගිල්ලට මුල් ගල තැබීමත් පරිපාලන ගොඩනැගිල්ලේ තෙවන කොටස සඳහා මුල්ගල තැබීමත් සැප්තැම්බර් 11 වැනි දින සිදුකරන ලදි. අළුතෙන් ඉදිකරන ලද විද්‍යාගාර සංකීර්ණය නොවැම්බර් මාසයේදී පීඨය විසින් බාර ගෙන ඊට ප්‍රවේශ විය. මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ සිසුන් 400 ක් සඳහා නවාතැන් පහසුකම් සැපයෙන සිව්මහල් නව ශිෂ්‍ය නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර, එහි පැරණි නේවාසිකාගාරයේ හා කාර්ය මණ්ඩල නිල නිවාසවල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන ලදි.

**බාධක සහ පිළියම්**

පීඨයට අනුබද්ධ වී සිටි එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් අගෝස්තු 29 වැනි දින අනතුරකින් අභාවප්‍රාප්ත විය. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හය දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු විශාල සේවාවක් ලබාදීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලබා ගන්නට වූහ. පීඨයට නවක සිසුන් ඇතුළත් කරගැනීම නොවැම්බර් මස 25 වැනි දින ආරම්භ වූවත් පීඨ පරිපාලනයට පරිබාහිරව පැවති හේතූන් නිසා මුළු ප්‍රමාණයම පිරවීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

සිසුන්හට වඩා යහපත් වූ ඉගෙනුම් පරිසරයක් අත්කරදීම සඳහා ප්‍රධාන සැලසුමේ දෙවන අදියර 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට පීඨය අපේක්‍ෂා කරයි. එමෙන්ම පීඨයේ අධ්‍යයන හා පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සාමාන්‍ය මහජනතාව හා පීඨයට සම්බන්ධ කොටස්කරුවන් දැනුවත් කිරීමට ද පීඨය සැලසුම් සකස් කරමින් සිටි.

## A2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති, වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 8 වැනි පීඨය ලෙස සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2007 වසරේදී ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම පීඨය හෙදවේදය හා සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු විශේෂ ප්‍රථම උපාධි පාඨමාලා හයක් පිරිනමන ලදි. මෙම පාඨමාලා පැවැත්වීම තුළින් විද්‍යාවේදී හෙදවේදය, විද්‍යාවේදී භෞත චිකිත්සක, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යාව, විද්‍යාවේදී ඔසුවේදය, විද්‍යාවේදී විකිරණ හා විකිරණ චිකිත්සක යන උපාධි සඳහා සුදුසුකම් ලබයි. 2010 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟ පෙන්වීම යටතේ මෙම උපාධි වැඩසටහන්වල ව්‍යුහය 3+1 (සාමාන්‍ය හා විශේෂ) ලෙස වෙනස් කරන ලදි. 2014 වසරේදී සිසුන්ගෙන් පැන නැගුණු විරෝධතාවන් හා පීඨ සාමාජිකයන්ගෙන් ලද ඉල්ලීම් හේතුවෙන් උපාධි වැඩසටහන්වල ව්‍යුහයට ජාත්‍යන්තරව පිළිගත් සම්මාන 120 උපාධි වැඩසටහන් බවට ප්‍රතිව්‍යුහගත කරන ලදි. සමසෞඛ්‍ය විද්‍යා පීඨය සතුව අධ්‍යයන අංශ පහක් පවතින අතර 33 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන කාර්ය මණ්ඩලයක් හා 46 දෙනෙකුගෙන් යුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් පවතී. මෙම පීඨයට ඇතුළත් කළ සිව්වන සිසු කණ්ඩායම මේ වනවිට ඔවුන්ගේ පාඨමාලා අවසන් කොට ඇත. වර්තමානය වනවිට ඉහත සඳහන් කළ විෂය ක්ෂේත්‍රයන්වල අධ්‍යයන කාර්යයෙහි නියැලි සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 892කි. මේ වනවිට පීඨයෙන් උපාධි ලබාගත් සංඛ්‍යාව 373 කි. පීඨය සිසුන්ට රෝහල් පදනම් කරගත් පුහුණුව ලබා දීම සඳහා ජාතික හා පුද්ගලික රෝහල්වල බලධාරීන් සමඟ සහයෝගිතාවන් ගොඩනගා ගෙන ඇත. පීඨයේ උපාධිධාරීන් පුද්ගලික රෝහල්වල හා රසායනාගාරවල රැකියාවන්හි නිරත වෙති. ඉහත කරුණු කෙසේ වෙතත් මෙම පීඨය මේවනතෙක්ම අනෙකුත් පීඨවල පීඨාධිපතීන්ගේ හා එම කාර්ය මණ්ඩලවල හොඳහිත සහ සහයෝගය මත රැඳී පවතී. පීඨයේ භෞත චිකිත්සක සේවාවන් ලබා දෙන අතර, පීඨය තුළ පිහිටි රෝගි සේවා අංශය සිසුන්ට මනා සායනික පුහුණු පරිසරයක් ලබා දෙයි. එක්ස් කිරණ ඒකකය ප්‍රථම උපාධි අධ්‍යාපනයට ප්‍රමුඛතාවය ලබා දෙන අතරම රෝගි සේවාව ද ලබා දෙයි.

### ජයග්‍රහණ

- ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු තිදෙනෙකු හා සිසුන් නව දෙනෙකුගෙන් යුත් ජපන් නියෝජිතයන් පිරිසක් පිළිවෙලින් පස්වැනි වතාවටත් අධ්‍යයන චාරිකාවක් සඳහා සමසෞඛ්‍ය විද්‍යා පීඨයට පැමිණියේය. ඔවුන් 2014 අගෝස්තු 31 දින සිට සැප්තැම්බර් 10 වැනි දින දක්වා මෙහි රැඳී සිටියහ.




- සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ දේශන ශාලා සහ විද්‍යාගාර සඳහා අළුතින් ඉදිකරන ලද අර්ධ ස්ථිර ගොඩනැගිලි 2014 සැප්තැම්බර් 18 දින පීඨයට බාර දෙන ලදි. 2014 ඔක්තෝබර් 14 වැනි දින පවත්වන ලද විවෘත කිරීමේ උත්සවයට උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතීන්, ලේඛකාධිකාරි, පීඨයේ අංශ ප්‍රධානීන්, අධ්‍යයන, අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සහභාගි වූහ. ගොඩනැගිලි විවෘත කරන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් විසිනි. මෙම ගොඩනැගිලි විවෘත කිරීමේ අවස්ථාවට බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික නායකයන් සහභාගි වූහ.
- නවීන උපකරණවලින් සමන්විත ක්ෂුද්‍රජීව විද්‍යා විද්‍යාගාරය නව විද්‍යාගාර ගොඩනැගිල්ලේ පිහිටුවන ලදි.
- උපාධි පාඨමාලා සම්මාන 120කට (120 credit) ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කරන ලදි.
- සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය විසින් 2014 මැයි මස සායනික පුහුණුව සඳහා කෑගල්ල, නාවලපිටිය හා ගම්පොල යන රෝහල්වලට යොමු වීමේ අවස්ථාව උදාකර දෙන්නට විය.

**හෙදවේද අධ්‍යයන අංශය**

- 2011/2012 හෙද සිසු කණ්ඩායමේ 6 වැනි ප්‍රදීප දැල්වීමේ උත්සවය 2014 සැප්තැම්බර් 22 වැනි දින සමසෞඛ්‍ය පීඨයේදී පවත්වන ලදි. එම උත්සවය එහි ප්‍රධාන අමුත්තා වූ ට්‍රික්සි මාතනස් මියගේ ප්‍රධානත්වයෙන් උපකුලපති හා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය රැගත් පෙරහැරකින් ආරම්භ විය. හොදවේද අධ්‍යයන අංශයේ ප්‍රධානි විසින් හෙද සිසුන්ගේ ප්‍රතිඥා දීමේ උත්සවයේ වැදගත්කම පැහැදිලි කරන ලදි. ශිෂ්‍ය හෙදියන් මහත් අභිමානයෙන් යුතුව ඔවුන්ගේ ප්‍රදීප දල්වා වේදිකාවට ගොඩවී මෙම උත්සවයේ කැපී පෙනෙන කාර්යය වූ "නයිටින්ගේල් ප්‍රතිඥාව" සිදුකරන ලදි.
- සායනික පුහුණුව සඳහා කෑගල්ල, ගම්පොල හා නාවලපිටිය රෝහල් පරිහරණය කිරීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය ලබා ගන්නා ලදි. ප්‍රාදේශීය අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදි.
- උපාධිධාරි හෙදියන් ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි වීම ඃ- රෝහල්වල සායනික සැසි පැවැත්වීමට කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මේවනවිට අවස්ථාව උදාවී ඇත. හෙදියන් ඉහත සභාවේ ලියාපදිංචිය ලබා ගෙන තිබීම මෙයට හේතුවයි.
- ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය සමඟ පවත්වන හෙද සම්බන්ධිත වැඩසටහන අඛණ්ඩව පවත්වා ගනිමින් හෙද අධ්‍යයන අංශය කෙටි කාලීන වැඩ සටහනක් සඳහා එම අංශයේ සිසුන් දෙදෙනෙකු 2014 වර්ෂයේ ජපානයට යවා ඇත.



- කාර්ය මණ්ඩල සංවර්ධනය :
-
    (i) ඒ.එම්.එස්.ඩී. පතිරණ මිය 2014.08.10 දින සිට කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන ආයතනයේ දර්ශනපති උපාධිය හදාරමින් සිටී.
    (ii) එම්.එල්. පතිරත්න මිය 2014.09.24 දින සිට ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධිය හදාරමින් සිටී.
    (iii) එච්.ඩී.ඩබ්. දමයන්ති මිය 2015.02.10 දින සිට මැලේසියා විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධිය හැදෑරීම සඳහා අවස්ථාවක් උදාකර ගන්නා ලදි.

- හෙද සිසුන් පුහුණු කිරීම සඳහා කඩුගන්නාව රෝහලේ ප්‍රජා සෞඛ්‍ය සායනය හා මහනුවර ශික්ෂණ රෝහලේ STD සායනික පහසුකම් පරිහරණය කිරීම පිණිස පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ අවසරය ලබා ගන්නා ලදි.

**වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයන අංශය**

- පරිවාස කථිකාචාර්යවරයෙකු බඳවා ගෙන මෙම අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල ශක්තිය ඉහළ නංවන ලදි.
- 2008/09 සිසු කණ්ඩායම වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි පාඨමාලාව අවසන් කරන ලදි.
- සම්මාන :- වෛද්‍ය ලාලන යටවර විසින් 2010 වසරේ සිට 2012 දක්වා විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති දක්ෂතා සම්මානය ලබා ගන්නා ලදි.

**භෞත චිකිත්සක අධ්‍යයන අංශය 14277**

- භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා (2013/2014 සිසු කණ්ඩායමේ සිට ඉදිරියට) සම්මාන 120 ( 120 credit ) විෂයමාලාව ස්ථාපිත කිරීම.
- විශ්වවිද්‍යාල ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයෙන් මෙම අධ්‍යයන අංශයේ සිසුන් තිදෙනෙකු ඉහළ ලකුණු ලබා ගත්හ.
- සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු හා ප්‍රතිකාර කටයුතු සඳහා නව විද්‍යුත් චිකිත්සක උපකරණ හා ශාරීරික ව්‍යායාම චිකිත්සක භාණ්ඩ දෙපාර්තමේන්තු සේවා ඒකකයට ලැබිණ.
- Tendinitis ඇතුළු විවිධ musculoskeletal තත්ත්වයන්ට ප්‍රතිකාර කරන ශ්‍රී ලංකාවේ පවතින එකම තරංග චිකිත්සක යන්ත්‍රය ලබා ගන්නා ලදි.
- මෙම අධ්‍යයන අංශයට අළුතින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් (කථිකාචර්ය / පරිවාස) සිව් දෙනෙකු බඳවා ගන්නා ලදි.

**ඖෂධවේද අධ්‍යයන අංශය**

- විද්‍යාවේදී ඖෂධවේද විෂයමාලාව සම්මාන 120 ලෙස සකස් කිරීම : 2014 ඔක්තෝබර් 15 වැනි දින පවත්වන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාල 396 වැනි සනාතන සභා රැස්වීමේදී ඉහත කරුණ සඳහා අනුමැතිය ලබා දෙන ලදි.
- 2008/2009 සිසු කණ්ඩායමේ උපාධි ලබා ගැනීම :
  2014 වසරේ මැයි මස පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේදී ඉහත සිසු කණ්ඩායමට අයත් සිසුන් උපාධි ලබාගත්හ.
- ජාත්‍යන්තර සහයෝගිතාවයන් : 2014 වසරේදී ඕස්ට්‍රේලියානු විද්වතුන් දෙදෙනෙකු පීඨයට පැමිණ ඖෂධවේද ප්‍රථම උපාධි සිසුන්ට සායනික ඖෂධවේද මොඩියුල I හා II කොටස් ඉගැන්වීමට දායක වූහ.
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන : ඖෂධවේද අධ්‍යයන අංශය ශ්‍රී ලංකා ඖෂධ සංගමය හා එක්ව ඖෂධවේද ප්‍රථම උපාධි සිසුන් වෙනුවෙන් වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි.
- නව බඳවා ගැනීම් : මෙම අධ්‍යයන අංශයට අලුතෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු බඳවා ගන්නා ලදි.

**විකිරණවේද හා විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය**

- විද්‍යාවේදී විකිරණවේද උපාධි වැඩසටහන (2013/14 කණ්ඩායමේ සිට ඉදිරියට) සඳහා වන සම්මාන 120 විෂය මාලාව ස්ථාපිත කිරීම
- MRI වැඩමුළුව (Magnetic Resonance Imaging) සාර්ථකව පවත්වන ලදි.

**බාධක හා පිළියම්**

- 2008/09 හෙදවේද සිසු කණ්ඩායමේ අධ්‍යයන කටයුතු අවසන් කිරීම සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ සියලුම සිසුන් දියත් කළ දින 169 ක වර්ජණය හේතුවෙන් ප්‍රමාද විය. මෙසේ ප්‍රමාද වූ අධ්‍යයන කටයුතු ආවරණය කොට ගෙන 2015 මැයි මාසයේදී පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවයේදී සිසුන්ට උපාධි ලබා ගත හැකි වන පරිදි 2014 දෙසැම්බර් වනවිට ප්‍රතිඵල නිකුත් කරන ලදි.
- විශ්වවිද්‍යාල ඔසුහලක් ස්ථාපිත කිරීමේ යෝජනාවට පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය ලැබිණ. කෙසේ වෙතත් මෙම ඔසුහල විශ්වවිද්‍යාල භූමියේ ස්ථාපිත කිරීම ක්‍රියාවට නැංවීමට නොහැකිවී ඇත්තේ එය පිහිටුවීම සඳහා අනුමැතිය ලද ස්ථානයේ පේරාදෙණිය පොලිස් ස්ථානය තවමත් පවත්වාගෙන යෑම හේතුවෙනි.
- පීඨයේ සිසුන්ගේ නොහොබිනා හැසිරීම හේතුවෙන් 2014 නොවැම්බර් 14-15 යන දිනවල පැවැත්වීමට නියමිත HETC ප්‍රදර්ශනය අවලංගු කරන ලදි.
- 2014 ජූලි වනවිට අවසන් කිරීමට නියමිත නව ගොඩනැගිලි ව්‍යාපෘතිය දීර්ඝ ප්‍රමාදයන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ කැපවීමේ මන්ද ස්වභාවය හේතුවෙන් අවසන් කිරීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

- ඔසුවේදය පිළිබඳව දර්ශනපති උපාධිය ක්‍රියාත්මක කිරීම : ඕස්ට්‍රේලියානු විද්වතුන් සමඟ සහයෝගිතාවෙන් උසස් පර්යේෂණ උපාධි වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා හෙදවේද අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් සකස් කළ යෝජනාව පීඨ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමැතිය සඳහා බාර දෙන ලදී . සනාතන සභාවේ අනුමැතිය මේ සඳහා ලද පසු ශ්‍රී ලංකාවේ පළමු උසස් පර්යේෂණ උපාධි වැඩසටහන ක්‍රියාත්මක කිරීමට හෙදවේද අධ්‍යයන අංශය සැලසුම් කරමින් සිටී.
- හෙදවේද උපාධිය සඳහා බඳවාගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම මෙම උපාධිය සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වසරේ සිට වැඩි කිරීමට සැලසුම් කෙරේ. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරතව සිටි බොහොමයක් කථිකාචාර්යවරුන් ඔවුන්ගේ එම කටයුතු සාර්ථකව අවසන් කොට පීඨයට නැවත පැමිණෙමින් සිටින නිසා සහ මෙම අධ්‍යයන අංශයේ කාර්ය මණ්ඩලයට නව බඳවා ගැනීම් කිහිපයක් සිදුකළ නිසා මෙම කාර්යය ඉටු කර ගතහැකි වනු ඇත. මෙසේ හෙදවේද අංශයේ මෙම පහසුකම් පවතින හෙයින් එම අංශයේ එක් සිසු කණ්ඩායමකට සිසුන් 30 දෙනෙකු ඇතුළත් කරගත හැකිවනු ඇතැයි විශ්වාස කෙරේ.
- දෙස් විදෙස් විශේෂඥයන් සමඟ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම : භෞතචිකිත්සකවේදය.
- දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ පර්යේෂණ ව්‍යාපෘති සහයෝගිතාවන් පැවැත්වීම - භෞත චිකිත්සකවේදය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය අතර හෙද සම්බන්ධිත වැඩ සටහන ශක්තිමත් කිරීම - හෙදවේදය
- හෙදවේද සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සහයෝගය සහිතව ප්‍රජා මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී උපාධියේ 2013/14 සිසු කණ්ඩායම බඳවා ගැනීම.
- වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධියේ 2009/10 සිසු කණ්ඩායමේ උපාධි ප්‍රදානය.
- විවිධ පර්යේෂණ ප්‍රදාන යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සහයෝගිතා පර්යේෂණ පැවැත්වීම.
- නව පරිශ්‍රයකට අධ්‍යයන අංශය මාරු කිරීම.
- වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි අපේක්ෂකයන්ට ඉගැන්වීම් කටයුතු කරගෙන යෑම
- පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- වෛද්‍ය රසායනාගාර විද්‍යා සම්බන්ධ වැඩමුළු පැවැත්වීම.
- දේශ විදෙස් පුද්ගලයන් සමඟ විකිරණවේදය හා විකිරණ චිකිත්සාව පිළිබඳ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම
- විකිරණවේදය හා විකිරණ චිකිත්සාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම.



## A3 ශාස්ත්‍ර පීඨය
(පීඨාධිපති, මහාචාර්ය නවරත්න බණ්ඩාර විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් ඉගැන්වීමේ හා පර්යේෂණයේ පුරෝගාමී මධ්‍යස්ථානයකි. මෙම පීඨය සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර ක්ෂේත්‍ර 15ක් ඔස්සේ ශාස්ත්‍රවේදී උපාධියද, ව්‍යාපාර පරිපාලනවේදී හා නීතිවේදී උපාධියද පිරිනමනු ලබයි. 2014 වර්ෂයේදී ශාස්ත්‍ර පීඨය ප්‍රථම උපාධි අපේක්ෂකයන් 3668 දෙනෙකුට (ශාස්ත්‍රවේදී 2906, ව්‍යාපාර පරිපාලන 547, හා නීති 215) ඉගැන්වීමේ පහසුකම් සපයන ලදී 2014 වර්ෂයේ 2013/14 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 976 දෙනෙකු (ශාස්ත්‍රවේදී 776, ව්‍යාපාර පරිපාලන 148 හා නීති උපාධිය සඳහා 52) බඳවා ගන්නා ලදි. මෙය ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා පවතින පුරප්පාඩු ප්‍රමාණයට වඩා 376 දෙනෙකුගෙන් ඉක්මවා යෑමකි.

### ජයග්‍රහණ

ශාස්ත්‍ර පීඨය 2014 වසරේදී ප්‍රථම උපාධිධාරීන් 886 දෙනෙකු (ශාස්ත්‍රවේදී 691, ව්‍යාපාර පරිපාලනවේදී 154, නීතිවේදී 41) හා පශ්චාත් උපාධිධාරීන් 584 දෙනෙකු (පශ්චාත් උපාධි ඩිප්ලෝමා 270, ශාස්ත්‍රපති හා අධ්‍යාපනපති 196, පශ්චාත් උපාධි සංවර්ධන පුහුණු 09, දර්ශනපති 05 ක් හා දර්ශනශූරි 04 ක්) බිහි කොට ඇත.

2014 වසරේදී පීඨ සම්මන්ත්‍රණ මාලාවෙන් සම්මන්ත්‍රණ 12 ක් හා අධ්‍යයන දෙපාර්තමේන්තු සම්මන්ත්‍රණ මාලාව යටතේ සම්මන්ත්‍රණ 45 ක් සංවිධානය කරන ලදි. මේ වසරේදී ආගන්තුක මහාචාර්යවරුන් කිහිප දෙනෙකු මෙන්ම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරයෙකු පත් කිරීමත් සමග පීඨ මණ්ඩලය විසින් දියත් කරනු ලබන ප්‍රධාන සම්මන්ත්‍රණ වැඩ සටහන පීඨ සම්මන්ත්‍රණ මාලාවයි. මේ වසරේදී ආගන්තුක මහචාර්යවරුන් කිහිප දෙනෙකු මෙන්ම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් මඟින් සම්මන්ත්‍රණ හා කතිකාවන් පැවැත්වීමට පීඨයට හැකි විය.

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විද්වතුන් විසින් බාර දෙන ලද පර්යේෂණ ව්‍යාපෘති සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයෙන් රුපියල් මිලියන 10.5 ක මුදලක් ලබා ගැනීමට 2014 වසරේදී පීඨයට හැකි විය. 2012 වසරේ අනුමත කෙරී ගෙන යන ව්‍යාපෘතීන් සමග 2014 වසරේ පීඨ කාර්ය මණ්ඩලය ආසන්න වශයෙන් පර්යේෂණ ව්‍යාපෘති 40 ක් පමණ බාරගෙන ඇත. මෙම වසරේදීම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙකනු ජාත්‍යන්තර සම්මාන 02 ක් හා දේශීය සම්මාන දෙකක් ලබා ගත්හ. මේ වනවිට ඔක්ස්ෆඩ් විශ්වවිද්‍යාලයේ ඔහුගේ දර්ශනශූරි උපාධිය හදාරමින් සිටින රෝහන සෙනෙවිරත්න මහතා සංස්කෘත භාෂාව අධ්‍යයන කිරීමේ සංවර්ධනයට ඔහු දැක්වූ

දායකත්වය වෙනුවෙන් ඉන්දියානු සංස්කෘතික සභාවෙන් "සරස්වත" සම්මානය පිරිනමන ලදි. ආචාර්ය අමරකීර්ති ලියනගේ ශ්‍රී ලංකා ප්‍රකාශකයන්ගේ සංසදයෙන් පිරිනමන "ස්වර්ණ පුස්තක" සම්මානය ලබා ගත්තේය.

HETC ව්‍යාපෘතිය විසින් අනුග්‍රහය දක්වන කලා සිසුන්ගේ නව නිපැයුම් සංවර්ධන ව්‍යාපෘතිය විසින් සපයන ලද ඩෙක්ස් ටොප් පරිගණක 150 ක් සහිත නව පරිගණක විද්‍යාගාර දෙකක් පිහිටුවීමේ කටයුතු ආරම්භ කිරීමට මෙම වසර තුළදී පීඨයට හැකි විය. IDAS ව්‍යාපෘතිය අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු මාලාවක් පවත්වන්නට විය. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 15ක් පමණ මෙම පුහුණු සැසිවලට සහභාගි වූ හෙයින් මීළඟ අධ්‍යයන වර්ෂයේදී එම සාමාජිකයන්ගෙන් බොහෝ පිරිසක් විද්‍යුත්-ඉගෙනුම් ක්‍රමය (E-learning system) උපයෝගි කරගනු ඇතැයි පීඨය විශ්වාස කරයි. වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුමෙන් ඉලක්ක කළ පරිදි පීඨයේ සිසුන් සඳහා මෘදු කුසලතා හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් කිහිපයක් විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතියෙන් අවසන් කරන ලදි. මෙම පීඨය සඳහා කුඩා දේශන ශාලා ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය උපකරණ UGC ප්‍රදානයෙන් සපයා ඇති අතර, එය සවිකිරීමේ කටයුතු 2015 මාර්තු වනවිට අවසන් කෙරෙනු ඇත.

උපකුලපතිතුමා විසින් අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමත් සමඟ කලා අධ්‍යාපන ඒකකයේ ක්‍රියාකාරකම් පීඨය විසින් දියත් කරන්නට විය. මේ සඳහා යොදා ගන්නා ලද්දේ ලෝක බැංකු අනුග්‍රහය ලබන HETC ව්‍යාපෘතිය විසින් සපයන ලද රුපියල් මිලියන 10ක ප්‍රදානයකි. මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ වනුයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අවශ්‍ය පුහුණුව ලබාදී කලා උපාධිධාරීන් රැකියාවන්හි යෙදවීමේ අවකාශ ඉහළනැංවීම හා ඵලදායිතාවය පදනම් කරගත් ඉගැන්වීමේ ක්‍රම සහ ශිෂ්‍ය කේන්ද්‍ර ඉගෙනුම අන්තර්ගත කොට විෂයමාලාව දියුණු කිරීම හා පීඨයට Internship වැඩසටහන හඳුන්වාදීමයි.

කලා අධ්‍යාපන ඒකකයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ අංශය වර්ෂය තුළදී HETC විසින් සපයන ලද මුදල් යොදා ගනිමින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 58 දෙනෙකු සඳහා 2013 වසරේදී බ්‍රිතාන්‍ය සභාව විසින් සංවර්ධනය කළ ඉංග්‍රීසි පුහුණු වැඩසටහන හා ශාස්ත්‍රීය ලේඛනය පිළිබඳ වැඩසටහන් පවත්වා ඇත. එමෙන්ම මෙම ඒකකය ඉගැන්වීම සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගි කර ගැනීම පිළිබඳ දෙපාර්තමේන්තු විෂයමාලා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් පුහුණු කිරීම සඳහා විදෙස් උපදේශකයෙකුගේ සහාය ද සහිතව පුහුණු වැඩමුළුවක් සංවිධානය කොට ඇත.

කලා අධ්‍යාපන ඒකකය පීඨ අන්තේවාසික (Internship) ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ද පීඨයට සහය දක්වා ඇත. එමෙන්ම මෙම ඒකකය ආසන්න වශයෙන් අවසන් වසර සිසුන් 300 දෙනෙකු සහභාගි වන වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුවක් පැවැත්වීමට ද කටයුතු සංවිධානය කරන ලදි. උපකුලපතිතුමන් හා මහජන බැංකුව අතර අවබෝධතා ගිවිසුමක් දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලදි. මෙම ගිවිසුම අත්සන් කරන ලද්දේ පීඨයේ ප්‍රථම උපාධි සිසුන්ට (internships) අන්තේවාසික තත්ත්වය ලබා දීම සඳහායි. ශ්‍රී ලංකා වෙළඳ සංසදය පීඨ අන්තේවාසික ලේකම් කාර්යාලයට කොටස්කරුවන් සෙවීම සඳහා පීඨයට සහය දැක්වීමට එකඟතාවය පළ කොට ඇත. නියමු අන්තේවාසික වැඩසටහන 2015 ජනවාරි මස ආරම්භ කිරීම සඳහා අන්තේවාසික ස්ථාන 75 ක් පීඨ අන්තේවාසික කාර්යාලයට ලැබී ඇත. විෂයමාලා සංවර්ධන කමිටුව පුහුණු වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදි. මෙම පුහුණු වැඩමුළු දෙක(2) සංවිධානය කරන ලද්දේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කිරීමට හා අධ්‍යයන දෙපාර්තමේන්තු දහහතේම(17) සහභාගිත්වයෙන් 2015 පෙබරවාරි මස දියත් කිරීම සඳහා විෂය මාලා විගණනයක් සැලසුම් කිරීම සඳහායි.

මීළඟ අධ්‍යයන වර්ෂයේ සිට පීඨයට ඇතුළත් වන නවක සිසුන් සඳහා නව කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් සංවර්ධනය කිරීම පිණිස මෙම වර්ෂයේදී පීඨය ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්යවරයෙකුගේ සහය ලබා ගන්නා ලදි. ඉදිරි අධ්‍යයන වර්ෂයේ පීඨයට ඇතුළත් වන නවක සිසුන් අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට ප්‍රථම මාසයක කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් හැදෑරිය යුතුවේ. පීඨ මණ්ඩලයේ නිර්දේශයන්ට අනුව ශාස්ත්‍ර පීඨය 2015 වසරේ සිට පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයට විවෘත තරඟ විභාගයකින් තාවකාලික ඉංග්‍රීසි උපදේශකයන් බඳවා ගෙන ඔවුන්ට පංති කාමරයේදී භාවිතා කිරීමට සිදුවන ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුළුල් පුහුණුවක් ලබාදීමට කටයුතු සූදානම් කොට ඇත.

2014 වසරේදී "විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වන මහාචාර්ය ඩී.පී.එම්. වීරක්කොඩි සම්පත් ඒකකය" විවිධ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් විනෝද චාරිකා කිහිපයක් සංවිධානය කළේය. මෙම ඒකකය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය හා ඊට අනුබද්ධ වෙනත් රටවල පිහිටා ඇති ශාඛා විසින් දක්වන ලද ත්‍යාගශීලී සහයෝගය ඇතිව විශේෂ අවශ්‍යතා සහිත මෙම ඒකකයේ සිසුන්ට ඉහත සඳහන් විද්‍යාර්ථීන්ගේ සංගමයෙන් හා විශ්වවිද්‍යාල වරම් ලබා ගෙන උපාධිධාරීන් බවට පත්වූ ආදි සිසුන්ගෙන් ශිෂ්‍යත්ව කිහිපයක් ලැබිණ. 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයට යෙදුන ලෝක ආබාධිතයන්ගේ දිනය සමරනු පිණිස මෙම ඒකකයේ සිසුන් ඔවුන්ගේ රංගන, ගායන හා නර්තන හැකියාවන් පිළිඹිඹු කෙරෙන ප්‍රසංගයක් සංවිධානය කළේය.

## ශිෂ්‍යත්ව / සහෘදත්ව ප්‍රදාන

ගෙවී ගිය වර්ෂයේදී පීඨය විදෙස් විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ ස්ථාපිත කළ සම්බන්ධිත වැඩ සටහන යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ සිසුන්ට ශිෂ්‍යත්ව හා සහෘදත්ව ප්‍රදාන කිහිපයක් පිරිනැමීය. ශ්‍රී ලංකා අන්තර් විද්‍යාල අධ්‍යාපන වැඩසටහනට සහභාගි වූ එක්සත් රාජ්‍යයේ විශ්වවිද්‍යාල කිහිපයක් විසින් ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආධුනික සාමාජිකයන් දෙදෙනෙකුට සහෘදත්ව ප්‍රදාන දෙකක් පිරිනැමීය. එය ඔවුන් දෙදෙනාට එක්සත් රාජධානියේ හා ඇමරිකා එක්සත් ජනපදයේ ඔවුන්ගේ දර්ශනශූරී උපාධි කටයුතු කර ගැනීමට අර්ධ වශයෙන් ලබා දුන් මුදලකි. ISLE වැඩසටහන යටතේ එක්සත් රාජ්‍යයේ සිසු කණ්ඩායම් දෙකක් 2014 වසරේදී ශාස්ත්‍ර පීඨයට පැමිණ පීඨයේ ආචාර්යවරුන්ගෙන් හා යාවජීව මහාචාර්යවරුන් කිහිප දෙනෙක-ගෙන් සැදුම්ලත් සම්පත්දායක මඩුල්ලක් විසින් පවත්වන ලද ක්ෂේත්‍ර පර්යේෂණ හා ඉගැන්වීම් වැඩ සටහන්වලට සහභාගි වූහ. ජපානයේ Fukuoka කාන්තා විශ්වවිද්‍යාලය හා ශාස්ත්‍ර පීඨය අතර පවතින සම්බන්ධිත වැඩසටහන යටතේ ජපානයේ එම විශ්වවිද්‍යාලයේ 2014 අධ්‍යයන වර්ෂය සඳහා ශාස්ත්‍ර පීඨයේ සිසුන් තිදෙනෙකු සම්බන්ධ වූ අතර Fukuoka කාන්තා විශ්වවිද්‍යාලයෙන් එක් සිසුවෙකු පේරාදෙණිය ශාස්ත්‍ර පීඨයේ 2014 අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකය හා සම්බන්ධ විය. 2014 වර්ෂයේ අත්සන් කළ අවබෝධතා ගිවිසුමකට අනුව මෙම පීඨයේ එක් සිසුවෙකු කොරියාවේ සෝල් නුවර ඩොන්ගුක් විශ්වවිද්‍යාලයට යවන ලදී. නොහාඩ් NORHED අනුග්‍රහය ලද සම්බන්ධිත වැඩසටහනක් යටතේ පීඨයේ එක් කණිෂ්ඨ ආචාර්යවරයකු හා රුහුණු විශ්වවිද්‍යාලයේ එක් අයෙකු නේපාලයේ තිංගුවන් විශ්වවිද්‍යාලයේ ඔහුගේ ආඩන් උපාධිය හැදැරීී සඳහා යවන ලදි. නේපාලයේ ත්‍රිභුවන් විශ්වවිද්‍යාලයට යවන ලදි. එම සම්බන්ධිත වැඩසටහන යටතේම හිටපු තාවකාලික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බංග්ලාදේශයේ ඩකාහි නෝර්ත් සවුත් විශ්වවිද්‍යාලයේ "රාජ්‍ය ප්‍රතිපත්ති හා පාලනය" පිළිබඳ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා පීඨය විසින් යවන ලදි.

## අනාගත සැලසුම්

2014/2015 වර්ෂය අවසාන වනවිට පීඨය කලා අධ්‍යාපන ඒකකය එහි ස්ථිර ඒකකයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ පීඨයේ විෂයමාලා සංවර්ධනය හා නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යනු ඇත. ඉහත අධ්‍යයන වර්ෂය තුළදීම පීඨය අන්තේවාසික වැඩසටහන පීඨ විෂයමාලාවට ඇතුළත් කිරීම හා සම්මාන 12 ක් පිරිනමන නව තොරතුරු තාක්‍ෂණ සන්නිවේදන තාක්‍ෂණ පාඨමාලා ආරම්භ කරනු ඇත. තවද පීඨය දැනට සනාතන සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටින අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.



## A4 දන්ත වෛද්‍ය පීඨය

(පීඨාධිපති, මහාචාර්ය උපුල් බී. දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාල දන්ත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල ජාත්‍යන්තර තත්ත්වයන් හා සංසන්දනය කළ හැකි නූතන පහසුකම් හා උපකරණවලින් සමන්විත ගොඩනැගිලි සමුදායකින් යුක්ත වන අතර, ඉගැන්වීම, පර්යේෂණ හා රෝගී සත්කාරය යන ක්‍රියාකාරකම්වලට සහාය වේ. රටට අවශ්‍ය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කරන එකම ආයතනය මෙම දන්ත වෛද්‍ය පීඨය වන අතර එය පහත සඳහන් අධ්‍යයන අංශ හතකින් යුක්ත වේ. මූලික විද්‍යාවන්, ප්‍රජා දන්ත වෛද්‍ය, මුඛ සෞඛ්‍ය හා පරිදන්ත විද්‍යාව, මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය, මුඛ ව්‍යාධිවේදය, කෘතිම දන්ත වෛද්‍ය සහ සංරක්ෂණ දන්ත වෛද්‍ය යන නම්වලින් එම අංශ හැඳින්වේ. දන්ත වෛද්‍ය පීඨය වාර්ෂිකව දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 80 දෙනෙකු පුහුණු කරනු ලබයි. ප්‍රථම උපාධි පශ්චාත් උපාධි ආයතනය හා සහයෝගිතාවයෙන් යුතුව විශේෂඥ දන්ත වෛද්‍යවරුන් පුහුණු කිරීම හා දන්ත වෛද්‍ය වෘත්තියට සම්බන්ධ අනෙකුත් උපස්ථම්භක දන්ත වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කිරීම මෙම පීඨය මඟින් ක්‍රියාත්මක කරන වෙනත් කෘත්‍යයන්වේ. තවද, දන්ත වෛද්‍ය පීඨ/දන්ත (ශික්ෂණ) රෝහල රෝගී සත්කාරය සඳහා තෘතීය යොමු කිරීම් (referral) මධ්‍යස්ථානයක් ලෙසද ක්‍රියා කරන අතර, එහි පහසුකම් වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා සිසුන් විසින් ද ඔවුන්ගේ පුහුණුව සඳහා පරිහරණය කරනු ලබයි.

දන්ත වෛද්‍ය පීඨ/රෝහල මුඛ පිළිකා ශල්‍යකර්ම, මුඛය, මුහුණෙ ප්‍රතිසංස්කරණ ශල්‍යකර්ම, පැළුණු තොල් සහිතව උපත ලද ළමුන්ගේ පූර්ණ සත්කාරය, පිළිකා ශල්‍ය කර්මවලින් හා මාර්ග අනතුරුවලින් පසු රෝගීන්ගේ කෘතිම දන්ත පුනරුත්ථාපනය (එනම් නාසය, කණ, ඇස් ආදිය කෘතිමව ආදේශ කිරීම) ආදි සුවිශේෂ සේවාවක් මෙරට ජනතාවට ලබාදේ.

### ජයග්‍රහණ

1. 2014 වසරේ දන්ත වෛද්‍ය පීඨයේ ලියාපදිංචිය ලබා ගත් විදෙස් සිසුන්ගෙන් රුපියල් මිලියන නවයක් උපයා ගෙන ඇත.
2. අමතර සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපාදන යටතේ සිසුන් 100කට ඉඩ සැලසෙන නව දේශන ශාලාවක කටයුතු පීඨය විසින් අවසන් කොට ඇත.
3. දන්ත වෛද්‍ය උපස්ථම්භක පුහුණු පාසැල විසින් උපයන ලද මුදල් යොදා ගනිමින් නව දේශන ශාලාවට පුටු 100 ක්, බහු මාධ්‍ය ප්‍රොජෙක්ටරයක් හා ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගන්නා ලදි.
4. දන්ත වෛද්‍ය පීඨයේ මුඛ හනුක ශල්‍යකර්ම වාට්ටුවට දිගුවක් ලෙස සාමාන්‍ය ශල්‍යකර්ම වාට්ටුවක් ස්ථාපිත කොට සාමාන්‍ය ශල්‍යකර්ම සිදුකිරීම ආරම්භ කරන ලදි. මෙම පහසුකම ලැබීමත් සමඟ සාමාන්‍ය ශල්‍යකර්ම ශික්ෂණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වේ.

5. මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න 2013.03.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුඛ ව්‍යාධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදි.
6. වෛද්‍ය ආර්.එම්. ජයසිංහ කෘතිම දන්ත වෛද්‍ය අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට පත් කරන ලදි.
7. වෛද්‍ය ඩබ්ලිව්.එම්.සී. වීරසේකර දන්ත චිකිත්සක අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට පත් කරන ලදි.
8. වෛද්‍ය එන්.එස්.එස්. ජයසූරිය මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට පත් කරන ලදි.
9. වෛද්‍ය ආර්. එම්. ජයසිංහ (මිය) කෘතිම දන්ත වෛද්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට පත් කරන ලදි.
10. වෛද්‍ය පී. එදිරිසිංහ සංරක්ෂණ දන්ත වෛද්‍ය අංශයේ කථිකාචාර්යවරයෙකු ලෙස පත් කරන ලදි.
11. වෛද්‍ය ආර්.එම්.ඩී.එන්.එල්. රාජකරුණා මුඛ වෛද්‍ය හා පරිදන්ත අධ්‍යයන අංශයට පත් කරන ලදි.
12. 2014 වසර සඳහා දන්ත වෛද්‍ය හෙද නිලධාරින් නව දෙනෙකු බඳවා ගන්නා ලදි.
13. දන්ත වෛද්‍ය පීඨ කාන්තා බැඩ්මින්ටන් කණ්ඩායම 2014 මැයි මස පවත්වන ලද නවකයන්ගේ ක්‍රීඩා තරඟාවලියේ ශූරියන් බවට පත් විය. එන්.ඩබ්.එච්.පී.එස්.එස්. සෙනෙවිරත්න මිය අන්තර් විශ්වවිද්‍යාල තරග නියෝජනය කිරීම සඳහා තෝරා ගන්නා ලදි.

**අනාගත සැලසුම්**

1. දන්ත වෛද්‍ය පීඨය එහි සිසුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර පරිගණක පදනම් කර ගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හඳුන්වාදීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දන්ත වෛද්‍ය විද්‍යුත් ඉගෙනුම් ඒකකයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක නිරතවී සිටී.
2. මෙරට Implant සඳහා සීඝ්‍රයෙන් වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි දන්ත වෛද්‍ය Implant ඒකකයක් ආරම්භ කිරීමට දන්ත වෛද්‍ය පීඨය සැලසුම් කරයි. මෙම සේවාවන් සපයාදීමට අමතරව ප්‍රධාන ඒකකය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ට දැනුම හා පුහුණුව ලබා දීමට ද සැලසුම් සකස් කරයි.
3. දන්ත වෛද්‍ය පීඨය නව ශිෂ්‍ය පොදු කාමරයේ හා ආපනශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කොට විවෘත කිරීමට ද සැලසුම් කරමින් සිටී.
4. මහල් පහකින් යුතු ගොඩනැගිල්ලේ කටයුතු සැලසුම් කළ පරිදි ආරම්භ කිරීමට පීඨයට නොහැකි විය. කෙසේ වෙතත්, මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ වී ඇත.

.



## A5 ඉංජිනේරු පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ විසින් වාර්තා කරන ලද පරිදි)



ඉංජිනේරු පීඨය 2014 වර්ෂයේදී එහි අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මකභාවයට හා ප්‍රමිතියට ඍජුවම බලපාන කලක සිට අපේක්ෂාවෙන් පසු වූ ප්‍රතිසංස්කරණ හා සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති රාශියක් ආරම්භ කරන්නට විය.

**යටිතල සංවර්ධනය**

යටිතල සංවර්ධනය අතින් ගත් කල පීඨයට දැඩිව බලපා ඇති ඉඩ පහසුකම් ගැටළුව විසඳීම සඳහා Drawing Office II, හි ප්‍රතිසංස්කරණ කටයුතු 2012 වසර අවසානයේදී ආරම්භ කොට සැලකිය යුතු ප්‍රමාණයෙන් පවත්වා ගෙන යන ලදි. තවද, ව්‍යුහ විද්‍යාගාරය, ඉංජිනේරු පුස්තකාලය, නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයන අංශය, Drawing office II හා නව ආපනශාලාව (ප්‍රධාන සැලසුමට අනුව) (රුපියල් මිලියන 40ක මුළු වියදමින් ) ආරම්භ කොට වර්ෂාවසානයේදී සියළු කාර්යයන් අවසන් කරන්නට හැකි විය. වසර පහක ප්‍රමාදයකින් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද රසායන ඉංජිනේරු විද්‍යා ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතුද (රුපියල් මිලියන 85 කට ආසන්න මුළු වියදමකින් ) 2014 වසරේදී ආරම්භ කරන ලදි. ඊට අමතරව යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය සඳහා නව කාර්යාලයක් ලබා ගැනීම හා අධ්‍යයන දෙපාර්තමේන්තු මට්ටමින් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති කිහිපයක් අවසන් කරන ලදි.

**අධ්‍යයන හා පර්යේෂණ කටයුතු**

E/12 සිසු කණ්ඩායම සඳහා සිසුන් බඳවා ගැනීම පසුගිය අවුරුදු කිහිපයක් තිස්සේ පවත්වාගෙන ගිය පරිදි (සිසුන් 415) සිදුවිය. මෙරට පවතින සියළුම ඉංජිනේරු පීඨ අතරින් මෙම ඉංජිනේරු සිසු කණ්ඩායම සඳහා අධ්‍යයන වැඩසටහන ප්‍රථමයෙන්ම ආරම්භ කරන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයයි. පීඨය නිත්‍ය අධ්‍යයන වැඩසටහන පවත්වා ඉංජිනේරු විද්‍යාවේදි තරුණ උපාධිධාරීන් 400කට වැඩි පිරිසක් බිහි කරන ලදි. මෙසේ බිහි කරන ලද මුළු ඉංජිනේරුවන් අතරට සිවිල් ඉංජිනේරුවන් 150 ක්, විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන් 100 ක්, පරිගණක ඉංජිනේරුවන් 60ක්ද, ඉතිරි පිරිස නිෂ්පාදන, යාන්ත්‍රික ඉංජිනේරු සහ රසායන හා සැකසුම් ඉංජිනේරුවන්ගෙන් යුක්ත වේ.

පීඨයේ සිසුන් විසින් ජාතික හා ජත්‍යන්තර තාක්ෂණික තරගවලින් සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගැනීම ප්‍රශංසනීයයි. විවෘත තරග ලෙස පවත්වන ලද මෙම තරගවලට විශ්වවිද්‍යාල රාශියක සිසුන් මෙන්ම රටේ වෙනත් ඉංජිනේරු පීඨවල සිසුන් ද සහභාගි වූහ. කැපවී ක්‍රියා කළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මඟ පෙන්වීම සහ අධීක්ෂණය මෙම ජයග්‍රහණ අත්කර ගැනීමට ඉමහත් රුකුලක් විය.

2014 වසරේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයට නවක සාමාජිකයන් 15 දෙනෙකු බඳවා ගන්නා ලදි. තවද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික ආචාර්ය එස්.බී. විජේකෝන් මෙරට ඉංජිනේරුවන් සඳහා

වන ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය ආයතනයක් වන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති තනතුරට පත් කර ගන්නා ලදි.

ජපානයේ විද්‍යා හා තාක්ෂණ ආයතනය හා JICA ආයතනයේ චිරස්ථායි සංවර්ධනය උදෙසා වන විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ සම්බන්ධතාවයේ (SATREP) මුදල් යටතේ ජපානයේ යසිතමා විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් පරිහරණයට නොගත් ඉඩම් ගොඩ කිරීමේ පස් අවුරුදු (05) ව්‍යාපෘතිය 2014 වසරේදී මනාව ක්‍රියාත්මක විය. ජපානයේ තානාධිපති විසින් පරිසර ඉංජිනේරු විද්‍යාගාරය විවෘත කිරීම 2014 වසරේ සිදුවූ තවත් සුවිශේෂී කාර්යයකි. පරිසරය හා සම්බන්ධ පර්යේෂණ සඳහා අවශ්‍ය කරන නවීන උපකරණ බොහෝමයකින් මෙම විද්‍යාගාරය සමන්විත වන අතර, මෙය SATREP ව්‍යාපෘතියේ කැප කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඳහන් කළ හැකිය.

පීඨයේ පවත්වන ලද පර්යේෂණවලින් ඉහළ මට්ටමේ වාර සඟරාවල පළවූ පර්යේෂණ පත්‍ර 20 කට වැඩි ප්‍රමාණයක් ඇතුළුව පර්යේෂණ ප්‍රකාශන 100කට වැඩි ප්‍රමාණයක් බිහිවී ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සහය ඇතිව සම්මන්ත්‍රණ වැනි CPD වැඩසටහන් ඇතුළත්ව පීඨය විසින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට විවිධ සැපයීම තුළින් පීඨය හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර පවතින සම්බන්ධතාවය පවත්වාගෙන යන ලදි.

ඉංජිනේරු කළමනාකරණ දෙපාර්තමේන්තුව නවක සාමාජිකයෙකු බඳවා ගනිමින් 2014 වසරේ අධ්‍යයන වැඩසටහනට දායකත්වය ලබා දෙන ලදි. පීඨයේ සෑම අධ්‍යයන අංශයක්ම ප්‍රථම වසර අධ්‍යයන පාඨමාලාව සංශෝධනය කිරීමේ කාර්යයෙහි නියැලී සිටී. මෙම සංශෝධනයට ප්‍රතිඵල පදනම් කරමින් නව ව්‍යුහයක් යෝජනා කෙරේ. මෙම කාර්යය 2014 වසරේදී මනාව ක්‍රියාත්මක වූ අතර ප්‍රධාන පෙළේ තීරණ කිහිපයකට ද එළඹෙන ලදි.

එක් එක් අධ්‍යයන අංශ හා පීඨයේ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය හරහා දේශීය වෘත්තිකයන්හට දැනුම ලබාදීමේ කාර්යය අඛණ්ඩව සිදුකරන ලදි. අවස්ථාවන් ගණනාවකදී අදාළ විදෙස් ආයතනවලින් සම්පත්දායක පුද්ගලයන් ගෙන්වා කෙටි පාඨමාලා 30කට වැඩි ප්‍රමාණයක් ද සම්මන්ත්‍රණ හා විශේෂ සම්මන්ත්‍රණද පවත්වන ලදි. පීඨය R&D සංවර්ධනය කිරීම හා කර්මාන්ත සබඳතා ඉහළනැංවීම සඳහා විදෙස් විශ්වවිද්‍යාල සමග අවබෝධතා ගිවිසුම් රාශියකට එළඹෙන ලදි. පර්යේෂණ සහයෝගිතාවන් ප්‍රවර්ධනය කිරීම හා පර්යේෂණ විශේෂඥයන් හුවමාරු කරගැනීම පිණිස ජාතික හා ජාත්‍යන්තර අන්තර් ක්‍රියාවන් හා කාර්යයන් කිහිපයක් වර්ෂය තුළදී පීඨය විසින් සංවිධානය කරන ලදි.

**පහසුකම් සංවර්ධනය**

අවුරුදු 25කට වැඩි කාලයකට පසුව පීඨය එහි වාහන සංඛ්‍යාවට අළුතින් වාහන කිහිපයක් එකතු කරන ලදි. ඉංජිනේරු පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් පරිත්‍යාග කරන ලද ආසන 50 බස් රථයක්, විශ්වවිද්‍යාල අරමුදලින් ලබා ගත් ආසන 16 වෑන් රථයක් හා මෝටර් රථයක් ද, උපයන ලද මුදල්වලින් ලබා ගත් ඩබල් කැබ් රථය ද, මේ අතරට ඇතුළත් වේ. තවද රුපියල් මිලියන 1.6ක වියදමින් රථ වාහන ඒකකය විසින් අලුත්වැඩියා කළ තවත් ඩබල් කැබ් රථයක් මීට ඇතුළත් වේ. මේ අනුව 2014 වසරේදී පීඨයේ වාහන සංඛ්‍යාවට රුපියල් මිලියන 27 ක් වටිනා අලුත් වාහන හතරක් එකතු විය.

පීඨයේ 1969 වසරේ කණ්ඩායම දැනට පවතින කාමරයක් නවීන උපකරණවලින් හා ශබ්ද පද්ධතියකින් සමන්විතව ප්‍රතිසංස්කරණය කොට සම්මන්ත්‍රණ ශාලාවක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 1.5ක මුදලක් පරිත්‍යාග කරන ලදි.

2013 වසරේ අයවැයෙන් රුපියල් මිලියන 80ක විශේෂ ප්‍රදානයක් ලැබීමත් සමග අධ්‍යයන පාඨමාලාවේ විද්‍යාගාර සම්බන්ධව කරන කටයුතු හා සෘජුවම සම්බන්ධ වන නව ආම්පන්න කිහිපයක් මිලදී ගැනීමට සියළුම අධ්‍යයන අංශවලට හැකි විය.

ඉංජිනේරු වැඩපොළ පීඨයට අවශ්‍ය කරන පසුබිම් සේවාවන් රාශියක් ඉටු කිරීමට මෙන්ම නිත්‍ය නඩත්තු කටයුතු හා ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු කිරීම සඳහා මහඟු දායකත්වයක් සැලසීය.

## A6 වෛද්‍ය පීඨය
(පීඨාධිපති, මහාචාර්ය එම්.ඩී. ළමාවංශ විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

පීඨයේ අභිවෘද්ධිය පතා ඉදිරියට යන ගමනේදී 2014 වසරේදී ද අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩල ආචාර්ය මණ්ඩලයට සහ සිසුන්ට මනා සහයෝගයක් දක්වන්නට විය. සියළුම දෙපාර්තමේන්තු හා ඒකක වර්ෂාරම්භයේදී සංවර්ධනය කළ ක්‍රියාකාරී සැලසුමකට අනුව කටයුතු කරන්නට වූහ.

### ජයග්‍රහණ

### සිසුන්

2012/2013 අධ්‍යයන වර්ෂයේ නවක සිසුන් බඳවා ගැනීම 2014 වර්ෂයේ ජනවාරි මාසයේදී ලියාපදිංචි කළ අතර, 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා 2014 වර්ෂයේ නොවැම්බර් මාසයේදී බඳවා ගන්නා ලදි. එම සිසු කණ්ඩායම්වලට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාව 418කි. මෙම සංඛ්‍යානවලට විදෙස් සිසුන් 19 දෙනෙකු ද ඇතුළත් වූහ. 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමේදී දේශීය සිසුන් 195 සිට 205 දක්වා වැඩිකිරීමට පීඨ මණ්ඩල එකඟතාවය ලබා ගන්නට හැකි විය. මෙම කාලය තුළදී සිසුන් 204 දෙනෙකු උපාධිලබා ගත් අතර එම සිසු කණ්ඩායමේ ඉහළ ලකුණු ලබාගත් සිසුන් සමස්ත ලංකා දක්ෂතා ශ්‍රේණිකරණයේ තෙවන ස්ථානයට පත් වූහ. සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය වැනි රටවලින් සිසුන් 30 දෙනෙකු ලියාපදිංචි කරන ලදි. පශ්චාත් උපාධි සිසුන් හය දෙනෙකු පර්යේෂණ උපාධි අවසන් කළහ.

2013 වසරේදී සිසුන් සඳහා ආරම්භ කළ මෘදු කුසලතා පුහුණු වැඩසටහන අධ්‍යයන උපදේශක හා උපදේශන වැඩසටහන් සමඟ අනුගත වෙමින් තවදුරටත් ශක්තිමත් කරන ලදි. සායනික කටයුතු / පුහුණුව කෙරෙහි සිසුන්ගේ මැදිහත්වීම පිළිබඳව ද අවධානය යොමු කරන ලදි.

අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් අතර පවත්වන නිත්‍ය රැස්වීම් එලෙසින්ම පවත්වන ලදි. සිසුන් සහ කාර්ය මණ්ඩලය "නවක සිසුන් පිළිගැනීමේ" හා "සමුගැනීමේ සාදවලදී" මහත්සේ විනෝදයට පත් වූහ. සිසුන් විසින් "කුජදා සංසදය" නියමිත පරිදි පවත්වන ලදි.

හොඳම සිසුන් ආකර්ෂණය කරගැනීම සඳහා සුදුසුකම් සහිත සිසුන් වෙනුවෙන් "විවෘත එක් දින වැඩසටහනක්" පවත්වන ලදි. ආසන්න වශයෙන් සිසුන් 250ක් පමණ සහභාගි වූ මෙම වැඩසටහන අතිශය සාර්ථක විය.

"ශ්‍රී ලංකාභිමානය ලක්ෂමන් කදිරගාමර් විශිෂ්ටතා රන් පදක්කම" ස්ථාපිත කිරීම පිණිස ලක්ෂමන් කදිරගාමර් පදනම විසින් රුපියල් මිලියනයක් පරිත්‍යාග කරන ලදි.

2014 වසරේදී උපයන ලද මුදල්වලින් සිසුන් 10 දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට අපට හැකිවූ අතර, පෙර සිදුකළ ආකාරයටම "පහන් තරුව" ශිෂ්‍යත්වය සිසුන් 15 දෙනෙකුට පිරිනමන ලදි.

**අධ්‍යයන හා විෂයමාලා කරුණු**

පීඨයේ අධ්‍යයන ක්ෂේත්‍රය තුළ විශාල වෙනස්කම් රාශියක් සිදුවිය. වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ හා එම විෂයට සම්බන්ධ මෑත කාලීන එළඹුම්වලට නව ප්‍රවණතාවන් මත පදනම්ව සායනික විෂය මාලාව සංශෝධනය කරන ලදි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශන සමාලෝචනය කිරීමේ පළමු වටය අවසන් කරන ලදි. මෙම උත්සාහය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ යාන්ත්‍රණයක් පිළිබඳ සාකච්ඡා කරන ලදි. සමාසික ඉගැන්වීම හා සායනික ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිපෝෂණය ශක්තිමත් කිරීම සඳහා නිසි පියවර ගන්නට විය. පවුල් සෞඛ්‍ය සංකල්පය විෂය මාලාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව පීඨය විසින් දැනුම් දෙන ලදි. මෙහිදී මේ වනවිට පවතින සංකල්ප ශක්තිමක් කොට නව සංකල්ප හඳුන්වා දෙන ලදි.

හරවත් සායනික නිපුණතාවන්ගේ ආකෘතික ඇගයීම සඳහා Mini CEX වැනි ශිල්පීය ක්‍රම හඳුන්වා දෙමින් සායනික ඉගැන්වීම් වැඩසටහනේ ශිෂ්‍ය තක්සේරුව ශක්තිමත් කරන ලදි.

**විභාග**

නියමිත පරිදි සියළුම විභාග පවත්වන ලදි. විභාග සඳහා Blue prints සංවර්ධනය කොට ඇත. MCQ reader උපකරණය සවි කොට පරිහරණයේ පවතී. සුදුසුකම් සම්පූර්ණ කළ විදෙස් වෛද්‍ය උපාධිධාරීන් 72 දෙදෙනෙකු වෙනුවෙන් ERPM – B විභාගය පවත්වන ලදි. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ MD විභාගයේ (සාමාන්‍ය වෛද්‍ය) දෙවන කොටස දින තුනක් පුරා වෛද්‍ය පීඨයේදී පවත්වන්නට විය.

**පර්යේෂණ**

පර්යේෂණ පත්‍ර පනස් පහක් (55) සම සමාලෝචන වාර සඟරාවේ පළ කරන ලදි. අධ්‍යයන කාර්ය මණ්ඩලය අතර සහයෝගිතා පර්යේෂණවල නියැලීමට දක්වන උනන්දුව කැපී පෙනෙන්නට විය. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසිදෙනෙකු ජාත්‍යන්තර සමුළු/ සම්මන්ත්‍රණවලදී ඔවුන්ගේ පර්යේෂණ කාර්යයන් ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා ලැබී තිබුණි.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ නව දෙනෙකු ඔවුන්ගේ පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ලබා ගත්හ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය වෙනත් සෞඛ්‍ය විද්‍යා / වෛද්‍ය පීඨ අතරින් ශ්‍රේණිගත කිරීමේ ප්‍රථම ස්ථානයේ රැදී සිටින අතර ලෝක විශ්වවිද්‍යාල අතර ශ්‍රේණිගත කිරීමේ 1111 ස්ථානයේ රැදී සිටී.

සර්පයන් දෂ්ඨ කිරීමෙන් පසු ඇති වන විෂ නාශක සංවර්ධනය කිරීම සඳහා පීඨ සාමාජිකයන් ජාතික පර්යේෂණ සභාවෙන් රුපියල් (මිලියන 50) ප්‍රදාන දෙකක් ලබා ගැනීමට සමත් වූහ. ඉන් එකක් රුපියල් මිලියන 50ක් CKDu සඳහා වෙන් කෙරෙනු අතර, එම ප්‍රදානය දිනා ගන්නා ලද්දේ විද්‍යා පීඨය හා එක්වයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආසන්න වශයෙන් රුපියල් මිලියන හයක(6) පර්යේෂණ ප්‍රදාන ලබා දෙන්නට විය.

පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවට ආසියා සහ බටහිර පැසිෆික් කලාපයේ සාර ධර්ම පර්යේෂණ කමිටු සංසඳය විසින් තත්ත්ව සහතිකය ලබා දෙන ලදි.

**ප්‍රජා සේවාවන්**

ප්‍රජා සායනික සේවාවන්ගේ පුළුල් ව්‍යාප්තියක් දක්නට ලැබිණ. බෝ නොවන රෝග සඳහා screening පිළිබඳ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. කඩුගන්නාව දිස්ත්‍රික් රෝහලේ වැඩිහිටි සත්කාරය වෙනුවෙන් කැපකළ වාට්ටුවක් එකතු කිරීමත් සමඟ geriatric සත්කාරක වැඩසටහන

පුළුල් කරන ලදි. art gamma කැමරාව න්‍යෂ්ටික වෛද්‍ය ඒකකයේ සවිකළ අතර ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයේ uroflowmetric s අධ්‍යයනය ආරම්භ කරන ලදි.

පාසල් ළමුන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩ සටහන් හා වැඩමුළු අඛණ්ඩව පවත්වන ලදි. කොරියානු ජාතික වෛද්‍යවරුන් සඳහා ලෝක බැංකුව අනුග්‍රහය දැක්වූ පුහුණු වැඩසටහනක් සාර්ථකව අවසන් කරන ලදි. පීඨය විසින් න්‍යෂ්ටික හෘද විද්‍යාව දියුණු කිරීම පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. සාමාන්‍ය මහජනතාවගේ පරිහරණය සඳහා heavy metals හා ammo aids සොයා ගැනීම සඳහා විශ්ලේෂණාත්මක සේවාවක් ආරම්භ කරන ලදි. ඩෙංගු වෛරසය අසාදනයවීමේ රෝග ලක්‍ෂණ හඳුනා ගැනීමේ පරීක්‍ෂණ ස්ථාපිත කරන ලදි.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය**

අධ්‍යයන කාර්ය මණ්ඩලයට අලුතින් සාමාජිකයින් සිව් දෙනෙකු සම්බන්ධ වූ අතර දෙදෙනෙක් සේවයෙන් ඉල්ලා අස්වූහ. එක් සාමාජිකයෙකු මහාචාර්ය තනතුරට උසස් කළ අතර තව අයෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදි.

ශ්‍රී ලකාවේ මධ්‍ය මහා විද්‍යාල බිහි කළ ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ 130 වැනි උපන් දිනය සැමරීම සඳහා සංවිධානය කළ සැමරුම් උත්සවයේදී ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ තිදෙනෙකු (එක් අයෙක් විශ්‍රාම ලබා සිටියි) ජනාධිපති සම්මාන ලබා ගත්හ.

පීඨය අධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ප්‍රමුඛත්වයෙහිලා සළකයි. පේරාදෙණිය වෛද්‍ය අධ්‍යාපන ඒකකය විසින් සංවිධානය කළ කාර්ය මණ්ඩල සංවර්ධන පුහුණු වැඩසටහන පරිවාස කථිකාචාර්යවරුන් 14 දෙනෙකු විසින් අවසන් කරන ලදි. මේ අතර ඇමෙරිකාවේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට ආචාර්ය මණ්ඩලයේ 15 දෙනෙකු සහභාගි වූහ. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ දස දෙනෙකු ඉගැන්වීමේ ක්‍රමවේදය හා සන්නිවේදනය, විද්‍යාගාර ශිල්පීය ක්‍රම ආදිය පිළිබඳ විදෙස් රටවල පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්වලට සහභාගි වූහ.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනෙකු විදෙස් විශ්වවිද්‍යාලවල පර්යේෂණ උපාධි හැදෑරීම සඳහා ලියාපදිංචි වූහ.

ඉගැන්වීම හා සම්බන්ධ අමුද්‍රව්‍ය වෙබ් අඩවියේ පළ කොට මොඩියුල පරිහරණය වැඩි කිරීමට උත්සාහ කළ ද මෙතෙක් එය සම්පූර්ණයෙන් සාර්ථක වී නොමැත.

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු සේවයෙන් විශ්‍රාම ලබා ගත් අතර එක් අයෙකු මාරුවීම් ලබා පීඨයෙන් ඉවත් විය. නවක සාමාජිකයෝ දහහත් දෙනෙකු පීඨයට සම්බන්ධ වූහ.

අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ සිව් දෙනෙකු තායිලන්තය, හන්ගේරියාව, ඕස්ට්‍රේලියාව හා ඉන්දියාව යන විදෙස් රටවල පැවැත්වූ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූහ.

**විදෙස් සහයෝගිතා**

පහත සඳහන් විශ්වවිද්‍යාලවලින්/රටවලින් විද්වතුන්/ ඉහළ නිලධාරීන් පීඨයට පැමිණියහ.

1. ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය
2. භූතාන රජයේ සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශය
3. ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය
4. ඇමෙරිකාවේ කෙන්චුකි විශ්වවිද්‍යාලය
5. මාලදිවයිනේ ජාතික විශ්වවිද්‍යාලය

**සමුළු**

විශ්වවිද්‍යාලයේ සියළුම පීඨවල සහභාගිත්වයෙන් එකම සෞඛ්‍ය සත්කාරයක් ("One Health") පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් පවත්වන ලදි. ඉන් අනතුරුව එම කාර්යය පිළිබඳ මූලික පියවර ගන්නා ලදි. කොළඹ පැවැත්වූ 03 වැනි ඊශාන දිග ආසියානු කලාපයේ වෛද්‍ය අධ්‍යාපන සමුළුවට පීඨය විසින් සහයෝගය දක්වන ලදි.

**අනාගත සැලසුම්**

**යටිතල පහසුකම්**

පීඨාධිපති කාර්යාලය ප්‍රතිසංස්කරණය කරන ලදි. මෙතෙක් අතහැර දමා තිබූ පැරණි ජෛව රසායන විද්‍යාගාරය විභාග ශාලාවක් බවට පරිවර්තනය කරන ලදි. පාරා සායනික ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවල දෙවන අදියර ආරම්භ කරන්නට විය. මහනුවර ශික්ෂණ රෝහලේ සිසුන් හා වෛද්‍යවරුන් විසින් පරිහරණය කරන ආපනශාලාව මහනුවර රෝහලේ වෛද්‍යවරුන්ගේ සුබසාධන සංගමයේ සහයෝගයෙන් ප්‍රතිසංස්කරණය කරන්නට විය. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ශල්‍ය වෛද්‍ය ඒකකයේ දිගුව ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. සායනික සේවාවන් හා පර්යේෂණ ගොඩනැගිල්ලේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට හැකි විය. වෛද්‍ය පශ්චාත් උපාධි පාසැල සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුම් සකස් කරන ලදි. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ Neonatology ඒකකයෙහි දත්ත ගබඩාවක් පවත්වාගෙන යෑම සඳහා යටිතල පහසුකම් ස්ථාපිත කරන ලදි.

කුසලතා විද්‍යාගාරයේ ඇතුළත වැඩි දියුණු කිරීමට හා පුස්තකාලයේ ශ්‍රව්‍ය දෘෂ්‍යාගාරය අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන ඇත.

**නව මධ්‍යස්ථාන / ඒකක**

නිවර්තන වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය CRTM නැවත ක්‍රියාත්මක කරන ලදි. පර්යේෂණ හා සංවර්ධනය සඳහා වෙනම ඒකකයක් පීඨ මට්ටමින් ස්ථාපිත කරන ලදි. වකුගඩු රෝග පිළිබඳ අධ්‍යාපන, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් (CERTKID) ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබා ගත හැකි විය. මහනුවර තුළ සහ ඒ අවට සිටින වෛද්‍යවරුන්ට පුහුණුව ලබාදීම සඳහා ආරම්භ කළ වෛද්‍ය පශ්චාත් උපාධි විද්‍යාලය ස්ථාපිත කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

**වෛද්‍ය පශ්චාත් උපාධි විද්‍යාලය**

2014 වසරේදී වෛද්‍ය පශ්චාත් උපාධි විද්‍යාලය විසින් අධ්‍යාපන ක්‍රියාකාරකම් කිහිපයක් පවත්වන ලද අතර, ඊට වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය ඇතුළත් විය. නව යෝජිත ගොඩනැගිල්ල සඳහා සුදුසු ගෘහ නිර්මාණාත්මක සැලසුම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳ සාකච්ඡා කිරීමට සැළකිය යුතු කාලයක් වැය කිරීමට සිදුවිය. වෛද්‍ය පශ්චාත් උපාධි විද්‍යාලය ස්ථාපිත කොට පරිපාලනය කිරීම සඳහා පණතක් සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත බාර දෙන ලද අතර ඒ සඳහා මුදල් ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද බාර දෙන ලදි.



## A7 විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය අනුර වික්‍රමසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

විද්‍යා පීඨය නව නිර්මාණ, පර්යේෂණ හා අධ්‍යාපනය සඳහා මහඟු ඉඩ ප්‍රස්ථාවන් උදාකරදෙනු ලබයි. 1942 වසරේදී ආරම්භ කොට 1961 ජූලි මාසයේදි දැනට පිහිටුවා තිබෙන ස්ථානයට ගෙන එන ලදුව මෙම විද්‍යා පීඨය වර්ෂ 70 ක් පුරා මෙරට විද්‍යා අධ්‍යාපනයේ මූලිකත්වය ගෙන ක්‍රියා කොට ඇත. මෙම කාල පරිච්ඡේදය පුරා අධ්‍යාපනය ඉහළනැංවීම සඳහා අවශ්‍ය කරන අවශ්‍යතාවයන්ගෙන් ප්‍රේරණය ලැබ විශාල සිසුන් පිරිසකට නවාතැන් පහසුකම් හා නව පීඨ, දෙපාර්තමේන්තු හා මධ්‍යස්ථාන ස්ථාපිත කොට පවතින පහසුකම් පුළුල් කරන ලදි. වර්තමානය වනවිට මෙම පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු අටක්, වෘත්තීයමය හා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 100ක්, ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් 1800ක් හා පශ්චාත් උපාධි සිසුන් 100 ක් සිටිති. විද්‍යා අධ්‍යාපන ඒකකයක් ද විද්‍යා පීඨය සතුව පවතී.

වාර්ෂිකව සිසුන් 300ක් පමණ, ඇතුළත් කෙරෙන ප්‍රථම උපාධි පාඨමාලා 14ක් පීඨය මඟින් පවත්වනු ලබයි. ජීව විද්‍යාව, උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, භූගර්භ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණවේදය, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා සත්ව විද්‍යාව යන විෂයන්ට අදාළ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධි වැඩසටහන විද්‍යා පීඨය විසින් ප්‍රදානය කෙරෙන අතර සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ, ගණනය හා කළමනාකරණය (ශාස්ත්‍ර පීඨය හා එක්ව) පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී උපාධිය ද විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබයි.

එමෙන්ම පීඨය ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී උපාධියක් හැදෑරීමේ විකල්පයක් සහිතව තුන් අවුරුදු විද්‍යාවේදී උපාධියක් ද ප්‍රදානය කරනු ලබයි. මෙහි ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු උපාධියේදි සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ස්ථානගත කිරීමක් සහිතව කර්මාන්ත ක්ෂේත්‍රය හා සම්බන්ධ පාඨමාලාවන් හදාරමින් අමතර අවුරුද්දක් ගත කරයි.

සියලුම උපාධි පාඨමාලාවන් හදාරන සිසුන් සියලුදෙනා විශේෂයෙන්ම ව්‍යවහාරික විද්‍යා උපාධි පාඨමාලාවේ සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ස්ථානගත කිරීමත් සමඟ පීඨය කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ පවත්වන සම්බන්ධතාවය ශක්තිමත් කර ගන්නා ලදි. විද්‍යා කර්මාන්ත අන්තර් ක්‍රියා සංසදය ප්‍රතිසංස්කරණය කොට එහි ක්‍රියාකාරකම් HETC ව්‍යාපෘතිය යටතේ ශක්තිමත් කරන ලදි. මෙමඟින් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර සමීප සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමේ පරිසරය නිර්මාණය වනු ඇත.

### ජයග්‍රහණ

2014 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිව් දෙනෙකු හා පරිවාස කථිකාචාර්යවරුන් සිව් දෙනෙකු ද බඳවා ගැනීමට පීඨයට හැකි විය. විදෙස් අධ්‍යයන නිවාඩු ලබා සිටි කාර්ය මණ්ඩල සාමාජිකයෝ හය දෙනෙකු ඔවුන්ගේ දර්ශනශූරි උපාධි අවසන් කොට පැමිණ නැවත රාජකාරි

ආරම්භ කළහ. එක් සාමාජිකයෙකු මහාචාර්ය තනතුරට උසස් කරනු ලැබීය. කාර්ය මණ්ඩල සාමාජිකයෝ කිහිප දෙනෙකු විශේෂ පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සහයෝගීතා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා විදෙස් විශ්වවිද්‍යාලවලට හා විද්‍යාගාරවලට ගියහ. එක් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු භෞතික විද්‍යාවන්හි වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂක සඳහා වන CVCD විශිෂ්ටතා සාමාන්‍ය ලබා ගත්තේය. එම සාමාජිකයා විසින්ම "හොඳම වාණිජමය වශයෙන් විශ්වාසනීය පර්යේෂණය 2014 සඳහා වන" නේචර්ස් බියුටි ක්‍රියේෂණ්ස් පර්යේෂණ සම්මානය" ලබා ගන්නා ලදි. කාර්ය මණ්ඩල සාමාජිකයන් විසි හතර දෙනෙකු (24) 2007, 2008 හා 2009 වර්ෂයන්හි ඔවුන්ගේ පර්යේෂණ ප්‍රකාශන මත පදනම්ව පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මානය ලබා ගන්නා ලදි. එමෙන්ම 2010, 2011 සහ 2012 වර්ෂවල පර්යේෂණ ප්‍රකාශන වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන් විසි එක් දෙනෙකු විසින් ඔවුන්ගේ පර්යේෂණ ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය දිනා ගන්නා ලදි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විද්‍යාත්මක විශිෂ්ටතාවය වෙනුවෙන් ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මානය ලබාගත් අතර තවත් සාමාජිකයෙකු විසින් පර්යේෂණ කටයුතු අධීක්ෂණය කිරීම වෙනුවෙන් ද සම්මානයක් ලබා ගන්නා ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2014 විද්‍යා පීඨ පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන්නට යෙදුන අතර එහිදී වාචික ඉදිරිපත් කිරීම් 560ක් හා පෝස්ටර ඉදිරිපත් කිරීම් 150ක් ඉදිරිපත් කරන ලදි. විදෙස් නියෝජිත මණ්ඩල 25ක්ද ඇතුළත්ව පර්යේෂකයන් හා පශ්චාත් උපාධි සිසුන් 850 ක් පමණ ඒ සඳහා සහභාගි වූහ. HETC ව්‍යාපෘතියේ විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදානය යටතේ සංවිධානය කළ සංස්කෘතික දිනයක් පවත්වන ලදි. මෙම දිනය පැවැත්වීමේ අරමුණ වූයේ අන්තර් ක්‍රියාකාරීත්ව ක්‍රියාකාරකම් තුළින් පීඨයේ සිසුන් අතර ජනවාර්ගික සහ සම්බන්ධතාවය ඉහළනැංවීමයි. මෙම වැඩසටහනට සමගාමීව HETC ව්‍යාපෘතිය විසින් මූල්‍ය අනුග්‍රහය දැක්වූ කලා ප්‍රදර්ශනයක් පීඨයේ සිසුන් වෙනුවෙන් පවත්වන ලදි.




පීඨය ඌව පළාතේ අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂයධාරාවට අදාළ ගුරුවරු 40ක් වෙනුවෙන් සිව් දින පුහුණු වැඩමුළුවක් ද මධ්‍යම පළාතේ අ.පො.ස. (උ/පෙළ) විද්‍යා විෂය ධාරාවට අයත් ගුරුවරුන් 250 ක් වෙනුවෙන් දින 16 පුහුණු වැඩ සටහනක් ද සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩසටහනට අ.පො.ස. (උ/පෙළ) තොරතුරු තාක්ෂණය උගන්වන ගුරුවරුන්ද ඇතුළත් වූහ. අ.පො.ස. (උ/පෙළ) සිසුන් 1300කට පමණ එක් දින පාසැල් විද්‍යා වැඩසටහන් විසිහතරක් (24) විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

වැඩමුළු හා සමුළු කිහිපයක් ද පීඨය විසින් සංවිධානය කළ අතර ඒ අතරින් සමහරක් වැඩමුළු හා සමුළු පවතවන ලද්දේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගිතාවයෙනි. අවසන් වසර සිසුන්ගේ හා මෑත කාලයේදී උපාධි ලබාගත් උපාධිධාරීන්ගේ ප්‍රයෝජනය පිණිස කර්මාන්ත ක්ෂේත්‍රයේ සේව්‍යයන්ට ආරාධනා කොට "කර්මාන්ත දිනයක්" පීඨය විසින් සාර්ථකව සංවිධානය කරන ලදි.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ කිහිප දෙනෙකුම මෙරට වෙනත් ජාතික ආයතනවල අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් හා කණ්ඩායම් නායකයන් ලෙස ඔවුන්ගේ සේවාවන් ලබා දුන් අතර,

තවත් සමහර කිහිපදෙනෙකු ජාතික වශයෙන් වැදගත්කමින් යුතු ව්‍යාපෘති හා සම්බන්ධව කටයුතු කළහ.

2014 වසරේදී පීඨය ජාතික පර්යේෂණ සභාව, ජාතික විද්‍යා පදනම හා HETC ව්‍යාපෘතියේ ප්‍රදාන හරහා රුපියල් මිලියන 10.5ක මුළු වියදමින් උපකරණ කිහිපයක් මිලදී ගැනීමට සමත් විය. රුපියල් මිලියන 3.6ක වියදමින් වෝල්ට මීටරයක් (Voltameter) මෙට්‍රෝම් සමාගම විසින් පීඨයට පරිත්‍යාග කරන ලදි. විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය රුපියල් මිලියන 65ක වියදමින් (Scanning Electron Microscope) යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි. මෙම යන්ත්‍රය භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයේ සවි කරන ලදි. පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සැලකිය යුතු පර්යේෂණ පත්‍ර ප්‍රමාණයක් දේශීය හා ජාත්‍යන්තර වාර සඟරාවල පළ කරන ලද අතර, ඔවුන්ගේ පර්යේෂණ කාර්යයන් ජාත්‍යන්තර සමුළුවලදී ඉදිරිපත් කරන්නට විය. භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කාර්මික කාර්ය මණ්ඩලයත් ප්‍රථම උපාධි සිසුන් හා පශ්චාත් උපාධි සිසුන් හුවමාරු කරගැනීම පහසු කරවීම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජපානයේ කියුෂු විශ්වවිද්‍යාලයත්, ජර්මනියේ බර්ලින්හි නිදහස් විශ්වවිද්‍යාලයත් අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ආරම්භ කරන ලදි.

ජීව විද්‍යා සිසුන්ට පවතින අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් පීඨයට බඳවා ගනු ලබන ජීව විද්‍යා සිසුන් සංඛ්‍යාව 150 සිට 180 දක්වා වැඩි කිරීමට පීඨය විසින් තීරණය කරන ලදි.

**බාධක හා පිළියම්**

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනෙකු අවුරුදු 40කට වැඩි කාලයක් විශ්වවිද්‍යාල පද්ධතියට ඔවුන්ගේ සේවය ලබාදී විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලබා ගත්හ. පෞද්ගලික හේතූන් මත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සහ එක් පරිවාස කථිකාචාර්යවරයෙකු විශ්වවිද්‍යාල සේවයෙන් ඉල්ලා අස් වූහ. සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සඳහා යෝජිත සිව්මහල් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත්ත ද එම ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ස්ථානය ඒ සඳහා නුසුදුසු බවට කරුණු අවබෝධ වී ඇත. කෙසේ වෙතත් ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් හඳුනා ගෙන නොමැති අතර, භූමියේ ගැටළුව විසඳුනහොත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හැකිවනු ඇත.

භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය සඳහා ඉදිකළ නව ගොඩනැගිල්ලට ලී බඩු ලබා ගැනීමේ පළමු අදියරෙන් කොටසක් ලබා ගැනීමට හැකිවූ නිසා එම අධ්‍යයන අංශය නව ගොඩනැගිල්ලට ගෙන යෑමට හැකි විය. එනමුත් ඉතිරි ලී බඩු මෙතෙක් ලැබී නොමැත.

**අනාගත සැලසුම්**

භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයේ දෙවන අදියර සඳහා බාරදුන් යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර පීඨය එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ අරමුණින් පසුවේ. පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධි වැඩසටහනක් හඳුන්වාදීමට ඉදිරිපත් කළ යෝජනාවට පේරාදෙණිය විශ්වවිද්‍යාල සනාතන සභාවේ හා ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා බාරදී ඇත. භූගර්භ විද්‍යා ප්‍රථම උපාධි පාඨමාලාවේ සංශෝධිත විෂය මාලාව ලබා ගත් අතර, එය අධ්‍යයන සංවර්ධන සහ සැලසුම් කමිටුවේ හා සනාතන සභාවේ අනුමැතිය සඳහා බාර දෙනු ඇත. පීඨයේ පරිපාලන ගොඩනැගිල්ලට ගොඩනැගිලි දිගුවක් ලබාගැනීම සඳහා බාර දුන් යෝජනාවට විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබාගත් අතර එය පුනරුත්ථාපන මුදල් යොදා ගනිමින් ඉදිකිරීමට අදහස් කරන ලදි.

## A8 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය එච්.බී.එස්.ආරියරත්න විසින් වාර්තා කරන ලද පරිදි)




**හැඳින්වීම**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය පිරිනැමීමේ හිමිකම අත්කරගත් එකම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයයි. සිව් අවුරුදු කාල පරිච්ඡේදයකින් යුතු මෙම අධ්‍යයන පාඨමාලාවට වාර්ෂිකව බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් 80කි. පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු පහක් අතර බෙදී යන විවිධ විෂය ධාරාවන්හි නිපුණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 41දෙනෙකි. ඉහළ ගුණාත්මකභාවයකින් යුතු අධ්‍යයන හා පරිපාලන ව්‍යුහයක් (setup) ලඟා කර ගැනීම උදෙසා පීඨාධිපතිතුමන්ට පවරා ඇති බලතලවලට අනුව පීඨ මණ්ඩලය විසින් අනුකමිටු 15කට වැඩි ප්‍රමාණයක් පත් කොට වගකීම් බෙදාහැර ඇත. පශු ශික්ෂණ රෝහල, පශු වෛද්‍ය පුස්තකාලය, පරිගණක ඒකකය, ජලජ සත්ව රෝග හඳුනා ගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානය සහ ආදර්ශ කිරිහලක් හා පිස්සු බලු රෝග හඳුනා ගැනීමේ ඒකකය ඇතුළත් සේවා ඒකක රාශියකින් පීඨයේ අධ්‍යයන පරිසරය සුපෝෂණය කොට ඇත. සමාසික අටක අධ්‍යයන වැඩසටහන සත්ව සෞඛ්‍ය හා නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති සහිත සමාසික එකක් හෝ දෙකක් පුරාවට උගන්වනු ලබන විෂයන් 23කින් යුක්තවේ. ඒ අනුව පීඨය සමාසික අවසාන හා වර්ෂාවසාන පරීක්ෂණ වැනි විවිධ ඇගයීම් ක්‍රම පවත්වනු ලබයි.

**ජයග්‍රහණ**

වසරකට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමේ අරමුණ සහිතව පීඨයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු විශාල සංඛ්‍යාවක් අවසන් කොට ඇත. මූලික විද්‍යා ගොඩනැගිල්ලේ පංති කාමර හා විද්‍යාගාර, ජෛව රසායනාගාර ගොඩනැගිල්ල, ව්‍යාධිජීව ගොඩනැගිල්ල සහ ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ගොඩනැගිල්ල දීර්ඝ කිරීම මෙම කටයුතුවලට ඇතුළත් විය. පැරණි පශු- ශික්ෂණ රෝහලේ බිම් මහළ පූර්ණ පහසුකම් සහිත පීඨාධිපති කාර්යාලය බවට පත් කොට ඇති අතැර, එම ගොඩනැගිල්ලේ පළමු මහල සේවා ඒකක බවට පත් කොට ඇත. පශු සායනික විද්‍යා දෙපාර්තමේන්තුව නව පරිශ්‍රයට ගෙන ගිය අතර නවීන පහසුකම්වලින් සමන්විත පශු ශික්ෂණ රෝහල ද ස්ථාපිත කරන ලදි. මෙය හීලෑ සතුන්ගේ සහ වන සතුන්ගේ සත්කාරය සඳහා විසි හතර පැය පුරාම විවෘතව පවතී. HETC ව්‍යාපෘතියේ මුදල් යොදා ගනිමින් ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා පශු ශික්ෂණ ගොවිපලේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙමින් පවතින අතර, කුකුළන් රඳවා සිටින ගෘහයක් හා නව ඒකකය දීර්ඝ කිරීම වැනි කටයුතු සිදු කෙරේ. ආචාර්ය මණ්ඩල සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කොට නැවත පීඨයට පැමිණීමත් සමඟ පීඨයේ අධ්‍යයන වැඩසටහන් දියුණු කරන ලදි. මෙම වසර තුළදී පීඨය අවබෝධතා ගිවිසුම් දෙකක් (02) අත්සන් කරන ලදි. ඉන් එකක් දකුණු කොරියාවේ චුන්ග්නම් ජාතික විශ්වවිද්‍යාලය වන අතර නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලය අනෙක් විශ්වවිද්‍යාලයයි. මෙහි පළමු ගිවිසුමෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් ,පර්යේෂකයන් හා ඉගැන්වීම් ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම ඇතුළු ද්විපාර්ශ්වීය සම්බන්ධතා ඉලක්ක කොට ගත්තක් වන අතර දෙවන ගිවිසුමෙන් සැලසුම් කරන ලද්දේ පශු වෛද්‍ය විෂයමාලාව සංශෝධනය කිරීම හා කලාපීය ආයතනවලින් හා

OIE ට්විනිං වැඩසටහන යටතේ පවතින ඕස්ට්‍රේලියානු පශු වෛද්‍ය සභාවේ ප්‍රමිතිකරණ තත්ත්වය ලබා ගැනීමයි. මෙම ව්‍යාපෘතියට වර්ෂ පහක කාලයක් සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වනුයේ නවසීලන්ත රජයේ දේශීය කර්මාන්ත අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය විසිනි.

පහතින් දැක්වෙනුයේ කාර්ය මණ්ඩලය විසින් අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයන්ය.

- ශ්‍රී ලංකා වනජීවී සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කොටස්කරුවෙකු වන පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය දෙවන වසරටත් සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව පවත්වාගෙන යෑමට සමත්විය. මෙය ශ්‍රී ලංකාවේ වනජීව හා මානව සෞඛ්‍ය පිළිබඳ විශිෂ්ටතා පර්යේෂණ ගොඩනැගීම සඳහා කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදානයකි.
- පර්යේෂණ වාණිජකරණය අරමුණු කොට ගෙන HETC-QIG Window-2 ව්‍යාපෘතියෙන් තරඟකාරී ප්‍රදාන අඛණ්ඩව දෙවන වරටත් ලබා ගැනීමට පීඨය සමත් විය.
- ප්‍රථම උපාධි විෂයමාලාව වැඩි දියුණු කිරීම අරමුණු කොට ගෙන HETC-QIG Window-4 ව්‍යාපෘතියෙන් තරඟකාරී ප්‍රදාන අඛණ්ඩව දෙවන වරටත් ලබා ගැනීමට පීඨය සමත් විය.
- වෛද්‍ය රුවිකා ප්‍රනාන්දු හා වෛද්‍ය සමන්තිකා ජාගොඩ පිළිවෙලින් ඇමෙරිකාවේ හා ජපානයේදී ඔවුන්ගේ දර්ශනශූරී උපාධියේ අධ්‍යයන කටයුතු අවසන් කොට නැවත පීඨයට පැමිණ සිටී.
- ලන්ඩන් විශ්වවිද්‍යාලයේ රාජකීය පශු වෛද්‍ය විද්‍යාලයෙන් පශු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ලබාගත් අපේක්ෂකයන් දෙදෙනෙකු ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන අවසන් කළහ.
- ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන දියුණු කිරීම සඳහා ජාතික පර්යේෂණ සභාවෙන් මෙගා ප්‍රදාන ලබා ගත් පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයන් අතර වෛද්‍ය බැසිල් ඇලෙක්සැන්ඩර් හා වෛද්‍ය එරන්ද ඉන්ද්‍රජිත් ද වෙති.
- වෛද්‍ය බැසිල් ඇලෙක්සැන්ඩර් හා වෛද්‍ය සම්පත් ලොකුගලප්පත්ති අන්තරායට පත් දේශීය ගොවිපල සතුන් බෝ කිරීම සඳහා සංරක්ෂණ උපක්‍රම අධ්‍යයනය කිරීම පිණිස IAEA වෙතින් පර්යේෂණ ප්‍රදානයක් ලබා ගත්හ.
- මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ සහ සහයෝගිතාකරුවන් ඉන්දියානු පර්යේෂණ සභාවෙන් සිව් අවුරුදු පර්යේෂණ ව්‍යාපෘතියක් ලබා ගත්හ. මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ විෂ සහිත සර්පයන්ගේ අණුක ජාන හා විෂ සංයුතියේ කලාපීය විවිධත්වය අධ්‍යයනය කෙරේ.

**බාධක හා පිළියම්**

සුදුසුකම් සහිත අපේක්ෂකයන් ඉල්ලුම් නොකිරීම නිසාවෙන් සමහර අධ්‍යයන දෙපාර්තමේන්තුවල පවතින අධ්‍යයන පුරප්පාඩු පිරවීමට නොහැකි සීමිත විද්‍යාගාර හා සායනික පහසුකම් හේතුවෙන් බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 100 දක්වා වැඩි කිරීම අසාර්ථක විය.



**අනාගත සැලසුම්**

**යටිතල පහසුකම් සංවර්ධනය :**

- ප්‍රධාන සැලසුමෙන් යෝජිත පරිදි සත්ව ශික්ෂණ රෝහල විශාල කිරීමට හා ඊට නව පහසුකම් එකතු කිරීම සඳහා යෝජනාවක් සකස් කොට විශ්වවිද්‍යාලයට බාර දෙන ලදි.
- පශු ශික්ෂණ රෝහලට රෝග හඳුනා ගැනීමේ සේවාවන් ලබාදීම පිණිස පශු ශික්ෂණ රෝහල සමීපයේ ව්‍යාධජීව විද්‍යා අධ්‍යයන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළව සැලසුම් සකස් කෙරෙමින් පවතී.

**අධ්‍යයන වැඩසටහන :**

- නවසීලන්තයේ මාසේ විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව විෂයමාලා සංශෝධනයක් සිදුකෙරෙමින් පවතී. මෙම සංශෝධනය තුළින් පවතින විෂය මාලාව ප්‍රතිඵල පදනම් කර ගත් ශිෂ්‍ය කේන්ද්‍රීය විෂයමාලාවක් බිහිකිරීම හා OIE විසින් ලබා දුන් මාර්ගෝපදේශවලට අනුගතවීම අපේක්ෂිතයි.

- පශු වෛද්‍ය විද්‍යාපති වැඩසටහනේ විෂය මාලාව ද සංශෝධනය කෙරෙමින් පවතී. මේ නිසා සිසුන්ට පශු වෛද්‍ය විද්‍යාවේදි, පශු විද්‍යාපති, පශු වෛද්‍ය දර්ශනපති හා දර්ශනශූරී මට්ටමින් ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන් අවසන් කිරීමට හැකිවනු ඇත.



# A9 පශ්චාත් උපාධි ආයතන

## A9.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA)

(අධ්‍යක්ෂ, මහාචාර්ය එස්. සමිත විසින් වාර්තා කරන ලද පරිදි )



**හැඳින්වීම**

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 09 දරණ පනතට අනුව පශ්චාත් උපාධි අධ්‍යාපනයේ මෙරට එකම හා ප්‍රථම ආයතනය ලෙස 1975 වසරේදී ස්ථාපිත කරන ලද අතර කළමනාකරණ මණ්ඩලයක මඟ පෙන්වීම යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය නිර්මාණය කිරීමේ මුඛ්‍ය අරමුණ වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය වෙනුවෙන් දේශීය අවස්ථාවන් සංවර්ධනය කිරීම සහ මෙරට සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ආකාරයෙන් පුහුණු කරන ලද විද්‍යාත්මක පුද්ගලයන් බිහි කිරීමත්ය. මෙම ආයතනය මෙකී ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් ශත වර්ෂ කාර්තුවක පමණ කාලයක් සේවය කොට ඇති අතර මෙරට මෙන්ම කලාපයේ ද පශ්චාත් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ට ගණයේ මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත.

පසුගිය වර්ෂ 89ක කාලයක් පුරා මෙම ආයතනය සිසුන් ලියාපදිංචි කරගැනීමෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. 2014 වසරේදි විවිධ අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන් 471 දෙනෙකු ලියාපදිංචි කොට ඇත. විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලනපති, දශනපති හා දර්ශනශූරි උපාධි සඳහා පිළිවෙළින් සිසුන් 362, 45, 40 හා 21 දෙනෙකු ලියාපදිංචි වී සිටිති.

එම වසරේම සිසුන් 345 දෙනෙකු ඔවුන්ගේ උපාධි හා ඩිප්ලෝමා වැඩසටහන් අවසන් කළහ. ඔවුන් අතරින් 297ක් විද්‍යාපති උපාධි ද, 16 ක් දර්ශනපති, පස් දෙනෙකු දර්ශනශූරි උපාධි ද, 27 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ගත්හ.

මේ වනවිට පිරිනමනු ලබන විද්‍යාපති උපාධි පාඨමාලා 29ට අමතරව කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමාලෝචිත වර්ෂයේදි බෝග විද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ වැවිලි කළමනාකරණය හා උද්‍යාන විද්‍යාව පිළිබඳ නව විද්‍යාපති උපාධි දෙකක් හඳුන්වා දෙන ලදි.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාවට පශු වෛද්‍ය හා සත්ව විද්‍යා, කලා, විද්‍යා, වෛද්‍ය ආදි පීඨ ඇතුළත් සියළුම පීඨවල උපාධිධාරීන් හා විදෙස් සිසුන් ද ඇතුළත් වේ. බංග්ලාදේශය, ඉන්දියාව, චීනය, නේපාලය, මියැන්මාරය, ඕමානය, ගහනාව යන රටවලින් එම ආයතනයට පැමිණි සිසුන් ඔවුන්ගේ පශ්චාත් උපාධි මේ වනවිටත් අවසන් කොට ඇත.

පශ්චාත් උපාධි වැඩසටහන්වලට අමතරව කෙටි පාඨමාලා 12ක්, වැඩමුළු හා විශේෂ සම්මන්ත්‍රණ දෙකක් ද 2014 වසරේදී පවත්වන ලදි.

**නව පත්වීම් / සේවක තනතුරු**

මහාචාර්ය කොලින් එන්. පීරිස් 2014 මැයි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වී කොළඹ හොරිෂන් මණ්ඩපයේ උපකුලපති තනතුර බාර ගත්තේය. කෘෂිවිද්‍යා පීඨයේ කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශයේ මහාචාර්ය බී.ඒ.එන්. ධර්මසේන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව අධ්‍යක්ෂවරයෙකු පත්කරන තෙක් මෙම ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ තනතුරට පත් කරන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයෙහි බෝග විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. සමිත කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 8 වැනි අධ්‍යක්ෂ ලෙස 2014 අගොස්තු 04 වැනි දින පත් කරන ලදි.

ස්ථිර සේවක තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම ආයතනයේ නිර්දේශ මත කම්කරුවන් තිදෙනෙකු හා ලඝුලේඛිකාවක් විශ්වවිද්‍යාලය විසින් පත් කරන ලදි.

**ජයග්‍රහණ**

අවුරුදු පහක කාලයකට පසුව විගණකාධිපති වෙත බාර දුන් අවසන් ගිණුම් සඳහා සතුටුදායක විගණන මතයක් ලබා ගැනීමට කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට හැකි විය.

**කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධි විදේශයන්ට පිරිනැමීම - ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය - ඝානාව**

ඝනාවේ යෙෂුආ තාක්ෂණ ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම යටතේ ජෛව සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය විදේශයන්ට පිරිනැමීම අදාළ අධ්‍යයන මණ්ඩල විසින් 2014 වසරේස දියත් කරන ලදි. මේ සඳහා සම්බන්ධ වන සම්පත්දායකයන්ගෙන් බහුතර පිරිස කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් වන අතර කිහිප දෙනෙක් යෙෂුආ ආයතනයෙන් සම්බන්ධ වේ. මෙම උපාධිය සඳහා ප්‍රථම සිසු කණ්ඩායම ඝනාවෙන් බඳවා ගත් අතර ඉදිරියේදී තදාසන්න රටවල සිසුන් ද ඇතුළත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. අප්‍රිකානු කලාපයේ පිළිගත් ප්‍රථම ශ්‍රී ලාංකික උපාධිය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාපති උපාධියයි.

**කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධි නිබන්ධන මාර්ගගත කෙරේ.**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරීන් විසින් පවත්වන ලද මුල් පර්යේෂණ එම ආයතනයේ උපාධි නිබන්ධන එකතුවෙන් පිළිඹිබු කෙරේ. ආයතනික තොරතුරු සුරක්ෂිතාගාරයක් ගොඩනැගීමේ මූලික අරමුණ සහිතව ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය යටතේ මෙම ආයතනයේ උපාධි නිබන්ධන ඩිජිටල්ගත කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් තෝරා ගෙන ඇත.

මෙම කාර්යය යටතේ 1979 වසරේ සිට 2014 වසර දක්වා පුස්තකාලයට ලැබුණ දර්ශනපති හා දර්ශනශූරි උපාධි නිබන්ධන
476 ක් හා ව්‍යාපාර පරිපාලනපති උපාධි නිබන්ධන 94 ක් විද්‍යුත් ක්‍රමයට ස්කෑන් කොට 2014 ඔක්තෝබර් මස කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියට **(www.pgia.ac.lk)** මුදාහරින ලදි. මෙතුළින් මේ දක්වා ආයතනික තොරතුරු ලබා ගැනීමට පැවති බාධක ඉවත්වී තොරතුරු නිදහසේ ලබා ගත හැකි වනු ඇත.

**කෘෂිවිද්‍යා පුස්තකාලයේ විද්‍යුත් සංසරණ පද්ධතියේ සමාරම්භය**

කෘෂිවිද්‍යා පුස්තකාලයේ විද්‍යුත් සංසරණ පද්ධතිය 2014-11-13 වැනි දින ආරම්භ කරන ලදි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා සිසුන් සහභාගි වූ මෙම අවස්ථාවට කෘෂි විද්‍යා පීඨයේ පීඨාධිපති හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය එස්. සමිත යන මහත්වරුන් සහභාගි වූහ. මෙම විද්‍යුත් සංසරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ වාසි ගෙනහැර දක්වමින් හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති අයි. මුදන්නායක මහත්මිය කථාවක් පැවැත්වූවාය. මෙහිදී ඈ සඳහන් කළේ පවතින මැනුවල් ක්‍රමයට වඩා මෙම ක්‍රමය තුළින් පුස්තකාලයේ සංසරණ ක්‍රියාවලිය මහත් කාර්යක්ෂමතාවයකින් යුතුව කළමනාකරණය කළ හැකි බවයි.

**අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජර්මනියේ ග්ලෝබල් ක්‍රොප් ඩයිවර්සිටි ට්‍රස්ට් ආයතනය හා ස්පාඤ්ඤයේ යුනිවර්සිටි පොලිටෙක්නිකා ඩි වැලෙන්සියා ආයතනය අතර ගිවිසුම් අත්සන් කර ලදි. මෙම ව්‍යාපෘතියෙන් විශේෂයෙන්ම ගිණිකොන දිග ආසියාව බටහිර අප්‍රිකාව පිළිබඳව විශේෂ සැලකිල්ලකින් යුතුව කාලගුණ විපර්යාසයට ඔරොත්තු දීමේ වැඩපිළිවෙළක් පිළිබඳව අවධානය යොමු කරයි. ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2014 ජනවාරි මස සිට ආරම්භ කොට 2016 දෙසැම්බර් වනවිට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති හා දර්ශනශූරී පර්යේෂණ වැඩ කිහිපයකට ද මෙම ව්‍යාපෘතිය අනුග්‍රහය දක්වයි.

**පහසුකම්**

සිසුන් ඇතුළත් කර ගැනීමේ කටයුතු, ශිෂ්‍ය තොරතුරු හා පරිපාලන කටයුතු ඇතුළත්ව කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සියලුම කාර්යයන් ස්වයංක්‍රීය කිරීම සඳහා පියවර ගෙන ඇත. මෙම ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව සිසුන්ගෙන් ප්‍රතිපෝෂණයක් online හරහා ලබා ගැනීම සඳහා පද්ධතියක් හඳුන්වා දී ඇත. සියලුම වර්තමාන සිසුන්ගේ හා ආචාර්ය මණ්ඩලයේ විද්‍යුත් තැපැල් ලිපිනයන් පහසු ප්‍රවේශය සඳහා සංගෘහිත කිරීමේ කටයුතු අවසන් කරන ලදි.

ආයතනයේ කාර්ය මණ්ඩලයේ කාන්තාවන්ට හා ශිෂ්‍යාවන්ගේ පරිහරණය සඳහා වෙනම ඒකකයක් එකතු කොට පරණ ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු අවසන් කරන ලදි.

ආයතනය විසින් පිරිනමනු ලබන සියලුම උපාධි සඳහා වන ගාස්තු ව්‍යුහය සංශෝධනය කොට ඉහළ දමන ලදි. මහජන බැංකුව සමඟ සහයෝගිතාවයෙන් නවක සිසුන් සඳහා ණය පහසුකමක් හඳුන්වා දී ඇත. සිසුන්ට ඔවුන්ගේ පාඨමාලා ගාස්තු එකවර ගෙවනවා වෙනුවට දෙවරකදී ගෙවීමට හැකිවන පරිදි ගෙවීම් ක්‍රමය පුළුල් කරන ලදි.

ආයතනයේ කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ පරිහරණය සඳහා නව පරිගණක විශාල ප්‍රමාණයක් ලබාගෙන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පහසුකම් ඉහළනංවන ලදි.

**2014 වාර්ෂික සමුළුව**

පවුල් ගොවිතැන පිළිබඳ ජාත්‍යන්තර දිනය සැමරීම සඳහා ගොවියා, පවුල හා ආහාර සුරක්ෂිතතාව යන තේමාව යටතේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 26 වැනි වාර්ෂික සමුළුව 2014 නොවැම්බර් 20, 21 දිනවල පවත්වන ලදි. පර්යේෂණ පත්‍ර 108ක් ලැබුණු අතර පූර්ණ පර්යේෂණ පත්‍ර 49ක් කලාප හතරකින් නිකුත් වන සර්මකලාපීය කෘෂිකර්ම පර්යේෂණ වෙළුම 26 වාර සඟරාවේ පළ කිරීම සඳහා පිළිගන්නා ලදි. ඉන්දුනිසියාවේ ජාකර්තා නුවර ආර්ථික පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ආචාර්ය වෙන්කටචාලම් අංබුමොෂි කැන්බරාවේ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අවන් අට්කින් සහ ඇමෙරිකාවේ අයොවා රාජ්‍ය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඩොං උක් අහන් යන අයගේ ආරාධිත ඉදිරිපත් කිරීම්වලින් මෙම සමුළුව සුපෝෂණය විය. නැගෙනහිර හා ගිනිකොණ දිග ආසියාවේ කලාපීය නියෝජිත ආචාර්ය ස්ටිවන් ජේ . ස්ටාල් මෙම සමුළුවේ ප්‍රධාන අමුත්තා වූ අතර, මෙවර මෙම සමුළුවට අනුග්‍රහය දක්වන ලද්දේ ජාත්‍යන්තර පශු සම්පත් පර්යේෂණ ආයතනයයි.

**බාධක සහ පිළියම්**

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකා යෝග්‍යතා ආකෘතිය පිළිගැනීමට කටයුතු කළද පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් එය අනුමත නොකිරීම හේතුවෙන් තාවකාලිකව අතහැර දමන ලදි.

**අනාගත සැලසුම් - කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කොළඹ ශාඛාව**

මෙම ආයතනයේ ශාඛාවක් කොළඹ ස්ථාපිත කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් අනුමැතිය ලබාදී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු එම කාර්යය ඉටු කෙරෙනු ඇත. මෙතුළින් මහජනතාවට කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ වැඩි වැඩියෙන් සම්බන්ධව කටයුතු කිරීමට මංපෙත් විවර වනු ඇත.

## 1. සිසුන් හා සම්පත් පිළිබඳ විස්තර - 2014 :

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩල බෙදී යෑම (ස්ථිර පමණි) අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | එකතුව |
|---|---|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 471 | 02 | 42 | 01 | 45 |
| විද්‍යාපති | | | | | |
| ව්‍යාපාර පරිපාලනපති | | | | | |
| දර්ශනපති | | | | | |
| දර්ශනශූරී | | | | | |
| අනියම් | | | | | |
| **එකතුව** | **471** | **02** | **42** | **01** | **45** |

## 2. දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2014 :

| අධ්‍යයන වැඩ සටහන | බඳවා ගැනීම 2014 | බඳවා ගැනීම 2013 | උපාධි ලැබූ සංඛ්‍යාව 2014 * |
|---|---|---|---|
| 1. පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | 16 |
| 2. විද්‍යාපති | 362 | 328 | 265 |
| 3. ව්‍යාපාර පරිපාලනපති | 45 | 45 | 33 |
| 4. දර්ශනපති | 40 | 31 | 15 |
| 5. දර්ශනශූරී | 21 | 04 | 04 |
| 6. අනියම් | 03 | - | - |
| **එකතුව** | **471** | **408** | **317** |

* 2009 වසරේ සිට ලියාපදිංචි වී 2014 වසරේදී උපාධි ලැබූවන්, තවද අසමත් හෝ අදාළ විභාගයට පෙනී නොසිටි සිසුන්හට සමාලෝචිත වර්ෂයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා සෘජුවම පෙනී නොසිටිය ද ඔවුන්හට පශ්චාත් උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදි.

## 3. විදෙස් සිසුන් පිළිබඳ විස්තර - 2014 :

| අධ්‍යයන වැඩ සටහන | බඳවා ගැනීම 2014 | බඳවා ගැනීම 2013 | උපාධි ලැබූ සංඛ්‍යාව 2014 |
|---|---|---|---|
| 1. පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | |
| 2. විද්‍යාපති | 17 | 01 | 01 |
| 3. ව්‍යාපාර පරිපාලනපති | - | - | |
| 4. දර්ශනපති | - | 31 | |
| 5. දර්ශනශූරී | - | 02 | 01 |
| **එකතුව** | **17** | **03** | **02** |

සමාලෝචිත වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා ගහනාවේ යෙෂුආ තාක්ෂණික ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ විදෙස් අධ්‍යයන පාඨමාලා පිරිනැමීම දියත් කිරීමට ආයතනයට හැකි විය. ගිවිසුම යටතේ ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ව්‍යවහාර සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය හැදෑරීම සඳහා සිසුන් 16 දෙනෙකු ලියාපදිංචි වූහ. මෙතුළින් ආයතනය එහි මූලික ප්‍රධාන කාර්යයක් වන විදෙස් සිසුන් සංඛ්‍යාව වැඩිකර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගන්නා ලදී.

## 4. පර්යේෂණ, නව නිපැයුම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2014 :

| විෂය | ප්‍රකාශයට පත් කළ | වානිජකරණය කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ | -- | -- | 33*+12**+40*** |
| නව නිපැයුම් | -- | -- | -- |
| වාර සඟරා | 04 | 04 | 04 |
| ග්‍රන්ථ | 03 | 03 | 03 |
| ලිපි | -- | -- | -- |
| වෙනත් | -- | -- | -- |
| එකතුව | 07 | 07 | 38 |

**සටහන :**

* කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් උපාධි අවසන් කළ ව්‍යාපාර පරිපාලනපති සිසුන් විසින් කළ ඉදිරිපත් කිරීම්

** කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ශිෂ්‍යත්ව ලබා දුන් සිසුන් විසින් සිදුකළ පර්යේෂණවල ප්‍රගතිය පෙන්වීම සඳහා කළ ඉදිරිපත් කිරීම් (පර්යේෂණ පහසු කරවීමේ අරමුදල)

*** සමාලෝචිත වර්ෂයේදී දර්ශනපති හා දර්ශනශූරි උපාධි සඳහා ලියාපදිංචි වූ සිසුන් විසින් කළ යෝජිත ඉදිරිපත් කිරීම්

## 5. 2014 වසරේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු / දැනුවත් කිරීමේ වැඩ සටහන් පිළිබඳ විස්තර

| අංකය | කාර්යය/තේමාව | ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|---|
| 01 | පාංශු, පැළෑටි, ජලය හා කෘමිනාශක විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 30 | 17-21/02/14 |
| 02 | බහුවිධ දත්ත විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 53 | 24-26/02/14 |
| 03 | වාර්ෂික ආහාර බෝගයන්හි තත්ත්ව සහතික කළ බීජ නිෂ්පාදනය සඳහා තාක්ෂණික අත්‍යවශ්‍යතා | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 27 | 26-02/01-03/14 |
| 04 | බහු විධ දත්ත විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 53 | 10-12/03/14 |
| 05 | නායකත්ව පුහුණු වැඩ සටහන | කෘෂි ව්‍යාප්ති අධ්‍යයන මණ්ඩලය | 51 | 14-16/03/2014 |
| 06 | පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 24 | 28-30/04/14 |
| 07 | ගණනය සහ තරාතිරමේ දිනය විශ්ලේෂණය | ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලය | 39 | 23-26/09/14 |
| 08 | පැළෑටි ආරක්ෂණ ශිල්පීය ක්‍රම | පැළෑටි ආරක්ෂණ අධ්‍යයන මණ්ඩලය | 20 | 24-10/04-09/14 |
| 09 | තමාම සවිබල ගැන්වීම | පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘ. වි.ප. උ. ආයතනය සහ කා.ම. ස. මධ්‍යස්ථානය | 33 | 15-16/12/14 |

කෘ.වි.ප.උ.ආ. - කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කා.ම.සං.ම. - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
අ.ම. - අධ්‍යයන මණ්ඩලය

## A9.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(අධ්‍යක්ෂ, මහාචාර්ය එච්.එම්.ඩී. නාමල් ප්‍රියන්ත විසින් වාර්තා කරන ලද පරිදි)



### හැඳින්වීම

වර්තමානය වනවිට විද්‍යා ක්ෂේත්‍රයේ සිසුන් 1600කට පමණ සේවය සළසන ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ විද්‍යා අධ්‍යාපනය, පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අටියෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පනතක් මඟින් 1996 වසරේදී ස්ථාපිත කරන ලදි. උපාධිධාරී ශාස්ත්‍රීය පරිචයන් ඉහළ දමමින් විවිධ විද්‍යාත්මක අංශයන්හි පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කොට ලබාදීම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුඛ්‍ය පරමාර්ථයයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සේවාස්ථ පුහුණු වැඩසටහන්, කෙටි පාඨමාලා. වැඩමුළු ආදිය පවත්වන අතරෙහි විද්‍යාපති, දර්ශනපති, දර්ශනශූරී වැඩසටහන් මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාද පවත්වනු ලබයි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම වැඩසටහන් අධ්‍යයන මණ්ඩල 10ක් හරහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨය සමඟ සමීප සහයෝගිතාවයෙන් යුතුව පවත්වනු ලබයි. ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨ අටෙන් මෙන්ම වෙනත් විශ්වවිද්‍යාලවලින් හා ආයතනවලින් දායක කර ගැනේ. එමෙන්ම මෙම ආයතනය දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට මෙන්ම රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනවලටද උපදේශන සේවාවන් ලබා දෙනු ලබයි. Sandwich සහ සහයෝගිතා වැඩසටහන් ද ජාත්‍යන්තර ආයතන සමඟ සහසම්බන්ධ වී දියත් කරනු ලබන අතර වෙනත් රටවල පර්යේෂණ ආයතන සමඟ සහයෝගිතා තුළින් ජාත්‍යන්තර විශේෂ සම්මන්ත්‍රණ ද පැවැත්වේ. විද්‍යාත්මක ක්ෂේත්‍රයේ හා පර්යේෂණ කාර්යයෙහි ශ්‍රී ලංකාවේ හොඳම පශ්චාත් උපාධි ආයතනය බවට පත්වීමේ දැක්ම 2020 වනවිට සාක්ෂාත් කරගැනීමට විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අපේක්ෂා කරයි.

### විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාර සංවර්ධනය

ඉගැන්වීමේ/ පරිගණක/ පර්යේෂණ විද්‍යාගාර හයක් විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතුවේ. මෙම විද්‍යාගාර සියල්ලම 2014 වර්ෂයේදී ඉහළනැංවීමට පියවර ගෙන ඇත. ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

1. **විද්‍යා විෂයට අදාළ උපකරණ විද්‍යාගාරය** - 2014 වර්ෂයේදී මෙම විද්‍යාගාරයට අදාළ උපකරණ රාශියක් මිලදී ගන්නා ලදි. මෙම විද්‍යාගාරය 2015.01.02 වැනි දින ශිෂ්‍ය පරිහරණය සඳහා නිල වශයෙන් විවෘත කරනු ලබයි.

2. **GIS විද්‍යාගාරය :** GIS විද්‍යාගාරයේ පරිහරණය විශාල වශයෙන් ව්‍යාප්ත කරන ලදි. GIS & Remote Sensing විද්‍යාපති වැඩසටහන සඳහා මීළඟ ශිෂ්‍ය කණ්ඩායමට වාර්තාගත වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. කරුණු එසේ හෙයින් මූලිකව පරිගණක 25 මිලදීගෙන ඇති අතර අවශ්‍ය වුවහොත් තවත් මිලදී ගැනීමට කටයුතු කරමින් GIS විද්‍යාගාරය ව්‍යාප්ත කිරීම සඳහා මේ වනවිටත් කටයුතු සැලසුම් කොට ඇත.
3. **පරිගණක විද්‍යාගාරය I:** ප්‍රධාන පරිගණක විද්‍යාගාරය ඉහළනැංවීම සඳහා නව පරිගණක මිලදී ගන්නා ලදි.
4. **පරිගණක විද්‍යාගාරය II:** පළමු පරිගණක විද්‍යාගාරයේ අතිරික්ත පරිගණක දෙවන පරිගණක විද්‍යාගාරයට මාරු කොට (පරිගණක මිලදී ගැනීමෙන් පසු) ඇති අතර පරිගණක විද්‍යාගාර දෙකම මේ වනවිට ක්‍රියාත්මක වේ.
5. **රසායන විද්‍යාගාරය :** විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව හා පරිසර විද්‍යා විද්‍යාපති පාඨමාලාව සඳහා විද්‍යාගාර ආශ්‍රිත පංති සුමටව කරගෙන යෑම සඳහා වීදුරු භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ මිලදී ගන්නා ලදි.
6. පාෂාණ හා පාංශු යාන්ත්‍රික විද්‍යාගාරය : 2015 වසරේදී මෙම විද්‍යාගාරය සංවර්ධනය කෙරෙනු ඇත. මෙය සංවර්ධනය කළ පසු ඉංජිනේරු භූගර්භ විද්‍යා හා ජල විද්‍යා විද්‍යාපති වැඩ සටහනේ විද්‍යාගාර පංති පැවැත්වීමට හා ජනතා සේවය ලබාදීම සඳහා පරිහරණය කෙරෙනු ඇත.

**අනාගත සැලසුම්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැක්ම සහ මෙහෙවරට අනුව ඉදිරි වර්ෂ කිහිපය සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කොට ඇත. (මේ පිළිබඳ විස්තර සංයුක්ත සැලැස්මේ හා ප්‍රධාන සැලැස්මෙහි දක්වා ඇත) මෙම සැලසුම්වලට පහත සඳහන් කටයුතු ඇතුළත් වේ.

- ඉහත විද්‍යාගාරයන් තවදුරටත් සංවර්ධනය කිරීම. විශේෂයෙන්ම ආම්පන්න විද්‍යාගාරය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පුළුල් කිරීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේදි හා මෙම ආයතනයේ නිල උත්සව අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා කොඩියක් සැලසුම් කිරීම. (මේ සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව මේ වනවිට අනුමැතිය ලබා දී ඇත.)
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පූර්ණ කාලීන පර්යේෂණ සිසුන්ට නවාතැන් පහසුකම් සැපයීම සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම.
- ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානයක්, ආපන ශාලාවක්, කාර්ය මණ්ඩලය සඳහා කාමරයක්, සාකච්ඡා කාමරයක්, කියවීම් කාමර, සම්මන්ත්‍රණ ශාලාවක්, විද්‍යාගාර ආදිය පිහිටුවීම සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම
- විද්‍යාපති, දර්ශනපති හා දර්ශනශූරී සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම
- ජාතියේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉල්ලුමට සරිලන පරිදි විද්‍යාපති වැඩසටහන් හඳුන්වාදීම

1. **දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2014**

| අධ්‍යයන වැඩසටහන් | නව ලියාපදිංචිය | | | | | උපාධි ලැබූ සංඛ්‍යාව 2014*** |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 36 | 33 | 22 | 36 | | 104 |
| විද්‍යාපති | 357 | 377 | 73 | 396 | 300 | 154 |
| ව්‍යාපාර පරිපාලනපති | | | | | | |
| දර්ශනපති | 36 | 30 | 38 | 46 | 21 | 17 |
| දර්ශනශූරී** | 10 ** | 01 | 02 | 04 | 04 | 04 |
| අනියම් | - | - | - | - | - | - |

** දර්ශනපති උපාධියේ සිට දර්ශනශූරී දක්වා ඉහළනැංවීම

*** 2014.01.01 සිට 2014.12.31 දක්වා උපාධි ලැබූ පිරිස

## 2. විදෙස් සිසුන් පිළිබඳ විස්තර - 2014

| අධ්‍යයන වැඩසටහන | බඳවා ගැනීම 2014 | බඳවා ගැනීම 2013 | උපාධි ලැබූ සංඛ්‍යාව 2014 |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| විද්‍යාපති | 02 | 03 | 01 |
| ව්‍යාපාර පරිපාලනපති | - | - | - |
| දර්ශනපති | - | - | - |
| දර්ශනශූරී | - | - | - |
| අනියම් | - | - | - |

*** 2014 වසරේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් හා කෙටි පාඨමාලා පිළිබඳ විස්තර**

## 3. විදෙස් සිසුන් පිළිබඳ විස්තර

| අංකය | කාර්යය/තේමාව | ආයතනය | දිනය/දින | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | SPSS යොදාගෙන පර්යේෂණ ක්‍රම හා දත්ත විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජනවාරි 2, 16 සහ 23 | 25 |
| 2 | විද්‍යාත්මක රචනය පිළිබඳ තෙවැනි ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජනවාරි 30 - 31 | 70 |
| 3 | GIS හා එහි යෙදුම පිළිබඳ 55 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පෙබරවාරි 17 - 22 | 29 |
| 4 | දත්ත කළමනාකරණය, විශ්ලේෂණය හා අර්ථකථනය දැක්වීම පිළිබඳ ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පෙබරවාරි 20 - 21 | 62 |
| 5 | GIS හා එහි යෙදුම පිළිබඳ 16 වැනි උසස් කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මාර්තු 3 - 8 | 20 |
| 6 | විද්‍යාත්මක ලේඛනය පිළිබඳ සිව්වැනි ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මාර්තු 6 - 7 | 77 |
| 7 | ආපදා Resilient නායකත්වය පිළිබඳ ප්‍රථම කලාපීය පුහුණු පාඨමාලාව (අර්ල් රීජන්සි හෝටලය) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය., BMGF, TU, DRLA හා ADPC* | මාර්තු 17 - 21 | 37 |
| 8 | GIS හා එහි යෙදුම පිළිබඳ 56 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මාර්තු 31 - අප්‍රේල් 05 | 29 |
| 9 | GIS හා එහි යෙදුම පිළිබඳ 57 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | අප්‍රේල් 21 - 26 | 26 |
| 10 | GIS හා එහි යෙදුම පිළිබඳ 17 වැනි උසස් පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජූනි 23 - 28 | 13 |
| 11 | ආපදා Resilient නායකත්වය පිළිබඳ දෙවැනි කලාපීය පුහුණු පාඨමාලාව (අර්ල් රීජන්සි හෝටලය) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, BMGF, TU, DRLA හා ADPC* | ජූලි 7 - 12 | 35 |
| 12 | බිම්මල් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජූලි 18 | 28 |
| 13 | GIS හා එහි යෙදුම පිළිබඳ 58 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජූලි 28 - අගෝස්තු 2 | 20 |
| 14 | SC/ISO 1400 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ | අගෝස්තු 23 - | 143 |

| | | | | |
|---|---|---|---|---|
| | | පාරිසර අධ්‍යයන මධ්‍යස්ථානය | 24 | |
| 15 | මානව සම්පත් කළමනාකරණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය | අගෝස්තු 30 - 31 | 151 |
| 16 | මානව සම්පත් කළමනාකරණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය | සැප්තැම්බර් 13 - 14 | 154 |
| 17 | උද්‍යාන විද්‍යා පුරා විද්‍යාව පිළිබඳ GIS පුහුණු වැඩසටහන | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ඔක්තෝබර් 3, 6 - 9 | 35 |
| 18 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සැසිය - 2014 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය, ඇනලිටිකල් ඉන්ස්ට්‍රුමන්ට්, ටෙක්නෝ ඉන්ස්ට්‍රුමන්ට් (පුද්.) සමාගම, බිටුමික්ස් (පුද්.) සමාගම සහ මහජන බැංකුව | ඔක්තෝබර් 10 - 11 | 264 |
| 19 | පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව පිළිබඳ SAARC පුහුණු වැඩ සටහන | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ආ.ක.ම. සහ SAARC-ආ.ක.ම. | ඔක්තෝබර් 13 - 17 | 36 |
| 20 | පැලෑටි ආරක්ෂණ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ඔක්තෝබර් 31 | 23 |
| 21 | ඓන්ද්‍රිය රසායන විද්‍යාව පිළිබඳ උසස් පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නොවැ. 8 - මැයි 2015 | 18 |
| 22 | "ආහාර අවදානම් සිතියම්කරණය, මොඩලින්ග් හා කළමනාකරණය සඳහා පෘතුවි නිරීක්ෂණ තාක්ෂණයන්" පිළිබඳ ජාතික සක්‍යතාවය ගොඩනැගීමේ වැඩමුළුව | ජා.ජ.ක. ආයත UN-SPIDER/UNOOSA, ආ.ක.ම හා වි.ප.උ.ආ. | නොවැ. 18 - 21 | 25 |
| 23 | GIS හා එහි යෙදුම පිළිබඳ 59 වැනි කෙටි පාඨමාලාව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දෙසැ. 1 - 6 | 19 |
| 24 | විද්‍යාත්මක ලේඛනය පිළිබඳ 5 වැනි ජාතික වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දෙසැ.4 - 5 | 80 |
| 25 | විද්‍යුත් රසායන ජල පිරිපහදුව පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ජා.වි. පදනම ස්වීඩනය | දෙසැ. 12 | 54 |
| 26 | බුද්ධිමය දේපල සහ පේටන්ට් පිළිබඳ වැඩමුළුව | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල සංවිධානය | දෙසැ. 19 | 66 |

## 4. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2014 වසරේදී සත්කාරකත්වය දරන ලද ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු පිළිබඳ විස්තර

| අංකය | කාර්ය/තේමාව | සංවිධානය කළ (පීඨය/අ.අංශය/මධ්‍යස්ථානය/ඒකකය) | දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ජලයේ ගුණාත්මක බව හා මානව සෞඛ්‍ය : ඉදිරි අභියෝග පිළිබඳ 3 වැනි ජාත්‍යන්තර විශේෂ සම්මන්ත්‍රණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය හා ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය / ප්ලැන් ශ්‍රී ලංකා හා ඉන්දියාවේ CAFET INNOVA ටෙක්නිකල් සොසයිටි | ජූනි 27 - 28 | 102 |

## උපග්‍රන්ථය B – විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථාන

### B1 කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය ප්‍රදීප් සී.ජී බණ්ඩාරනායක විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පීඨයේ කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ පර්යේෂණ පහසු කරවීම හා ශක්තිමත් කිරීමත් හැකියාවන් ගොඩනැගීම හා අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණ විද්‍යාව යොදා ගනිමින් වෙළඳපොළට ඉදිරිපත් කළ හැකි නිෂ්පාදන උත්පාදනය කිරීමත් සඳහායි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ජෛව තාක්ෂණය සඳහා කැපවී සිටින මෙරට එකම ආයතනය කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය බව මෙහිදී සඳහන් කිරීම වැදගත්වේ. මෙම මධ්‍යස්ථානය කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ හා පූර්ණ කාලීන අධ්‍යක්ෂවරයෙකුගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ. මෙහි අධ්‍යක්ෂවරයා වනුයේ ද එම පීඨයේම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය ජෛව තාක්ෂණය හා ඒ හා සම්බන්ධ වූ වැඩසටහන්වලට දායකවීම පිණිස පර්යේෂණ, විද්‍යාත්මක ප්‍රජාව. පර්යේෂණ ආයතන පර්යේෂණ විද්‍යාගාර හා පුද්ගලික අංශය සමඟ සබඳතා ගොඩනගා ගැනීම පිණිස බහු ක්ෂේත්‍ර පරිසරයක් ලබා දෙනු ලබයි. මෙම මධ්‍යස්ථානය ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ නවීනතම ශිල්පීය ක්‍රම පිළිබඳව කුසලතාවන් දියුණු කර ගැනීම සඳහා විද්‍යාත්මක ප්‍රජාවට වැඩමුළු, පුහුණු වැඩසටහන් හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව ද ලබා දෙයි. කෘෂි ජෛව තාක්ෂණ ආයතනයේ අනාගතය ඉතා පැහැපත් වන අතර අනෙකුත් ඉලක්කයන් අතර මෙරට හා කලාපයේ වර්ධනය වෙමින් පවතින ඉල්ලුමට සරිලන පරිදි අපගේ පර්යේෂණ හා පුහුණු පහසුකම් පුළුල් කිරීමට ද අප බලාපොරොත්තුවෙන් සිටිමු. එමෙන්ම අප සමාජයේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහළනැංවීම උදෙසා ගුණාත්මක අධ්‍යයන වැඩසටහන් මෙන්ම වෙළඳ පොලට ඉදිරිපත් කළ හැකි නිෂ්පාදන සංවර්ධනය කෙරෙන අපගේ අපේක්ෂිත ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කැපවී සිටින බව ද සහතික කරමු.

වර්තමානය වනවිට දර්ශනශූරී සිසුන් පස් දෙනෙකු හා එක් දර්ශනපති සිසුවෙකු මෙම මධ්‍යස්ථානයේ විද්‍යාගාරයන්හි ඔවුන්ගේ පර්යේෂණ කටයුතුවල නියැලී සිටිති. මෙම වසරේදී ප්‍රථම උපාධි අවසන් වසරේ සිසුන් සිව් දෙනෙකු ව්‍යාපෘතිවලට අදාළ කටයුතු මෙම මධස්ථානයේදී සිදුකළහ.

**ජයග්‍රහණ**

**සහතික පත්‍ර පාඨමාලා**

**1. අණුක ජීව විද්‍යාවේ මූලික ශිල්පීය ක්‍රම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය හා කෘෂිවිද්‍යා පීඨයේ ජීව විද්‍යා සංසදය විසින් එක්ව සංවිධානය කරන ලදි. මෙම පාඨමාලාව තුළින් DNA නිස්සාරණය හා ප්‍රමාණීකරණය (පැලෑටි, බැක්ටීරියා හා රුධිරයෙන්) polymerase chain reaction, ඇගරෝස් ජෙල් විද්‍යුතාගමනය සහ දත්ත විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද ලබා දෙනු ලබයි. 2014 වසරේ මාර්තු 29-30 හා අප්‍රේල් පස්වැනි දින මෙය පවත්වන ලද අතර ඒ සඳහා සිසුන් 29 දෙනෙකු සහභාගි වූහ.

**2. අණුක චිකිත්සාව පිළිබඳ කෙටි පාඨමාලාව**

අණුක චිකිත්සාව පිළිබඳ කෙටි පාඨමාලාව 2014 වසරේ නොවැම්බර් 17 සිට 19 වැනි දින දක්වා පවත්වන ලදි. මේ සඳහා විශ්වවිද්‍යාල උගතුන්, රජයේ පර්යේෂණ ආයතනවලින් හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පර්යේෂණ නිලධාරින් හා පර්යේෂණ සහයකයන් 23 දෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සහභාගි වූහ. මෙම පාඨමාලාව න්‍යාත්මක පැය හයකින් හා ප්‍රායෝගික පැය 18 කින්

යුක්ත විය. මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය බ්‍රැඩ්ඩේ, ආචාර්ය ඉවැන්ජලින් අලෝසිල්ජා, ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක, ආචාර්ය දේවිකා කොස්තා දේශන පැවැත්වූ අතර, මහාචාර්ය ප්‍රොබ්බ්‍රැඩ්ඩේ හා ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක ප්‍රායෝගික සැසි පැවැත්වූහ.

**පර්යේෂණ :**

**1. පෙර වර්ෂයේ සිට අඛණ්ඩව පැවැත්වූ පර්යේෂණ ප්‍රදාන**

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවෙන් (මුදල රුපියල් 14,592,054.00, කාලය : වර්ෂ 3, සැලසුම් කළ පශ්චාත් උපාධි, දර්ශනශූරී උපාධි 02)
**තේමාව :** ශ්‍රී ලංකාවේ දෙළුම් වගාව ප්‍රචලිත කිරීම සඳහා දෙළුම්වල අණුක හා ජෛව රසායන වර්ගීකරණය සහ විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ ප්‍රධාන ජානවල පෙනුම හා ඒවා වැඩෙන අවධීන් විශ්ලේෂණය කිරීම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයෙන් (මුදල රුපියල් 2500000, කාලය අවුරුදු 3 ,සැලසුම් කළ පශ්චාත් උපාධි : දර්ශනශූරී උපාධි 01යි.)

**තේමාව :** වී වගාවේදී ජල හිඟය මඟහැරවීම සඳහා දේශීය වී වර්ගයක (Oryza rhizomatis Vaughan) ජාන සම්පත් තක්සේරු කිරීම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් (මුදල රුපියල් 500000/- කාලය අවුරුද්දයි)

**තේමාව :** පැළෑටිවල "පරපෝෂිතතා යාන්ත්‍රණය අධ්‍යයනය කිරීම"

**1. අත්සන් කළ අවබෝධතා ගිවිසුම් හා ලද විදෙස් අරමුදල් - පසුගිය වසරේ සිට කරගෙන එන**

"Evolutionary Gain And Loss Of Function In Parasitic Plant Genomes" සහයෝගිතා ව්‍යාපෘතියකි

අනුප්‍රදානය : අංක 201223330-01
අනුලාභියා : පී.අයි. ප්‍රදීපා, සී.ජී බණ්ඩාරනායක
මෙම කාර්යයට ලද මුදල : ඇ.ඩො. 10,000
කාල පරිච්ඡේදය : 2013/01/08 – 2016/07/31
තේමාව :"Evolutionary Gain And Loss Of Function In Parasitic Plant Genomes"
ප්‍රධාන අනුග්‍රාහක : ජාතික විද්‍යා පදනම
ප්‍රදානය : #IQS-1238057
යූ.සී. ඩේවිස් PI:ජෝන් යොදර්

**සම්මන්ත්‍රණ:**

කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම අධ්‍යාපන ඒකකය, කෘෂිවිද්‍යා පීඨය ශිෂ්‍ය සුබ සාධන හා උපදේශන කමිටුව සමඟ එක්ව මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයෙහි උපාධි අධ්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. දිනය : නොවැම්බර් 18 වේලාව : ප.ව. : **5.15-7.00**
**ස්ථානය : පේරාදෙණිය විශ්වවිද්‍යාල සභා ශාලාව**
**සම්පත්දායක : මහාචාර්ය බ්‍රැඩ්ඩේ . ඔහු මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ උපාධි කමිටුවේ සභාපතිවරයායි.**

**බාධක සහ පිළියම්**

ප්‍රතිසංස්කරණ කටයුතු හැර අනෙක් සියලු කාර්යයන් සැලසුම් කළ පරිදි සිදුවිය.

**අනාගත සැලසුම්**

දෙස් විදෙස් සහයෝගිතාකරුවන් සමඟ වඩා වැඩි සහයෝගිතා පර්යේෂණ කාර්යයන් සිදුකිරීම. පුද්ගලික අංශයේ ලංකෙම් සමාගම සමඟ වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා (concept paper) සංකල්ප පත්‍රයක් බාර දෙන ලදි. කෘෂිවිද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් බාරදුන් ජාතික විද්‍යා පදනමේ අරමුදල් ලබන ව්‍යාපෘති දෙකක් පිළිගෙන ඇති අතර අණුක විද්‍යා කටයුතු කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේදී සිදු කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතියේ සම-විමර්ශකයෙකු ලෙස ද කටයුතු කරමි.

## B2 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

(අධ්‍යක්‍ෂ, ආචාර්ය ඒ.ජී..එච්.ජේ. එදිරිසිංහ විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය 1979 වසරේ ස්ථාපිත කරන ලද බාහිර විභාග අංශය දක්වා දිවයයි. සංවර්ධන අදියර කිහිපයකින් හා විවිධ නම්වලින් හැඳින්වීමෙන් අනතුරුව නව පරිපාලන ව්‍යුහයකින් යුතු "දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය" යන නමින් 2007 වසරේ අප්‍රේල් මාසයේදි ප්‍රසිද්ධියට පැමිණියේය. මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණ වනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සංයුක්ත සැලසුමේ දැක්වෙන එක් ඉලක්කයක් වන "විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීමේ" අරමුණ සාක්‍ෂාත් කර ගැනීමයි.

තවදුරටත් වෘත්තීය ඉලක්කයන් සාක්‍ෂාත් කර ගැනීමට අපේක්‍ෂා කරන පුද්ගලයන්ට සමාන අවස්ථාවන් ලබාදීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ දැක්ම වේ. අධ්‍යාපනය ලැබීමට අපේක්‍ෂා කරන්නන්හට බාධාවකින් තොරව එම කාර්යය ඉටු කර ගැනීම සඳහා අධ්‍යාපන අවස්ථා ලබා දෙමින් සියළුම දෙනාට අධ්‍යාපනය ලබාදීම මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර ලෙස හඳුනාගෙන ඇත.

උපකුලපතිතුමා විසින් සභාපතිත්වය දරණ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ පාලනය යටතේ මෙම මධ්‍යස්ථානය පවතින අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු මෙහි අර්ධ කාලීන අධ්‍යක්‍ෂවරයෙකු ලෙස ප්‍රධානත්වය දරනු ලබයි. තවද ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් තිදෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරුන් ලෙස අධ්‍යක්‍ෂවරයාට සහය වෙති. එහි පරිපාලන ක්‍රියාකාරිත්වය ලේඛකාධිකාරීවරයෙකුගේ පාලනය යටතට වැටෙන අතර මූලිකවම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙකු, සහකාර ලේඛකාධිකාරීවරයෙකු හා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු විසින් එය කළමනාකරණය කරනු ලබයි. ලිපිකාර හා සම ශ්‍රේණිවල අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් සිව් දෙනෙකු (04) අර්ධ නුපුහුණු ශ්‍රේණිවලටද අයත් වෙති.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යයන පරිපාලනය විශ්වවිද්‍යාල පනතේ මධ්‍යස්ථානවලට හා ඒකකවලට අදාළ විධිවිධානවලට අනුව සිදුවේ. 1979 වසරේ සිට පවත්වනු ලබන ශාස්ත්‍රවේදි උපාධිය සහ 2008 වසරේ ආරම්භ කළ ව්‍යාපාර පරිපාලනවේදි (මාර්ගගත) යන උපාධි වැඩ සටහන් පමණක් වර්තමානයේදි පිරිනමනු ලැබේ. මෙම උපාධි දෙක අධ්‍යයන මණ්ඩල දෙකක් යටතේ පවත්වනු ලබන අතර, ඒවා අනුමත කරන ලද්දේ ශාස්ත්‍ර පීඨය, අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුව හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසිනි.

### ජයග්‍රහණ

බාහිර උපාධි වැඩසටහන් සඳහා රුපියල් මිලියන 25 ක් වටිනා HETC ප්‍රදාන ලබා ගැනීමට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට හැකි විය.

- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් 2014 වසරේදී සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ලැයිස්තුව
- මෙම මධ්‍යස්ථාන පරිශ්‍රයට පූර්ණ නව පෙනුමක් ලබා දෙන ලදි.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධියේ මාර්ගගත (Online) වැඩසටහන සඳහා නවක සිසු කණ්ඩායමක් 2014 වසරේ අප්‍රේල් මාසයේදී ලියාපදිංචි කරන ලදි.
- කලා යෝග්‍යතා පරීක්‍ෂණය හා ශාස්ත්‍රවේදි උපාධිය සඳහා සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදි.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා "ලිපිගොනු කළමනාකරණ පද්ධතිය" පිළිබඳ එක් දින වැඩමුළුවක් සංවිධානය කොට 2014 ජූලි 10 දින පවත්වන ලදි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා මෙම වැඩමුළුවේ සම්පත්දායක පුද්ගලයා විය.

- "වඩා යහපත් වූ වැඩ ජීවිතයක්" පිළිබඳ එක් දින වැඩමුළුවක් මෙම මධ්‍යස්ථානය විසින් සංවිධානය කොට 2014 ඔක්තෝබර් 15 වැනි දින පවත්වන ලදි. එහි සම්පත්දායක පුද්ගලයා ලෙස ශ්‍රී ලංකා වෙළඳ ආයතනයේ අමිත් ගමගේ මහතා සහභාගි විය.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය බාහිර ශාස්ත්‍රවේදී විභාගය හා සාමාන්‍ය කලා යෝග්‍යතා පරීක්ෂණය සාර්ථකව පවත්වන ලදි.
- 2014 වසරේදී බාහිර උපාධි 2000කට වැඩි ප්‍රමාණයක් පිරිනමන ලදි. මෙම උපාධි ප්‍රදානෝත්සවය 2014 සැප්තැම්බර් 29 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි පැවැත්වූ අතර මහාචාර්ය ජේ.බී. දිසානායක එහි ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.
- මෙම මධ්‍යස්ථානය ISO 9001:2008 (තත්ත්ව සහතික) පිළිබඳ එක් දින වැඩමුළුවක් 2014 දෙසැම්බර් 10 වැනි දින මහනුවර ඕක් රේ රිජන්සි හෝටලයේදී පවත්වන ලදි.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් 15 දෙනෙකුට ගමන් කල හැකි ඉඩ පහසුකම් සහිත වෑන් රථයක් මෙම වසරේදි මිලදී ගන්නා ලදි. මෙම මධ්‍යස්ථානයේ ප්‍රවාහන අවශ්‍යතා විශේෂයෙන්ම විභාග පැවැත්වෙන කාල සීමාවේදී ඉතා බහුලවේ. අලුතින් මිලදී ගත් මෙම වෑන් රථය මධ්‍යස්ථානයට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

**බාධක සහ පිළියම්**

විෂය නිර්දේශ සංශෝධන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වූ හෙයින් 2014 වර්ෂයේ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන සඳහා නවක සිසු කණ්ඩායම බඳවා ගැනීමට නොහැකි විය.

**අනාගත සැලසුම්**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය වෙනුවෙන් යෝජිත සිව්මහල් ගොඩනැගිල්ල සඳහා විශ්වවිද්‍යාල ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලදි. අනාගතයේදී මෙම මධ්‍යස්ථානය විසින් පිරිනැමීමට සැලසුම් කරන අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීම සඳහා මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් වනු ඇත. ගුරු ශිෂ්‍ය අන්තර් ක්‍රියාවන් ඉහළනැංවෙන ශ්‍රවණාගාරයකින් මෙම ගොඩනැගිල්ල යුක්ත වේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවට අදාළ විෂයමාලාව මධ්‍යස්ථානයේ ආරම්භයේ සිට මේ දක්වා ප්‍රධාන සංශෝධනයට භාජනය වී නොමැති නිසා එය සංශෝධනය කිරීම සඳහා මූලික පියවර ගන්නා ලදි. මෙම මධ්‍යස්ථානය විසින් අදාළ සංශෝධනය සිදුකරන ලද්දේ වෙනස්වන ගෝලීය සහ දේශීය අවශ්‍යතාවන්ට සරිලන පරිදි ප්‍රායෝගික හා නිපුණතාවයෙන් හෙබි උපාධිධාරින් පිරිසක් බිහිකිරීමේ අරමුණින් යුතුවයි. මෙම විෂයමාලා සංශෝධනය අවසන් කිරීමට ආසන්නව පවතින අතර ඊට අදාළ පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම 2015 වසරේ මුලදී සිදුවනු ඇත. සමාසික ක්‍රමය යටතේ පාඨමාලා සංවිධනය කිරීම මූලික සහ පරිපූරක පාඨමාලා හඳුන්වාදීම, නව හා වැඩි දියුණු කළ පාඨමාලා සහ සිසුන් ඇගයීම සඳහා GPA ක්‍රමය හඳුන්වාදීම මෙම සංශෝධිත විෂය මාලාවේ ලක්ෂණ වේ.

## B3 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, ආචාර්ය එස්.බී. විජේකෝන් විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 1993 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය විද්‍යා සභාවේ සහයෝගය ඇතිව ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම මධ්‍යස්ථානයට අරමුදල් සපයන ලද්දේ ආසියා සංවර්ධන බැංකුවේ ණයක් යටතේ විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සංවර්ධන කිරීමේ ව්‍යාපෘතියෙන් වන අතර මේ වනවිට එය සම්පූර්ණයෙන්ම ස්වාධීන මධ්‍යස්ථානයකි. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ වාණිජ හස්තයකි.

විශ්වවිද්‍යාලයේ නීති හා රෙගුලාසි මඟින් මෙම මධ්‍යස්ථානය පාලනය වන අතර ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ කළමනාකරණ කමිටුවක් විසිනි. පීඨ මණ්ඩලයේ සාමාජිකයන් නව දෙනෙකුගෙන් හා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ සාමාජිකයෙකුගෙන් මෙම කමිටුව සංයුක්ත වේ.

### ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ අර්ධ කාලීන පදනම මත වැඩ කරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකි. මෙහි කාර්ය මණ්ඩලය ඉංජිනේරුවන් දෙදෙනෙකුගෙන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් යුක්ත වේ.

### ජයග්‍රහණ

ව්‍යාපෘති සහ CPD වැඩසටහන් සහිත වර්ෂයේ පිරිවැය රුපියල් මිලියන 25 කි. ඉන් රුපියල් මිලියන 19ක් ව්‍යාපෘතිවලින් හා රුපියල් මිලියන හයක් (6) CPD වැඩසටහන්වලිනි. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය ගෙවී ගිය වර්ෂයේදී ගණනය කළ මුදල්වලින් ඩබල් කැබ් පිකප් ට්‍රක් රථයක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 5.9 ක් නිදහස් කරන ලදි.

### බාධක සහ පිළියම්

මෙම වර්ෂයේදී සැලසුම් කළ වැඩමුළු තුනක් ඒ සඳහා සහභාගිවන්නන් නොපැමිණීම නිසා පැවැත්වීමට නොහැකි විය.

### අනාගත සැලසුම්

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 2015 වසර තුළදී වැඩමුළු 15ක් පවත්වා රුපියල් මිලියන 30ක් ඉපයීමට සැලසුම් කරයි.

## B4 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එම්. සෝමතිලක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය විදෙස් අරමුදල් ලද ව්‍යාපෘතියක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය සහිතව 2002 වසරේදී ස්ථාපිත කරන ලදි. විදෙස් මුදල් ලද ව්‍යාපෘතිය 2008 වසරේදී අවසන් වූ අතර මෙම කාල පරිච්ඡේදය තුළදී " මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව, මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හා ( internship) සමාරෝධන වැඩසටහන" යන ප්‍රධාන ක්‍රියාකාරකම් තුන බාර ගෙන කටයුතු කරන ලදි. මෙම මධ්‍යස්ථානයෙන් පිරිනමන මානව හිමිකම් පිළිබඳ ඉගැන්වීම් පාඨමාලාව සඳහා පවතින ඉල්ලුම නිසාම එම ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වන්නට විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය ශාස්ත්‍ර පීඨයේ කන්නන්ගර ගොඩනැගිල්ලේ සිව්වන කාමරයේ පිහිටුවා ඇත. මානව හිමිකම් හා මූලික නිදහස පිළිබඳ කරුණු සම්බන්ධයෙන් පැහැදිලි, විචාරශීලි හා ක්‍රියාශීලි සමාජයක් නිර්මාණය කිරීම මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වන අතර විශ්වවිද්‍යාල ප්‍රජාව හා සාමාන්‍ය මහජනයා මැදිහත්වන බහු ක්ෂේත්‍ර, අධ්‍යාපන හා පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් මානව හිමිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ඉලක්කය වේ.

මෙම මධ්‍යස්ථානයේ ව්‍යුහය පහත පරිදි වේ.

(i) පාලක මණ්ඩලය
(ii) අධ්‍යක්ෂ
(iii) අධ්‍යයන කාර්ය මණ්ඩල සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙක්
(iv) පරිපාලන නිලධාරි
(v) සමාරෝධකයන් සිව් දෙනෙක් (සිංහල හා දෙමළ මාධ්‍ය)

මානව හිමිකම් මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයට ප්‍රතිපත්ති සම්බන්ධ කරුණු, අයවැය හා මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බලය පවරා ඇත. පාලක මණ්ඩලය ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති (සභාපති, දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති, මානව හිමිකම් සම්බන්ධ පාඨමාලා උගන්වනු ලබන අධ්‍යයන දෙපාර්තමේන්තු නියෝජනය කිරීම පිණිස ශාස්ත්‍ර පීඨයේ පීඨ මණ්ඩලය විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකු සහ පීඨ අට නියෝජනය වන පරිදි විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයන් අටදෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පාලක මණ්ඩලයේ ලේකම් ලෙස ක්‍රියාකරයි. මධ්‍යස්ථානයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය අතුරෙන් විවෘත පුවත්පත් දැන්වීමක් හරහා විශ්වවිද්‍යාල බල අධිකාරිය විසින් තෝරාගනු ලබන අධ්‍යක්ෂවරයෙකු විසින් හසුරවනු ලබයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු පරිපාලන නිලධාරියෙකු හා සමාරෝධකයකු විසින් අධ්‍යක්ෂකට සහය දක්වනු ලබයි. ස්ථිර ආචාර්ය මණ්ඩලයක් මෙම මධ්‍යස්ථානය සතු නොවේ. මෙම මධ්‍යස්ථානයට සම්බන්ධ වන සියළුම සම්පත්දායක පුද්ගලයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් තෝරා ගැනේ. ඔවුහු ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස සේවය ලබා දෙති.

### ජයග්‍රහණ

2004 වර්ෂයේ සිට 2014 අතර කාලය තුළ ඉගැන්වීමේ වැඩසටහන් දෙකේ පාඨමාලා ගාස්තු ලෙස රුපියල් මිලියන 29ක් උපයන ලද අතර ඉන් රුපියල් මිලියන 9.3ක මුදලක් ඉතිරි කර ඇත. වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානයේ ඉගැන්වීමේ වැඩසටහන් දෙක සඳහා විශ්වවිද්‍යාල උපාධි

අපේක්ෂකයන්ගෙන්, උපාධිධාරීන්ගෙන්, ශ්‍රී ලංකා පොලිසිය, යුධ හමුදාව, බන්ධනාගාර නිලධාරීන්, පාසල් ගුරුවරුන්ගෙන් හා රාජ්‍ය නොවන සංවිධානවලින් කෙරෙන ඉල්ලුම ඉහළ යමින් පවතී. මෙම මධ්‍යස්ථානය ආරම්භ කළදා පටන් 2014 වසර දක්වා මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහතික පත්‍ර ලාභීන් 3832 ක් හා ඩිප්ලෝමාධාරීන් 1045 දෙනෙකු බිහි කොට ඇත.

2014 වසරේදී මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහතික පත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වූ අතර ඒ සඳහා සහභාගි වූ සංඛ්‍යාව පහත පරිදි වේ.

1) මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - සිංහල සහ දෙමළ මාධ්‍ය සිසුන් 681 කි.
2) මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සිංහල මාධ්‍ය සිසුන් 147 කි.

## B5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය
(අධ්‍යක්ෂ, ආචාර්ය ඒ.බී. නිශ්ශංක විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

ස්වභාවික සම්පත් සහ පෘතුවියේ පරිසර පද්ධතිය මානව වර්ගයාගේ ක්‍රියාකාරකම් මුල්කර ගනිමින් පුළුල් පරාසයක පැන නැගී පවතින දැනෙන පාරිසරික ගැටළු එලදායි පාලනයක් තුළින් විසඳා ගැනීම පිණිස ජාතික හැකියාව දියුණු කිරීම සඳහා සහයවීමේ පරමාර්ථයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය 1992 වසරේදී ස්ථාපිත කරන ලදි. නව නිර්මාණ හා අන්තර් ක්ෂේත්‍ර එළඹුම් කෙරෙහි අවධානය යොමු කරන පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ වූ උගතුන්, ඒ කෙරෙහි උනන්දුවන සිසුන් පුරෝගාමී පාර්ශවකරුවන් සහ විශ්වවිද්‍යාල ප්‍රජාවගෙන් පරිබාහිර වූ මහ සමාජය ද එක්රැස් කර ගනිමින් මෙම මධ්‍යස්ථානයේ ඉහත සඳහන් කළ ඉලක්ක සපල කර ගනිමින් සිටී.

පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රධාන කෘත්‍යයන් වනුයේ කෙටි පාඨමාලා, පුහුණු වැඩසටහන්, වැඩමුළු, සමුළු පවත්වමින් දේශීය වශයෙන් හා කලාපීය වශයෙන් පවතින පාරිසරික ගැටළු පිළිබඳව පර්යේෂණ පවත්වමින් සහ ගෝලීය වැඩසටහන් සමග සම්බන්ධ වෙමින් සියළු මට්ටමේ පාර්ශවකරුවන් තුළ හැකියාවන් ගොඩනැගීමයි. තවද මෙම ස්ථානය වෙනත් විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලික අංශයේ සංවිධාන සමග සහයෝගිතාවයෙන් සැලසුම් කළ පාරිසරික ක්‍රියාමාර්ග හරහා ජාතික ස්වභාවික සම්පත් ආරක්‍ෂා කිරීමට හා චිරස්ථායි ලෙස ඒවා කළමනාකරණය කිරීම සඳහා රජයේ විවිධ ආයතන හා වෙනත් පාර්ශවකරුවන්ට සහයෝගය ලබා දෙයි. මෙසේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය වඩාත් සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තහවුරු කරනු පිණිස පරිසරය හා සම්බන්ධවූ ක්ෂේත්‍රයන්හි පුහුණු හා පර්යේෂණයන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ට ගණයේ මධ්‍යස්ථානයක් බවට පත්වීමේ අදිටනින් යුතුව මහත් උද්යෝගයෙන් හා උත්සාහයෙන් කටයුතු කරයි.

### ජයග්‍රහණ

### උපදේශන කටයුතු

පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ප්‍රසිද්ධ වෘත්තිකයන් හා සහයෝගිතාවයෙන් යුතුව පරිසරය සම්බන්ධ විවිධ ව්‍යාපෘති සඳහා විවිධාකාරයේ පුළුල් උපදේශන සේවාවන් පවත්වනු ලබයි. මේ දක්වා ආරම්භ කළ උපදේශන කටයුතු පවත්වාගෙන යන අතරම නව උපදේශන කටයුතු කිහිපයක්ම ආරම්භ කරන ලදි.

- වැව්ලි සමාගම් විසින් (සීමාසහිත ලාලන් රබර් පුද්ගලික සමාගම හා කහවත්ත වැව්ලි සමාගම) ඔයිල් පාම් වගාව ස්ථාපිත කිරීම වෙනුවෙන් EIA පිළිබඳ උපදේශන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.
- මධ්‍යම පරිසර අධිකාරිය සමග සහයෝගිතාවයෙන් හන්තාන පරිසර ආරක්‍ෂක ප්‍රදේශයේ හරිත ආවරණය ඉහළනැංවීම පිළිබඳ උපදේශන කටයුතු ද ආරම්භ කොට ඇති අතර විශ්වවිද්‍යාල සිසුන් ද මෙම කාර්යයෙහි නිරත වෙති.
- ගෝනදයිකවත්තේ සනීපාරක්‍ෂක ඉඩම් ගොඩ කිරීමේ ව්‍යාපෘතියේ පරිසර බලපෑම් තක්සේරු වාර්තාව අවසන් කරන ලදි.

### පුහුණු වැඩසටහන්

පරිසරය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් පිළිබඳ මනා දැනුමක් ජනතාව තුළ ඇති කරලීම සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් මෙම මධ්‍යස්ථානය විසින් පිරිනමනු ලැබීය.

- ISO 9001 හා 14001 පිළිබඳ තත්ත්ව සහ පරිසර කළමනාකරණ පද්ධතියේ ISO සහතිකය හැඳින්වීමේ පාඨමාලාව

  2014 අගෝස්තු 23-24 යන දිනවල පවත්වන ලද මෙම පුහුණු වැඩමුළුවට 143 දෙනෙකු පමණ සහභාගි වූහ. මෙම වැඩමුළුවේ ප්‍රධාන අමුත්තා ලෙස මහාචාර්ය මද්දුම බණ්ඩාර වැඩමුළුව ආරම්භ කළ අතර මහාචාර්ය අතුල සේනාරත්න වැඩමුළුවේ සමාප්ත උත්සවයේ ප්‍රධාන අමුත්තා විය.

- **මානව සම්පත් කළමනාකරණය**

  151 දෙනෙකු පමණ සහභාගි වූ මෙම පුහුණු වැඩමුළුව 2014 අගෝස්තු 30-31 දිනවල පවත්වන ලදි. නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ශාන්ත හෙන්නායක සමාරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වූ අතර මහාචාර්ය අනුර වික්‍රමසිංහ සමාප්ති උළෙලේ ප්‍රධාන අමුත්තා විය.

- **මානව සම්පත් කළමනාකරණය**

  මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පවතින ඉහල ඉල්ලුම හේතුවෙන් දෙවන වැඩමුළුව 2014 සැප්තැම්බර් 13-14 දිනවල පවත්වන ලද අතර ඒ සඳහා 154 දෙනෙකු සහභාගි වූහ. සමාරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ශාන්ත හෙන්නායක සහභාගි වූ අතර මහාචාර්ය නාමල් ප්‍රියන්ත සමාප්ති උළෙලේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.

- **පරිසර බලපෑම් තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව**

  මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වන ලද ජාත්‍යන්තර EIA නේවාසික පාඨමාලාව පවත්වමින් නැවත වතාවක් පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය සහයෝගිතා ආයතනයක් බවට පත්විය. 2014 නොවැම්බර් 15-24 දින දක්වා මහනුවර "Tree of Life" හෝටලයේදි පවත්වන ලද මෙම පුහුණු වැඩමුළුවට විදේශිකයන් ද ඇතුළත්ව විවිධ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තු, විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතනවලින් 60 දෙනෙකු පමණ සහභාගි වූහ. නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ශාන්ත හෙන්නායක මෙම පුහුණු වැඩසටහනේ සමස්ත සම්බන්ධිකාරක ලෙස ද පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය වෙනුවෙන් ප්‍රධාන සම්පත්දායකයෙකු ලෙසද කටයුතු කළේය. මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකද සම්පත්දායකයෙකු ලෙස කටයුතු කළේය.

- **නව පුහුණු පාඨමාලා**

  නව කෙටි පාඨමාලා තුනක් සංවර්ධනය කොට 2015 වසරේ සිට පිරිනැමීමට මෙම මධ්‍යස්ථානය විසින් සැලසුම් කොට ඇත. එම පාඨමාලා (1) කර්මාන්ත දූෂණය පාලනය හා අපද්‍රව්‍ය කළමනාකරණය (දින 03), (2) නිවර්තන ජෛව විවිධත්වය (සති 02) සහ (3) නිවර්තන පරිසර පද්ධතිය කෙරෙහි කාලගුණ විපර්යාසය හා එහි බලපෑම (දින 03 යි) යන නම්වලින් හැඳින්වේ.

**පර්යේෂණ ක්‍රියාකාරකම්**

පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය පරිසරය හා සම්බන්ධ පර්යේෂණවල ක්‍රියාශීලිව නියැලී සිටින හා මෙම මධ්‍යස්ථානය හා එක්ව සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට ප්‍රියතාවයක් දක්වන විශ්වවිද්‍යාලයේ විද්වතුන් පිළිබඳ දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදි.

විශ්වවිද්‍යාලයට තදාසන්නව පිටිසර ගම්මානයක් නිර්මාණය කිරීමට මේවනවිටත් මූලික පියවර ගෙන ඇත. මෙසේ පරිසර හිතකාමී ආදර්ශ ගම්මානයක් නිර්මාණය කිරීම තුළින් ස්වභාවික සම්පත් සංරක්ෂණය, අපද්‍රව්‍ය පාලනය කිරීම, චිරස්ථායි ආකාරයෙන් පරිසරය කළමනාකරණය කිරීම ආදි කරුණු පිළිබඳව ජන ප්‍රජාව දැනුවත් කෙරෙනු ඇත.

පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගිතාවයෙන් හැකියාවන් ගොඩනගන හා තාක්ෂණ පරිණාමන යාන්ත්‍රණයක් ලෙස කාලගුණ විපර්යාස, කාබන් foot printing,

හරිත තාක්‍ෂණය, ප්‍රමිතිකරණය ආදි සුවිශේෂී අංශයන් පිළිබඳව පුහුණු, පර්යේෂණ හා උපදේශන ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කිරීමටත් ජාත්‍යන්තර සමුළු/ විශේෂ සම්මන්ත්‍රණ පැවැත්වීමටත් සැලසුම් සකස් කරමින් සිටී.

**අනාගත සැලසුම්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම් මත පදනම්ව යෝජිත ක්‍රියාකාරකම් සමූහය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථානය පරිසර ගැටළු හා සම්බන්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සහය දැක්වීම පිණිස වෙනත් ව්‍යාපෘති රාශියක් සිදුකිරීමට ද සැලසුම් කරමින් සිටී.

**පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය 2014 වසරේ මාර්තු මාසයේ සිට පහත සඳහන් ක්‍රියාකාරකම් ආරම්භ කොට / පවත්වාගෙන යමින් සිටී.**

- පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය වෙනුවෙන් වෙබ් පිටුවක් සැකසීම
- 2015 වසරේ සිට පරිසර ගැටළු සම්බන්ධ ජාත්‍යන්තර වාර සඟරාවක් ආරම්භ කිරීම
- විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් විශ්වවිද්‍යාලය උදෙසා අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩසටහනක් සැකසීම
- පරිසර අමාත්‍යාංශයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් යුතුව හන්තාන සංරක්‍ෂණ වැඩසටහනක් සැකසීම
- පරිසර පර්යේෂකයන් පිළිබඳව දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම
- සැලසුම් කළ වෙනත් ක්‍රියාකාරකම් : පාරිසරික අංශයේ පාර්ශවකරුවන් උදෙසා පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ කාර්ය භාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, උපදේශන, හැකියාවන් ගොඩනැගීම හා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සහයෝගිතා සංවර්ධනය කිරීම, බෝග නිෂ්පාදන අංශයේ පාර්ශවකරුවන් සඳහා බෝග නිෂ්පාදනයට කාලගුණ විපර්යාසයන්ගේ බලපෑම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම, නව කෙටි පාඨමාලා හඳුන්වාදීම හා දැනට පවතින කෙටි පාඨමාලා නිත්‍ය කාල වකවානුවලදී අඛණ්ඩව පවත්වාගෙන යෑම, පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය පාරිසරික ගැටළු පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට ගන්නා උත්සාහයේදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද පාරිසරික පර්යේෂණ පිළිබඳව ග්‍රන්ථනාමාවලියක් සංවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම් මෙම මධ්‍යස්ථානය මඟින් සැලසුම් කළ වෙනත් කාර්යයන්වලට අයත් වේ.

## B6 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, ආචාර්ය නන්ද ගුණවර්ධන විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හයක් (06) ලෝක මට්ටමේ විශ්වවිද්‍යාල බවට පත් කිරීමට යෝජනා කරන ලදි. මෙම වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එක් එක් විශ්වවිද්‍යාලයට අරමුදල් වෙන් කොට එම විශ්වවිද්‍යාල හයෙන් යෝජනා කැඳවන්නට විය. මේ අනුව 2011 ජූනි 25 වැනි දින පවත්වන්නට යෙදුන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය 397 වැනි පාලක සභා රැස්වීමේදී බහු ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු යැයි යෝජනා විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය කෙරෙහි දක්වන ගෝලීය දැක්ම වැඩිදියුණු කරවීම සහ අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන්හි විශිෂ්ට ගණයේ මධ්‍යස්ථානයක් ලෙස එහි අනන්‍යතාවය ස්ථාපිත කිරීම ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ දැක්ම වේ.

වැඩි විස්තර හා තවදුරටත් තොරතුරු දැන ගැනීම සඳහා අපගේ http://www.pdn.ac.lk/uop/inrc/index.php වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

### ජයග්‍රහණ

පසුගිය වර්ෂය පුරාවට ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය එහි අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා විවිධ ක්‍රියාකාරකම්වල නියැලී ඇත. 2014 වසරේදී බාරගත් ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් විස්තර කෙරේ.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් අවබෝධතා ගිවිසුම් 13ක් ආරම්භ කොට / සහය දක්වන ලදි. මෙම ආයතන කොටස්කාර ආයතන සමඟ නිරන්තරයෙන්ම සන්නිවේදනය පවත්වා ගනිමින් වඩා වැඩි පර්යේෂණ හුවමාරු හා සහයෝගිතාවන් සඳහා දිරිගැන්වීම් කරනු ලබයි.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සහයෝගිතා ක්‍රියාකාරකම් හා හුවමාරු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා විදෙස් විශ්වවිද්‍යාලවලින් දූත කණ්ඩායම් 17ක් ගෙන්වා ගැනීම සංවිධානය කොට සම්බන්ධීකරණය කරන ලදි. ඔවුන්ගෙන් ලද ප්‍රතිචාර සුබවාදි හා දිරිගන්වන සුළුවූ අතර එම සියළු ආයතන සමඟ යහපත් හා අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනගා ගැනීමට අපේක්ෂා කරයි.

ටෝකියෝ තාක්ෂණ ආයතනයේ ශිෂ්‍ය නියෝජිතයන් සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් දෙකක් පවත්වන ලද අතර 2015 වසරේ මුල් කාලයේදි හොකයිඩෝ විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍ය කණ්ඩායමක් ගෙන්වා සත්කාරකත්වය දැරීමට ද අප සැලසුම් කර ඇත. මෙම වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර ඒවාට සහභාගි වූවන්ගේ ඉමහත් ඇගයීමට ද ලක් විය.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ප්‍රදානයන් ලබාදෙන විවිධ ආයතනවලින් විශාල ප්‍රදාන ලබා ගැනීම සඳහා සහයෝගිතාවයෙන් යුතුව ඉල්ලුම් කර ඇත. මෙසේ අයදුම් කළ ආයතන අතරට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් දෙපාර්තමේන්තුව, විද්‍යා හා තාක්ෂණ, චිරස්ථායි සංවර්ධනය උදෙසා වන පර්යේෂණ සහයෝගිතාවය, ආසියා පැසිෆික් නෙට්වර්ක් AusAID, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ලියන් ෆවුන්ඩේෂන් හා ජර්මන් ඩිරෙක්ට් ඒඩ් යන ආයතන ඇතුළත් වේ.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය වෙන් කරන ලද මුදල්වලින් 2013 වර්ෂය පුරාම ප්‍රදාන ලබා දීමට හැකි වූ අතර එම ප්‍රදාන අතරට පහත සඳහන් ප්‍රදාන ද ඇතුළත් වේ.

| | |
|---|---|
| ප්‍රවාහන ප්‍රදාන | 85 |
| ප්‍රකාශන ප්‍රදාන | 07 |

ක්‍රියාකාරකම් ප්‍රදාන (සංවිධානය කළ/අනුග්‍රහය දැක්වූ) 15
ආගන්තුක ශිෂ්‍යත්ව ප්‍රදාන 13
උපකරණ ප්‍රදාන 07

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහයන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ ඇස්ට්‍රෝජීව විද්‍යා මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලද්දේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසිනි. මෙම ඇස්ට්‍රෝජීව විද්‍යා මධ්‍යස්ථානය ජාත්‍යන්තර සමුළුවක් පැවැත්වීමත් සමඟ 2015 වසරේදී දියත් කිරීමට අදහස් කෙරේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පවත්වන ලද SAARC සංස්කෘතික මධ්‍යස්ථානයේ වාර්ෂික පර්යේෂණ සමාලෝචන රැස්වීම හා සමුළුව පැවැත්වීමට ද ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සහ සම්බන්ධතාවය දැක්වූ අතර මෙම සමුළුවට සියලුම SAARC රටවලින් නියෝජිත මණ්ඩල සහභාගී වූහ.

මෙම කාර්යයන් හැරුණු විට විවිධ ක්ෂේත්‍රයන්ට අයත් පුරෝගාමී සම්පත්දායක පුද්ගලයන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු හා සම්මන්ත්‍රණ 14ක් සංවිධානය කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියළුම කාර්ය මණ්ඩලවලට හා සිසුන්ට එම වැඩමුළු හා සම්මන්ත්‍රණ මහත්සේ වැදගත් විය.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ක්වින්ස්ලන්ඩ් තාක්ෂණික විශ්වවිද්‍යාලය සමඟ එක්ව ඒකාබද්ධ උපාධි වැඩසටහනක් දියත් කරන ලද අතර එය මේවනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම මධ්‍යස්ථානය උසස් ක්‍රියාකාරිත්වයකින් යුතු උපකරණයක්, ස්කෑනිං විද්‍යුත් අන්වීක්ෂයක් මිලදීගෙන මේ වනවිට එම උපකරණ නව භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලේ තබා ඇත. උපකරණය ඉතා වැදගත් පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනෙන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්වතුන්ට මෙම උපකරණයෙන් පහසුකම් සැලසේ.

වැඩිදුර විස්තර හා තොරතුරු සඳහා
http://www.pdn.ac.lk/uop/inrc/NewsFull.php?value=CurAll වෙත පිවිසෙන්න.

**බාධක සහ පිළියම්**

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ නිල කාර්යාලය පවත්වාගෙන යෑම සඳහා A6 ගොඩනැගිල්ල වෙන් කෙරුන අතර මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල කාර්යාල, දේශන ශාලා හා විද්‍යාගාරයක් ඇතුළත් කිරීමට නියමිතය. මෙම ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු 2015 වසරේදී අවසන් කිරීමට අපේක්ෂිතයි.

**අනාගත සැලසුම්**

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2015 වසරේදී නව සහයෝගිතා වැඩසටහන් ආරම්භ කිරීමට හා දැනුම හුවමාරු කරගැනීම සඳහා විදෙස් විද්වතුන් 20 දෙනෙකු පමණ ගෙන්වීම සංවිධානය කොට සම්බන්ධීකරණය කිරීමට අපේක්ෂා කරයි. එමෙන්ම අඩුම තරමින් ජාත්‍යන්තර සමුළු තුනක්වත් සංවිධානය කරනු ඇත. තවද, ආචාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ පර්යේෂණ කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කොට ගත් වැඩමුළු හා පරිපාලන ක්‍රියාමාර්ගයන් දියුණු කරන සහ ආයතනික හැකියාවන් ගොඩනැගීම ඉලක්ක කරගත් වැඩමුළු ද සංවිධානය කිරීමට අදහස් කරයි.

ඇස්ට්‍රෝ ජීව විද්‍යා මධ්‍යස්ථානය දියත් කිරීම සහ පර්යේෂණ ප්‍රදාන සඳහා අලුතෙන් අයදුම්පත් කැඳවීම 2015 වසරේදී සිදුවනු ඇත. එපමණක් ද නොව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම, නව බහු විධ සහයෝගිතාවන් හා අවබෝධතා ගිවිසුම් ආරම්භ කිරීමට ද කටයුතු කරනු ඇත. පර්යේෂණ ප්‍රදාන අයදුම්පත්‍ර සඳහා දෙවන වටයේ අයදුම්පත් කැඳවීම් ද 2015 වසරේදී සිදුවනු ඇත.

## B7 හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ (වැ.බ) වෛද්‍ය සම්පත් තෙන්නකෝන් විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 වසරේ ආරම්භ කළදා සිට මෙරට හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන් පවත්වන පුරෝගාමී මධ්‍යස්ථානයකි. මෙම මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමඟ සහයෝගිතාවයෙන් යුතුව අර්බුදයට භාජනය වී පවතින ඒකාබද්ධ ලිංගික ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් පිළිබඳව ජාතික මට්ටමේ වැඩමුළු එකොළහක් පවත්වා ඇති බව ඉමහත් සතුටින් යුතුව සඳහන් කර සිටිමු. එසේම මෙම මධ්‍යස්ථානය සමහර SRH වැඩසටහන් සඳහා පසු ක්‍රියාමාර්ග සහිත වැඩසටහන් ද පවත්වන ලදි.

එපමණක්ද නොව, මෙම මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට කාර්යාලය සමඟ සහයෝගිතාවයෙන් හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික වැඩමුළු හතක් සාර්ථකව පවත්වා ඇත. තෙවන හා සිව්වන PHEDMa වැඩසටහන් සඳහා පසු ක්‍රියාමාර්ග වැඩසටහන් ද පවත්වන ලදි. එමෙන්ම ඉහත සඳහන් කළ ආයතන දෙක සමඟ එක්ව ඉදිරියේදී පවත්වනු ලබන මෙම පාඨමාලා වැඩි දියුණු කිරීම පිණිස එම පාඨමාලාවල අන්තර්ගතය හා විෂය මාලාව ඇගයීමට ලක් කිරීම PHEDMa පාඨමාලාව ඇගයීම හා විෂයමාලාව සමාලෝචනය කිරීමේ වැඩමුළුව සහ විෂයමාලාව සංවර්ධනය කිරීමේ වැඩමුළු ද පවත්වන ලදි.

මෙම සියලුම ජාතික මට්ටමේ වැඩමුළු සාර්ථකව පැවැත්වීමට හැකි වූයේ විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් හා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් දක්වන ලද අගනා දායකත්වය නිසාවෙනි.

මෙම මධ්‍යස්ථානය විසින් සෞඛ්‍ය පරිපාලකයන්, චිකිත්සකයන්, අධ්‍යයන ආයතනයන්හි ආචාර්ය මණ්ඩල, රාජ්‍ය පරිපාලකයන් ද නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් පමණක් ද නොව සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය උදෙසා ජාතික ප්‍රතිපත්ති මාර්ගෝපදේශ /මෙහෙයුම් ක්‍රියාමාර්ග හෝ ඉගැන්වීම් /පුහුණු කටයුතු සකස් කරන /යාවත්කාලීන කිරීමේ කාර්යයන්හි නිරතව සිටින වෙනත් අත්‍යාවශ්‍ය සේවාවන්හි සාමාජිකයන් සඳහා හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලා පවත්වනු ලබයි.

### ජයග්‍රහණ

- මෙම මධ්‍යස්ථානය හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික පාඨමාලා හතක් හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පාඨමාලාව ඇගයීම හා විෂයමාලා සමාලෝචන වැඩමුළුව, එම පාඨමාලාවේ විෂයමාලා සංවර්ධන වැඩමුළු SRH පිළිබඳ ජාතික පුහුණු පාඨමාලා එකොළහක් හා පූර්ව-රෝහල් සත්කාරය හා ගිලන් රථ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා 10 ක් ද සාර්ථකව පවත්වා ඇත.

- මෙම මධ්‍යස්ථානය වෛද්‍යවරුන්, හෙදියන් හා පාසල් ළමුන් සඳහා පූර්ව රෝහල් සත්කාරක වැඩසටහන් රාශියක් සාර්ථකව පවත්වා ඇත.

- එමෙන්ම වෛද්‍ය නිලධාරින් හා ස්වේච්ඡා සේවකයන් සඳහා හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලා බොහෝමයක්ම පවත්වා ඇත.

- හදිසි සෞඛ්‍ය සූදානම හා ඊට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ හැකියාව පිළිබඳ SEARO තක්සේරුව 2012 මැයි මාසයේදී 78 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

- ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි පාඨමාලා සංවර්ධනය : පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආපදා කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවට හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ මොඩියුලයක් ඇතුළත් කරන ලදි. හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත්දායකයන් විසින් මෙම මොඩියුලයේ ඉගැන්වීමේ කටයුතු සිදුකරනු ලබයි.

**අනාගත සැලසුම්**

- මෙම මධ්‍යස්ථානය හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ පාඨමාලාවේ පාඨමාලා ඇගයීම හා විෂයමාලා සමාලෝචන වැඩමුළුවේ සහ එම පාඨමාලාවේ විෂයමාලා සංවර්ධන වැඩමුළුවල ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය සංවර්ධන හා නවීකරණ කටයුතු සහිතව තුන්වැනි හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ වැඩසටහන පවත්වනු ඇත.

- එමෙන්ම හදිසි සෞඛ්‍යමය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා කළමනාකරණය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම එම ක්ෂේත්‍රයට අදාළව කලාපීය හා ජාත්‍යන්තර සබඳතා සංවර්ධනය කරගැනීමටත් අවශ්‍ය පියවර ගනු ඇත.

## උපග්‍රන්ථ C – ඉගෙනුම් සහයක සේවාවන්

### C1 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය

(පුස්තකාලයාධිපතිණි, ආචාර්ය කේ.ජී.පී.ජී. විජේතුංග විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය වසර 1921 දී කොළඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල මණ්ඩප පුස්තකාලය ලෙස ආරම්භ විය. 1952 වසරේදී පේරාදෙණියට ගෙන එන ලද මෙම පුස්තකාලය 1960 වසරේදී එය දැනට පවතින පරිශ්‍රයට රැගෙන යන ලදි. පේරාදෙණියට ගෙන ඒමෙන් පසු එය කෘෂිවිද්‍යා, සමසෞඛ්‍ය, දන්ත, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා හා පශු වෛද්‍ය යන ශාඛා පුස්තකාල හත (07) සහ ප්‍රධාන පුස්තකාලයකින් යුක්ත පුස්තකාල ජාලයක් බවට සංවර්ධනය විය. එහි නවවැනි පුස්තකාලය කෘෂිවිද්‍යා පීඨයේ මහඉලුප්පල්ලම උප මණ්ඩපයට අනුයුක්ත කොට ඇති අතර අනෙකුත් ශාඛා පුස්තකාල අදාළ පීඨවලම පිහිටුවා ඇත. නව ගලහ පාර දිගේ පැමිණ කලාගාර ප්‍රවේශය පසුකොට දකුණට හැරී සනාතන ගොඩනැගිල්ලට පැමිණීමෙන් ප්‍රධාන පුස්තකාලයට පිවිසිය හැකිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය ශ්‍රී ලංකාවේ පවතින පැරණිතම හා විශාලතම විශ්වවිද්‍යාල පුස්තකාලයයි. මෙම පුස්තකාලයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන් පිළිබඳ දැන ගැනීම සඳහා කරුණාකර http://www.lib.pdn.ac.lk/About_us/general_info/general_info.html වෙත පිවිසෙන්න.

**ජයග්‍රහණ**

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු 2014/2015 වසර සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයට හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට තෝරාගන්නා ලදි. ආචාර්ය පී. විජේතුංග (මිය) 2014/2016, වර්ෂ සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ලෙස තෝරා පත් කළ අතර එම සංගමයේ මධ්‍යම පළාතේ අධ්‍යාපන වැඩසටහනේ සම්බන්ධීකාරක ලෙස ආර්. මහේෂ්වරන් මහතා පත් කරන්නට විය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල සමූහයේ කැඳවුම්කරු ලෙස එස්. ප්‍රේමරත්න මහතා පත් කරන ලදි. එමෙන්ම ඒ. ධර්මරත්න මහතා විශ්වවිද්‍යාල පුස්තකාල සංගමයේ වාර සඟරාවේ කතෘ ලෙස අඛණ්ඩව සේවය කළේය.

ආර්. මහේෂ්වරන් මහතා හා එස්. ඉලේපෙරුම මහත්මිය නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට උසස් කරන ලදි. ඩී.කේ. අබේරත්න මහත්මිය පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයේ ලියාපදිංචි වූවාය. ඒ. ධර්මරත්න මහතා බෙල්ජියමේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ මාස තුනක (03) පුහුණුවක් ලබා ගත්තේය.

**යාවජීව මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර කලා භාණ්ඩ එකතුව**

2014 වර්ෂයේදී පුස්තකාල ජාලය තුළ සිදුවූ සුවිශේෂම සිද්ධිය වූයේ යාව ජීව මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍ය හා සම්බන්ධ කලා භාණ්ඩ සහ ඔහුගේ පෞද්ගලික භාණ්ඩ එකතුවක් පුස්තකාලයට බාරදී ඒවා තැන්පත් කොට විවෘත කිරීමේ උත්සවයයි. ශ්‍රී ලංකාවේ ජපන් තානාධිපති නොබිහිතෝ හොබෝ මහතා විසින් 2014 මැයි මස 29 වැනි දින මෙය උත්සවකාරයෙන් විවෘත කරන ලදි. මෙම එකතුවට මහාචාර්යතුමාගේ අනුස්මරණීය නාට්‍යයක් වන මනමේ සහ සිංහබාහු නාට්‍යවලදී එතුමා විසින් පරිහරණය කළ මුල් කාලයේ ඇඳුම් කිහිපයක් ද ඇතුළත් වේ.

**පුස්තකාලය සතු දුර්ලභ භාණ්ඩ ප්‍රදර්ශනය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය විසින් සංවිධානය කළ තවත් කැපී පෙනෙන සිදුවීමක් වූයේ පුස්තකාලය සතු දුර්ලභ හා වටිනා භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමයි. මෙය 2014 ඔක්තෝබර් මස 9 - 10 යන දිනවල විශ්වවිද්‍යාලය ආරම්භ කොට එහි 60 වැනි සංවත්සර සැමරුමට සමගාමීව පවත්වන ලදි. හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති එන්.ඒ.ඩබ්.ඒ.ටී. අල්විස් මහතා විසින් මහත්

කැපවීමෙන් සංග්‍රහ කළ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය ඇතුළත් කාණ්ඩ පහකින් යුතු විශ්වවිද්‍යාලයක ඇරඹුම නම් කෘතිය 2014 ඔක්තෝබර් 09 වැනි දින එළිදක්වන ලදි.

පුස්තකාලාධිපතිණිය විසින් සංවර්ධනය කළ තොරතුරු සාක්ෂරතා පොදු විෂයමාලාව විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගන්නා ලදි. පුස්තකාලය විසින් පිරිනමනු ලබන පරිහරණ අධ්‍යාපනයේ වැදගත් සංවර්ධනයක් සනිටුහන් කරමින් පුස්තකාලයාධිපතිනිය විසින් සංවර්ධනය කළ එම විෂයමාලාව ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට පළමු වසර දෙක තුළ පිරිනැමීමට නියමිතය.

මහාචාර්ය ආර්.ඒ.එල්.එච්. ගුණවර්ධන, මහාචාර්ය විශ්වා වර්ණපාල සහ මහාචාර්ය අනුරාධ සෙනවිරත්න යන මහාචාර්යවරුන්ගේ කෘතීන් එකතුවක් ප්‍රධාන පුස්තකාලයට ත්‍යාග කරන ලදි. මීට අමතරව සුළු ප්‍රමාණයේ ත්‍යාග රාශියක් සහ නීති තැන්පතු එකතුවට ජාතික ලේඛණාගාර දෙපාර්තමේන්තුවෙන් ලැබෙන කෘතීන් ද අඛණ්ඩව ලැබිණ. මෙම ලැබීමේ මාසික සාමාන්‍ය කෘති දහසක් පමණ වේ.

**බාධක සහ පිළියම්**

ප්‍රධාන පුස්තකාලයේ විශේෂයෙන්ම පවිත්‍රතාවය පවත්වා ගැනීමට ප්‍රමාණවත් කම්කරුවන් පිරිසක් නොමැතිවීම ප්‍රධාන බාධකයකි. උපකරණ හා සේවාවන් ලැබීම ප්‍රමාදවීම, පුස්තකාල ජාලය හරහා කාර්යක්ෂම හා කාලීන සේවාවන් ලබාදීමට පවතින තවත් බාධකයකි. පුස්තකාල මෘදුකාංග එහි ධාරිතාවයේ උපරිමයට පැමිණීම අපේක්ෂා නොකළ බාධකයකි. පද්ධතියේ කඩා වැටීම වලක්වා ගනු පිණිස සංකේත අංක යෙදීම (Bar coding) සහ සුචි සංස්කරණය කිරීම මන්දගාමි කොට ඇත. පුස්තකාලයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම තවත් ප්‍රබල ගැටළුවක් වන අතර දුලභව පරිහරණය කරනු ලබන කෘති තැන්පතු එකතුවක් ලෙස වෙනම පවත්වාගෙන යෑම සඳහා යෝග්‍ය ස්ථානයක් ලබා ගැනීමට ගත් උත්සාහය ද අසාර්ථක විය.

**අනාගත සැලසුම්**

පුස්තකාලයේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම 2014 වසරේදී සුචි වාර්තා KOHA බවට පරිවර්තනය කොට නිර්වද්‍යතාවය පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පරීක්ෂා කිරීම් සිදුකරනු ලබයි. ප්‍රධාන පුස්තකාලයේ කෘති එකතුවල සංකේත අංක යෙදීම (bar coding) PAC සම්පූර්ණයෙන් නව මෘදුකාංගයකට මාරු කළහොත් 2015 වසරේදි අවසන් කිරීමට ඉලක්ක කොට ඇති අතර එමගින් ප්‍රමාද කළ ස්වයංක්‍රීය සංසරණය නැවත ආරම්භ කළ හැකිවනු ඇත. නව පුස්තකාල ගොඩනැගිල්ලක් සොයා ගැනීමේ මූලික ක්‍රියාමාර්ග මේ වනවිට ක්‍රියාත්මක වන අතර මෙම කාර්යය 2015 වසරේ ආරම්භ වනු ඇත. දීර්ඝ කාලයක සිට දැනෙන CCTV කැමරා පද්ධතියක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 2014 වසරේදි සවි කිරීමට අපේක්ෂිතයි. පවිත්‍රතා සේවාවන් ඉටු කර ගැනීම සඳහා පවතින කම්කරු හිඟය මඟහරවා ගැනීම සඳහා පුද්ගලික පවිත්‍රතා සේවාවක් ඉල්ලමින් කළ ඉල්ලීමට සුබවාදි ප්‍රතිචාරයක් ලැබුණ අතර 2015 ජනවාරි මාසයේදී බාහිර සමාගමක් විසින් එම සේවාව ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## C2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස 2014 වසරේදී ස්ථාපිත කරන ලදී. උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් සාමාජිකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා දියුණු කර ගැනීමට අවස්ථාවක් ලබාදීම මෙම මධ්‍යස්ථානයේ එක් ප්‍රධාන අරමුණකි. මධ්‍යස්ථානය විසින් සැලසුම් කොට පැවැත්වීමට නියමිත අර්ධ කාලීන සහ නිත්‍ය පුහුණු වැඩ සටහන් රාශියක් තුළින් මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

පරිගණක භාවිතා කිරීමේ ස්ථාන 320කට පමණ ඉඩ සැලසිය හැකිවනසේ මධ්‍යස්ථානය සැලසුම් කර ඇත. Mbps 1000 අතර එම පරිගණක සියල්ලම VLAN කිහිපයකට සම්බන්ධ කර ඇත. එක් පරිගණකයකට දත්ත සැපයීමේ වේගය Mbps 100 කි. වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානය ෆයිල් සර්වරයක්, වෙබ් සර්වරයක්, මේල් සර්වරයක්, ප්‍රොක්සි සර්වරයක්, දත්ත ගබඩා සර්වරයක් සහ කන්ටෙන්ඩ් මැනේජ්මන්ට් සර්වරයක් හා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වැඩමළු 160 කින් යුකත්ත වේ. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය හරහා ලැබුණු අන්තර් ජාල සබඳතාවය Mbps (1) එකකි. අන්තර්ජාල සබඳතාවය සඳහා ADLS මාර්ග තුනක් ඇත.

### ජයග්‍රහණ

- ප්‍රථම උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් පවත්වනු ලබන තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩ සටහන් සහ පොදු මහජනයා උදෙසා කෙටි පාඨමාලා පැවැත්වීම ද අඛණ්ඩව සිදුකරන ලදී. පසුගිය වසර හා සංසන්දනය කරන විට මෙවර බාහිර අපේක්ෂකයින් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් රාශියක් පවත්වන ලදී.
- ප්‍රථම උපාධි අපේක්ෂකයන් වෙනුවෙන් විශේෂ කෙටි කාලීන පුහුණු වැඩසටහන් තුනක් පැවැත්වීය.
- HETC ව්‍යාපෘතිය යටතේ UTEL සහ UCTIT මාර්ගගත විභාග පැවැත්වීම සඳහා පරිගණක පහසුකම් සපයා දෙන ලදී.
- HETC ව්‍යාපෘතිය විසින් පරිත්‍යාග කළ මුදල් යොදා ගනිමින් නව බහු කාර්යය යන්ත්‍ර 50ක් මිලදී ගන්නා ලදී.
- පරිහරණයට නුසුදුසුව පැවති පරිගණක පුටු හා කාර්යාල පුටු 125ක් පමණ අලුත්වැඩියා කරන ලදී.

### බාධක සහ පිළියම්

සහභාගීවන්නන්ගේ සංඛ්‍යා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් වර්ෂයේ මුල් මාස කිහිපයේදී නිත්‍ය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි විය. ප්‍රචාරණ ක්‍රියාවලිය ප්‍රමාණවත් නොවීම මේ සඳහා බලපෑ හේතුව ලෙස හඳුනාගෙන ප්‍රචාරණ කටයුතු පුළුල් කරන ලදී.

### අනාගත සැලසුම්

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සේවාවන් ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට මෙන්ම පොදු මහජනතාවට ද ලබාදීම සඳහා එහි සේවාවන් පුළුල් කිරීමට අපේක්ෂිතයි.

## C3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය

(අංශ ප්‍රධාන, ඒ.එන්.එම්. සල්ගාදු මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන සහයක ඒකකයක් වන අතර එහි මූලික අරමුණ වනුයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට අධ්‍යයන, වෘත්තීය හා සාමාන්‍ය කටයුතු සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමයි. ඉංග්‍රීසි භාෂව ඉගැන්වීමේ ඒකකය පීඨ අටටම ඉංග්‍රීසි පාඨමාලා පවත්වන අතර වර්තමානය වනවිට එහි විවිධ මට්ටමේ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 4500 කි. අදාළ පීඨවල අවශ්‍යතාවයන්ට අනුව ප්‍රථම, දෙවන සහ තෙවන වසරවලදී ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි (ESL) විශේෂ අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි (ESP) හා අධ්‍යයන කටයුතු සඳහා ඉංග්‍රීසි (EAP) ලෙස ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලබයි.

ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට ඉංග්‍රීසි දැනුම ලබා දෙමින් ඔවුන් බලගන්වන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වේ. සිසුන් අදාළ ක්ෂේත්‍රයන්හි හා අනාගත වෘත්තීන්හි ඵලදායි ආකාරයෙන් නියැලීම සඳහා සිසුන්ගේ ඉංග්‍රීසි කුසලතා දියුණු කිරීම අභිලාෂයයි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය උප ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය ලෙස සළකනු ලැබූ අතර මුල් කාලීනව එය ප්‍රධාන ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ ප්‍රධාන කොටසක් ලෙස ක්‍රියාත්මක විය. එය ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලද්දේ 1987 වසරේදීය.

පාසල් මට්ටමේදී තම මව් භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ නවක සිසුන් වෘත්තීය මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යාපනයට යොමු කරවීම පිණිස ඉංග්‍රීසි භාෂා පංති පැවැත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ ප්‍රධාන වගකීම වේ. මෙම ඒකකය මඟින් දෙවිදිහක පාඨමාලාවන් පවත්වනු ලැබේ. සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත්වී ඔවුන් උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිසි ලෙස හැදෑරීම පිණිස මූලික ඉංග්‍රිසි භාෂා කුසලතාවයන් ලබා දෙන කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව හදාරනු ලබයි. එම පාඨමාලාව අවසන් වූ පසු දෙවනුව මෙම මධ්‍යස්ථානය මාර්ගගත ඉංග්‍රීසි පාඨමාලාව පවත්වයි. මේ වනවිට සමාසික ක්‍රමය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වාදීමත් සමඟම කඩිනම් යන වචනය භාවිතා නොකෙරේ. එසේ වුවත් සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ දින සිට ඉංග්‍රීසි පාඨමාලාවන් ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ මුල් කොටස ආසන්න වශයෙන් සති 10 ක් වුවත් අදාළ පීඨවල අවශ්‍යතා සහ විශේෂතාවලට අනුව එය වෙනස් විය හැකිය. මාර්ගගත පාඨමාලාවල කාලසීමාව වර්ෂ 1-3 දක්වා විවිධ වේ.

ඉංග්‍රීසි පංතිවලට සහභාගිවීම අනිවාර්ය වන අතර මුල් සමාසික (2) දෙක තුළ පවත්වනු ලබන ඉංග්‍රීසි විභාගවලට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට ශිෂ්‍යයෙකුගේ 80% ක පැමිණීම අවශ්‍ය වේ. ඉංග්‍රීසි පංතිවලට නිතර සහභාගිවීම තුළින් මනා දැනුමක් ලබා ගත හැකි වන හෙයින් සිසුන්ට තමන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා දියුණු කර ගැනීම සඳහා පංතිවලට සහභාගිවන ලෙසට දිරිමත් කිරීම්ද කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලට සහභාගිවීම සඳහා සිසුවෙකුට ඉංග්‍රීසි භාෂාවට "A" සාමාර්ථයක් ලබා ගැනීම අනිවාර්ය වේ.

වර්තමානයේදි ලෝක බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන HETC ප්‍රදාන කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා ඉංග්‍රීසි වැඩමුළු සංවිධානය කිරීමට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා උපයෝගි කරනු ලැබේ.

### ජයග්‍රහණ

HETC UDG වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම පීඨ වෙනුවෙන් වැඩමුළු පවත්වා ඇත. වෛද්‍ය පීඨයට වැඩමුළු හතරක් කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් හයක්, ඉංජිනේරු, කෘෂිවිද්‍යා හා වෛද්‍ය යන එක් එක් පීඨ සඳහා සිසුන් ප්‍රේරණය කිරීමේ වැඩමුළු දෙකක් ද පවත්වන ලදි. වර්තමානය වනවිට IDAS වැඩසටහන ශාස්ත්‍ර පීඨයේ ආරම්භ කොට ඇත.

**බාධක සහ පිළියම්**

ආචාර්යවරුන් හා උපදේශකයන් වෙනත් විශ්වවිද්‍යාලවලින් ලබා දෙන පරිවාස කථිකාචාර්ය තනතුරු සඳහා පිටව යෑම අප මුහුණ පා සිටින ගැටළුවකි. අධ්‍යයන ආයතනය විසින් මෙහි කාර්ය මණ්ඩලය 73 දෙනෙකුට සීමා කිරීම කඩිනම් පාඨමාලා පැවැත්වීම සඳහා ආචාර්යවරුන්ගේ හිඟයක් ඇති කරයි.

**අනාගත සැලසුම්**

- සියලුම පීඨවල HETC වැඩසටහන පූර්ණ වශයෙන් දියත් කිරීම
- මෙම ඒකකයට කථිකාචාර්යවරුන් බඳවා ගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ හැකි විගස පවත්වනු ඇත.

## C4 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
(අධ්‍යක්ෂ, ආචාර්ය බී.එම්.කේ. පෙරේරා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

2005 වර්ෂයේ ස්ථාපිත කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාවට මෙන්ම අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට ද විවිධ සේවාවන් සැපයීම අඛණ්ඩව සිදුකොට ඇත. සමාලෝචිත වර්ෂයේදී මෙම ඒකකයේ සේවාවන් ලබා ගැනීම පිණිස ඉහළ ඉල්ලුමක් පවතින අතර සිසුන්ට. කාර්ය මණ්ඩලයට හා වෙනත් කණ්ඩායම් සහ සංවිධාන සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු. සම්මන්ත්‍රණ හා දේශන විශාල ප්‍රමාණයක් පවත්වන ලදි. මනෝ විද්‍යා උපදේශනය අවශ්‍ය වූ සිසුන්ට උපකාර කිරීමෙන්ම හා ආවේගාත්මක කම්පනය තුළින් හට ගන්නා අභියෝගයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය පහසු කරවීම ඉතා සාර්ථකව මෙම ඒකකය විසින් සිදුකරන ලදි. පවත්වන ලද බොහොමයක් වෘත්තීය වැඩසටහන් සාමාන්‍ය වශයෙන් කරන ලද ඉල්ලීම්වලට සහ විශ්වවිද්‍යාලයේ උපක්‍රමික සැලසුමෙන් අපේක්ෂිත හා විශේෂයෙන්ම මෙම ඒකකයේ උපක්‍රමික සැලසුමට අනුව සිදුකරන ලදි.

සමාලෝචිත වර්ෂයේදී HETC ව්‍යාපෘතියේ ශිෂ්‍යත්ව යටතේ වැඩසටහන් රාශියක් සිසුන් වෙනුවෙන් පවත්වන ලදි. තෙවන සහ සිව්වන වසරවල සිසුන්ට ඔවුන්ගේ රැකියාවන් තෝරා ගැනීමට සහ ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රවල අනාගත සංවර්ධනයට ඉතා වැදගත් වන ජීව දත්ත සටහන් ලිවීම. ඵලදායි රැකියා සෙවීමේ උපක්‍රම හා සම්මුඛ සාකච්ඡාවලට මුහුණදීම සඳහා අවශ්‍ය කුසලතාවන් පිළිබඳ පුහුණුව ලබා දෙන ලදි.

වෘත්තීය මාර්ගෝපදේපදේශන හා උපදේශන ඒකකයේ අධ්‍යක්ෂ විසින් වෙනත් විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි. මෙම ඒකකයේ වෘත්තීය උපදේශිකා අරෝෂා පෙරේරා මහත්මිය නායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ විශ්වවිද්‍යාවලට ඇතුළත් වන නවකයන් වෙනුවෙන් වැඩ සටහන් කිහිපයක් පැවැත්වූවාය.

වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශක ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය බී.එම්.කේ. පෙරේරා වර්ෂ දහයක් මෙම ඒකකයේ සේවය කොට 2014 අගෝස්තු මාසයේදී විශ්‍රාම ලබා ගත්තේය. එල්.එස්.පී. ලංකාතිලක කැළණිය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති උපාධිය හැදෑරීම සඳහා සේවයෙන් නිදහස් කරන ලදි.

### ජයග්‍රහණ

මෙම ඒකක විසින් සිදුකළ ක්‍රියාකාරකම්වල විස්තර පහතින් දැක්වේ.

අ. ඉංජිනේරු, කලා (දෙමළ සහ සිංහල කථා කරන සිසුන් වෙනුවෙන් වෙන වෙනම වැඩ සටහන් දෙකක්)
කෘෂිවිද්‍යා, දන්ත වෛද්‍ය, සමසෞඛ්‍ය හා පශු වෛද්‍ය යන පීඨවල නවන සිසුන්ගේ දිසානුයෝජන වැඩසටහන් පැවැත්වීම. (සියලු සිසුන්ට එක් දින වැඩසටහනක්)

ආ. විද්‍යා පීඨයේ තෙවන හා සිව්වන වසරවල සිසුන් සඳහා විශේෂ වැඩසටහන් (ඉල්ලුම මත) (HETC අනුග්‍රහය ලද වැඩමුළුව) කෘෂිවිද්‍යා උපාධියෙන් පසු ඉදිරිය. විද්‍යා පීඨය (ප්‍රේරණ වැඩ සටහනින් හොඳම ප්‍රතිඵල අත්කර ගන්නේ කෙසේද?) විද්‍යා පීඨය (වැඩ ලෝකයට ආකල්ප දියුණු කිරීම) සමසෞඛ්‍ය (හෙදියන් සඳහා සන්නිවේදන කුසලතා) ශාස්ත්‍ර පීඨයේ කළමනාකරණ අධ්‍යයන අංශය (වැඩ ලෝකය අවබෝධ කර ගැනීම හා සාර්ථක වෘත්තියක් උදෙසා සැලසුම් කිරීම) යන විශේෂ වැඩසටහන් පවත්වන ලදි. සියලුම සිසුන්ට එක්දින වැඩසටහනක් හා වාණිජවේදි සිසුන්ට විශේෂ වැඩසටහනක්ද පවත්වන ලද අතර මෙම වැඩසටහනට වෘත්තීය සංවර්ධනය හා සම්බන්ධ විවිධ විෂයයන් ආවරණය වන පරිදි සති පහක් පුරා මෙම වැඩසටහන පවත්වන ලදි.

ඇ. අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් පවත්වන ලදි.

- පේරාදෙණිය විශ්වවිද්‍යාල (අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා)
    - ඉගැන්වීමේදී role plays හා සිද්ධි අධ්‍යයනයේ ප්‍රයෝජන
    - ආවේගාත්මක බුද්ධිය
    - අන්තර් පුද්ගල කුසලතා සංවර්ධනය

ඈ. රජරට විශ්වවිද්‍යාලය (අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපක්‍රමික සැලසුම් හා උපදේශන කුසලතා)

ඉ. ගිනිකොණ දිග විශ්වවිද්‍යාලය (අවේගාත්මක බුද්ධිය, අන්තර් පුද්ගල කුසලතා, උපදේශන කුසලතා, පුද්ගල සංවර්ධන සැලසුම්, ගැටුම් නිරාකරණය)

ඊ. යාපනය විශ්වවිද්‍යාලය (අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෘදු කුසලතා සංවර්ධනය.)
උ. සබරගමුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා දෙදින වැඩමුළුව
ඌ. වෘත්තීය සංවර්ධනය සඳහා තොරතුරු තාක්‍ෂණ කුසලතා (කලා සිසුන් 60දෙනෙකු සඳහා තෙදින (03) වැඩසටහන)
එ. මිනිස්බල සවි ගැන්වීම් හා වෘත්තීය සංවර්ධන අමාත්‍යාංශය විසින් සිසුන් 45දෙනෙකු සඳහා " ඔබ අසිරිමත්ය" යටතේ තෙදින වැඩසටහන)
ඒ. වෙනත් සංවිධාන සඳහා පවත්වන ලද වැඩසටහන්

- සණස රක්‍ෂණ කළමනාකරුවන් (ඉලක්ක පිළිබඳ වැඩමුළුව)
- SAITM (අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපදේශන කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩසටහන)
- ශ්‍රී ලංකා සැලසුම් ආයතනය (සිසුන් 150 දෙනෙකු සඳහා නායකත්ව සංවර්ධනය සඳහා දෙදින වැඩසටහන)
- මහනුවර පාසැල් සඳහා වැඩසටහන් 10 ක් (පින්නවල ම.ම. විද්‍යාලය හා අබේපුස්ස මහාවිද්‍යාලය)
- පොල්ගොල්ල සහ මාපනාවතුර වෘත්තීය පුහුණු විද්‍යාලවල සිසුන් (එක් සැසියකට සිසුන් 160 දෙනෙකු)
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (පුද්ගලික ඉලක්ක)

මෙම ඒකකය සතියේ දින හතේම උපදේශන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ හා පේරාදෙණිය ශික්‍ෂණ රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩයේ ක්‍රියාකාරී සහයෝගය සහිතව මානසික කම්පනයට ලක්වූ සිසුන්ට උපදේශනය ලබාදී නිරෝගි තත්ත්වයට පත් කරන ලදි. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ඉල්ලීම මත ද උපදේශනය පවත්වන ලදි. මීට අමතරව සිසුන් පෞද්ගලිකව කැඳවා දෛනික පදනමින් උපදේශනය ලබාදෙන ලද අතර සියදිවි නසා ගැනීමට හෝ ස්වයං හානිකර ගැනීමට තැත් කළ සිසුන් කිහිප දෙනෙකු ඉන් ගලවා ගන්නට ද හැකි විය.

**බාධක සහ පිළියම්**

වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකයේ කටයුතු සුමටව පවත්වා ගෙන යෑම සඳහා හැකි විගස අධ්‍යක්‍ෂ තනතුර පුරවාලිය යුතුවේ.

## උපග්‍රන්ථ D – සහයක සේවාවන්

## D1 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

(අධ්‍යක්‍ෂ. ආචාර්ය සී. බෙනරගම විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 1999 වසරේ මාර්තු මාසයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන්නට විය. ඒ ඒ පීඨවල විවිධ ඒකකයන්වලට ඒකවත්‍ර සංවිධානයක් වෙමින් මෙම මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල පද්ධතියේ අනෙකුත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් බාරව කටයුතු කරයි. වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානයට මෙරට අනෙකුත් ආයතනයන්හි කාර්ය මණ්ඩල සංවර්ධනය කිරීම සඳහා එහි සේවාවන් ලබාදීමේ හැකියාව ද පවතී.

**කාර්ය මණ්ඩලය :**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට අර්ධ කාලීන අධ්‍යක්‍ෂවරයෙකු (අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික) ස්ථිර ලඝුලේඛිකාවක් සහ කම්කරුවෙකු ඇත. කළමනාකරණ කමිටුව විසින් මෙම මධ්‍යස්ථානය කළමනාකරණය කරන අතර වැඩසටහන් කමිටුව විසින් වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

**ජයග්‍රහණ**

පේරාදෙණිය විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2014 වසරේදි පහත සඳහන් වැඩමුළු හා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

### 2014 වසරේදි පවත්වන ලද වැඩමුළු

**"ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම" පිළිබඳ වැඩමුළු**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විද්‍යා පීඨයේ විෂයමාලා සංවර්ධන කමිටුව සමග සහයෝගිතාවයෙන් "ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම" පිළිබඳ වැඩමුළුවක් 2014 පෙබරවාරි මාසයේ 03 වැනි දින පෙ.ව.9.00 සිට ප.ව. 2.00 දක්වා පවත්වන ලදි. මෙම වැඩමුළුව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 40 දෙනෙකු සහභාගි වූහ. වයඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය උදිත් ජයසිංහ මුදලිගේ මෙහි සම්පත්දායකයා ලෙස කටයුතු කළේය.

**"මම සහ මගේ රැකියාව " පිළිබඳ වැඩමුළුව**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කෘෂිවිද්‍යා පීඨයේ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඉහත තේමාවෙන් යුතු වැඩමුළුවක් 2014 පෙබරවාරි 25 වැනි දින කෘෂිවිද්‍යා පීඨයේ පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ SRICANSOL මධ්‍යස්ථානයේදී ප්‍රේරණ වැඩසටහනක් ලෙස පවත්වන ලදි. තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 49 දෙනෙකු මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ අතර එහි සම්පත්දායකයන් ලෙස කෘෂිවිද්‍යා පීඨයේ මහාචාර්ය කේ. සමරසිංහ. මහාචාර්ය දීප්ති බණ්ඩාර. මහාචාර්ය යූ.ආර්. සංගක්කාර. ආචාර්ය එල්.ගලගෙදර හා එස්.බී. අතාවුද යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

**"කාල කළමනාකරණය " පිළිබඳ වැඩමුළුව**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන නිලධාරින් වෙනුවෙන් "කාල කළමනාකරණය" පිළිබඳ වැඩමුළුවක් 2014 මාර්තු 21 වැනි දින පෙ.ව.9.30 සිට

ප.ව.4.00 දක්වා ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන්නට විය. පරිපාලන නිලධාරීන් දහ අට දෙනෙකු (18) සහභාගි වූ මෙම වැඩමුළුවේ සම්පත්දායකයා ලෙස දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය ජයලත් එදිරිසිංහ සහභාගි විය.

## "Ignite Passion" වැඩමුළුව

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලසුලේඛිකාවන් සඳහා ඉහත තේමාව යටතේ පෞරුෂත්ව සංවර්ධන වැඩමුළුවක් 2014 ජූනි 27 වැනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා විශ්වවිද්‍යාල සනාතන සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි. විශ්වවිද්‍යාලයේ ලසුලේඛක/ලේඛිකාවන් 45 දෙනෙකු මෙම වැඩමුළුවට සහභාගි වූ අතර නුගවෙල පරිපාලන වෘත්තිකයන් සඳහා වන අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂිකා සුනේත්‍රා ජයරත්න මහත්මිය සම්පත්දායිකාව ලෙස සහභාගි වූවාය.

### "අන් අයගේ හැඟීම් දැන ගැනීම " පිළිබඳ වැඩමුළුව

මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයීය හෙදියන් තුළ ඵලදායි සන්නිවේදන කුසලතාවන් දියුණු කිරීම සඳහා ඉහත තේමාව යටතේ වැඩමුළුවක් පවත්වන ලදි. මෙය 2014 ජූලි 19 වැනි දින පෙ.ව.9.00 සිට ප.ව. 4.00 දක්වා දන්ත වෛද්‍ය පීඨයේදී පවත්වන්නට විය. මෙම වැඩමුළුව සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයේ සහ දන්ත වෛද්‍ය පීඨයේ වෛද්‍ය රුවන් ජයසිංහ, කෘෂිවිද්‍යා පීඨයේ මහාචාර්ය දීප්ති බණ්ඩාර. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, ආචාර්ය චාලින්ද බෙනරගම මෙම වැඩමුළුවේ සම්පත්දායකයන් ලෙස සහභාගි වූහ.

### "උසස් අධ්‍යාපනයේ නූතන ප්‍රවණතාවන්ට යෝග්‍ය පරිදි විෂයමාලා සංවර්ධනය කිරීම" පිළිබඳ තෙදින (03) වැඩමුළුව

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ඉහත තේමාව යටතේ තෙදින වැඩමුළුවක් 2014 නොවැම්බර් 17, 18 හා 26 වැනි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.15 දක්වා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී පවත්වන ලදි. මහාචාර්ය දීප්ති බණ්ඩාර සම්පත්දායිකාව ලෙස සහභාගි වූ මෙම වැඩමුළුවට කෘෂිවිද්‍යා, සමසෞඛ්‍ය, කලා, ඉංජිනේරු, වෛද්‍ය සහ විද්‍යා යන පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 26දෙනෙකු සහභාගි වූහ.

### කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා "ස්වයං බල ගැන්වීම" පිළිබඳ දෙදින වැඩමුළුව

මෙම මධ්‍යස්ථානය ඉහත තේමාව යටතේ දෙදින වැඩමුළුවක් 2014 දෙසැම්බර් 15,16 යන දිනවල ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පවත්වන ලදි. පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 35දෙනෙකු මේ සඳහා සහභාගි වූ අතර හිටපු උපකුලපති මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන්, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, ආචාර්ය ජයලත් එදිරිසිංහ, වෘත්තීය හා මාර්ගෝපදේශන ඒකකයේ අධ්‍යක්ෂ, ආචාර්ය බී.එම්.කේ. පෙරේරා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, ආචාර්ය චාලින්ද බෙනරගම වැඩමුළුවේ සම්පත්දායකයන් ලෙස සහභාගි වූහ.

### පුහුණු වැඩසටහන්

**අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 8 සහ 9 වැනි ප්‍රේරණ වැඩසටහන (වෙනම වූ වැඩසටහන් දෙකක්)**

**මෙම වැඩසටහන 2014 වර්ෂයේ පහත සඳහන් දිනයන්වලදී පවත්වන ලදි.**

| අදියර | පළමු වැඩ සටහන | දෙවන වැඩ සටහන |
|---|---|---|
| පළමු අදියර | පෙබරවාරි 17 සිට 21 සහ 24 සිට 28 | සැප්තැම්බර් 23 සිට 26 සහ 30 ඔක්තෝබර් 03 දක්වා |
| දෙවන අදියර | මාර්තු 10 සිට 14 සහ 17 සිට 21 | ඔක්තෝබර් 14 සිට 17 සහ 20 සිට 24 |
| තෙවන අදියර | අප්‍රේල් 01 සිට 09 දක්වා | ඔක්තෝබර් 28 සිට 31 සහ නොවැම්බර් 03 සහ 04 |

මෙහි පළමු වැඩසටහන සඳහා පේරාදෙණිය, ඌව වෙල්ලස්ස, මොරටුව හා ගිනිකොණ දිග යන විශ්වවිද්‍යාලවලින් 25 දෙනෙකු සහභාගි වූ අතර දෙවන වැඩසටහන සඳහා පේරාදෙණිය, ඌව වෙල්ලස්ස යන විශ්වවිද්‍යාල දෙකෙන් 24 දෙනෙකු සහභාගි වූහ. මෙම එක් එක් වැඩ සටහන සඳහා සම්පත්දායකයන් 35දෙනෙකු සහභාගි වූහ.

**බාධක සහ පිළියම්**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 937 යටතේ 2014 වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා යෝජනාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත බාරදී තිබුණි. එම යෝජනාවට අනුව ඉහත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට මෙම මධ්‍යස්ථානයට හැකි වූ අතර ඉතිරි වැඩසටහන් ඊළග වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරනු ඇත.

වර්තමානයේදි විශ්වවිද්‍යාලයේ සේවක කාණ්ඩ රාශියකට පුහුණුව ලබාදීමට මෙම මධ්‍යස්ථානයට හැකි වූ අතර 2015 වසර අවසාන වනවිට සෑම සේවක කාණ්ඩයකටම එක් පුහුණු වැඩසටහනක් හෝ ලබාදීමට අපේක්ෂා කරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වූ අතර එය මෙම මධ්‍යස්ථානයේ පාලනයට පරිබාහිර හේතුන් නිසාවෙනි. ඒ කෙසේ වෙතත් ජනවාරි මාසය අවසානයේදී පමණ මෙම නව ගොඩනැගිලි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීමට අපේක්ෂිතයි.

**අනාගත සැලසුම්**

විශ්වවිද්‍යාලයේ සියළුම සේවක කාණ්ඩවලට අයත් සෑම සේවකයෙකුටම එක් පුහුණු වැඩසටහනක් හෝ පිරිනැමීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය බලාපොරොත්තු වේ. මෙම මධ්‍යස්ථානයේ කාර්යාලය පූර්ණ උපාංගවලින් යුතු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස 2015 වසරේදී වෙනම ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සැලසුම් සකස් කොට ඇත.

## D2 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්

(ප්‍රධාන වෛද්‍ය නිලධාරි, වෛද්‍ය පී.එම්.ඒ. සමරක්කොඩි විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානය රජය මගින් හෝ පුද්ගලික ආයතන මගින් නඩත්තු කරනු ලබන මධ්‍ය ප්‍රමාණයේ රෝහල් හා සංසන්දනය කිරීමේදී සුවිශේෂී වෙයි.

මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානය සිසුන්, විශ්වවිද්‍යාල සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පුද්ගලයන් 20,000ගේ පමණ සුවකාරක වෛද්‍ය සේවා අවශ්‍යතාවයන් ඉටු කර දෙනු ලබයි. එමෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථානය ප්‍රජා/පාරිසරික සෞඛ්‍ය පවත්වා ගැනීමේ හා කසල බැහැර කිරීම කළමනාකරනය කිරීම සඳහා අවශ්‍ය කාර්යයන්හි ද නිරතවේ.

මෙතරම් සුවිශාල වූ පිරිසකගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් පිරිමසාලීම සඳහා මනා ලෙස සංවිධානය කළ කාර්යය වැඩසටහනක් හඳුන්වා දී ඇති අතර එක් එක් රෝගියාට අදාළ වෙන වෙනම පුද්ගලික ලිපිගොනුවක ද මෙම මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. සේවකයන් හා සම්බන්ධ පුද්ගලික ලිපිගොනු සේවයට බඳවා ගැනීමේ යෝග්‍යතාවය පෙන්නුම් කෙරෙන වෛද්‍ය වාර්තාවලින් ආරම්භ වන අතර සිසුන්ගේ ලිපිගොනු ආරම්භ වනුයේ මූලික වෛද්‍ය වාර්තා ඇතුළත් කිරීමෙනි. සේවක ලිපිගොනු ඔවුන් විශ්‍රාම ලබාගන්නා තෙක්ම පවත්වාගෙන යන අතර සිසුන්ගේ ලිපිගොනු ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අවසන් කරන තෙක්ම පවත්වාගෙන යනු ලබයි.

මෙතරම් විශාල පිරිසකගෙන් යුක්ත මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානය රෝගි හෝ රෝගි නොවන සෑම පුද්ගලයෙක් වෙනුවෙන්ම සෞඛ්‍ය ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබන එකම ආයතනය මෙය බව මේ පිළිබඳ නිරීක්ෂණය කරන්නෙකුට වැටහෙනු ඇත.

සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට අමතරව විශ්වවිද්‍යාලයේ සිසුන් හා සේවකයන් වෙනුවෙන් පහත සඳහන් සේවාවන් ද ලබා දෙනු ලබයි.

1. ඉහළ අවධානමක් සහිත සිසුන්ට එන්නත් ලබා දීම (හෙපටයිටීස් B/ARV/TT)
2. උපදේශනය
3. ක්‍රීඩා යෝග්‍යතාවය සඳහා වෛද්‍ය පරික්ෂණය
4. රසායනාගාර විමර්ශන
5. ප්‍රථමාධාර වැඩසටහන්
6. සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල පැවැත්වීම
7. විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය පහසුකම් පිළිබඳ නවක සිසුන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්
8. සිසුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම

පිළිගත් රෝහලකින් අපේක්ෂා කරනුයේ ඒ වෙත පැමිණෙන රෝගීන්ට වෛද්‍ය සේවාවන් ලබාදීම පමණක් වන අතර විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය සෞඛ්‍ය සත්කාරක පහසුකම් සැපයීමට අමතරව පහත සඳහන් ප්‍රජා සේවාවන් ද ලබාදෙනු ලබයි.

1. විශ්වවිද්‍යාල අපද්‍රව්‍ය කළමනාකරණය
2. පාරිසරික සනීපාරක්ෂාව
3. ඩෙංගු උණ පාලනය
4. දඩාවතේ යන සුනඛයන්ට වඳ එන්නත් ලබාදීම
5. නේවාසිකාගාර පරීක්ෂාව හා සනීපාරක්ෂාව
6. ආපනශාලා පරික්ෂාව හා සනීපාරක්ෂාව පවත්වා ගැනීම
7. විශ්වවිද්‍යාලයේ සියලුම ගොඩනැගිලිවල වේයන් මර්ධනය කිරීම
8. ආහාර හා ජල සනීපාරක්ෂාව

කාර්යක්ෂම ගිලන් රථ සේවාවක් විසිහතර පැය පුරාම ක්‍රියාත්මක කරන අතර රෝගියෙකු පිළිබඳව දැනුම් දුන් විට විනාඩි පහක් වැනි කෙටි කාලයක් තුළ කිලෝමීටර් හයක පමණ දුරක් ආවරණය කරමින් රෝගියා වෛද්‍ය ප්‍රතිකාර සඳහා රැගෙන යනු ඇත. (මෙම ක්‍රමය සංවර්ධිත රටවල ක්‍රියාත්මක වුවත් ශ්‍රී ලංකාවේ වෙන කිසිම තැනක දැකිය නොහැක)

දිනකට රෝගින් 100 දෙනෙකු පමණ මෙම මධ්‍යස්ථානයට පැමිණෙන අතර ඔවුන්ගේ සියලු වෛද්‍ය අවශ්‍යතාවන් මෙම මධ්‍යස්ථානය විසින් සපයා දෙනු ලබයි. රෝගියෙකුට අවශ්‍ය කරන කිසියම් ඖෂධයක් මධ්‍යස්ථානයේ නොතිබුණහොත් එම ඖෂධය මිලදී ගෙන කෙටි කාලයක් තුළ රෝගියාට ලැබෙන්න සලස්වනු ඇත. මෙම කාර්යය ද රජයේ රෝහල්වල හෝ බාහිර රෝගී අංශවලින් සිදු නොවන්නකි.

විශ්වවිද්‍යාල සේවකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ සම්බන්ධයෙන් විශේෂ ක්‍රියාකාරකමක් මෙම සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කරන ලදි. ඒ අනුව අවුරුදු 40 ට වැඩි 1,600ක් පමණ සේවකයන් පිරිසක් අවශ්‍යතාවය පරිදි වාර්ෂිකව හෝ ද්විවාර්ෂිකව පරීක්ෂා කොට සියලුම අවශ්‍ය කරන විමර්ශන ගාස්තු අය කිරීමකින් තොරව සිදුකරනු ලබයි.

විශ්වවිද්‍යාල සේවකයන් සෑම කෙනෙක්ම මෙම වැඩසටහනට ඇතුළත් කොට ඇති අතර විශ්‍රාම ලබා ගන්නා අවස්ථාව වනතෙක්ම අවශ්‍ය වන පරිදි වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කෙරේ. මේ තුළින් සේවකයන්ට ඔවුනගේ විශ්‍රාමික දිවිය නිරෝගි පුද්ගලයෙකු ලෙස ගත කිරීමට හැකිවනු පිණිස අවස්ථාව උදාකරදීම මෙම ක්‍රියාමාර්ගයේ පරමාර්ථය වේ. මෙම වැඩසටහන සඳහා ඉතා අඩු වියදමක් දැරීමට සිදුවන හෙයින් එය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමටද යෝග්‍ය වේ. එවන් ක්‍රියා මාර්ගයක් ගන්නේ නම් විශ්වවිද්‍යාලයේ මෙම වැඩසටහන අධ්‍යයනය කොට නියමු ව්‍යාපෘතියක් ලෙස සලකා බැලිය හැකිය.

ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වියදම් කරනු ලබන ප්‍රාග්ධන වියදම රුපියල් 5,500/ක් පමණ වන අතර විශ්වවිද්‍යාලය සමග එක්ව පුළුල් සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ නම් එක් පුද්ගලයෙකුට වැය වන මුදල රුපියල් 8000/- කට අඩුය.

මෙම සියලු ක්‍රියාකාරකම් සඳහා ලබාදී ඇති කාර්ය මණ්ඩලය වෛද්‍ය නිලධාරීන් සිව් දෙනෙකු, හෙදියන් නව දෙනෙකු සහ සහය කාර්ය මණ්ඩල සාමාජිකයන් 40දෙනෙකුගෙන් යුක්ත වේ.

මෙම සියලු කාර්යයන් සිදුකිරීම සඳහා පවතින ගොඩනැගිලි පහසුකම් නිල රාජකාරි සිදුකරන පැරණි උඩුමහළ හා වර්ග අඩි 2000කින් පමණ යුක්ත "ප්‍රජා හා පරිසර ඒකකයකින් සමන්විත වේ".

විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහන ඵලදායි ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහන් හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කරන අයෙකු හෝ සෞඛ්‍යමය ආර්ථික කටයුතුවල නියැලි සිටින විශේෂඥයකු විසින් අධ්‍යයනය කරන්නේ නම් සුදුසුවේ යැයි සඳහන් කළ යුතුවේ.

**ජයග්‍රහණ**

1. දියවැඩියාව, රුධිර පීඩනය, කොලොස්ටරෝල්, අක්මාවේ ක්‍රියාකාරිත්ව, වකුගඩු රෝග සම්බන්ධයෙන් සේවකයන් 920 දෙනෙකු පරීක්ෂා කොට ප්‍රතිකාර සඳහා යොමු කරන ලදි.
2. විශ්වවිද්‍යාල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ආරම්භ කොට දැනට ක්‍රියාත්මක වේ.
3. මානසික රෝග සහිත සිසුන් වෙනුවෙන් නිසි කළමනාකරණයක් හා පසු ක්‍රියාමාර්ග වැඩ සටහනක් ස්ථාපිත කරන ලදි.
4. සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කොට එහි කටයුතුවලින් 75%ක් පමණ අවසන් කර ඇත.
5. රසායනාගාරයට අලුතින් වෛද්‍ය රසායනාගාර තාක්ෂණිකයෙකු ලබා ගන්නා ලදි.
6. නේවාසිකාගාරයන්හි ඇඳන්වල මකුණන් බෝවීමේ ගැටළුව සැලකිය යුතු මට්ටමින් විසඳන ලදි.

**අනාගත සැලසුම්**

1. විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලබා ගන්නා සේවකයන්ගේ විශ්‍රාමික දිවිය ඵලදායි ආකාරයෙන් ගත කිරීම හා විශ්‍රාම ලබා ගැනීමෙන් අවුරුදු දෙකක කාලයක් ඔවුන්ගේ සුබසාධනය නිරීක්ෂණය කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
2. විශ්වවිද්‍යාල ආපන ශාලා ප්‍රතිසංවිධානය කොට පිළිගත් තත්ත්වයන්ට අනුව ඒවායේ නඩත්තු කටයුතු සහතික කිරීම.
3. නේවාසිකාගාර තුළ සනීපාරක්ෂක කටයුතු දියුණු කොට ඒ සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
4. විශ්වවිද්‍යාලයට බරක් නොවන පරිදි සෞඛ්‍ය මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් (ගොඩනැගිලි) දියුණු කිරීම.
5. සිසුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන ශක්තිමත් කිරීම
6. සේවකයන් වෙනුවෙන් වෘත්තීය ආශ්‍රිතව හටගන්නා සෞඛ්‍ය ගැටළු වැලැක්වීමේ වැඩසටහනක් ස්ථාපිත කිරීම
7. විශ්වවිද්‍යාලය තුළ දඩාවතේ යන සුනඛයන්ගේ ගැටළුවට පිළියමක් වන පරිදි "වගකීමෙන් යුතුව සුරතල් සතුන් ඇති කිරීම" පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

## D3 21 වැනි ශතවර්ෂයේ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය
(අධ්‍යක්ෂ, මහාචාර්ය රංජිත් දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

21 වැනි ශත වර්ෂයේ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යනු 2011 වසරේ සිට 2016 වසර දක්වා අවුරුදු 5 1/2ක කාලයක් පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ශ්‍රී ලංකා රජයට ලබා දෙන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 40ක ණය ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ උසස් අධ්‍යාපන පද්ධතියේ සමාර්ථතාවය ඉහලනැංවීම හා රටට අවශ්‍ය සාධාරණ, සමාජ හා ආර්ථික සංවර්ධනයට සමාන්තරව උසස් අධ්‍යාපන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමයි.

මෙම ව්‍යාපෘතියට කරුණු හතරක් අඩංගුවේ. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවක් සහ තත්ත්ව සහතික හා පැවරුම් ක්‍රමයක් සංවර්ධනය කිරීම එහි පළමු කරුණයි. සියලුම විශ්වවිද්‍යාල පහළොවෙම (15) ඉගෙනුම් හා ඉගැන්වීම අදාළත්වය සහ ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම එහි දෙවැන්නයි. තෙවැනි කාරණය වනුයේ උසස් තාක්ෂණික ආයතන සංවර්ධනය කිරීම තුළින් විකල්ප උසස් අධ්‍යාපනය ශක්තිමත් කිරීම වන අතර උසස් අධ්‍යාපන පද්ධතියේ මානව සම්පත් ශක්තිමත් කිරීම එහි සිව් වැනි කාරණයයි.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කරගෙන යෑම සඳහා සෑම විශ්වවිද්‍යාලයකම මෙහෙයුම් තාක්ෂණික කාර්යාල (OTS) ස්ථාපිත කිරීම ද මෙහි අරමුණකි. මෙම කාර්යාල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ලැබෙන ප්‍රදානවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමයි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ලැබෙන ප්‍රදාන 14 ක් ඇත. එබැවින් එම සෑම ප්‍රදාන ක්‍රියාකාරකමක්ම OTS කාර්යාලය හරහා සම්බන්ධීකරණය කරනු ලබයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ OTS කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රදාන පහත පරිදි වේ.

1. විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදානය
2. බාහිර උපාධි වැඩසටහන
3. කලා සිසුන්ගේ නව නිර්මාණ සංවර්ධනය
4. කෘෂිවිද්‍යා පීඨයේ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
5. දන්ත වෛද්‍ය පීඨයේ තත්ත්ව හා නව නිර්මාණ ප්‍රදානය
6. කෘෂිවිද්‍යා පීඨයේ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානයේ දෙවන වටය
7. පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය දෙවන වටය
8. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
9. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
10. කෘෂි ව්‍යාපාරික මධ්‍යස්ථානය/තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
11. පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය/ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
12. විද්‍යා පීඨය/ තත්ත්ව සහ නව නිර්මාණ ප්‍රදානය
13. මානව සම්පත් සංවර්ධනය
14. මෙහෙයුම් තාක්ෂණික කාර්යාලය

**ජයග්‍රහණ**

2014 වර්ෂය අවසාන වනවිට පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය HETC ව්‍යාපෘතියේ සියලුම ප්‍රදානවලින් 60%ක මුදල් ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රගතින් සමග පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කොට ඇත.

1. භාණ්ඩ සැපයීම - (පරිගණක, මල්ටිමීඩියා ප්‍රෙජෙක්ටර්, රසායනික හා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් යන්ත්‍ර)
2. වැඩ - දේශන ශාලා, සම්මන්ත්‍රණ ශාලා ආදිය පුනරුත්ථාපනය කිරීම
3. උපදේශන - විෂය නිර්දේශ සංවර්ධනය කිරීම ආදි කටයුතු
4. වෙනත් සේවාවන් - සිසුන් හා ආචාර්යවරුන් සඳහා පුහුණු වැඩමුළු ආදිය

**අනාගත සැලසුම්**

2015 වසර අවසන් වනවිට සියළුම QIG ප්‍රදාන 100%ක්ම කාර්යයන් සඳහා වියදම් කිරීමට සැලසුම් කෙරේ. 2016 වසර සඳහා සැලසුම් කළ නව ව්‍යාපෘති වෙනුවෙන් ව්‍යාපෘති යෝජනා සංවර්ධනය කොට ඇත.

## D4 ශාරීරික අධ්‍යාපන අංශය

(වැඩබලන අධ්‍යක්ෂ, පාලිත කුමාර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා භාර අංශය වශයෙන් ශාරීරික අධ්‍යාපන අංශය ජීවිතකාලීන ක්‍රීඩා ප්‍රගුණනය ස්වයං වර්ධනයට හා වඩා යහපත්වූ ස්වස්ථතාවක් හා නිරෝගිභාවය වැනි ද්විතියික ප්‍රතිඵල අත්කර දීම එහි ඉලක්කය ලෙස සළකයි. ශාරීරික අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ විසින් එහි ප්‍රධානත්වය දරණ අතර මෙහි වැඩසටහන් මනා ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා උගත් හා වෘත්තිමය වශයෙන් සුදුසුකම් සපිරූ උපදේශකයන් හය දෙනෙකු (6) මෙම අංශයට අනුයුක්ත කොට ඇත. ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා අන්තර් ක්‍රීඩා තරඟ හා විනෝද කටයුතු අවස්ථාවන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ආයතන, දේශීය හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරනු ලබන තරඟකාරී ක්‍රීඩා ඉසව්වලට සහභාගි වීමේ අවස්ථාව උදාකරදීම සහ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළු පැවැත්වීම හා විටින්විට ක්‍රීඩාව පිළිබඳ න්‍යායාත්මක පංති පැවැත්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සිසුන්ට ඔවුන්ගේ ගත සිත සංවර්ධනය කර ගැනීමට මනා අවස්ථාවක් උදාවන අතර එමඟින් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් හා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩ හරහා සාර්ථකත්වයක් අත්කර ගැනීමටත් අවශ්‍ය කුසලතා දියුණු කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව ද නිර්මාණය වනු ඇත.

### ජයග්‍රහණ

විශ්වවිද්‍යාල ක්‍රීඩාවේ වඩාත් උච්චතම අවස්ථාව ලෙස සැලකෙන අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය මෙවර ද පවත්වන්නට යෙදුන අතර එහිදි කාන්තා අංශයේ සමස්ත ශූරතාවය ද සමස්ත තරඟාවලියේ තෙවන ස්ථානය ද පේරාදෙණිය විශ්වවිද්‍යාලය දිනා ගැනීම නිසා කැපී පෙනෙන වසරක් ලෙස 2014 සඳහන් කළ හැකිය.

මෑතකදි පවත්වන ලද 2014 අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලියේදි පේරාදෙණිය විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අපේක්ෂකයන් කැපී පෙනෙන දක්ෂතා පෙන්නුම් කළ අතර එම තරඟාවලියේදී චෙස්, බර ඉසලීම, පිරිමි අංශයේ මල්ලව පොර හා කාන්තා අංශයේ පිහිනුම් තරඟවලින් ශූරයන් බවට පත්විය. පේරාදෙණිය පිරිමි කණ්ඩායම් හොකී, කරාතේ, මාර්ග ධාවන තරඟ, රග්බි හා පිහිනුම් යන ක්‍රීඩා ඉසව්වලින් දෙවන ස්ථානය ද දැල් පන්දු හා මේස පන්දු යන ඉසව්වලින් කාන්තා කණ්ඩායම දෙවන ස්ථානයට ද පත් විය. බේස් බෝල, ටෙනිස් හා ජවන හා පිටිය ඉසව්වලින් පේරාදෙණිය පිරිමි කණ්ඩායම් තෙවන ස්ථානය අත් කර ගත් අතර කාන්තා කණ්ඩායම් පැසි පන්දු, කැරම්, චෙස්, හොකී, ජවන හා පිටිය ඉසව්වලින් තෙවන ස්ථානය ද අත් කර ගනු ලැබීය.

### 2012/2013 වර්ණ ප්‍රදාන උත්සවය

ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි විශිෂ්ට දක්ෂතා දක්වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රථම උපාධි අපේක්ෂක ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට උපහාර පිදෙන වාර්ෂික වර්ණ ප්‍රදාන උත්සවය 2014 ඔක්තෝබර් 17 වැනි දින පේරාදෙණිය විශ්වවිද්‍යාල ඊ.ඕ.ඊ. පෙරේරා ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්විය. මෙම මහඟු අවස්ථාවේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් 2012/2013 වසරවලදී අන්තර් විශ්වවිද්‍යාල තරඟ. ජාතික හා ජාත්‍යන්තර තරඟවලදී කැපී පෙනෙන දක්ෂතා පෙන්නුම් කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වර්ණ හා විශේෂ සම්මාන පිරිනමනු ලැබීය. විශේෂ සම්මාන 29ක් හැරුණු විට ක්‍රීඩකයන් 274 දෙනෙකුට හා ක්‍රීඩිකාවන් 167 දෙනෙකුට දේශීය හා ජාත්‍යයන්තර තරඟවලින් අත්කරගත් ජයග්‍රහණ වෙනුවෙන් පූර්ණ වර්ණ ප්‍රදානය පිරිනමනු ලැබීය.

### ලෝක විශ්වවිද්‍යාල බර ඉසිලීමේ ශූරතාවය - 2014

ලෝක විශ්වවිද්‍යාල බර ඉසිලීමේ තරඟාවලිය 2014 දෙසැම්බර් 5 - 8 යන දිනවල තායිලන්තයේ චියැංමායිහිදී පවත්වන ලදි. ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල බර ඉසිලීමේ කණ්ඩායම නියෝජනය කරමින් අපගේ එක් බර උසුලන්නෙක් සහභාගි වූ අතර ඔහු කිලෝ ග්‍රෑම් 56 බර පන්තිය යටතේ තරඟ කලේය. වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාල නියෝජනය කරමින් මෙම ලෝක තරඟාවලියට ශිෂ්‍ය බර උසුලන්නන් සිව් දෙනෙකු සහභාගි වූහ. පේරාදෙණිය විශ්වවිද්‍යාල ශාරීරික අධ්‍යාපන අංශයේ

අධ්‍යක්ෂ පාලිත කුමාර මහතා ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල බර ඉසිලීමේ කණ්ඩායම බාර ප්‍රධානියා විය.

**අන්තර් පීඨ නවකයන්ගේ ක්‍රීඩා ශූරතාවලිය -2014**

වාර්ෂික සංසිද්ධියක් ලෙස පැවැත්වෙන මෙම තරඟාවලිය ශාරීරික අධ්‍යාපන අංශය විසින් සාර්ථකව සංවිධානය කරන ලදි. විවිධ ක්‍රීඩා ක්ෂේත්‍ර 20ක් ඇතුළත් වූ මෙම තරඟාවලියට සියළුම පීඨ සහභාගි වූ අතර අති සාර්ථක ලෙස නිමා විය.

**අධ්‍යාපන / පුහුණු වැඩසටහන්**

ශාරීරික අධ්‍යාපන අංශය විශ්වවිද්‍යාල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉලක්ක කර ගනිමින් ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා පුහුණු වැඩසටහන් වර්ෂය පුරාම පවත්වන ලදි. ඊට අමතර ක්‍රීඩා කණ්ඩායම්වල ක්‍රීඩකයන් මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව සහ දෙපාර්ශවය සඳහා සවි පුහුණු හා ශාරීරික වැඩසටහන් ද වරින් වර පවත්වන ලදි. මෙම විශ්වවිද්‍යාලයේ පවතින සියලුම ක්‍රීඩිකාවන් සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු ජනවාරි මාසයේ ආරම්භ කොට වර්ෂය පුරාම පවත්වන ලදි. විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අපේක්ෂකයන් ඉලක්ක කොට විනෝද ක්‍රීඩා ක්‍රියාකාරකම් කිහිපයක් ද පවත්වන්නට විය.

**ප්‍රධාන තරඟාවලි/ආරාධිත තරඟාවලි/විදෙස් සංචාර**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කණ්ඩායම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව සහ පාපන්දු සංගමය විසින් සංවිධානය කළ ප්‍රධාන තරඟාවලි කිහිපයකට සහභාගි වූහ. එමෙන්ම විශ්වවිද්‍යාල කැරම්, පාපන්දු, රගර්, හොකී, ක්‍රිකට, තයිකොන්ඩෝ, චෙස්, දැල් පන්දු, පැසිපන්දු. මේස පන්දු හා වුෂු යන කණ්ඩායම් ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල විසින් සංවිධානය කළ ආරාධිත තරඟාවලි කිහිපයකට ද සහභාගි වූහ.

පේරාදෙණිය විශ්වවිද්‍යාල පැසිපන්දු කාන්තා කණ්ඩායම ජූලි 18-19 යන දිනවල කොළඹදී පැවැත්වූ යෞවන ක්‍රීඩා උළෙලේ දෙවන ස්ථානය දිනා ගන්නා ලදි. නොවැම්බර් 8-9 යන දිනවල මහනුවරදී පැවැත්වූ මහනුවර විවෘත බැඩ්මින්ටන් තරඟාවලියේ දෙවන ස්ථානය දිනා ගැනීමට කාන්තා කණ්ඩායම සමත් වූවාය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය රග්බි, බැඩ්මින්ටන් හා ටෙනිස් පිරිමි කණ්ඩායම් මැලේසියාවේ පැවැත්වූ 9 වැනි UiTM 2014 ජාත්‍යන්තර ක්‍රීඩා උත්සවයට සහභාගි වූහ.

**බාධක සහ පිළියම්**

පවතින ක්‍රීඩා පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය දීර්ඝ කලක සිට මෙම අංශයට දැනෙනා අවශ්‍යතාවයකි. මෙම පහසුකම් බොහොමයක්ම කල් පැන ගොස් ඇති හෙයින් හා පරිහරණය කළ නොහැකි නිසා ඒවා හැකි විගස ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. මලල ක්‍රීඩා පිටිය, රගර් හා පාපන්දු පිටිය, ක්‍රිකට් ක්‍රීඩා පිටිය, පිහිනුම් තටාකය හා ගෘහස්ථ ක්‍රීඩාගාරය යන ස්ථානවල තත්ත්වය ඉහළ නංවා දියුණු කළ යුතුව ඇත. මේ පිළිබඳව නැවත නැවතත් ඉල්ලීම් කළද මෙතෙක් එම ව්‍යාපෘති අවසන්වී නොමැත.

**අනාගත සැලසුම්**

ශාරීරික අධ්‍යාපන අංශය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය සම්බන්ධ non –credit විෂයයන් පැවැත්වීමට සැලසුම් සකස් කරමින් සිටී. මෙම විෂයයන් සියලුම පීඨ සඳහා non –credit පදනම මත ප්‍රථම උපාධි විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට ශාරීරික අධ්‍යාපන අංශය අදහස් කරයි.

## D5 ශිෂ්‍ය සේවා අංශය

(සහකාර ලේඛකාධිකාරී, සී.කේ.කේ. රත්නායක මිය විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

ශිෂ්‍ය සේවා අංශය සිසුන් වෙනුවෙන් විවිධ මාදිලියේ සේවාවන් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ හා වෙනත් සේවා ඒකකවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබයි.

විශ්වවිද්‍යාල ප්‍රජාව ශිෂ්‍ය උපදේශනය, සංස්කෘතික, ආගමික හා සිසු සංගම්වල ක්‍රියාකාරකම් වැනි සුබසාධන, සංස්කෘතික සහ ආගමික වශයෙන් පුළුල් පරාශයක ක්‍රියාකාරකම් සඳහා සහභාගි වෙයි.

විශ්වවිද්‍යාලය තුළ සිසු විනය පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් විශ්වවිද්‍යාලය විසින් ගෙන ඇත. විශ්වවිද්‍යාලය තුළ සිසු විනය සම්බන්ධ කරුණු ගැන උපකුලපතිතුමා වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයෙකු විනය පාලක ලෙස උපකුලපතිතුමා විසින් පත් කොට ඇත. එමෙන්ම උපකුලපතිතුමා අදාළ පීඨ සමග සාකච්ඡා කොට එක් එක් පීඨය සඳහා නියෝජ්‍ය විනය පාලකවරයෙකු ද පත් කොට ඇත.

වර්තමානය වනවිට විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංගම් සංඛ්‍යාව 882 කි. 1978 අංක 16 දරණ පණතේ 135, 112 වගන්තිය, 1985 අංක 7, 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත 1978 අංක 16 දරණ පණතේ 135,112 යන වගන්ති ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සකස් කළ අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය සහ පීඨවල සියළු ශිෂ්‍ය සංගම් ස්ථාපිත කොට ඇත. විශ්වවිද්‍යාල කලා සංගමය විශ්වවිද්‍යාල ප්‍රජාවගේ යහපත උදෙසා චිත්‍රපට උළෙල, වාර්ෂික නාට්‍ය උත්සවය කලා එම සංගමය විසින් පවත්වනු ලබන ක්‍රියාකාරකම්වලින් වැදගත් අංගයකි.

**ජයග්‍රහණ**

1. මාසික මහපොල හා ශිෂ්‍යාධාර ගෙවීම නිසි කලට ක්‍රියාත්මක වේ
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය 1964 වර්ෂයේ විද්‍යාර්ථයින්ගේ සංගමය විසින් ශිෂ්‍යත්ව 64ක් පිරිනමා ඇත.

## D6 ශිෂ්‍ය නේවාසිකාගාර අංශය

(ශිෂ්‍ය නේවාසිකාගාර අධ්‍යක්ෂ ඒ.එන්. සිරිවර්ධන විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

ශිෂ්‍ය නේවාසිකාගාර අංශය විශ්වවිද්‍යාලයේ පවතින ශිෂ්‍ය නේවාසිකාර 16කට වැඩි ප්‍රමාණයක් පාලනය කිරීමෙන් හා වෙන් කරදීමෙන් විශ්වවිද්‍යාලයේ සියළුම සිසුන්ට අති විශාල වූ සේවාවක් සලසනු ලබයි. සිසුන්ට කාර්යක්‍ෂම හා ඵලදායි නේවාසික සේවාවන් හා පහසුකම් සපයාදීමට සහයවීම මෙම අංශයේ ඉලක්කය වේ.

ප්‍රථම උපාධි සිසුන්ට නේවාසික පහසුකම් ලබාදීම, නේවාසික සිසුන්ගෙන් නේවාසික ගාස්තු හා සිදුවන හානිවලට දඩ මුදල් අය කර ගැනීම, නේවාසිකාගාරවල කාර්ය මණ්ඩල කාමර අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට ලබා දීම හා ඔවුන්ගෙන් කාමර ගාස්තු අය කර ගැනීම, අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර අංශය යටතේ සිදුවන කාර්යයන්ය.

**අපගේ අරමුණ වනුයේ සිසුන්ට පහත සඳහන් ආකාරයෙන් සහයවීමයි**

1. නේවාසික පහසුකම් අයදුම් කිරීම/නේවාසිකාගාර පහසුකම් ලබා දීමේ ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි තොරතුරු හා උපදෙස් ලබා දීම.
2. සෑම අවස්ථාවකම සිසුන්ගේ අවශ්‍යතාවන්ට අනුව අයදුම්කාර පුද්ගලයන් ලෙස හඳුනා ගැනීම (නිදසුනක් ලෙස ආබාධිත සිසුන්)
3. සියළුම ජන කොටස්වලට අයත් සිසුන් සමාන ආකාරයෙන් නේවාසිකාගාරවලට වෙන් කිරීම
4. අඩු ආදායම්ලාභි පවුල්වල සිසුන්ට නේවාසික පහසුකම් ලබා දීම
5. සිසුන් සම්බන්ධ ගැටළුවලදී කාර්යක්‍ෂමව හා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම
6. නේවාසිකයන්ට උපරිමයෙන් සහයවීම සඳහා විශ්වවිද්‍යාලයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ මැදිහත්වී සම්බන්ධීකරණය කිරීම
7. සිසුන්ට සපයනු ලබන පහසුකම් හා සේවාවන් පිළිබඳව සිසුන්ගේ අදහස් ලබා ගැනීම, ප්‍රවණතා විශ්ලේෂණය හා වර්ධනයන් නිර්දේශ කිරීම
8. නේවාසිකාගාරවල ආහාර සනීපාරක්‍ෂාව සහ සෞඛ්‍ය ආරක්‍ෂක සේවාවන්ගේ ප්‍රමිතිය අධීක්‍ෂණය කිරීම හා පවත්වාගෙන යෑම.

**ශිෂ්‍ය නේවාසිකාගාර ප්‍රතිපත්තිය**

සිසුන්ගේ නිවාසවල සිට විශ්වවිද්‍යාලය අතර පවතින දුර පදනම් කොට ගෙන විශ්වවිද්‍යාල නේවාසික පහසුකම් සපයනු ලැබේ.

1. ප්‍රථම වසර සිසුන් කිලෝමීටර් 50 ට වැඩි
2. දෙවන වසර සිසුන් කිලෝමීටර් 40 ට වැඩි
3. තෙවන වසර සිසුන් කිලෝමීටර් 30 ට වැඩි
4. සිව්වන වසර සිසුන් කිලෝමීටර් 30 ට වැඩි
5. පස්වන වසර සිසුන් කිලෝමීටර් 10 ට වැඩි

- එමෙන්ම ක්‍රීඩා කණ්ඩායම්වල නායක සහ උප නායක /නායිකාවන් සඳහා ද නේවාසික පහසුකම් සපයනු ලබයි.
- විවිධ ආබාධ සහිත සිසුන්
- විශ්වවිද්‍යාල ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශ කරනු ලබන වෛද්‍ය හේතු මත පදනම් වූ සිසුන් සඳහා ද නේවාසික පහසුකම් සපයා දෙනු ඇත.
- ග්‍රාම සේවක, ප්‍රාදේශීය ලේකම්වරයාගේ, උපකුලපති, නියෝජ්‍ය උපකුලපති හා ශිෂ්‍ය න්වාසිකාගාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ මත දැඩි ආර්ථික අපහසුතා සහිත සිසුන් වෙනුවෙන් ද නේවාසික පහසුකම් ලබා දෙනු ලැබේ.

සියලුම ප්‍රථම උපාධි සිසුන් වෙනුවෙන් නේවාසික පහසුකම් ලබා දීමේ ප්‍රධාන සැලසුමක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුවේ. එහෙත් අවාසනාවකට මෙන් නේවාසික පහසුකම් ලබාදීම සියලුම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 60%කට පමණක් සීමාවී ඇත. කෙසේ වෙතත් නේවාසික පහසුකම් ලබා ගැනීමේ ඉල්ලුමට සරිලන පරිදි අලුතින් නේවාසිකාගාර හතරක් ඉදිකොට ඇති අතර එම නේවාසිකාගාර හතරත් සමග විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 19ක් ඇත. එම නේවාසිකාගාරවල එදිනෙදා කටයුතුවලට සහයවීම පිණිස අර්ධ කාලීන අධ්‍යයන ශාලාධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපතිවරයෙක්, අධ්‍යයන උප ශාලාධිපතිවරයෙක් හා පූර්ණ කාලීන උපශාලාධිපතිවරයෙකු ද සිටිති.

**ජයග්‍රහණ**

තෙවන වසර සිසුන්ගේ නේවාසික ගැටළු විසඳීම සඳහා පහත සඳහන් කෙටි කාලීන විසඳුම් ලබා දීමට හැකිවූ බව සඳහන් කරමි.

1. විශ්වවිද්‍යාලය අවට පුද්ගලික නිවාස එක් අවුරුද්දක් සඳහා කුලියට ගෙන සිසුන් 130දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම

2. නේවාසිකාගාරවලට (බන්කර් ඇඳන්) තට්ටු ඇඳන් හඳුන්වාදීමෙන් එක් කාමරයකට එක් සිසුවෙකු වැඩියෙන් ඇතුළත් කිරීමෙන් සිසුන් 720කට නේවාසික පහසුකම් සැපයීම.

3. නේවාසිකාගාරවල මෙතෙක් පරිහරණයට නොගත් ඉඩ පහසුකම් සුදුසු පරිදි සකස් කිරීමෙන් හා AQ 40 නිවස අත්කරගෙන නේවාසිකාගාරයක් බවට පත්කිරීම තුළින් සිසුන් 240 කට නේවාසික පහසුකම් සැපයීම.

4. දෙවන වසර සිසුන් අතරින් අඩු ආදායම්ලාභී සිසුන් වෙනුවෙන් නේවාසික පහසුකම් සැපයීම.

විශ්වවිද්‍යාලයේ සිට කිලෝමීටර් 25ක් දුරින් සිටින තෙවන වසර සිසුන් සියලුම දෙනාට නේවාසික පහසුකම් ලබාදීමට හැකිවූ බව සඳහන් කිරීම වැදගත්වේ.

සිසුන් 1090 දෙනෙකුට කෙටි කාලීන විසඳුමක් ලෙස අමතර නේවාසික පහසුකම් සපයා දීම තුළින් සිසුන්ගේ නවාතැන් පිළිබඳ පැවති ගැටළුව විසඳීමට හැකියාව ලැබී ඇත. එබැවින් රජය විසින් ලබා දෙන නේවාසික පහසුකම් දීමනාවේ පළමු කෝටාවෙන් රුපියල් මිලියන 30ක් ඉතිරි කිරීමට හැකිවිය.

**බාධක සහ පිළියම්**

සියලුම සිසුන්ට නවාතැන් පහසුකම් ප්‍රමාණවත් නොවීම.

**අනාගත සැලසුම්**

අලුතින් ඉදිකළ ගොඩනැගිලි යොදාගෙන සිසුන් 1800 දෙනෙකුට නවාතැන් ලබාදීමට හා දෙවන වසර සිසුන්ට නේවාසික පහසුකම් සැපයීමටත් එමගින් නේවාසික පහසුකම් ලද සංඛ්‍යාව 75% දක්වා ගෙන ඒමටත් සැලසුම් සකස් කෙරෙමින් පවතී.

## D7 ආරක්ෂක අංශය

(වැඩබලන ප්‍රධාන ආරක්ෂක නිලධාරි එන්.කේ. සූරියබණ්ඩාර බණ්ඩාර විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ආරක්ෂක අංශය ප්‍රධාන ආරක්ෂක නිලධාරී, නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී, ආරක්ෂක පරීක්ෂකවරුන් හා ආරක්ෂක නියාමකවරුනගෙන් යුක්ත වන අතර විශ්වවිද්‍යාලයීය නිශ්චල චංචල දේපල ආරක්ෂා කිරීම එහි වගකීම වේ. මේ වනවිට නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. වර්තමානය වනවිට ආරක්ෂක පරීක්ෂකවරුන් එකොළොස් දෙනෙකු හා ආරක්ෂක නියාමකවරුන් 61 දෙනෙකු මෙම අංශයේ සේවය කරන අතර එම ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නැත. මේ නිසා පුද්ගලික ආරක්ෂක අංශයක සේවය ලබා ගැනීමට සිදුවිය.

### ජයග්‍රහණ

2014 වර්ෂයේ අත් කරගත් ජයග්‍රහණයන් පහත සඳහන් පරිදි වේ.

1. විශ්වවිද්‍යාලය තුළ 24 පැය පුරා ක්‍රියාත්මක ජංගම මුර සංචාර ක්‍රමයක් ආරම්භ කිරීම
2. උපකුලපතිතුමාගේ අනුමැතියෙන් වාහන දෙකක් ලබා ගැනීම
3. **"ආරක්ෂක දිනය 2014"** අගෝස්තු 18 වැනි දින අතිසාර්ථකව සමරන ලදි.
4. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සිදුවන සොරකම්, වාහන අනතුරු ආදිය අවම කරන ලදි.
5. ආරක්ෂක අංශයේ පැවති සේවක පුරප්පාඩු (නිලධාරින් හා ආරක්ෂක නියාමකයන්) පුරවන ලදි.
6. ආරක්ෂක අංශ පරිශ්‍රය සහ අවට පරිසරය සංවර්ධනය කරන ලදි.
7. විනය සහ ඵලදායිතාවය දියුණු කරන ලදි.
8. ආරක්ෂක කාර්යාලයට අවශ්‍ය කරන භාණ්ඩ හා උපකරණ සපුරා ගැනීම
9. ජංගම මුර සංචාර ඒකකයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් වැඩි කරන ලදි. (නව යතුර පැදි 04 ක්)
10. 2013 උපාධි ප්‍රදානෝත්සවයට උසස් ආරක්ෂක ක්‍රමයක් සකස් කොට ආරක්ෂාව ලබාමෙන් සහය දක්වන ලදි.

### අනාගත සැලසුම්

මනා පුහුණුවක් ලද ප්‍රමාණවත් කාර්ය මණ්ඩල සාමාජිකයන් පිරිසක් සේවයේ යෙදවීම, වාහන සංඛ්‍යාව වැඩි කිරීම, ආරක්ෂක පරීක්ෂකයන් විසින් පාලනය කරනු ලබන උප ආරක්ෂක කාර්යාල ස්ථාපිත කිරීම, විද්‍යාගාර, පුස්තකාල හා ගබඩාවල සොරකම් වැලැක්වීම සඳහා ආරක්ෂක කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව තර කිරීම සඳහා විශ්වවිද්‍යාලයට මුර කුටි පිහිටුවීම, ආරක්ෂක නියාමකයන් ලවා දිවා රාත්‍රි ආරක්ෂක සේවාවන් ලබාදීම හා ආරක්ෂාව සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීම, විශ්වවිද්‍යාලයේ ආරක්ෂක පද්ධතියේ පවතින දූර්වලතා හඳුනා ගෙන ඒවාට වඩා යහපත් පිළිතුරු ලබාදීම අපගේ අනාගත සැලසුම් වේ.

## D8 විනයාරක්ෂක අංශය

(ප්‍රධාන විනයාරක්ෂක (වැ.බ.) ආර්.ගජවීර මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින විනයාරක්ෂක අංශය ප්‍රධාන විනයාරක්ෂක, විනයාරක්ෂකයන් සිව් දෙනෙකුගෙන් හා එක් කාන්තා විනයාරක්ෂකවරියකගෙන් යුක්ත වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ උපකුලපති. නියෝජ්‍ය උපකුලපති හා විනය පාලක යන නිලධාරීන්ගේ මඟ පෙන්වීම යටතේ පීඨ, මධ්‍යස්ථාන, ගෘහස්ථ ක්‍රීඩාගාරය, ක්‍රීඩා පිටි, නේවාසිකාගාර හා පොදු ස්ථානයන්හි සිසුන්ගේ ක්‍රියාකාරකම් හා හැසිරීම් පිළිබඳ සුපරීක්ෂාකාරී වෙමින් සිසුන්ගේ විනය පවත්වා ගැනීමයි.

### වර්ෂයේ සංවර්ධනය

නීති කඩ කිරීම්, අවම කරගැනීම පිණිස අතුරු ව්‍යවස්ථා හා විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පීඨවල නවක සිසු කණ්ඩායම් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. අදාළ පාර්ශවයන් සමඟ එක්ව සමාජ සහජීවන ව්‍යාපෘතියක් සහ නවක වදය වැළැක්වීමේ වැඩසටහනක් දියත් කරන ලදි. මෙම අංශයට කාන්තා විනයාරක්ෂකවරියක් බඳවා ගන්නා ලදි.

### සිදුකළ ප්‍රධාන කාර්යයන්

- කරුණු සෙවීමේ මෙහෙයුම
- විශ්වවිද්‍යාලයේ විනය පාලක සහ රාජ්‍ය උපදේශකයා සමඟ එක්ව නියෝජ්‍ය විනයපාලකවරුන්, ශාලාධිපතින්, උපශාලාධිපතින්, විනයාරක්ෂකයන් හා ශිෂ්‍ය උපදේශකයන් වෙනුවෙන් නවක වදය පිටු දැකීමේ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.
- මත්ද්‍රව්‍ය අංශයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කමල් සිල්වා හා වෛද්‍ය දයා ජයසුන්දරගේ උදව් ඇතිව 2013/2014 අධ්‍යයන වර්ෂයේ නවක සිසුන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "සොබා සංසදය" සමඟ එක්ව ශ්‍රී පාද අඩවියේ පරිසරය පිරිසිදු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි.
- උපාධි ප්‍රදානෝත්සවය හා විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන නාට්‍ය උත්සව වැනි ප්‍රධාන අවස්ථාවන්ට සහයෝගය දක්වන ලදි.
- සොබා සංසදය සංගමය සමඟ එක්ව සමස්ත හන්තාන කඳුවැටිය තරණය සංවිධානය කරන ලදි.
- ක්‍රීඩා උත්සවය හා නවකයන්ගේ ක්‍රීඩා උත්සවයට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.
- සිසුන්ගේ විනය කරුණු සම්බන්ධයෙන් පීඨාධිපතින්, විනය පාලකයන්, නියෝජ්‍ය විනය පාලකවරුන් හා ශාලාධිපතින්ට සහයෝගය ලබා දෙන ලදි.

### ජයග්‍රහණ

- නවක වදය සම්බන්ධ සිද්ධි අවම කිරීම
- සිසුන් සමඟ සමාජ පාරිසරික, සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම සම්බන්ධීකරණය කිරීම

### බාධක සහ පිළියම්

ගෙවී ගිය වර්ෂයේදී පීඨ, නේවාසිකාගාර හා පොදු ස්ථානවලින් සිදුවීම් 18 ක් හඳුනා ගන්නා ලදි.

### අනාගත සැලසුම්

- සිසුන්ට අදාළ විනය ක්‍රියාමාර්ග සංවිධානය කිරීම
- සිසුන් විනය පාලක, නියෝජ්‍ය විනය පාලකවරුන්, ශාලාධිපතින් හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන් සමඟ සම්බන්ධ කරවන සංවිධානය ජාලයක් සංවර්ධනය කිරීම

## D9 උද්‍යාන අංශය

(උද්‍යාන පාලක ඩී.එම්.එස්.කේ.ඩබ්.බී. පලීපාන මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 230ක් පීඨ, නේවාසිකාගාර, කාර්ය මණ්ඩල නිල නිවාස සහ වෙනත් පහසුකම් සැපයීම සඳහා සංවර්ධනය කොට ඇත. විශ්වවිද්‍යාල උද්‍යානයෙහි විවිධ මල් ගස් වර්ග, විශාල ගස්, කප්පාදු කළ බඩවැටි හා විශාල තණ පිට්ටනි සකසා සැලකිය යුතු ප්‍රමාණයක උද්‍යාන අලංකාර සිදු කොට ඇත. උද්‍යාන මූල ධර්මයන්ට අනුකූලව එම උද්‍යාන රටා නිසි ලෙස පවත්වා ගනිමින් දියුණු කිරීම උද්‍යාන අංශයෙහි ප්‍රධාන අරමුණ වේ.

**උද්‍යාන අංශය පහත සඳහන් උද්‍යාන ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් වගකිව යුතුවේ.**

1. විශ්වවිද්‍යාලයෙහි පවතින උද්‍යාන රටා නඩත්තු කිරීම
2. පැළ තවාන් පවත්වා ගනිමින් විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන් සඳහා පැල බඳුන් සපයා දීම
3. අවදානම් සහිත ගස් සහ අතු කපා ඉවත් කොට සාමාන්‍ය සේවා අංශය හා ආරක්ෂක අංශය සමඟ එක්ව කඳන් ටෙන්ඩර් කොට විකිණීමේ කටයුතු සිදු කිරීම
4. විශ්වවිද්‍යාලයේ උද්‍යාන අලංකාර ඉහළනංවා දියුණු කිරීම
5. නව උද්‍යාන සැලසුම් සකස් කිරීම, මිල ඇස්තමේන්තු සකස් කිරීම හා නව උද්‍යාන සැලසුම් ක්‍රියාත්මක කිරීම

### ජයග්‍රහණ

විශ්වවිද්‍යාල භූමියේ ඉලක්ක කළ උද්‍යාන කටයුතු කළමනාකරණය හා නඩත්තු කිරීම සාර්ථකව සිදුකරන ලදී. සමාලෝචිත වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ සිදුවූ සියලුම විශේෂ ක්‍රියාකාරකම් සඳහා එනම් විශ්වවිද්‍යාල උත්සව, උපාධි ප්‍රදානෝත්සවය, පර්යේෂණ සැසිය, නාට්‍ය උත්සවය වැනි අවස්ථාවන්ට මල් පෝච්චි සැපයීම වැනි කටයුතු තුළින් උපරිම සහයෝගය දක්වන ලදී.

### විශේෂ වර්ධනයන් හා ක්‍රියාකාරකම්

1. හිල්ඩා උද්‍යානය සඳහා නඩත්තු වැඩසටහනක් සංවිධානය කොට සකස් කරන ලදී.
2. රුක් රෝපණ වැඩ සටහනක් පැවැත්වූ අතර මල් පාත්ති ප්‍රතිසංවිධානය කරන ලදී.
3. ඉහළ හන්තාන විශ්‍රාම ශාලාව, පුහුණු මධ්‍යස්ථානය හා ගල් බංගලාව ආශ්‍රිත භූමිවල උද්‍යාන කටයුතු ප්‍රතිසංවිධානය කොට දියුණු කරන ලදී.
4. කපන ලද තණ කොළ, කොටස් කළ අතු, ගොම හා වෙනත් යෝග්‍ය ඉවතලන ද්‍රව්‍ය යොදා ගෙන උද්‍යාන කටයුතු සඳහා කොම්පෝස්ට් පොහොර සකස් කරන ලදී.

### උද්‍යාන අලංකාර වර්ධනය කිරීම් හා නව උද්‍යාන රටා සැලසුම් කිරීම

1. මීවතුර දෙමුහන් නේවාසිකාගාර සඳහා යෝජිත උද්‍යාන සැලසුම්.
2. විශ්වවිද්‍යාල හිල්ඩා උද්‍යානයේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීම.
3. සනාතන මන්දිරය, පීඨ, මාඔය, පොදු ස්ථාන හා නේවාසිකාගාර ආශ්‍රිත ප්‍රදේශයන්හි උද්‍යාන අලංකාර කටයුතු සිදු කිරීම.
4. නව ගලහ මාර්ගය දිගට උද්‍යාන අලංකාර කටයුතු සිදුකළ අතර මල් පාත්ති සකස් කිරීම ද සිදුකරන ලදී.
5. ඉංජිනේරු පීඨයේ හා විද්‍යා පීඨයේ උද්‍යාන කටයුතු වර්ධනය කිරීම ආරම්භ කරන ලදී.

**සිදුකළ ප්‍රධාන කාර්යයන්**

1. උද්‍යාන උපදේශක කමිටුව නැවත ක්‍රියාත්මක කොට වර්ෂය තුළදී රැස්වීම් හතරක් පවත්වන ලදි.
2. උද්‍යාන අංශයේ යාන්ත්‍රික ශක්තිය වැඩි කරන ලදි.
3. සේවක පුරප්පාඩු පිරවීම හා නව සේවක පුරප්පාඩු නිර්මාණය කිරීම සම්බන්ධ කටයුතු සිදුකළ අතර තණ කොළ කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නන් හත් දෙනෙකු බඳවා ගන්නා ලදි.
4. නේවාසිකාගාර අවට ප්‍රදේශ සඳහා උද්‍යාන ක්‍රියාකාරකම් සැලසුම් සකස් කළ අතර පඳුරු කපන යන්ත්‍ර හා වෙනත් උද්‍යාන උපකරණ ලබාදෙන ලදි.

**බාධක සහ පිළියම්**

1. එදිනදා උද්‍යාන කටයුතු උපරිම ආකාරයෙන් ඉටු කිරීම සඳහා පවතින කම්කරු හිඟය ප්‍රධාන බාධකයකි.
2. විශාල ප්‍රදේශයක් පුරා පවතින අධික වැඩ කටයුතු ප්‍රමාණය පරීක්ෂා කිරීම සඳහා අධීක්ෂණ බලය ප්‍රමාණයත් නොවීම.
3. උද්‍යාන වැඩ අධීක්ෂකයන් සඳහා ප්‍රමාණවත් යතුරුපැදි නොමැතිවීම.
4. කම්කරුවන් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පවතින වාහන හිඟය (කැබ් රථ).

**අනාගත සැලසුම්**

**වැඩිදියුණුව සඳහා යෝජනා :**

1. අවම වශයෙන් උද්‍යාන අධීක්ෂකයන් දෙදෙනෙකු හෝ බඳවා ගෙන අධීක්ෂණ බලය වැඩි කිරීම.
2. විවිධ දෙපාර්තමේන්තු හා ඒකක මගින් කරනු ලබන ඉල්ලීම්වලට අනුව මෙම අංශයේ කම්කරුවන් විශ්වවිද්‍යාලයේ වෙනත් අංශවලට මාරු කිරීමෙන් වැලකීම.
3. බඩවැටි කප්පාදු කරන්නා, ගස් කැපීමට උදව්වන්නා, ගස් ශල්‍ය තාක්ෂණඥයා වැනි නව පුහුණු සේවක තනතුරු නිර්මාණය කොට සේවක සංඛ්‍යාව ඉහළනැංවීම.
4. විශ්වවිද්‍යාල මනරම් පරිසරයට උචිත පරිදි උද්‍යාන මූලධර්මවලට අනුකූලව අලුතින් ඉදිකළ ගොඩනැගිලි සඳහා නව උද්‍යාන රටා සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.

## D10 වැඩ දෙපාර්තමේන්තුව

(වැඩ ඉංජිනේරු ජේ.ඒ.සී.එන්. ජයසූරිය මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

### හැඳින්වීම

වැඩ දෙපාර්තමේන්තුව ඉදිකිරීම් හා නඩත්තු අංශය, විදුලි වැඩ අංශය, සැලසුම් හා ඇස්තමේන්තු අංශය හා නිරීක්ෂණ අංශය ලෙස අංශ හතරකින් යුක්ත වේ. මෙම දෙපාර්තමේන්තුව යටතේ සිවිල්, විදුලි සහ ජල කටයුතු යන ගබඩා තුනක් ක්‍රියාත්මක වේ.

කම්කරු ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා ඉදිකිරීම් හා නඩත්තු අංශය යටතේ කලාප හයක් හා ඒකක පහක් ක්‍රියාත්මක වේ. මෙම කලාප හය උතුරු, මධ්‍යම, දකුණ, බටහිර, නැගෙනහිර හා ඈත බටහිර කලාප ලෙස හැඳින්වේ. ඒකක පහ (05) මධ්‍යම ජල, මාර්ග, කාර්යාල හා ගබඩා, විශේෂ පුහුණු හා ජල කානු කළමනාකරණය ලෙස ක්‍රියාත්මක වේ.

ජල සැපයුම, මාර්ග පද්ධතිය මෙන්ම වර්ග අඩි මිලියන 4.09ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරුණු වර්ෂ 60 ක් පමණ පැරණි ගොඩනැගිලි හරහා ගලායන 612කින් යුතු ජල කානු ජාලයේ සාමාන්‍ය නඩත්තු කටයුතු හා සුළු පුනරුත්ථාපන කටයුතු ආවරණය කිරීම ඉදිකිරීම් නඩත්තු අංශයේ වගකීම වේ.

විදුලි වැඩ අංශය විශ්වවිද්‍යාලයේ පොළොව යටින් ඇද තිබෙන කි.වො.11000ක ධාරිතාවයකින් යුක්ත විදුලි සැපයුම් ජාලයේ නඩත්තු කටයුතු සම්බන්ධ වගකීම දරයි. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය හැරුණු විට මෙසේ පොළොව යටින් රැහැන් ඇද විදුලිය සපයන එකම අංශය මෙම විදුලි වැඩ අංශයයි.

සැලසුම් හා ඇස්තමේන්තු අංශය විශ්වවිද්‍යාලයේ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල සඳහා යෝජනා ඇස්තමේන්තු සකස් කිරීම, මූලධන ව්‍යාපෘති සඳහා වාර්තා සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම, ස්ථාවර තාක්ෂණික කමිටුවේ හා වෙනත් ලේඛන කටයුතු සිදුකිරීම සහ විශ්වවිද්‍යාලය තුළ සිදුවන සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය කිරීම යන කාර්යයන් ඉටු කිරීමේ වගකීම දරයි. මේ වනවිට සැලසුම් හා ඇස්තමේන්තු අංශය රුපියල් බිලියන 3.8ක මුළු වටිනාකමින් යුතු ඉදිකිරීම් ව්‍යාපෘති 102ක් අධීක්ෂණය කරයි.

නිරීක්ෂණ අංශය ස්ථාපිත කරන ලද්දේ කාර්ය මණ්ඩලයේ පැමිණීම හා අමුද්‍රව්‍ය භාවිතය ඇතුළත් වැඩ දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රියාකාරකම් සම්බන්ධ දත්ත එක්රැස් කොට විශ්ලේෂණය කිරීම සඳහායි. මෙම දෙපාර්තමේන්තුවේ සේවාවන් දියුණු කිරීම සඳහා අලුතෙන් ක්‍රියාමාර්ග හා නව ක්‍රම හඳුන්වාදීම මෙම විශ්ලේෂණයන් මත පදනම් වේ.

### ජයග්‍රහණ

සාමාන්‍ය නඩත්තු කටයුතු පිළිබඳ සහතික කළ වැඩ ලැයිස්තුවලට අනුව 2011 සහ 2014 වර්ෂවල අවසන් කළ මුළු වැඩ කටයුතු සංඛ්‍යාව පිළිවෙළින් 1006 හා 2579 වන අතර 2011 වසරේ සාමාන්‍ය නඩත්තු කටයුතු සමඟ සන්සන්දනය කරන විට එය 2014 වසරේදී 256%ක වර්ධනයකි.

විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවේ වාර්තාවන්ට අනුව වැඩ දෙපාර්තමේන්තුව 2011 වසරේදී ව්‍යාපෘති යෝජනා 45ක් සකස් කළ අතර එහි වටිනාකම රුපියල් මිලියන 97.9 කි. වැඩ දෙපාර්තමේන්තුව 2014 වසරේදී රුපියල් මිලියන 467.5 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති යෝජනා 81ක් සකස් කරන ලදි.

මෙලෙස 2014 වර්ෂයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවල ප්‍රගතිය 2011 වසරේ වැඩ කටයුතු සමඟ සංසන්දනය කරන විට එය 477.55% කි. 2012 වසරේ මෙම දෙපාර්තමේන්තුව සතුව රුපියල් මිලියන 443.73ක මුළු වටිනාකමින් යුතු මූලධන ව්‍යාපෘති හතක් (07) පැවති අතර 2014 වසරේ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 3,486.02 ක මුළු වටිනාකමින් යුක්ත මූලධන ව්‍යාපෘති විස්සක් (20) මෙහෙයවනු ලබයි.

ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ ප්‍රමාණය මුදල් පරිමාවට සෘජුව සමානුපාතික වේ. මෙලෙස ව්‍යාපෘතිවල පවතින වැඩ ප්‍රමාණය අධීක්ෂණය කිරීමේ ශක්තිය 2012 වසරේ මූලධන ව්‍යාපෘති සමඟ සංසන්දනය කරන විට 2014 වසරේ එය 785% කින් ඉහළ ගොස් ඇත.

**බාධක සහ පිළියම්**

2014 වසරේ මෙම අංශයට වෙන් කළ සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට වැඩ දෙපාර්තමේන්තුවට නොහැකි විය. එමෙන්ම වර්තමානය වන විට පවතින වැඩ ප්‍රමාණයට අනුව අවශ්‍ය කරන ශ්‍රම බලකාය හා සේවක තනතුරු දියුණු කර ගැනීමට ද මෙම අංශයට නොහැකි විය. මෙම තත්ත්වයන් යටතේ අධික වැඩ කටයුතු ප්‍රමාණයක් ඉටු කිරීමට නිලධාරීන්ට සිදුවූ අතර එතුළින් ඉච්චාභංගත්වයක් නිර්මාණය විය.

වැඩ සහ ව්‍යාපෘති අධීක්ෂණය සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට නොහැකි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ කටයුතු අඩාල වී කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ පුද්ගලික වාහන ඒ සඳහා යොදා ගැනීමට සිදුවිය.

කලා කවයේ ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි 2014 වසර ආරම්භයේදී ක්‍රියාත්මක කිරීමට වැඩ දෙපාර්තමේන්තුවට නොහැකි විය.

මෙම සියලු අඩාලවීම්වලට මූලික හේතුව වනුයේ කාර්ය මණ්ඩලයට අධික වැඩ ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුව ඇති හෙයින් එවැනි කාර්යයන් සඳහා යෙදවීමට කාලය ප්‍රමාණවත් නොවීමයි.

**අනාගත සැලසුම්**

මෙලෙස ප්‍රගතියක් අත්කර ගත්ත ද විශ්වවිද්‍යාලය තුළ මෙතෙක් යොමු නොවූ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු රාශියක් ඉතිරිව ඇත. සාමාන්‍ය සහ පුනරුත්ථාපන කටයුතුවල පවතින මෙම බරපතල ගැටළුව විසදා ගැනීම සඳහා ගොඩනැගිලි හා සේවා පද්ධති ඉහළනංවා ගැනීම වෙනුවෙන් පුනරුත්ථාපන ව්‍යාපෘති යෝජනා සකස් කිරීම ආරම්භ කොට ඇත. වර්තමානය වනවිට ජයතිලක සහ හිල්ඩා ඔබේසේකර ශාලා සඳහා එකී යෝජනා සකස් කෙරෙමින් පවතී.

මෙම ගොඩනැගිලි හා සේවා පද්ධති ඉහළනැංවීමේ ව්‍යාපෘති විශ්වවිද්‍යාලය තුළ පවතින සියලුම ගොඩනැගිලි හා පද්ධති සඳහා ඉදිරි වර්ෂ කිහිපයක කාලය තුළ පවත්වාගෙන යායුතු වේ.

වේදිකා නාට්‍යයක් නිෂ්පාදනය කිරීමේ අරමුණින් යුතුව වැඩ දෙපාර්තමේන්තුව තුළ ඒ පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. කලා කවයේ මෙම ක්‍රියාකාරකම් තුළින් සේවකයන්ට ඔවුන්ගේ ආත්ම විශ්වාසය දියුණු කර ගැනීමට සහ සේවා ස්ථානය ප්‍රීතිමත් ස්ථානයක් බවට පත් කර ගැනීමට හැකිවනු ඇත.

## උපග්‍රන්ථ E – ව්‍යාපෘති විස්තර

## E1 (දෙස් විදෙස් ආධාර ලද) ව්‍යාපෘති පිළිබඳ විස්තර – 2014

| පීඨය | නම සහ විස්තර | ණය/ප්‍රදාන | ආධාරක ආයතනය | රට | ප්‍රදානය කළ වසර | කාල පරිච්ඡේදය | ටී.සී.ඊ. රු. |
|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු පීඨය | ආචාර්ය ජේ.ආර්.එස්.එස්. සමන් කුමාර RG/2014/19/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 1 | 2,570,000.00 |
| | මහාචාර්ය ආර්.ශාන්තිනි RG/2014/20/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 1 | 445,000.00 |
| | ආචාර්ය කේ.ඒ.එස්. සුසන්ත RG/2014/21/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 1 ½ | 825,600.00 |
| | ආචාර්ය කේ.ජී.එන්. නානායක්කාර RG/2014/22/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 2 | 1,300,000.00 |
| | එස්.එච්.අයි.පී. රත්නපාල මයා RG/2014/23/E | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 1 ½ | 641,013.00 |
| | ආචාර්ය අසේල කුලතුංග ආර්.ඒ. ඒකනායක එම්.ධර්මවර්ධන RG/2014/24/E/ | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | විශ්වවිද්‍යාලය | | 2014 | වසර 1 | 807,500.00 |
| | ආචාර්ය ජේ.ජේ. විජේතුංග 2011/ESA/01 | ජා.වි.ප. | ජා.වි.ප. | | 2011 | To Present | 1,554,800.00 |
| | SATREPS | විදෙස් ප්‍රදාන | ජපන් ජාත්‍යන්තර සමාගම | ජපානය | 2011 | වසර 5 | 5,000,000.00 |
| | UNESCO | විදෙස් ප්‍රදාන | යුනෙස්කෝ ප්‍රෝග්‍රමටික් කෝපරේෂන් | නෙදර්ලන්තය | 2010 | වසර 5 | 2,619,584.15 |
| | ටෝකියෝ සිමෙන්ට් ෆන්ඩ් | ප්‍රදාන | ටෝකියෝ සිමෙන්ට් සමාගම | | 2011 | | 300,000.00 |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය එෆ්. නුර්දීන් | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.10.15-2015.10.14 | 840,000.00 |
| | වෛද්‍ය එච්.කේ.අයි.. පෙරේරා | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2014.11.14 | 600,000.00 |
| | වෛද්‍ය එල්.වයි.වී. පතිරණ | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2014.11.14 (extension to 2015.05.14) | 840,000.00 |
| | වෛද්‍ය ඩබ්.ඒ.ටී.ඒ.ජයලත් | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2015.11.14 | 395,000.00 |
| | වෛද්‍ය සී.එන්.ආර්.ඒ. ඇලිස් | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 15.11.2013-14.11.2016 | 900,000.00 |
| | වෛද්‍ය ඩබ්ලිව්.එම්.ඩී.ආර්. ඉද්දවෙල | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2016.11.14 | 450,000.00 |
| | වෛද්‍ය ඩී.ආර්.කේ.සී. දිසානායක | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2014.11.14 | 946,572.00 |
| | වෛද්‍ය සී.ඩී. ගමගේ | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2015.11.14 | 1,045,000.00 |
| | වෛද්‍ය ආර්.එම්. මුදියන්සේ | අතිරේක අරමුදල් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.11.15-2015.11.14 | 628,750.00 |
| | වෛද්‍ය පී.එච්.පී ෆනැන්ඩු | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01 -2014.11.30 | 200,000.00 |
| | වෛද්‍ය එම්.පී.යූ.කේ. රූපනාව | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 200,000.00 |
| | මහාචාර්ය පී.බී. හේවාවිතාන | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2015.06.31 | 199,700.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වෛද්‍ය බී.එන්. දිසානායක | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 200,000.00 |
| | වෛද්‍ය කේ.පී. ගල්කැටිය | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-30.11.2014. | 200,000.00 |
| | වෛද්‍ය ජේ.කේ. දිසානායක | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 160,000.00 |
| | වෛද්‍ය ආර්.එස්. තලගහගොඩ | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 154,000.00 |
| | වෛද්‍ය එච්.එම්.එස්.ආර්.බී. කොටකදෙණිය | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 200,000.00 |
| | වෛද්‍ය ඒ.කේ.බී.බී.ටී.බී සමරසිංහ | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 84,000.00 |
| | වෛද්‍ය ඒ.එච්.එච්.එම්. ජයවීර | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 140,000.00 |
| | වෛද්‍ය එස්. රොසයිරෝ | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 200,000.00 |
| | වෛද්‍ය ඩබ්.ඩී.එස්.ජේ. වික්‍රමසිංහ | උපයන ලද මුදල් | පීඨය විසින් උපයන ලද මුදල් | ශ්‍රී ලංකාව | 2013 | 2013.12.01-2014.11.30 | 45,000.00 |
| | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.07.01-014.06.30 | 245,000.00 |
| | වෛද්‍ය සී.එන්.ආර්.ඒ. ඇලස් | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 2013.07.01-2014.02.27 | 70,000.00 |
| | වෛද්‍ය එස්.ඩී.අයි. නානයක්කාර | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013-30.06.2014 | 69,400.00 |
| | වෛද්‍යතාරක දිසානායක | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2014-30.06.2014 | 200,000.00 |
| | වෛද්‍ය ඩී.එම්.පී.යූ.කේ. රැල්පනාව | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013-30.06.2014 | 100,000.00 |
| | වෛද්‍ය ඩබ්ලිව්.අයි.ටී. ෆර්නෑන්ඩු | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013-30.06.2014 | 101,316.04 |
| | වෛද්‍ය එස්.ඩී.අයි නානයක්කාර | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 783,000.00 |
| | වෛද්‍ය සුලෝචනා විජේතුංග | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 475,000.00 |
| | වෛද්‍ය ඒ. සෝමිනන්ද | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 250,000.00 |
| | වෛද්‍ය එම්.වී.ජී පින්ටෝ | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-31.12.2014 | 125,000.00 |
| | වෛද්‍ය එච්.එෆ්.එස්. ෆොන්සේකා | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 255,000.00 |
| | වෛද්‍ය කේ.බී ගල්කැටිය | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 333,000.00 |
| | වෛද්‍ය ඒ.ඩී. ධර්මපාල | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.12.2015 | 699,895.00 |
| | වෛද්‍ය ඒ.ඒ.ජේ. රාජරත්න | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 454,200.00 |
| | වෛද්‍ය බී.එන්. දිසානායක | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 600,000.00 |
| | වෛද්‍ය පී.එච්.පී. ෆනැන්ඩු | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 1,500,000.00 |
| | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක | විශ්වවිද්‍යාල ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014-30.06.2015 | 550,000.00 |
| | වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා | ජා.වි.ප. | ජාතික විද්‍යා පදනම | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2012-31.05.2015 | 1,550,000.00 |
| | මහාචාර්ය වී. තෙවිනේසම් | ජා.වි.ප. | ජාතික විද්‍යා පදනම | ශ්‍රී ලංකාව | 2011 | 2011-2014 | 3,159,103.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වෛද්‍ය සුලෝචනා විජේතුංග | ජා.වි.ප. | ජාතික විද්‍යා පදනම | ශ්‍රී ලංකාව | 2011 | 2011-2013 | 615,800.00 |
| | යූ.ටී.එන්. සේනාරත්න | ජා.වි.ප. | ජාතික විද්‍යා පදනම | ශ්‍රී ලංකාව | 2012 | 03.09.2012-01.03.2015 | 1,650,000.00 |
| | වෛද්‍ය ඩබ්ලිව්.අයි.ටී. ප්‍රනාන්දු | වි.ප්‍ර.කො.ස. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ශ්‍රී ලංකාව | 2009 | Three Years | 750,000.00 |
| | හදිසි සෞඛ්‍ය ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | | ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | ශ්‍රී ලංකාව | 2007 | - | 1,033,390.52 |
| **විද්‍යා පීඨය** | RG/2011/32/S 13.01.14.11.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2011 | 01.07.2011 - 30.06.2012 | 75,000.00 |
| | RG/2011/33/S 13.01.14.11.02 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2011 | 01.07.2011 - 30.06.2013 | 82,215.00 |
| | RG/2011/34/S 13.01.14.11.03 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2011 | 01.07.2011 - 30.09.2013 | 98,200.00 |
| | RG/2011/35/S 13.01.14.11.04 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2011 | 30.06.2011 - 31.12.2013 | 175,000.00 |
| | RG/2012/40/S 13.01.14.12.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2012 - 30.11.2013 | 148,000.00 |
| | RG/2012/41/S 13.01.14.12.02 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2012 - 30.11.2013 | 448,000.00 |
| | RG/2012/42/S 13.01.14.12.03 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2012 30.05.2014 | 358,500.00 |
| | RG/2012/43/S 13.01.14.12.04 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2011 - 28.02.2014 | 150,000.00 |
| | RG/2012/GG-1/46/S 13.01.14.12.07 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.07.2012 - 30.09.2013 | 140,000.00 |
| | RG/2012/GG-1/47/S 13.01.14.12.08 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.06.2012 - 31.05.2013 | 76,000.00 |
| | RG/2012/GG-1/48/S1 3.01.14.12.09 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.07.2012 - 30.09.2013 | 95,250.00 |
| | RG/2012/GG-1/49/S 13.01.14.12.10 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2012 | 01.07.2012 31.12.2013 | 200,000.00 |
| | RG/2013/13/S 13.01.14.13.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013 - 30.06.2014 | 156,780.00 |
| | RG/2013/14/S 13.01.14.13.02 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013 - 30.06.2014 | 123,000.00 |
| | RG/2013/15/S 13.01.14.13.03 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013 30.06.2014 | 150,000.00 |
| | RG/2013/16/S 13.01.14.13.04 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013 30.06.2014 | 168,500.00 |
| | RG/AF/2013/71/S 13.01.14.13.05 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 15.11.2013 14.11.2016 | 2,620,500.00 |
| | RG/AF/2013/72/S 13.01.14.13.06 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 15.10.2013 14.10.2016 | 2,086,000.00 |
| | RG/AF/2013/73/S 13.01.14.13.07 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 15.11.2013 14.11.2015 | 858,000.00 |
| | RG/2011/NRB/01 13.11.14.11.01 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 15.09.2011 14.03.2014 | 763,800.00 |
| | NSF/Fellow/2011/02 13.11.14.11.02 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 15.12.2011 14.12.2014 | 3,000,000.00 |
| | RG/2011/NRB/03 13.11.14.11.03 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 15.09.2011 14.11.2014 | 2,407,322.00 |
| | RG/2011/ES/01 13.11.14.11.04 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 30.12.2011 29.12.2014 | 1,772,050.00 |
| | RG/2011/NRB/08 13.11.14.11.05 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 30.12.2011 29.12.2014 | 1,905,310.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | RG/2012/AG/03 13.11.14.12.06 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2012 | 20.09.2012 19.03.2013 | 1,651,720.00 |
| | RG/2010/NANO/0413.10 .11.120.214 | ප්‍රදාන | ජා.වි.ප. | ශ්‍රී ලංකාව | 2011 | 01.01.20113 1.12.2013 | 2,127,258.00 |
| | 13.42.14.11.01 | ප්‍රදාන | Nature's Beauty Creatious Ltd | ශ්‍රී ලංකාව | 2010 | 01.11.2010 31.12.2013 | 817,000.00 |
| | AC/ACIAR/RG/01 11.01.05.14.02 | ප්‍රදාන | postharvest Project | ශ්‍රී ලංකාව | 2014 | 01.09.2014 28.02.2015 | 929,500.00 |
| | RG/2014/39/S 13.01.14.00.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014 30.06.2015 | 431,310.00 |
| | RG/2014/41/S 13.01.14.00.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014 30.6.2015 | 595,000.00 |
| | RG/2014/42/S 13.01.14.00.01 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 01.07.2014 30.06.2016 | 1,095,000.00 |
| | MTR/TRD/AGR/03/01/04 13.24.14.13.02 | ප්‍රදාන | Ministry of Tec. & Reserch | ශ්‍රී ලංකාව | 2013 | 01.07.2013 31.12.2016 | 3,300,000.00 |
| **පශු වෛද්‍ය පීඨය** | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය - 2013 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2013 | 1-3 Years | 5,232,120.00 |
| | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය - 2014 | ප්‍රදාන | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකාව | 2014 | 1-3 Years | 4,406,550.00 |
| | මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ ඉන්දු-ශ්‍රී ලංකා පර්යේෂණ සහයෝගිතාව | ප්‍රදාන | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | ශ්‍රී ලංකාව | 2013 | 3 Years | 9,168,000.00 |
| | මහාචාර්ය පී.අබේනායක IDRC ව්‍යාපෘතිය | ප්‍රදාන | ජාත්‍යන්තර පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය-කැනඩාව | කැනඩාව | 2013 | 4 Years | 126,022,327.0 0 |
| | මහාචාර්ය පී.අබේනායක IAEA ව්‍යාපෘතිය | ප්‍රදාන | ජාත්‍යන්තර ඇටමික් බලශක්ති අධිකාරිය | කැනඩාව | 2009 | Continuing Project | 7,644,404.00 |
| | මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ | ප්‍රදාන | IAEA | කැනඩාව | 2010 | 5years | 35,566,640.00 |
| | ආචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර | ප්‍රදාන | IAEA | කැනඩාව | 2013 | 2 Years | 1,707,562.50 |
| | ආචාර්ය ආර්.එස්. කළුපහන | ප්‍රදාන | RVC Grant | United Kingdom | | Continuing Project | 815,402.00 |
| | RG/2011/BS/04 | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | ශ්‍ර ලංකාව | 2011 | 3 Years | 556,124.00 |
| | RG/2011/HS/12 | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | ශ්‍ර ලංකාව | 2011 | 3 Years | 2,568,648.00 |
| | RG/2011/BT/11 | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | ශ්‍ර ලංකාව | 2011 | 3 Years | 2,430,000.00 |
| | RG/2012/AG/08 | ප්‍රදාන | ජාත්‍යන්තර විද්‍යා පදනම | ශ්‍ර ලංකාව | 2012 | 3 Years | 185,000.00 |
| | NARP/11/VP/VMAS | ප්‍රදාන | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍ර ලංකාව | 2011 | 3 Years | 2,813,613.00 |
| | NARP/12/UP/VMAS/01 | ප්‍රදාන | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍ර ලංකාව | 2013 | වසර 1 | 860,000.00 |
| | NARP/12/UP/VMAS/02 | ප්‍රදාන | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍ර ලංකාව | 2013 | 2 Years | 2,350,000.00 |
| | NARP/12/UP/VMAS/06 | ප්‍රදාන | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍ර ලංකාව | 2013 | වසර 1 | 1,000,000.00 |
| | මහාචාර්ය ආර්.පී.ජේ. අබේනායත වි.වි.ප්‍ර.කො.ස. ප්‍රදාන | ප්‍රදාන | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ශ්‍ර ලංකාව | 2013 | 2 Year | 1,500,000.00 |

# E2 (දෙස් විදෙස් ආධාර ලද ) ව්‍යාපෘති පිළිබඳ විස්තර – 2014

| පීඨය | නම | ටී.ඊ.සී.<br>රු. | 2013 වියදම්<br>රු. | 2014 වියදම්<br>රු. | 2014.12.31 වන දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **ඉංජිනේරු පීඨය** | ආචාර්ය ජේ.ආර්.එස්.එස්. සමන් කුමාර<br>RG/2014/19/E | 2,570,000.00 | | 2,570,000.00 | 2,570,000.00 |
| | මහාචාර්ය ආර්. ශාන්තිනී<br>RG/2014/20/E | 445,000.00 | - | - | |
| | ආචාර්ය කේ.ඒ.එස්. සුසන්ත<br>RG/2014/22/E | 825,600.00 | | 825,600.00 | 825,600.00 |
| | ආචාර්ය කේ.ජී.එන්. නානායක්කාර<br>RG/2014/22/E | 1,300,000.00 | | - | 1,300,000.00 |
| | එස්.එච්.අයි.පී.රත්නපාල<br>RG/2014/24/E | 641,013.00 | | 641,013.00 | 641,013.00 |
| | ආචාර්ය අසේල කුලතුංග<br>RG/2014/24/E | 807,500.00 | | 40,000.00 | 40,000.00 |
| | ආචාර්ය ජේ.ජේ. විජේතුංග<br>2011/ESA/01 | 1,554,800.00 | 774,319.25 | 689,939.00 | 1,464,258.25 |
| | SATREPS | 10,865,000.00 | 4,280,998.35 | 6,163,729.89 | 10,444,728.24 |
| | UNESCO | 2,619,584.15 | 857,228.13 | 460,109.58 | 1,317,337.00 |
| | ටෝකියෝ සිමෙන්ට් ෆන්ඩ් | 673,755.00 | 101,784.00 | 280,731.00 | 382,515.00 |
| **වෛද්‍ය පීඨය** | වෛද්‍ය එෆ්. නූර්දීන් | 840,000.00 | | 681,762.70 | 681,762.70 |
| | වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා | 600,000.00 | | 597,697.03 | 597,697.03 |
| | වෛද්‍ය එල්.වයි.වී. පතිරණ | 840,000.00 | | 608,136.40 | 608,136.40 |
| | වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ටී.ඒ. ජයලත් | 395,000.00 | | - | - |
| | වෛද්‍ය සී.එන්.ආර්.ඒ. ඇලස් | 900,000.00 | | 12,980.00 | 12,980.00 |
| | වෛද්‍ය ඩබ්.එම්.ඩී.ආර්. ඉද්දවෙල | 450,000.00 | | 369,118.40 | 369,118.40 |
| | වෛද්‍ය ඩී.ආර්.කේ.සී. දිසානායක | 946,572.00 | | 272,845.27 | 272,845.27 |
| | වෛද්‍ය සී.ඩී. ගමගේ | 1,045,000.00 | | 133,969.60 | 133,969.60 |
| | වෛද්‍ය ආර්.එම්.  මුදියන්සේ | 628,750.00 | | 205,622.17 | 205,622.17 |
| | වෛද්‍ය වෛද්‍ය පී.එච්.පී. ෆනැන්ඩු | 200,000.00 | | 33,996.55 | 33,996.55 |
| | වෛද්‍ය ඩී.එම්.පී.යූ.කේ. රැලපනාව | 200,000.00 | | - | - |
| | මහාචාර්ය පී.බී. හේවාවිතාන | 199,700.00 | | 2000 | 2000 |
| | වෛද්‍ය බී.එන්. දිසානා | 200,000.00 | | 143,930.40 | 143,930.40 |
| | වෛද්‍ය කේ.බී ගල්කැටිය | 200,000.00 | | - | - |
| | වෛද්‍ය ජේ.කේ. දිසානාක | 160,000.00 | | - | - |
| | වෛද්‍ය ආර්.එස්. තලගහගොඩ | 154,000.00 | | - | - |
| | වෛද්‍ය එච්.එම්.එස්.ආර්.බී. කොටකදෙණිය | 200,000.00 | | - | - |
| | වෛද්‍ය ඒ.කේ.බී.බී.ටී.බී. සමරසිංහ | 84,000.00 | | - | - |
| | වෛද්‍ය ඒ.එච්.එච්.එම්. ජයවීර | 140,000.00 | | - | - |
| | වෛද්‍ය එස්. රොසයිරෝ | 200,000.00 | | 48,870.00 | 48,870.00 |
| | වෛද්‍ය ඩබ්ලිව්.ඩී.එස්.ජේ. වික්‍රමසිංහ | 45,000.00 | | 44,921.25 | 44,921.25 |
| | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක | 245,000.00 | | 244,426.65 | 244,426.65 |
| | වෛද්‍ය සී.එන්.ආර්.ඒ. ඇලස් | 70,000.00 | | 69,996.50 | 69,996.50 |
| | වෛද්‍ය එස්.ඩී.අයි. නානායක්කාර | 69,400.00 | | 69,159.18 | 69,159.18 |
| | වෛද්‍යතාරක දිසානායක | 200,000.00 | | 372,600.00 | 372,600.00 |
| | වෛද්‍ය ඩී.එම්.පී.යූ.කේ. රැලපනාව | 100,000.00 | | - | - |
| | වෛද්‍ය ඩබ්ලිව්.අයි.ටී. ෆනැන්ඩු | 101,316.04 | | 18,725.12 | 18,725.12 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෛද්‍ය එස්.ඩී.අයි. නානායක්කාර | 783,000.00 | | - | - |
| | වෛද්‍ය සුලෝචනා විජේතුංග | 475,000.00 | | - | - |
| | වෛද්‍ය ඒ. සොමිනන්ද | 250,000.00 | | - | - |
| | වෛද්‍ය එම්.වී.ජී පින්ටෝ | 125,000.00 | | - | - |
| | වෛද්‍ය එච්.එෆ්.එස්. ෆොන්සේනා | 255,000.00 | | - | - |
| | වෛද්‍ය කේ.බී ගල්කැටිය | 333,000.00 | | 318,450.00 | 318,450.00 |
| | වෛද්‍ය ඒ.ඩී. ධර්මපාල | 699,895.00 | | 435,500.00 | 435,500.00 |
| | වෛද්‍ය ඒ.ඒ.ජේ. රාජරත්න | 454,200.00 | | - | - |
| | වෛද්‍ය බී.එන්. දිසාානායක | 600,000.00 | | - | - |
| | වෛද්‍ය පී.එච්.පී. ෆනැන්ඩු | 1,500,000.00 | | - | - |
| | මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක | 550,000.00 | | - | - |
| | වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා | 1,550,000.00 | 782,821.82 | 597,427.10 | 1,380,248.92 |
| | මහාචාර්ය වී. තෙවනේසම් | 3,159,103.00 | 2,910,395.26 | 115,365.42 | 3,025,760.68 |
| | වෛද්‍ය සුලෝචනා විජේතුංග | 615,800.00 | 361,557.50 | 196,744.60 | 558,302.10 |
| | යූ.ටී.එන්. සේනාරත්න | 1,650,000.00 | 313,744.20 | 385,044.00 | 698,788.20 |
| | වෛද්‍ය ඩබ්ලිව්.අයි.ටී. ෆනැන්ඩු | 750,000.00 | 85,929.24 | 18,265.00 | 285,189.76 |
| **විද්‍යා පීඨය** | 13.01.14.11.01<br>RG/2011/32/S (UPDN )<br>ආචාර්ය එන්.පී.එස්. කුඹුරේගම | 75,000.00 | 17,838.00 | 18,186.00 | 36,024.00 |
| | 13.01.14.11.02<br>RG/2011/33/S (UPDN)<br>ආචාර්ය ජේ.ඩබ්ලිව්. දමුණුපොල | 82,215.00 | 4,495.00 | 26,355.92 | 30,850.92 |
| | 13.01.14.11.03 (UPDN )<br>RG/2011/34/S<br>කේ.එම්.ජී.ජී. ජයසූරිය | 98,200.00 | 12,884.80 | 47,287.01 | 60,171.81 |
| | 13.01.14.11.04<br>RG/2011/35/S<br>එස්.ඩී.එස්.එස්. සූරියපතිරණ | 175,000.00 | 140,078.50 | | 140,078.50 |
| | 13.01.14.12.01<br>RG/2012/40/S (UPDN )<br>ආර්.එස්. රාජකරුණා | 148,000.00 | 128,154.99 | 19,845.01 | 148,000.00 |
| | 13.01.14.12.02<br>RG/2012/41/S (UPDN )<br>එම්.ඒ..එස්.පී.කේ. මලවිආරච්චි | 448,000.00 | 263,318.04 | 60,334.00 | 323,652.04 |
| | RG/2012/42/S (UPDN )<br>13.01.14.12.03<br>එම්.වයි.යූ. ගනේහේනගේ | 358,500.00 | 106,303.80 | 250,525.40 | 356,829.20 |
| | 13.01.14.12.04 (UPDN )<br>RG/2012/43/S<br>එච්.එම්.එස්.පී. මඩවල | 150,000.00 | 105,546.00 | 41,311.00 | 146,857.00 |
| | 13.01.14.12.07<br>RG/2012/GG-1/46/S<br>ජී.ඒ.ඩී. පෙරේරා | 140,000.00 | 142,749.22 | | 142,749.22 |
| | 13.01.14.12.08<br>RG/2012/GG-1/47/S (UPDN )<br>ඒ.එම්.ටී.ඒ. ගුණරත්න | 76,000.00 | 18,526.00 | 4,838.00 | 23,364.00 |
| | 13.01.14.12.09<br>RG/ 2012/GG-1/48/S (UPDN )<br>ජේ.ඩබ්ලිව්. දමුණුපොල | 95,250.00 | 82,911.32 | | 82,911.32 |
| | 13.01.14.12.10<br>RG/2012/GG-1/49/S (UPDN )<br>එන්.පී.එස්. කුඹුරේගම | 200,000.00 | 146,418.80 | 3,998.40 | 150,417.20 |
| | 13.01.14.13.01<br>RG/2013/13/S (UPDN )<br>එස්.සී.කේ. රූබසිංහ | 156,780.00 | 96,195.00 | 60,585.00 | 156,780.00 |
| | 13.01.14.13.02 ( UPDN)<br>RG/2013/14/S<br>ඩබ්ලිව්.එම්.සී.එස්. විජේසුන්දර | 123,000.00 | 46,425.00 | 75,510.00 | 121,935.00 |
| | 13.01.14.13.03<br>RG/2013/15/S<br>ජී.ඒ.ඩී. පෙරේරා | 150,000.00 | 58,690.70 | 91,309.30 | 150,000.00 |
| | 13.01.14.13.04<br>RG/2013/16/S (UPDN )<br>ඩී.එන්. කරුණාරත්න | 168,500.00 | 157,000.00 | | 157,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 13.01.14.13.05 (UPDN )<br>RG/AF/2013/71/S<br>මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් | 2,620,500.00 | | 409,826.00 | 409,826.00 |
| | 13.01.14.13.06<br>RG/AF/2013/72/S<br>ජී.ඒ.ඩී. පෙරේරා | 2,086,000.00 | | 816,693.45 | 816,693.45 |
| | 13.01.14.13.07<br>RG/AF/2013/73/S<br>එච්.එම්.එස්.පී. මඩවල | 858,000.00 | | 327,521.50 | 327,521.50 |
| | 13.11.14.11.01<br>RG/2011/NRB/01 (NSF)<br>ඩබ්ලිව්.ඒ.අයි. කරුණාරත්න | 763,800.00 | 127,187.00 | 38,465.00 | 165,652.00 |
| | 13.11.14.11.02<br>NSF/Fellow/2011/02 (NSF)<br>ජී.ආර්.ඒ. කුමාර | 3,000,000.00 | 879,601.13 | 911,426.09 | 1,791,027.22 |
| | 13.11.14.11.03<br>RG/2011/NRB/03 (NSF)<br>මහාචාර්ය ඩී.එම්.ඩී යකන්දාවල | 2,407,322.00 | 743,430.89 | 972,439.04 | 1,715,869.93 |
| | 13.11.14.11.04<br>RG/2011/ES/01 (NSF)<br>ආචාර්ය එච්.එම්.එස්.පී. මඩවල | 1,772,050.00 | 344,767.50 | 273,486.00 | 618,253.50 |
| | 13.11.14.11.05<br>RG/2011/NRB/08 (NSF)<br>ආචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරිය | 1,905,310.00 | 986,352.70 | 371,232.00 | 1,357,584.70 |
| | 13.11.14.12.06 (NSF)<br>RG/2012/AG/03<br>ආචාර්ය ජේ.ඩබ්ලිව්. දමුණුපොල | 1,651,720.00 | 771,916.54 | 806,573.48 | 1,578,490.02 |
| | 13.10.11.120.214<br>RG/2011/NANO/04 (NSF)<br>ආචාර්ය ඩී.එන්. කරුණාරත්න | 2,127,258.00 | 573,004.60 | 686,997.40 | 1,260,002.00 |
| | 13.42.14.11.01<br>(Nature's Beauty Creatious Ltd)<br>මහාචාර්ය ඒ.එන්. නවරත්න | 817,000.00 | 8,429.00 | | 8,429.00 |
| | 11.01.05.14.02<br>AC/ACIAR/RG/01<br>මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම් | 929,500.00 | | 383,396.32 | 383,396.32 |
| | 13.01.14.00.01<br>RG/2014/39/S ( UPDN )<br>ජී.ඒ.එන්.. සුරන්ජිත් | 431,310.00 | | 158,411.00 | 158,411.00 |
| | 13.01.14.00.01<br>RG/2014/41/S<br>ඩබ්ලිව්.එම්.සී.එස්. විජේසුන්දර | 595,000.00 | | 136,431.00 | 136,431.00 |
| | 13.01.14.00.01<br>RG/2014/42/S<br>ආචාර්ය එස්.කේ. යටිගම්මන | 1,095,000.00 | | 84,500.00 | 84,500.00 |
| | 13.24.14.13.02<br>MTR/TRD/AGR/03/01/04<br>(Ministry of Tec. & Reserch )<br>ආචා්ය එම්.ඒ.එස්.පී.කේ. මලවිආරච්චි | 3,300,000.00 | | 532,016.72 | 532,016.72 |
| **පශු වෛද්‍ය පීඨය** | RG/2011/BS/04<br>NSF ප්‍රදාන | 556,124.00 | 19,500.00 | 381,510.00 | 401,010.00 |
| | RG/2011/HS/12 | 2,568,648.00 | 754,443.75 | 356,942.20 | 1,111,385.95 |
| | RG/2011/BT/11 | 2,430,000.00 | 1,200,000.00 | 503,287.92 | 1,703,287.92 |
| | RG/2012/AG/08 | 1,850,000.00 | 494,428.99 | 868,302.87 | 1,362,731.86 |
| | NARP11 | 2,813,613.00 | 435,280.18 | 525,750.00 | 961,030.18 |
| | NARP/12/UP/VMAS 01 | 860,000.00 | 168,000.00 | 206,274.72 | 374,274.72 |
| | NARP/12/UP/VMAS 02 | 2,350,000.00 | 80,365.50 | 544,380.00 | 624,745.50 |
| | NARP/12/UP/VMAS 06 | 1,000,000.00 | 134,081.99 | 451,750.81 | 585,832.80 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | RG/2013/17V | 75,000.00 | 15,150.00 | 22,148.74 | 37,298.74 |
| | RG/2013/18V | 76,000.00 | | 35,268.00 | 35,268.00 |
| | RG/2013/19V | 75,000.00 | 20,000.00 | 17,957.99 | 37,957.99 |
| | URG/2013 | 5,232,120.00 | | 728,299.50 | 728,299.50 |
| | URG/2014 | 4,406,550.00 | | 22,030.00 | 22,030.00 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන | 1,500,000.00 | | 80,000.00 | 80,000.00 |

## උපග්‍රන්ථය F – මුදල් ප්‍රකාශනය

### F1 2014 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්ව ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනට රුපියල්* | *සටහන* | *දූ.හා.අ.අ.ම.* | *විශ්වවිද්‍යාලය* | *2014 රු.* | *2013 රු.* |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් අගය | 2 | 2,038,770 | 329,906,221 | 331,944,991 | 189,130,296 |
| අත්තිකාරම්-සැපයුම් හා සේවාවන් | 3 | - | 5,790,286 | 5,790,286 | 2,418,259 |
| සිසුන්ට අත්තිකාරම් | 4 | - | 2,950 | 2,950 | 2,950 |
| අත්තිකාරම්-විවිධ | 5 | 82,241 | 324,589,664 | 324,671,905 | 120,392,380 |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් | 6 | 586,406 | 873,876 | 1,460,282 | 916,482 |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් | 7 | 109,550,226 | 5,030,154 | 114,580,380 | 106,173,690 |
| විවිධ ණය ගැතියෝ/අයවිය යුතු | 8 | - | 59,727,803 | 59,727,803 | 69,559,341 |
| භාණ්ඩ | 9 | 3,077,260 | 126,674,333 | 129,751,593 | 166,984,520 |
| මාර්ගගත භාණ්ඩ | 10 | - | - | - | 527,927 |
| පෙර ගෙවීම් | 11 | - | 3,950,435 | 3,950,435 | 2,783,566 |
| තැන්පතු-ඉන්ධන | 12 | 83,000 | 3,158,530 | 3,241,530 | 1,449,030 |
| **මුළු ජංගම වත්කම්** | | **115,417,903** | **859,704,251** | **975,122,154** | **660,338,440** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| බැදුම්කර කඩ කිරීමෙන් අයවියයුතු | 13 | - | 152,662,996 | 152,662,996 | 202,093,247 |
| බැදුම්කර කඩ කරන්නන් සඳහා වැඩිපුර ගෙවූ වැටුප් | 14 | - | 2,859,426 | 2,859,426 | 3,393,755 |
| බැදුම්කර කඩ කරන්නන්ගෙන් විවිධ අයවීම් | 15 | - | 358,899 | 358,899 | 1,907,099 |
| කාර්ය මණ්ඩල ණය | 16 | 2,609,179 | 125,655,983 | 128,265,162 | 123,103,287 |
| ආයෝජන - සීමිත මුදල් | 17 | - | 148,669,697 | 148,669,697 | 148,669,697 |
| ආයෝජන් වෙනත් මුදල් | 18 | - | 644,035,968 | 644,035,968 | 582,567,935 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 19 | - | 7,997,372 | 7,997,372 | 8,115,588 |
| කෙරීගෙන යන වැඩ | 20 | - | 750,451,338 | 750,451,338 | 440,405,476 |
| දේපල, යන්ත්‍ර හා උපකරණ | 21 | 2,301,027 | 10,423,177,282 | 10,425,478,309 | 10,422,295,853 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **4,910,206** | **12,255,868,963** | **12,260,779,168** | **11,932,551,937** |
| **මුළු වත්කම්** | | **120,328,108** | **13,115,573,214** | **13,235,901,322** | **12,592,890,377** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ තැන්පතු | 22 | 200,000 | 6,404,108 | 6,604,108 | 4,462,764 |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් | 23 | - | 19,832,939 | 19,832,939 | 29,241,435 |
| විවිධ ගෙවිය යුතු | 24 | 428,750 | 206,119,277 | 206,548,026 | 219,224,325 |
| උපචිත වියදම් | 25 | 5,248,604 | 140,541,002 | 145,789,606 | 189,754,892 |
| **මුළු ජංගම වගකීම්** | | **5,877,354** | **372,897,326** | **378,774,679** | **442,683,415** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම පාරිතෝෂික | 26 | 5,574,693 | 790,554,354 | 796,129,047 | 759,529,444 |
| බැදුම්කර කඩ කිරීම් | 27 | - | 152,662,996 | 152,662,996 | 202,093,247 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **5,574,693** | **943,217,350** | **948,792,042** | **961,622,690** |
| **මුළු වගකීම්** | | **11,452,046** | **1,316,114,675** | **1,327,566,721** | **1,404,306,106** |
| **ශුද්ධ වත්කම්/EQUITY** | | **108,876,062** | **11,799,458,539** | **11,908,334,601** | **11,188,584,272** |
| **ප්‍රාග්ධන මුදල්** | | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් කළ | 28 | 396,935 | 1,357,575,845 | 1,357,972,779 | 1,374,028,620 |
| ප්‍රාග්ධන ප්‍රදාන කෙරීගෙන යන වැඩ වෙනුවෙන් වියදම් කළ | 29 | - | 563,621,488 | 563,621,488 | 360,375,337 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකල ගොඩනැගිලි | 30 | - | 615,322,512 | 615,322,512 | 209,482,792 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකල උපකරණ, ලී බඩු, පුස්තකාල පොත් | 31 | - | (286,853,958) | (286,853,958) | (197,083,033) |
| පුනරුත්ථාපන ප්‍රදාන - ප්‍රාග්ධන ස්වභාවයේ කෙරීගෙන යන වැඩ සඳහා වියදම් කළ | 32 | - | 186,829,851 | 186,829,851 | 80,030,140 |
| පුනරුත්ථාපන ප්‍රදාන - වියදම් නොකළ | 33 | - | (127,931,482) | (127,931,482) | (19,696,313) |
| පරිත්‍යාග ගොඩනැගිලි - දන්ත වෛද්‍ය පීඨය | | - | 1,225,101,020 | 1,225,101,020 | 1,225,101,020 |
| පරිත්‍යාග වත්කම් | 34 | 1,468,164 | 1,815,991,163 | 1,817,459,327 | 1,695,893,943 |
| පරිත්‍යාග ගොඩනැගිලි- දෙස් /විදෙස් | | - | 585,377,836 | 585,377,836 | 585,377,836 |
| පරිත්‍යාග | | - | 60,038 | 60,038 | 60,038 |
| | | **1,865,098** | **5,935,094,313** | **5,936,959,411** | **5,313,570,381** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **වෙන් කළ මුදල් (සංචිත)** | | | | | |
| ස්ථාවර වත්කම් ඇගයීම් සංචිතය | 35 | 4,742,659 | 9,969,301,896 | 9,974,044,555 | 9,970,731,152 |
| සාමාන්‍ය සංචිතය | | 102,268,305 | (5,140,473,861) | (5,038,205,556) | (4,953,477,743) |
| | | **107,010,964** | **4,828,828,035** | **4,935,838,999** | **5,017,253,409** |
| **equity වෙනත් කොටස්** | | | | | |
| වෙනත් මුදල් | 36 | - | 751,193,399 | 751,193,399 | 636,174,923 |
| Endowment මුදල් | 37 | - | 151,491,859 | 151,491,859 | 151,158,037 |
| ශිෂ්‍යාධාර මුදල | | - | 42,400 | 42,400 | 42,400 |
| පර්යේෂණ ප්‍රදාන | 38 | - | 130,611,085 | 130,611,085 | 68,019,735 |
| විශේෂ ප්‍රදාන | 39 | - | 2,197,448 | 2,197,448 | 2,365,387 |
| | | **-** | **1,035,536,191** | **1,035,536,191** | **857,760,483** |
| **මුළු ශුද්ධ වත්කම්/සමාන අගය** | | **108,876,062** | **11,799,458,539** | **11,908,334,601** | **11,188,584,272** |

## F2 2014 දෙසැම්බර් 31 දිනට මුදල් කාර්ය සාධන ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල් | සටහන | දූ.හා.අ.අ.ම. | විශ්වවිද්‍යාලය | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| **ආදායම්** | | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | - | 3,271,121,578 | 3,271,121,578 | 2,521,448,830 |
| ශිෂ්‍යාධාර | | - | 26,459,400 | 26,459,400 | 13,423,100 |
| මහපොල | | - | 24,337,600 | 24,337,600 | 15,531,950 |
| අරමුදල්/ප්‍රදාන/ප.උ.වැඩසටහන්වල ආදායම් | | - | 495,492,791 | 495,492,791 | 430,178,886 |
| | | **-** | **3,817,411,369** | **3,817,411,369** | **2,980,582,766** |
| **වෙනත් ආදායම්** | | | | | |
| ප්‍රාග්ධන වත්කම් නඩත්තුව සඳහා රජයේ ප්‍රදාන | | - | 33,065,568 | 33,065,568 | 37,843,444 |
| ජාත්‍යන්තර මට්ටමට පත්වීම සඳහා රජයේ ප්‍රදාන | | - | 21,022,726 | 21,022,726 | 16,625,728 |
| ආයෝජනවල පොළී | | - | 49,799,605 | 49,799,605 | 74,847,141 |
| කාර්ය මණ්ඩල ණයවල පොළී | | 116,775 | 4,972,767 | 5,089,542 | 5,145,344 |
| දේපල කුලී | | 117,657 | 9,386,504 | 9,504,161 | 7,460,268 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 40 | - | 3,424,710 | 3,424,710 | 3,701,182 |
| නිෂ්පාදන අලෙවිය | | - | 7,000 | 7,000 | 635 |
| විවිධ ලැබීම් | 41 | 14,230 | 17,568,194 | 17,582,424 | 19,936,521 |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | | 6,274,500 | 17,929,873 | 24,204,373 | 12,322,408 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | | - | 292,000 | 292,000 | 268,000 |
| උපකාරක පංති ගාස්තු (පශ්චාත් උපාධි) | | - | 3,234,000 | 3,234,000 | 3,124,950 |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | | 17,943,580 | 215,025 | 18,158,605 | 37,465,102 |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | | - | 655,500 | 655,500 | 625,000 |
| ප්‍රකාශන අලෙවිය | | 65,760 | 8,445 | 74,205 | 112,030 |
| පුස්තකාල දඩ මුදල් | | - | 480,607 | 480,607 | 391,280 |
| වෛද්‍ය ගාස්තු | | - | 1,966,000 | 1,966,000 | 1,767,600 |
| විදෙස් ශිෂ්‍ය ආදායම | 42 | - | 45,253,748 | 45,253,748 | 36,970,240 |
| සහයක ක්‍රියාකාරකම්වලින් අඛණ්ඩතාවය | 43 | 19,044,600 | 15,869,951 | 34,914,551 | 38,213,571 |
| | | **43,577,102** | **225,152,223** | **268,729,325** | **296,820,444** |
| | | **43,577,102** | **4,042,563,592** | **4,086,140,694** | **3,277,403,209** |
| **අඩුකිරීම් :** | | | | | |
| ණය ගෙවීම සඳහා හිලව් කිරීම | | - | 4,921,938 | 4,921,938 | 4,966,329 |
| විදෙස් ශිෂ්‍ය ආදායම් ප්‍රාග්ධනායනය සඳහා හිලව් කිරීම | | - | 10,844,713 | 10,844,713 | 1,374,456 |
| ආයෝජනවල පොළිය ප්‍රාග්ධනායනය සඳහා හිලව් කිරීම | | - | 1,600,000 | 1,600,000 | - |
| ප්‍රාග්ධන සංචිතය සඳහා හිලව් කිරීම් | | - | 3,148,403 | 3,148,403 | - |
| | | **-** | **20,515,054** | **20,515,054** | **6,340,785** |
| | | **43,577,102** | **4,022,048,538** | **4,065,625,640** | **3,271,062,424** |

**වියදම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | | 16,381,911 | 2,657,940,923 | 2,674,322,834 | 2,362,377,978 |
| ප්‍රවාහන | | 360,281 | 20,157,258 | 20,517,539 | 9,879,168 |
| සැපයුම් | | 4,205,535 | 183,960,437 | 188,165,973 | 168,380,024 |
| නඩත්තු | 44 | 568,451 | 28,429,578 | 28,998,029 | 26,096,230 |
| කොන්ත්‍රාත් සේවාවන් | | 4,424,634 | 330,683,673 | 335,108,307 | 325,653,070 |
| සිසුන්ට මූල්‍ය සහය දීම | | - | 50,797,000 | 50,797,000 | 28,955,050 |
| ක්ෂයවීම් | | 685,110 | 598,054,944 | 598,740,054 | 504,650,029 |
| වෙනත් වියදම් | | 22,321,843 | 180,442,379 | 202,764,222 | 185,064,208 |
| අරමුදල්/ප්‍රදාන/ප.උ.වැඩ සටහන් වෙනුවෙන් වියදම් | | - | 380,474,315 | 380,474,315 | 315,879,254 |
| | | **48,947,766** | **4,430,940,506** | **4,479,888,273** | **3,926,935,011** |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය/හිඟය** | | **(5,370,664)** | **(408,891,968)** | **(414,262,633)** | **(655,872,586)** |

<u>**එක් සිසුවෙකු සඳහා වියදම**</u>

| | | |
|---|---|---|
| **ක්ෂය වීම් සහිත** | **365,599** | **378,795** |
| **ක්ෂයවීම් රහිත** | **311,618** | **325,005** |
| **එක් සිසුවෙකු සඳහා රජයේ පුනරාවර්තන** | **295,254** | **269,386** |

## F3 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනය රු.* | *සටහන* | *2014* | *2013* |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | | |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම්වල අතිරික්තය/හිඟය** | | (414,262,633) | (655,872,586) |
| | | | |
| **මුදල් නොවන ගනුදෙනු/ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 598,740,054 | 504,650,029 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 37,062,451 | 95,198,770 |
| පෙර වසරේ ශුද්ධ ගැලපීම් | | (14,930,447) | 86,010,155 |
| වෙනත් අරමුදල්වල අතිරික්තය | | (115,018,477) | - |
| ආයෝජනවල පොළිය | | (48,199,605) | (74,847,141) |
| විදෙස් ශිෂ්‍ය ආදායම් | | (34,409,035) | (36,970,240) |
| ප්‍රාග්ධන සංචිත සඳහා හිලව් කිරීම | | 3,148,403 | - |
| ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් (අතිරික්තය/හිඟය) | | **12,130,711** | **(81,831,013)** |
| | | | |
| **වැඩ මූලධන වෙනස්කම්** | | | |
| අත්තිකාරම්-සැපයුම්/සේවාවන් (වැඩිවීම්/අඩුවීම්) | | (3,372,027) | 1,490,204 |
| අත්තිකාරම් - විවිධ (වැඩිවීම්/අඩුවීම්) | | (204,279,525) | (86,930,019) |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්) | | (543,800) | - |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අය විය යුතු මුදල් | | (8,406,690) | (8,541,220) |
| විවිධ ණය ගැතියෝ/අයවිය යුතු + (වැඩිවීම්/අඩුවීම්) | | 9,831,538 | 26,098,239 |
| භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්) | | 37,232,927 | (67,643,496) |
| මාර්ගගත භාණ්ඩ (වැඩිවීම්/අඩුවීම්) | | 527,927 | 5,430,393 |
| පෙර ගෙවීම් (වැඩිවීම්/අඩුවීම්) | | (1,166,868) | (517,572) |
| තැන්පතු (වැඩිවීම්/අඩුවීම්) | | (1,792,500) | (42,500) |
| බැඳුම්කර කඩ කිරීමෙන් අය විය යුතු (වැඩිවීම්/අඩුවීම්) | | 51,512,780 | (8,312,917) |
| කාර්ය මණ්ඩල ණය (වැඩිවීම්/අඩුවීම්) | | (5,161,876) | (3,692,025) |
| විවිධ තැන්පතු (වැඩිවීම්/අඩුවීම්) | | 2,141,345 | - |
| වෙනත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු (වැඩිවීම්/අඩුවීම්) | | (9,408,496) | - |
| විවිධ ගෙවිය යුතු (වැඩිවීම්/අඩුවීම්) | | (12,676,298) | 106,838,014 |
| (උපචිත වියදම් (වැඩිවීම්/අඩුවීම්) | | (43,965,286) | 105,973,155 |
| **වැඩ මූලධන වෙනස්වීම්වලින් පසු මෙහෙයුම් - ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ගලනය** | | **(177,396,139)** | **(11,680,759)** |
| පාරිතෝෂික ගෙවීම් | | (59,189,473) | (67,344,394) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(236,585,612)** | **(79,025,154)** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම්වලට එකතු කිරීම් | | (522,973,719) | (524,647,417) |
| කෙරීගෙන යන වැඩවලට එකතු කිරීම් | | (392,470,218) | (131,524,168) |
| සීමාකළ මුදල් ආයෝජන I | | - | (16,140,700) |
| සීමා කළ මුදල් ආයෝජන II | | (61,468,033) | 146,616,897 |
| ආයෝජනවල පොළි | | 67,270,066 | 71,151,536 |
| ස්වයං මූළ්‍ය ව්‍යාපෘති | | (344,931,817) | (247,839,841) |
| විදෙස් ආදායම් | | 47,183,113 | 14,088,465 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(1,207,390,609)** | **(688,295,228)** |
| | | | |
| **මුදල් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ ප්‍රදාන මූලධන | | 1,085,800,000 | 494,300,000 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන | | 1,000,000 | - |
| ස්වංකීය ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම | | 499,990,915 | 296,177,359 |
| | | | |
| **මුදල් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | **1,586,790,915** | **790,477,359** |
| | | | |
| **මුදල් හා මුදල්වල සමාන අගයේ ශුද්ධ වැඩිවීම** | | 142,814,694 | 23,156,977 |
| **වර්ෂාරම්භයේදී මුදල් හා මුදල්වල සමාන අගය** | | 189,130,296 | 165,973,318 |
| **වර්ෂාවසානයේදී මුදල් හා මුදල්වල සමාන අගය** | | **331,944,991** | **189,130,296** |

## F4 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම්

| දෙසැම්බර් 31 දිනට<br>රු. | සටහන | දූ.හා අ.අ.කේ | විශ්වවිද්‍යාලය | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය (හිඟය)** | | (5,370,664) | (408,891,968) | (414,262,633) | (655,872,585) |
| **පෙර වසරෙන් ඉදිරියට ගෙන ආ ශේෂය** | | 85,699,206 | (5,040,406,306) | (4,954,707,100) | (4,660,826,738) |
| **එකතු කිරීම : පෙර වසරේ ශේෂයට ගැලපීම්** | | - | - | - | (163,999) |
| | | 85,699,206 | (5,040,406,306) | (4,954,707,100) | (4,660,990,737) |
| | | 80,328,541 | (5,449,298,274) | (5,368,969,733) | (5,316,863,322) |
| **එකතු කිරීම් :** | | | | | |
| වත්කම්වල disposal ලාභය | | - | - | - | 1,001,428 |
| විදෙස් මුදල් ලැබීම් loss | 45 | - | (897,350) | (897,350) | 2,047,170 |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | | - | - | - | 2,500 |
| ස්ථාවර වත්කම්වල ක්ෂයවීමේ අගය හිලව් කිරීම | | - | 502,066,191 | 502,066,191 | 425,446,817 |
| රජයේ ප්‍රදාන යොදා ගනිමින් මිලදී ගැනීම් | | 80,328,541.41 | (4,948,129,433) | (4,867,800,892) | (4,888,365,407) |
| **අඩුකිරීම් :** | | | | | |
| පෙර වර්ෂ සඳහා ගැලපීම | | 21,939,764 | (45,043,623) | (23,103,859) | 85,600,894 |
| වෙනත් අරමුදල්වල අතිරික්ත හිලව් කිරීම | | - | (115,018,477) | (115,018,477) | (114,299,632) |
| විදෙස් ශිෂ්‍ය ආදායම් හිලව් කිරීම | | - | (34,409,035) | (34,409,035) | (35,595,785) |
| විදෙස් මුදල් gain/loss හිලව් කිරීම | 45 | - | 897,350 | 897,350 | (2,047,170) |
| **ශේෂය :** | | 102,268,305 | (5,141,703,218) | (5,039,434,913) | (4,954,707,100) |
| නැගෙනහිර හා යාපනය ඒකකය | | - | 1,229,356 | 1,229,356 | 1,229,356 |
| **ඉදිරියට ගෙන ආ ශේෂය** | | **102,268,305** | **(5,140,473,861)** | **(5,038,205,556)** | **(4,953,477,743)** |

## F5 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාන අගය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල්වලින්.* | *ප්‍රාග්ධන ප්‍රදාන* | *රඳවාගත් ඉපයීම්* | *ප්‍රතිගණන වෙන්කිරීම්* | *වෙනත් සංචරක කොටස්* | *එකතුව* |
|---|---|---|---|---|---|
| **2012 දෙසැම්බර් 31 දිනය ශේෂය** | **5,231,639,389** | **(4,659,597,382)** | **9,977,675,545** | **744,850,081** | **11,294,567,632** |
| මුදල්/ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ ගණුදෙනු | 81,930,992 | - | (6,944,393) | 112,910,402 | 187,897,000 |
| කාල වකවානුව සඳහා අතිරික්තය හිඟය | - | (293,880,361) | - | - | (293,880,361) |
| **2013දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,313,570,381** | **(4,953,477,743)** | **9,970,731,152** | **857,760,483** | **11,188,584,272** |
| මුදල්/ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ ගණුදෙනු | 623,389,030 | - | 3,313,403 | 177,775,708 | 804,478,141 |
| කාලවකවානුව සඳහා අතිරික්තව (හිඟය) | - | (84,727,812) | - | - | (84,727,812) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,936,959,411** | **(5,038,205,556)** | **9,974,044,555** | **1,035,536,191** | **11,908,334,601** |

## උපග්‍රන්ථ G – විගණන කමිටු වාර්තාව 2014

(විගණන කමිටු සභාපති යූ.ඩබ්ලිව්. අත්තනායක මහතා විසින් වාර්තා කරන ලද පරිදි)

**හැඳින්වීම**

විගණන කමිටුව විශ්වවිද්‍යාල පාලක සභාවේ අනු කමිටුවකි. යහපාලනය සඳහා වන විධිවිධානවල විෂය පථයට අනුව විගණන කමිටුව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහාත් පරිපාලන හා මුදල් පටිපාටි ඉහළ නැංවීම සඳහාත් නිර්දේශ ඉදිරිපත් කරමින් ක්‍රියා කරයි.

**ජයග්‍රහණ**

සමාලෝචිත වර්ෂයේදී මෙම කමිටුව අවස්ථා හතරකදී රැස්වී අභ්‍යන්තර විගණන අංශය හරහා සම්බන්ධීකරණය කරමින් රජයේ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ක්‍රියාපටිපාටියද, බැදුම්කර කඩ කරන්නන්ගේ වගකීම අය කර ගැනීමේ හා බැදුම්කර හා ගිවිසුම් පාලනය කිරීමේ ක්‍රියාවලිය සහ ණය හා උත්සව අත්තිකාරම් ලබා දීම ඒවා අය කර ගැනීම යන ක්‍රියාපටිපාටීන් සංවිධාන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කොට විශ්වවිද්‍යාල කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉහළ නැංවීම සඳහාත් මඟ පෙන්වන ලදි.

ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි සඳහා මාර්ගෝපදේශ සැකසීම, මුදල් කමිටුව සඳහා මාර්ගෝපදේශ හා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ තත්ත්ව වාර්තා සැකසීම යන කරුණු පිළිබඳව උපදෙස් ලබා දුන් අතර පවරා තිබෙන වගකීම් හා විශ්වවිද්‍යාලයේ විවිධ ක්‍රියාකාරකම්/උත්සව පැවැත්වෙන කාලවකවානු පිළිඹිඹු කෙරෙන ලේඛන පද්ධතියක් පවත්වා ගෙන යෑමේ වැදගත්කම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදි. මීට අමතරව විගණන කමිටුව වර්ෂ කිහිපයක් තිස්සේ නැවත නැවත විමසුමට භාජනය වූ විගණන විමසුම් සඳහා විසඳුම් සමාලෝචනය කරමින් හා නිර්දේශ කරමින් 2014 වර්ෂයේ ලද විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය අඛණ්ඩව නිරීක්ෂණය කරන ලදි.

අභ්‍යන්තර විගණන අංශය මෙම සමාලෝචිත වර්ෂයේදී දෛනික පූර්ව විගණන ක්‍රියාකාරම් රජයේ විගණන විමසුම් හා විගණකාධිපති වාර්තාවේ කරුණු සැපයීම් 74 ක් සඳහා පිළතුරු සැපයීම සම්බන්ධීකරණය කොට සංගෘහිත කිරීම හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතුද ඇතුළත්ව මෙම අංශයේ වාර්ෂික විගණන සැලැස්මේ කාර්යයන් 80%ක් පමණ අවසන් කර තිබුණි.

**බාධක සහ පිළියම්**

2014 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන කටයුතු බොහෝමයක් සිදුකිරීමට අභ්‍යන්තර විගණන අංශයට නොහැකි විය. මීට හේතුව වූයේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විගණන විමසුම් හා වාර්තාවන්ට පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය කොට සංගෘහික කිරීමේ කටයුතුවල නියැලීමට සිදුවීම හා ප්‍රමාණවත් මානව සම්පත් නොමැතිවීමයි.

**අනාගත සැලසුම්**

විගණන කමිටුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා එය සමාලෝචනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීමට සැලසුම් කරයි.

# උපග්‍රන්ථය H – විගණන වාර්තා

## H1 විගණකාධිපති වාර්තාව - 2014

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඑල්-1/කේඩී/ජේ/පියු/01/2014/08

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 දෙසැම්බර් 21 දින.

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2015 දෙසැම්බර්          දින.

සීඑල්-1/කේඩී/ජේ/පියු/01/2014/08

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5), 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර, විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2015 ජුලි 09 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-------------------

2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

සම්පූර්ණයෙන් ක්ෂය කර ශුන්‍ය වටිනාකමක් පෙන්නුම් කෙරෙන වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නේ නම් එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් මිලට ගන්නා ලද රු. 1,883,681,542 ක වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.6,357,000 ක් වටිනා පරිගණක සම්පූර්ණයෙන්ම ගිණුම්වලින් අත්හැරී තිබූ අතර, ඒ අනුව එම වත්කම් සම්බන්ධයෙන් රු. 195,064 ක ක්ෂය ප්‍රතිපාදන ද සිදු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 690,321 ක්වූ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාළ ඉදිරියට ලැබූ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ කුලී ආදායම රු.1,156,530 ක් වුවත්, රු. 275,130 ක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම සහ ලැබිය යුතු ආදායම රු. 881,400 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ලැබිය යුතු කුලී ආදායම් හා පාඨමාලා ගාස්තු රු.1,435,800 ක් සහ ගෙවිය යුතු පාඨමාලා වියදම හා වෙනත් වියදම් රු. 555,971 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෛද්‍ය පීඨයේ Pathology දෙපාර්තමේන්තුවේ පැවති රසායනික ද්‍රව්‍යවල, මිල ගණන් හඳුනාගෙන ඒවා අගය කර ගිණුම්ගත කළ යුතු වුවත්, රසායනික ද්‍රව්‍ය අයිතම් 153 කට අදාළව වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලය විසින් ඉදිකර තිබූ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් සහ "සී" වර්ගයේ නිවාස 03 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයට අදාළ මාවලවත්ත ගොවිපලේ රු.2,082,965 ක ආදායම සමාලෝචිත වර්ෂයේදී චක්‍රීය අරමුදලින් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු රු.7,393,674 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට නියමිත වෛද්‍ය පීඨය පිහිටා ඇති ඉඩමේ මිනුම් කිරීම, මායිම් ප්‍රතිෂ්ඨාපනය හා පිඹුරු සැකසීම වෙනුවෙන් දරන ලද රු. 355,250 ක මුදල පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) අරමුදල් 09 ක් සඳහා ලැබී තිබුණු මුදල් ප්‍රමාණය ඉක්මවා එකතුව රු.3,596,793 ක් විධිමත් අනුමැතියකින් තොරව වියදම් කර තිබුණු අතර, එම අරමුදල්වල ඇති වී තිබුණු සෘණ ශේෂ ධන ශේෂ සමඟ ගැලපීම් කර රු. 751,193,340 ක ශුද්ධ ධන ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් අක්කර 1390 රූඩ් 02 පර්චස් 21.6 ක අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පාඨමාලා 04 කට අදාළ එකතුව රු. 293,000 ක් වූ ඉදිරියට ලැබීම්, සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 3,325,289 ක පුනරාවර්ථන වියදම් මූලධන ප්‍රතිපාදන මගින් දරා ප්‍රාග්ධනිත කර තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පැරණි ආපදා ණය ශේෂය රු. 2,657,386 ක් වූ නමුත් උපලේඛණ සමඟ සැසඳීමේදී රු. 333,356 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති උපචිත අනෙකුත් සැපයුම් රු.1,308,228 ක ශේෂය, විගණනයට ඉදිරිපත් වූ උපලේඛණයේ රු.1,060,030 ක ශේෂය සමඟ සැසඳීමේදී රු. 248,198 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 1,567,749,848 ක් වූ පහත දැක්වෙන ගිණුම් විෂයයන් 08 ක ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| i. | පීඨ 08 කට අදාළව කථිකාචාර්යවරුන් 674 දෙනෙකු සඳහා සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 29 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා | 142,943,451 | පර්යේෂණ වාර්තා |
| ii. | ජංගම වගකීම් | 961,277 | විස්තරාත්මක උපලේඛණ හා වගකීම තහවුරු කිරීම සඳහා වූ සාක්ෂි. |
| iii. | යාපනය විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු මුදල් | 3,819,554 | වටිනාකම සනාථ කර ගැනීම සඳහා උපලේඛණ හා ශේෂ තහවුරු ලිපි |
| iv. | වාහන රක්ෂණ වියදම් | 105,589 | වාහන විස්තර සහ ශේෂය සැඳුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛණ සහ අදාළ කාලපරිච්ඡේද |

| | | | |
|---|---|---|---|
| v. | International Training course on Elephant Health Nutrition and Reproduction වැඩමුළුවට අදාළ වියදම් සහ සම්පත්දායක දීමනා | 1,053,290 | ව්‍යාපෘති ඇස්තමේන්තුව සඳහා ලබාගත් අනුමැතීන් සහ වැඩමුළුවට සහභාගී වූ බවට තහවුරු කිරීම් |
| vi. | හඳුනා නොගත් ලැබීම් | 10,459,026 | වටිනාකම සනාථ කිරීමට අදාළ උපලේඛණ |
| vii. | විද්‍යා පීඨයේ ගෑස් පිරිපහදු මධ්‍යස්ථානයේ වෙන්දේසි කරන ලද ගෑස් ටැංකිවල වටිනාකම | 1,825,000 | ගැනුම්කරුවන් තෝරා ගැනීමට අදාළ අනුමැතීන් |
| viii. | ස්ථාවර වත්කම් | 1,406,582,661 | ස්ථාවර වත්කම් ලේඛණ හා භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා සත්‍යාපන වාර්තා |
| | එකතුව | 1,567,749,848 | |

(ආ) පශු වෛද්‍ය පීඨයේ පශු වෛද්‍ය සායනික රෝහලේ සේවය කරන නිර්වින්දන වෛද්‍යවරුන් සමාලෝචිත වර්ෂයේ විවිධ ආයතනවල පෙරහැර රාජකාරී සඳහා දින 39 ක් සහභාගී වී ඇතත්, ඒ සඳහා ලද ආදායම, දැරූ වියදම්, සහභාගී වූ නිලධාරීන් හා වාහන ධාවනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) පශු වෛද්‍ය පීඨය යටතේ ක්‍රියාත්මක වන සත්ත්ව ගොවිපල නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළව කරන ලද විගණන පරීක්ෂණයේදී විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය විසින් ඒ සඳහා ඉඩ ප්‍රස්ථාවන් සැලසීමට කටයුතු නොකිරීම හේතුවෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳ සතුටුදායක විගණනයක් සිදු කිරීමට නොහැකි විය.

i. අයකරනු ලබන ගාස්තු, දෛනිකව තැන්පත් කිරීම් පිළිබඳ විස්තර
ii. බාහිර පාර්ශවයන් වෙත ගොස් (ක්ෂේත්‍රයට) කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ හා ප්‍රතිකාර වෙනුවෙන් අය කිරීම් විස්තර, රිසිට්පත් පිළිබඳ විස්තර
iii. එක් එක් සතුන් සඳහා කරන ලද ප්‍රතිකාර වෙනුවෙන් කරනු ලබන අය කිරීම් පිළිබඳ අනුමත කරන ලද ගාස්තු ප්‍රමාණය

iv. ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා ගනු ලබන සිසුන් හා කථිකාචාර්යවරුන් සහභාගීවීම් පිළිබඳ විස්තර.

v. පරිත්‍යාග වශයෙන් ලැබෙන සතුන් භාරගැනීමේදී ලියාපදිංචි කිරීමේ විස්තර

vi. සතුන්ගේ උපත් හා මරණ වාර්තා පිළිබඳ විස්තර

vii. මරණයට පත් වූ සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා

viii. මරණයට පත් වූ සතුන්ගේ මෘත ශරීරය ආදාහනය කිරීම පිළිබඳ විස්තර.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය 2002 වර්ෂයේ නිම කර තිබූ නමුත් අවසන් බිල්පත ගෙවීම සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් නොවීම මත විගණන දිනය වන විටත් රු.2,401,745 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ නිම කර භාරදී තිබෙන කොන්ත්‍රාත් 08 කට අදාළ එකතුව රු. 6,504,097 ක් වූ රඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් මුදල් අයකර ගැනීමේදී වැඩිපුර අයකර තිබෙන වර්ෂ 05 කට වඩා පැරණි එකතුව රු.1,153,363 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය සතු නිල නිවාසවලින් සහ බාහිර පාර්ශවයන්ට විශ්වවිද්‍යාල භූමිය කුලියට දීමෙන් ලැබිය යුතු කුලී, ජල හා විදුලි බිල්පත්වල එකතුව රු. 5,307,283 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1995 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා කාලය තුළ නිලධාරීන් තිදෙනෙකු වෙත ලබා දී ඇති එකතුව රු.70,000 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) නිලධාරීන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 2,381,348 ක්වූ පැරණි ආපදා ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලය විසින් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික බිම්කුලී ගාස්තු ගෙවීමේ පදනම මත බදු දී තිබූ ඉඩමෙන් 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු රු.5,340,000 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඍ) පේරාදෙණිය නගරයේ සතිපොළ පැවැත්වීම සඳහා මහනුවර කඩවත් සතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත බදු පදනම මත ලබා දී තිබූ විශ්වවිද්‍යාලයට අයත් ඉඩමෙන් 1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු රු.7,449,000 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ මුදල් විධිවිධාන යටතේ වූ 99(1) වගන්තිය | විශ්වවිද්‍යාල අරමුදලට බැරකළ යුතු එකතුව රු.12,647,980 ක මුදල් එම අරමුදලට බැර නොකර පශු වෛද්‍ය පීඨය මඟින් පාලනය වන විවිධ අරමුදල් 09 කට බැර කර තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය | |
| (i) IX පරිච්ඡේදයේ 2.1 හා 2.2 වගන්ති | ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හා පශු වෛද්‍ය පීඨයේ නිලධාරීන් වෙත පිලිවෙලින් රු.927,092 ක් හා රු.974,639 ක් අතිකාල දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ii) I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 වගන්තිය සහ II කොටසේ IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාරව, සාමාන්‍ය වැඩකටයුතුවලින් පරිබාහිරවූද, හදිසිවූද සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වූද වැඩ සඳහා අතිකාල හෝ නිවාඩු දින වැටුප් පමණක් ගෙවිය හැකි වුවද, ඊට පටහැනිව 2014 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු සහ එහි අධීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් නිලධාරීන් 92 ක් සඳහා එකතුව රු. 1,375,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණු අතර, ගබඩා භාරකරුවන් සහ ගබඩා සහායකවරුන් 14 දෙනෙකුට රු. 122,500 ක් විධිමත් අනුමැතියකින් තොරව දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. |

| | |
|---|---|
| (iii) 02 කොටසේ 6.2 (ii) හා (iii) වගන්ති | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දන්ත වෛද්‍ය පීඨයේ බාහිර දේශන ගාස්තු සඳහා කරන ලද ගෙවීම්වලින් එකතුව රු.77,985 ක් ද, විද්‍යා පීඨයේ බාහිර දේශන ගාස්තු හා පර්යේෂණ අරමුදලින් කළ වැඩමුළු සඳහා රාජකාරී කාලය තුළ කරන ලද ගෙවීම්වලින් එකතුව රු.56,025 ක් ද බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) I කොටසේ III පරිච්ඡේදයේ 26 වගන්තිය | විශ්වවිද්‍යාලයේ වෙනත් පීඨවල කථිකාචාර්යවරුන් රාජකාරී කාලය තුළ විද්‍යා පීඨයේ දේශන පැවැත්වීම වෙනුවෙන් බාහිර දේශන ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු.607,810 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(1) | ගණන්දීමේ නිලධාරියෙකු හැර අන්‍ය කවර නිලධාරියෙකු විසින් වුවද තමාට ලැබෙන අත්තිකාරම් මුදලින් කවර කොටසක්වත් භාණ්ඩාගාරයේ ප්‍රකාශිත අධිකාර බලයකින් තොරව තවත් කෙනෙකු වෙත නිකුත් නොකළ යුතු වුවත්, ඊට පටහැනිව දන්ත වෛද්‍ය පීඨයේ සහ විද්‍යා පීඨයේ පිළිවෙලින් රු.141,765 ක් සහ රු.182,800 ක් වශයෙන් අවස්ථා 55 කදී ලබා දී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(2) | i. | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත්, විද්‍යා පීඨයේ අවස්ථා 20 කදී ලබා දී තිබූ එකතුව රු. 404,765 ක වටිනාකමින් යුතු අත්තිකාරම් දින 20 සිට මාස 04 1/2 ක් දක්වා ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි. |
| | | ii. | අතුරු අග්‍රිමයක් දීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමාවිය යුතු වුවත්, එකතුව රු. 1,059,046 ක වටිනාකමින් යුතු අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරීන්ට ලබා දී තිබුණි. |
| | | iii | එක් අවස්ථාවකදී තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් ලබා දිය හැකි උපරිම සීමාව රු. 20,000 ක් වුවත්, එම සීමාව ඉක්මවා පීඨ 2ක අවස්ථා 53 කදී රු.1,897,284ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371(4) | | ගණන්දීමේ නිලධාරියා විසින්ම වුවද ප්‍රයෝජනයට ගැනීම අනිසිවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම නොගත යුතු වුවත්, අවශ්‍යතාවයට වඩා සියයට 46 ක් හෙවත් රු.220,697 ක අත්තිකාරම් ලබා ගෙන ඒවා දින 08 සිට මාස 03 දින 26 ක කාලපරාසයක් අතරදවා ගෙන තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 371(5) | | මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පියවිය යුතු වුවද, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ මාස 02 ක් ඉක්මවා තිබූ එකතුව රු.93,200 ක අත්තිකාරම් ද, විශ්ව විද්‍යාලයේ මාස 06 ක් ඉක්මවා තිබූ රු.214,667 ක අත්තිකාරම්ද පියවීම් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 570 හා 571 | | තැන්පත් කර වර්ෂ 02 ඉක්ම වූ රු.217,499 ක්වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය | ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගත කළයුතු අතර එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයින් විසින් අත්සන් කළයුතු වුවද, දන්ත වෛද්‍ය පීඨයේ අවස්ථා 07 කට අදාළව රු.1,369,547 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 1990 පෙබරවාරි 06 දිනැති අංක 422 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නිලධාරීන් 05 දෙනෙකු සඳහා, කාර්යාල වේලාව තුළදී සේවය කිරීම වෙනුවෙන් ගෞරවාන්විත දීමනා ලෙස රු. 40,000 ක් ද විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෞරවාන්විත දීමනා සහ මාසික දීමනා ලෙස එකතුව රු. 58,000 ක ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (2) ඡේදය හා 2003 ජනවාරි 09 දිනැති අංක PE 1/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | භාණ්ඩාගාර අවසරයක් නොමැතිව ගාස්තු / දිරි දීමනා ගෙවිය නොහැකි වුවද, දන්ත වෛද්‍ය පීඨයේ වෛද්‍යවරු හා අනෙකුත් නිලධාරීන් වෙනුවෙන් දන්ත පුහුණු පාසැලේ පුහුණු කටයුතු සඳහා විධිමත් අනුමැතියක් නොමැතිව 2013 හා සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා රු.210,050 ක් හා ප්‍රදර්ශකවරුන් සඳහා 2012, 2013 සහ 2014 වර්ෂවලදී එකතුව රු.889,500 ක් ද ගෙවා තිබුණි. |
| (උ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් රසායනාගාර මඟින් විශ්වවිද්‍යාලයේ මානව හා භෞතික සම්පත් උපයෝගී කරගෙන සාමාන්‍ය රාජකාරී වේලාවේදී බාහිර පාර්ශවයන්ගෙන් පරීක්ෂණ (Testing) භාරගෙන පරීක්ෂණ වාර්තා නිකුත් කර 2009 වර්ෂයේ සිට 2014 දක්වා රු.1,437,156 ක ආදායමක් උපයාගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඍ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.8 ඡේදය | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කාර්ය මණ්ඩලය වෙත බලතල හා රාජකාරී බෙදා දියයුතු වුවද විශ්වවිද්‍යාලයේ පීය 03 ක නිලධාරීන් 179 දෙනෙකුට සහ දෙපාර්තමේන්තු 05 කට අදාළ නිලධාරීන් 79 දෙනෙකුට බලතල හා රාජකාරී ලිඛිතව පවරා දී නොතිබුණි. |
| (එ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | අධ්‍යයන දීමනාව අර්ථසාධක අරමුදල් දායකය, විශ්‍රාම වැටුප් අරමුදල, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකය යන කරුණුවලට අදාළ කර නොගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ පීය 04 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් අධ්‍යයන දීමනාව ඇතුළත් කර ඉහත අරමුදල් වලට දායකය ගණනය කිරීම නිසා රු.23,103,982 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පනතේ 24 වන වගන්තියට සංශෝධිතව 1995 අංක 01 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 02 වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා සහ පාලක සභාවේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන නියමයන් මගින් ආයතන හෝ මධ්‍යස්ථාන පිහිටුවිය යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි භෞතික චිකිත්සක දෙපාර්තමේන්තුව සහ විකිරණ වේද හා විකිරණ චිකිත්සක යන දෙපාර්තමේන්තුවලින් පිටස්තර පුද්ගලයින් සඳහා සේවාවන් සැපයීම වෙනුවෙන් සේවා මධ්‍යස්ථාන 03 ක් ස්ථාපිත කොට එම සේවා මධ්‍යස්ථාන 2009 සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමෙන් රු. 538,465 ක ආදායමක් උපයා ගෙන තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 ජුලි 01 දිනැති අංක DMS/1528(A) ලිපිය පදනම් කරගෙන 2014 ජුලි 17 දිනැති අංක 07/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව, භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසාන හය මාසය සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් දීමනා වශයෙන් රු. 88,193,167 ක්ද, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ නිලධාරීන් 31 දෙනෙකු වෙනුවෙන් රු. 735,396 ක් ද ලෙස එකතුව රු. 88,928,563 ක්ද ගෙවීම් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල පනතේ IX වන පරිච්ඡේදයේ 55(ආ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව හා 2002 නොවැම්බර් 25 දිනැති අංක 309 දරන පාලක සභා තීරණය මත 2002 වර්ෂයේදී දන්ත සහායක පුහුණු පාසැල ආරම්භ කර එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වාම පුහුණු පාසැල පවත්වා ගෙන යමින් අදාළ පාඨමාලා පවත්වා සහතිකපත්‍ර ප්‍රදානය කර තිබුණි.

(ඇ) එක් එක් කාර්යයන් සඳහා ඇතිකර තිබූ අරමුදල්වල ප්‍රමාණවත් මුදල් නොතිබියදී වියදම් කිරීම හේතුවෙන් පර්යේෂණ අරමුදල් 20 ක රු.1,300,969 ක් වූ ඍණ ශේෂයන් පැවතුණු අතර 2013 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිව පර්යේෂණ අරමුදල් 21 ක එකතුව රු.2,733,342 ක් අනුමැතියකින් තොරව වියදම් කර සමාලෝචිත වර්ෂයේදී ලැබූ මුදල්වලින් හිලව් කර තිබූ අතර, කිසිදු ශේෂයක් නොමැති අරමුදල් 02 කින් එකතුව රු. 57,511 ක් වූ වියදම් දරා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 414,945,843 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.655,872,586 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 240,926,743 කින් අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි ප්‍රකාරව, ලෝහ භාණ්ඩ හැර නුසුදුසු හැටියට ප්‍රකාශ කරන වෙනත් භාණ්ඩ පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීමෙන් පසුව ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් හෝ විවෘත ප්‍රසම්පාදන මගින් අවසන් කළ යුතු වුවත්, 2010 හා 2013 වර්ෂවලදී අපහරණය කිරීම සුදුසු බවට තීරණය කරන ලද එකතුව පිළිවෙලින් රු. 39,236,680 ක් හා රු.666,495 ක් වූ භාණ්ඩ විගණිත දිනය වූ 2015 ජුනි 11 දින වන විටත්, බැහැර කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) බාහිර දේශීය හා විදේශීය පාර්ශවයන්ගෙන් ලැබුණ පර්යේෂණ අරමුදලින් රු.195,821,314 ක මුදලක් පර්යේෂණ කාර්යයන්ට එලදායී ලෙස උපයෝජනය නොකර වසර 1 ත් වසර 10 කට වඩා වැඩි කාලයක් ආයෝජනය කර තිබුණි.

(ඇ) 1991 සිට 2001 කාලය තුළ පර්යේෂණ සඳහා ලබා දී තිබූ එකතුව රු.183,487 ක් වටිනාකමින් යුතු අත්තිකාරම් ශේෂ 08 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නව ආපදා ණය ගිණුම යටතේ නිලධාරීන් 12 දෙනෙකුට ලබා දී තිබුණු එකතුව රු.1,036,644 ක් වූ ආපදා ණය වාරික සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තොග වටිනාකම රු.126,674,333 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, එම වටිනාකම තුළ සෙමින් චලනය වන තොග අයිතම 268 ක වටිනාකම රු. 2,378,718 ක් අන්තර්ගතව තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයට අයත් පීඨවල ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ශිෂ්‍යත්ව අරමුදල් 233 ක් ආරම්භ කර තිබුණද, ඉන් රු. 34,488,022 ක් වටිනා ශිෂ්‍යත්ව අරමුදල් 67 ක් මගින් සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ දෙකේදී කිසිදු ශිෂ්‍යත්වයක් ලබා දී නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් ලැබිය යුතු ඇපබැඳුම්කර එකතුව රු.152,662,995 ක් වුවත්, එම ඇපබැඳුම්කර අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඎ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ඉදිරියට ගෙනා සෘණ ශේෂය වර්ෂයේ ප්‍රතිපාදන මගින් ගැලපූ පසු ඉතිරි වූ රු.286,853,958 ක ශේෂය පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා තිබුණි.

(එ) ආර්ථික අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා බාහිර පුද්ගලයින් විසින් විශ්වවිද්‍යාලයට ලබා දී තිබූ පරිත්‍යාග ආයෝජනය කර ලැබෙන පොලියෙන් සියයට 80 ක ප්‍රමාණයක් අදාළ කාර්යය සඳහා යොදා ගැනීමට විශ්වවිද්‍යාලීය පාලක සභාව විසින් තීරණය කර තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් කළමනාකාරීත්වය විසින් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා රු.32,882,327 ක පොලී ආදායමක් ලැබී ඇතත් ඉන් සියයට 35 ක් වූ රු. 11,445,239 ක වටිනාකමකින් යුත් ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් හා දෙසැම්බර් මාසවලදී අයකර ගත යුතු එකතුව රු.5,773,164 ක් වූ ණය වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන්ට සායනික පුහුණු කටයුතු විශ්වවිද්‍යාල භූමියේම පිහිටා ඇති පේරාදෙණිය ශික්ෂණ රෝහලෙන් හෝ මහනුවර ශික්ෂණ රෝහලෙන් ලබා ගැනීමට විශ්වවිද්‍යාලයේ කළමනාකාරීත්වය කටයුතු නොකිරීම හේතුවෙන්, අනුමැතිය ලබාදී ඇති කුරුණෑගල මහ රෝහල වෙත සිසුන් රැගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 142,352 ක ප්‍රවාහන වියදමක් දරා ඇති අතර, අදාළ සායනවලට සහභාගී වූ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීය.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා පොරොත්තු ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 124,575 ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරියකට දර්ශනපති උපාධිය සඳහා රු. 5,682,948 ක ඇපබැඳුම්කර සහිතව වර්ෂ 6ක වැටුප් සහිත නිවාඩු ලබා දී තිබුණු අතර, කථිකාචාර්යවරිය විසින් ඇප ගිවිසුම් කඩකර තිබුණි. ඒ සඳහා National Centre for Advance Studies ආයතනය මගින් ප්‍රදානය කර තිබු රු.1,602,630 ක් වු ප්‍රදානිත මුදල කථිකාචාර්යවරියගෙන් අයකර ගෙන තිබුණද එම මුදල NCAS ආයතනය වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1988 අගෝස්තු මස 30 දිනැති අංක 30/88 හා 1990 ජුනි 19 දිනැති අංක 30/88(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, 2010 නොවැම්බර් 03 දින සිට විශ්‍රාම ලැබූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විකිරණ ශිල්පි ලෙස සේවය කරන ලද නිලධාරිනියක් 1990 නොවැම්බර් 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි නැවත විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය (පරිවාස) තනතුරකට 2010 නොවැම්බර් 03 දින පත්වීම ලබාදී වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාදීම නිසා එකතුව රු. 4,936,818 ක් විශ්වවිද්‍යාල අරමුදලෙන් වැටුප් හා දීමනා වශයෙන් ගෙවීම් කොට තිබුණි.

(ඇ) පශු වෛද්‍ය පීඨයේ සත්ත්ව ගොවිපල නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී ගේ වර්ග අඩි 100 ක පමණ වන කාර්යාලයට 24000 Btu ප්‍රමාණයේ වායුසමීකරණ යන්ත්‍රයක් සවිකර තිබීම නිසා විශ්වවිද්‍යාලයේ සම්පත් බෙදීයාම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඈ) දන්ත වෛද්‍ය පීඨයේ කාර්මික නිලධාරීවරයෙකුට Crown and Bridge සකස් කිරීම සඳහා 2001 ජුනි 25 සිට 2001 දෙසැම්බර් 21 දින දක්වා වූ විදේශ දන්ත පාඨමාලාවක් හැදෑරීමට වැටුප් සහිත නිවාඩු ලබා දී තිබු අතර, එම පුහුණුවීමෙන් පසු ඔහුගේ පුහුණුවට අදාල නොවන ක්ෂේත්‍රයක් වූ සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අනුයුක්ත කර තිබූ තිබුණි. දන්ත වෛද්‍ය පීඨයේ Crown and Bridge සකස් කිරීමේ කටයුතු පෞද්ගලික රසායනාගාරයක් මඟින් ඉටු කරගෙන, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.745,550 ක් ගෙවීම් කර තිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

(අ) පර්යේෂණ අරමුදල් 59 කට අදාළව 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට ගෙන එන ලද එකතුව රු. 10,383,885 ක් වූ පර්යේෂණ අරමුදල් ශේෂය අදාළ අරමුණ සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන වෙනත් අරමුදල් ගිණුම් 27 ක් සහ සමාලෝචිත වර්ෂයේ වෙනත් අරමුදල් ගිණුම් 26 ක පැවති පිළිවෙලින් රු.10,763,458 ක් සහ රු. 32,736,440 ක ශේෂ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------
විශ්ව විද්‍යාලයේ ගබඩා 4ක එකතුව රු. 468,778 ක් වූ අයිතම 56ක් ඌන උපයෝජිතව පැවතුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයේ Technical Resources Centre හි තිබූ Gestetner Torner 05 ක් අස්ථානගත වී ඇතත්, එහි වටිනාකම හඳුනාගෙන අදාළ වගකිවයුතු පාර්ශවයෙන් සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පශු වෛද්‍ය පීඨයට අයත් ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් අනතුරට භාජනය වීම නිසා රක්ෂණ සමාගමෙන් ආවරණය නොවූ රු. 76,426 ක අලාභය සහ දොඹකරයක් මඟින් එසවීමට ගිය රු. 30,000 ක වියදම වගකිවයුතු පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති
-------------------

විද්‍යා පීඨයේ අංක CW/CON/2013/979 දරන ව්‍යාපෘතිය සඳහා රු. 2,653,740 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 03 දින ආරම්භ කර 2014 ජනවාරි 02 දින නිම කළ යුතු වුවත්, 2014 සැප්තැම්බර් 15 දින ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 4.2.2 වගන්තිය ප්‍රකාරව, මිලියන 1 ත් 5 ත් අතර වටිනාකමකින් යුත් ව්‍යාපෘති සඳහා දින 105 ක නිශ්චිත කාලසීමාවක් ප්‍රකාශ කර ඇතත්, ඊට අනුකූල නොවන පරිදි මෙම ව්‍යාපෘතිය සඳහා දින 377 ක් ගෙන තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අනුමත නොවූ තනතුරක් සඳහා තාවකාලික, අනියම්, ආදේශ හෝ කාර්ය පැවරුම් පදනම යටතේ කිසිදු බඳවා ගැනීමක් සිදු නොකළ යුතු බව දැක්වෙතත් සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඊට අනුකූල නොවන පරිදි මුදල් කමිටුවේ අනුමැතිය මත ලිපිකරු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කොට වැටුප් හා දීමනා ලෙස රු. 106,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු අතර, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය විසින් විවිධ තනතුරුවලට බඳවා ගැනීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.651,155 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) පශු වෛද්‍ය රෝහල නඩත්තු කිරීමේ අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය තුළ අනුමත නොවූ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.1,236,568 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ලිපිකරු සහ කම්කරු අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටියදී විද්‍යා පීඨයේ සම්පත් මධ්‍යස්ථානයට ලිපිකරු හා කම්කරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත ලිපිකරුවකු සහ කම්කරුවකු බඳවා ගැනීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 244,347 ක වැටුප් ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේද දෙසැම්බර් 31 දිනට විද්‍යා පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු 19 ක් හා තනතුරු 07 ක අතිරික්තතා 25 ක් පැවති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු 60 ක් හා තනතුරු 05 ක අතිරික්තතා 35 ක් පැවතුණි.

(ඉ) දන්ත වෛද්‍ය රෝහලේ මළපවාහන ජල පවිත්‍රාගාර ඒකකයේ දෛනික පිරිසිදු කිරීම් සඳහා 2008 වර්ෂයේ සිට දෛනික පදනම මත කම්කරුවකු සහ 2013 වර්ෂයේ සිට බාහිර රෝගී අංශයේ රෝගීන් ලියාපදිංචි කිරීමේ කවුන්ටරයේ සේවය සඳහා පැවරුම් පදනම මත නිලධාරිනියක් ද බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වැටුප් වශයෙන් රෝගී වාර්තා අරමුදලින් රු. 1,538,196 ක් ගෙවා තිබූ අතර, මෙම කාර්යයන් සඳහා නව තනතුරු අනුමත කර ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) දන්ත වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තු 08 ක ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 28 ක් සහ දෙපාර්තමේන්තු 07 ක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 20 ක් පැවතුණි.

(උ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ III පරිච්ඡේදයේ 26 ඡේදය පරිදි බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් දේශනයකට වැය වන මුදල ඉතා අධික වන හෙයින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීම අධෛර්ය කළයුතු බවට උපදෙස් දී ඇතත්, විශ්වවිද්‍යාලයේ පීඨ 08 ක අනුමත කථිකාචාර්යවරුන්ගේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගෙන ඒ සඳහා එකතුව රු.14,959,992 ක් ගෙවා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලීය ස්ථිර සේවයේ ආරක්ෂක නිලධාරීන් සහ තාවකාලික ආරක්ෂක සේවයේ නිලධාරීන් වෙනුවෙන් පිළිවෙලින් රු. 55,687,130 ක් සහ රු. 46,337,305 ක් වශයෙන් එකතුව රු. 102,024,435 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර, එම සේවකයින් අතර අතිරික්ත ආරක්ෂක නිලධාරීන් 117 ක් සිටියදී සමාලෝචිත වර්ෂයේදී රු.12,034,599 ක අතිකාල වියදමක් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 විගණන කමිටු

-----------------

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ප්‍රකාරව විගණන කමිටුව මඟින් තම නිරීක්ෂණ, පාලක මණ්ඩල වෙත ඉදිරිපත් කිරීමක් සිදු කර නොතිබුණු අතර, ආයතනය තුළ ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගයීම් කිරීමටත්, රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මඟපෙන්වීම පිළිබඳ සමාලෝචනය කිරීමටත් විගණන කමිටුවේ විෂය පථයට අදාළ කරගෙන නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි අඩංගු රු. මිලියන 499,282 ක් වටිනා කොන්ත්‍රාත් ව්‍යාපෘති 63 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තුවෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තුවෙහි සඳහන් රු. මිලියන 1,737 ක් වටිනා කොන්ත්‍රාත් ව්‍යාපෘති 18 ක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

5.3 පාලක සභා රැස්වීම්

-----------------------

සමාලෝචිත වර්ෂය තුළ පාලක සභා රැස්වීම් වාර 10 ක් පවත්වා ඇතත්, 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ප්‍රකාරව කාර්යක්ෂමතාවය අගය කිරීම හා මඟ පෙන්වීම සඳහා ඉදිරිපත් කළ යුතු වාර්තා හා තොරතුරු පාලක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස සහ වර්ෂය ආරම්භයේදී අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළ යුතු වුවද, අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර සියයට 2 සිට සියයට 3210 ක් සහ අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර සියයට 20 සිට සියයට 2799 ක පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) තොග පාලනය

(ආ) වාහන පරිපාලනය

(ඇ) අරමුදල් පාලනය

(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඉ) ප්‍රසම්පාදන

(ඊ) සේවක ණය පරිපාලනය

(උ) කොන්ත්‍රාත් පරිපාලනය

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති .

## H2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර

| | |
|---|---|
| **2** | **මූල්‍ය ප්‍රකාශන** |
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| **2.2.1** | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති** |
| | උප ලේඛන පිළියෙල කර අවසන් අතර වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයේදී ගිණුම් සමග එම වාර්තා ලබා දීමට කටයුතු කරනු ඇත. |
| **2.2.2** | **ගිණුම්කරණ අඩුපාඩු** |
| (අ) | මේ යටතේ වූ පරිගණක 50 HETC ව්‍යාපෘතිය (උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යංශය මගින් ලෝක බැංකු අධාර යටතේ ක්‍රියාත්මක වන ) මගින් සපයන ලද ඒවා වන අතර එම ව්‍යාපෘතිය අවසන්වූ පසු විශ්වවිද්‍යාලයට එම පරිගණකවල අයිතිය පවරනු ලබයි. මේ දක්වා එම ව්‍යාපෘතිය අවසන් වී නොමැති බැවින් හා අදාල වත්කමේ අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා දී නොමැති බැවින්ද එම වත්කම විශ්වවිද්‍යාල ගිණුම් වලට ගෙන ප්‍රාග්ධනිත ගත කල නොහැක. එසේම මෙම ව්‍යාපෘතිය මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුලම ක්‍රියාත්මක වන අතර ඒවායේ ගිණුම් උසස් අධ්‍යාපන අමාත්‍යංශය මගින් තබාගෙන යනු ලැබේ. ඒ අනුව අදාල ඉහත ව්‍යාපෘතිය අවසානයේ වත්කම් පවරා දුන් පසු ගිණුම් වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල ලැබීම් සහ ගෙවීම් 2014 වර්ෂයේ මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. එය නිවැරදි කොට 2015 වර්ෂයේ උපචිත පදනම මත ගිණුම්ගත කොට 2014 වර්ෂයට සංසන්දනාත්මක ගිණුම් ශේෂයන් පෙන්නුම් කිරීමට පියවර ගෙන ඇත. 2015 වර්ෂයේ සිට ඉදිරියට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල කලින් ලැබීම්, කලින් ගෙවීම්, ලැබියයුතු හා ගෙවියයුතු වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල ලැබීම් සහ ගෙවීම් 2014 වර්ෂයේ මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. එය නිවැරදි කොට 2015 වර්ෂයේ උපචිත පදනම මත ගිණුම්ගත කොට 2014 වර්ෂයට සංසන්දනාත්මක ගිණුම් ශේෂයන් පෙන්නුම් කිරීමට පියවර ගෙන ඇත. 2015 වර්ෂයේ සිට ඉදිරියට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල කලින් ලැබීම්, කලින් ගෙවීම්, ලැබියයුතු හා ගෙවියයුතු වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල ලැබීම් සහ ගෙවීම් 2014 වර්ෂයේ මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. එය නිවැරදි කොට 2015 වර්ෂයේ උපචිත පදනම මත ගිණුම්ගත කොට 2014 වර්ෂයට සංසන්දනාත්මක ගිණුම් ශේෂයන් පෙන්නුම් කිරීමට පියවර ගෙන ඇත. 2015 වර්ෂයේ සිට ඉදිරියට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල කලින් ලැබීම්, කලින් ගෙවීම්, ලැබියයුතු හා ගෙවියයුතු වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | මේ වන විට මෙම රසායනික ද්‍රව්‍ය සඳහා මිල ගණන් හඳුනාගෙන ඇති අතර අදල අයිතමයන් 2015 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත. |
| (ඊ) | මෙම ශේෂය 2013 වර්ෂයට අදාලව ගැලපිය යුතු අතර මෙම අඩුපාඩුව ස්වයංක්‍රීයව ගිණුම් වල නිවැරදි වී ඇති බැවින් 2015 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමක් අවශ්‍ය නොවේ.<br>එසේම 2015 ගිණුම් ඉදිරිපත් කිරීමේදී 2014 වර්ෂයේ ගිණුම්ශේෂ සැසඳීම් නිවැරදි පරිදි ගලපා ඉදිරිපත් කර ඇත. |
| (උ) | 2015ගිණුම් වල නිවැරදි කර ඇත. |
| (ඌ) | මෙය මේ වන විට 2015 ගිණුම් වල නිවැරදිකර ඇත.<br>ජ්නල් අංක J/V 488/2015 හා G0035 මගින් වියදම ප්‍රාග්ධන ගත කර ඇති අතර ප්‍රාග්ධන ගිණුමෙන් පුනරාවර්තන ගිණුමට මුදල් මාරු කිරීමට ද කටයුතු කර ඇත. |

(එ)

**වෛද්‍ය පීඨය**

- **11-01-01-11-01 -රු. 306,816.00 - Higher Degree Programme- Faculty of Medicine**

2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ ඍණ ශේෂය නිරූපණය කිරීමට හේතු වූයේ මෙම ගිණුමට බැර විය යුතු ආදායම් වැරදීමකින් වෙනත් ගිණුම් වලට ගිණුම්ගත වීම හේතුවෙනි. මෙය ජ'නල් අංක 0211 J 15 මගින් 2015-02-27 වැනි දින නිවැරදි කර ඇත.

- **11-01-02-11-01 - රු. 1,747,888.00 School of Advance Medical Sciences**

මෙම ගිණුම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ආරම්භ කළ ගිණුමක් වන අතර ආයතනයේ ප්‍රාරම්භක වියදම් මෙම ගිණුම මගින් සිදුකර ඇති අතර මේ සඳහා මුදල් ප්‍රතිපාදන ලැබෙන තුරු වෛද්‍ය පීඨයේ ඉපයූ ආදයම් මගින් මෙම වියදම් දරා ඇත. 2014-12-31 දින වන විට මේ සඳහා පීඨය මගින් දැරූ වියදම රු. 1,747,888.40 ක් වන අතර මේ සඳහා රු. 1,000,000 මුදලක් 2016 පෙබරවාරි මස විශ්වවිද්‍යාලය මගින් ප්‍රතිපාදනය කර ඇත.

- **11-01-04-11-02 - රු. 390,320.00 - Dept. of Anesthesiology - Faculty of Medicine**

ගිණුම්ගත කිරීම් වලදී සිදුවු දෝෂයන් මේ වන විට නිවැරදි කර ඇති අතර දැනට මෙම ගිණුමේ ශේෂය රු. 1,000 ක බැර ශේෂයකි. ජ'නල් අංක 211 J 11 , 211 J 12, 211 J 13 මගින් මෙම නිවැරදි කිරීම් කර ඇත.

- **11-01-04-11-04 - රු. 685,755.00 - Private Laboratory Work**

පරපෝෂිත විද්‍යා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන මෙම ගිණුම් අංකය යටතේ සාම්පල පරීක්ෂාවෙන් ලැබෙන ආදායම මෙම ගිණුමට සටහන් කරනු ලබන අතර එම ආදායමින් මෙම කටයුතු සඳහා සෘජුව සම්බන්ධවන පාර්ශවයන්ට අතිකාල ගෙවීම් සහ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම් වෙනුවෙන් යොදවා ගනු ලැබේ.

2014-12-31 දිනට මෙම මෙම ගිණුමේ ශේෂය රු. 685,755 ඍණ ශේෂයකි.

මෙයට හේතු වූයේ අතපසු වීම් හේතුවෙන් මෙම ගිණුමට සටහන් නොවිය යුතු ගණුදෙනු මෙම ගිණුමේ සටහන්ව තිබීමයි. මෙම නිවැරදි කිරීම් ජ'නල් අංක 211 J 10 යටතේ නිවැරදි කර ඇති අතර 2015-12-31 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 283,884.84ක ධන ශේෂයකි.

- **11-01-22104-211- රු. 9,750.00**

ඉහත ගිණුමේ ඍණ ශේෂයක් පෙන්නුම් කලද එය සිදුවී ඇත්තේ වෙනත් ගිණුමකට හරවිය යුතු වියදම් මෙම ගිණුමට හර වීමෙනි. ජ'නල් අංක 211/J/17, 211/J/21 මගින් මෙම වැරදි නිවැරදි කර ඇත.
2015-12-31 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 7834.83 ධන ශේෂයකි.

- **11-01-97-00-211- රු. 8,011.00**

ඉහත ගිණුම් අංකය යටතේ 2014-12-31 දිනට රු. 8011 ක ඍණ ශේෂයක් පෙන්නුම් කරයි. මෙම ශේෂය 2015 වර්ෂයේ අගෝස්තු මස පැවැත්වීමට නියමිතවූ 8 වන වෛද්‍ය ප්‍රදර්ශනය පැවැත්වීමේ කටයුතු සංවිධානයේ ද මූලික වියදම් ලෙස දරා ඇති කම්ටු රැස්වීම්, සංග්‍රහ වියදම් සහ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා දරන ලද වියදමකි.

2015 වර්ෂයේ වෛද්‍ය ප්‍රදර්ශනයේ වැඩකටයුතු ආරම්භයත් සමගම මෙම ගිණුම සක්‍රීය වී ඇති අතර 2015-12-31 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 14,347,050.58 කි.

- **1101070003 - රු. 20,000.00 - Science and Technology personal Development Project**

මෙහිදී සිදුවී ඇත්තේ සේවක සංවර්ධන මධ්‍යස්ථානයකට අදාල ජ'නල් සටහනක් ඉහත ගිණුමට වැරදීමකින්

| | |
|---|---|
| | ගිණුම් ගත කර තිබීම නිසා වූ දෝෂයකි. 2015.12.31 ට ශේෂය හඳුනා ගත් පසු නිවැරදි කිරීමට කටයුතු කර ඇත .<br><br>**ඉංජිනේරු පීඨය**<br>• **11-01-01-07-02 - රු 14,057.00**<br>ඉංජිනේරු පීඨ Industrial Day programme වෙනුවෙන් දරණ ලද වියදමක් ඉංජිනේරු ගණිත ඩිප්ලෝමා ගිණුමට හරවීමෙන් පැන නැගුණ හර ශේෂය 2015/JV/01 දරණ ජ'නලය මගින් නිවැරදි කර ඇත.<br><br>**දන්ත වෛද්‍ය පීඨය**<br>• **10123500-221- රු. 49,500.00**<br>තොරතුරු පරිඝණක පද්ධතියට ඇතුලත් කිරීමේදී සිදු වු දෝෂයක් හේතුවෙන් 10123500-221 දරණ ගිණුමට රු. 49,500.00 ක් හර වී තිබුණි. අදාල වරද නිවැරදි කර ඇත.<br><br>• **11-01-04-21-02 - රු. 375,637.00**<br>දන්ත වෛද්‍ය පීඨයට පැමිණෙන රෝගින්ගේ ලිපිගොනු වෙනුවෙන් ආරම්භ කර ඇති 11-01-04-21-02 ගිණුමෙන් ගෙවීම් කර ඇත්තේ කම්කරු මහතෙකුගේ අතිකාල දීමනා හා තාවකාලික සේවකයින් දෙදෙනෙකුගේ වැටුප වන අතර මෙම ගෙවීම් සඳහා විධිමත් අනුමැතියක් යටතේ ගෙවීම් කර ඇති අතර ශේෂය බැර ශේෂයක් ලෙස පවතී.<br>**ශාස්ත්‍ර පීඨය**<br>• 11-01-01-04-03**- රු. 34,059.00**<br>ශාස්ත්‍ර පීඨයට අයත් උක්ත ලෙජර් ගිණුම ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සති අන්ත පාඨමාලාවේ ගිණුම් කටයුතු සඳහා විවෘත කළ ගිණුමකි.<br>කෙසේ නමුත් වෙනත් ගිණුමකට අයත් වියදම් මෙම ගිණුමට වැරදීමකින් හර කිරීම මත මෙම වරද සිදුවී ඇති බව හෙලි විය. එබැවින් ජ'නල් අංක 204K0008 මගින් එය නිවැරදි කරන ලදි.<br>ශාස්ත්‍ර පීඨයෙහි අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි සති අන්ත පාඨමාලාවේ ගනුදෙනු ගිණුම් අංක 11-01-01-04-08 යටතේ පමණක් සටහන් කරනු ලබන අතර විමසුමේ සඳහන් 11-01-01-04-03 ගිණුම භාවිතයට නොගනී. මේ වනවිට එම ගිණුමේ ශේෂයක් නොමැත. |
| **(ඒ)** | මෙම ඉඩම් අක්කර 1390 රූඩ් 2 පර්චස් 21.6 ක අගයෙන් පිඹුරු පත් අංක 227 ට අදාලව පර්චස් 35.4 තක්සේරු වටිනාකම ලබා ගෙන ඇති අතර අනෙකුත් සියලුම ඉඩම් පවරා ගැනීමේදී මතු වී තිබෙන ගැටලු හේතුවෙන් මේ දක්වා පැවරුම් නියෝග ලබා ගෙන නොමැත. කෙසේ නමුත් රජයේ දෙපාර්තමේන්තු හරහා ඉඩම් වල අයිතිය සඳහා පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. පැවරුම් නියෝග ලබා ගත් පසු තක්සේරු කර ගිණුම් වලට ගැනීමට කටයුතු කරමි. |
| **(ඔ)** | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල ලැබීම් සහ ගෙවීම් 2014 වර්ෂයේ මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුනි. එය නිවැරදි කොට 2015 වර්ෂයේ උපචිත පදනම මත ගිණුම්ගත කොට 2014 වර්ෂයට සංසන්දනාත්මක ගිණුම් ශේෂයන් පෙන්නුම් කිරීමට පියවර ගෙන ඇත. 2015 වර්ෂයේ සිට ඉදිරියට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අදාල කලින් ලැබීම්, කලින් ගෙවීම්, ලැබියයුතු හා ගෙවියයුතු වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. |
| **(ඕ)** | මෙම විගණන පරිච්ඡේදයෙන් විමසා ඇත්තේ රු. 3,325,289.00 ක් වූ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයට අදාලව කරන ලද වසර තුල දරන ලද වැටුප් හා විවිධ වියදම් සමූහයක එකතුවකි. ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2011 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ නිර්දේශ මත පිහිටවූ මධ්‍යස්ථානයක් වන අතර එකී මධ්‍යස්ථානයට ලැබෙන සියලු වියදම් මහා භාණ්ඩාගාරය මගින් මූලධන ශීර්ෂය යටතේ ලැබී ඇත.<br>මෙම පර්යේෂණ මධ්‍යස්ථානය මානව සම්පත් ප්‍රාග්ධනය වර්ධනයට පමණක් ඉවහල් වේ. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය මූල්‍ය ප්‍රකාශන තුල මෙම පර්යේෂණ මධ්‍යස්ථානයට අදාලව කරනු ලබන සියලු වියදම් පුනරාවර්තන හා මූලධන ලෙස වෙන් කර පැහැදිලිව දක්වා ඇත. මෙහිදී නියමිත ගිණුම් නිවැරදි ආකාරයෙන් සිදුකර ඇති බවත් අය වැය හා ගිණුම් කට්ටලයෙහි අනුරූපි බවද ආරක්ෂා වන පරිදි මෙම ක්‍රියාවලිය සිදුකර ඇත. |

**2.2.3 නොසැසඳු පාලන ගිණුම්**

**(අ)** ආපදා ණය පැරණි ගිණුම සහ උප ලේඛනය අතර දීර්ඝ කාලයක සිට පවතින නොසැසඳීමක් ඇති අතර පවතින තොරතුරු මත එය නිවැරදි කිරීම අපහසු වූ බැවින් ආපදා ණය සඳහා නව ගිණුමක් ආරම්භ කරන ලදි. කෙසේ නමුත් පැරණි ගිණුමෙහි පවතින වෙනස සම්බන්ධව තවදුරටත් සොයා බලා නිවැරදි කිරීම් කරගෙන යනු ලබන අතර අධ්‍යයන කාර්ය මණ්ඩල නිළධාරීන් අධ්‍යයන නිවාඩු අවසන් කර පැමිණි පසු නැවතත් ණය අයකර ගැනීම් ආරම්භ කරනු ලැබේ. එබැවින් අදාල ණය අයවීම් අවසන් වූ පසු නොසැසඳෙන ශේෂය අවශ්‍ය පරීක්ෂණ කටයුතු කිරීමෙන් අනතුරුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ.

**(ආ)** උපචිත වියදම් වල (11-04-04-000) අනෙකුත් සැපයුම් යටතේ (0607) එකතුව ලෙස සඳහන් වන්නේ රු. 1,308,228 ක මුදලකි. මෙම උපලේඛනය වැය ශීර්ෂ අනුව පිළියෙළ කළ එකකි. තවද මෙම උපචිත වියදම් උප ලේඛණය ව්‍යාපෘති ශීර්ෂ යටතේද පිළියෙල කර ඉදිරිපත් කර ඇත. මෙහි වැය ශීර්ෂ 0607 හි එකතුව රු. 1,060,030 ක් වේ. එම නිසා මෙම ශේෂ දෙකෙහි (රු. 1,308,228- රු. 1,060,030) වෙනස රු. 248,198.25 ක් වේ. මෙයට හේතු වී ඇත්තේ මෙම මුදල රු. 248,198.25 ක් ලෙස 02-17-913 යන ව්‍යාපෘතිය ශීර්ෂය දෙවන උපලේඛණයේ වෙනමම සඳහන් වීමයි. කෙසේ නමුදු මුළු වියදමේ වෙනසක් නොවන අතර වැය ශීර්ෂ අතර මෙය බෙදා වෙන් කිරීමේදී ඇතිවූ වෙනස්කමකි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ)**

**i.** සෑම වර්ෂයකම පර්යේෂණ දීමනා ගෙවීමට අදාලව පර්යේෂණ කමිටු මඟින් අනුමත කරන ලද පර්යේෂණ වාර්තා උපකුලපති වන මාගේ අනුමැතිය යටතේ අධ්‍යයන / අනධ්‍යයන ආයතන අංශය මගින් ගිණුම් අංශය වෙත යොමු කරනු ලැබේ. මෙම අනුමත කරන ලද පර්යේෂණ වාර්තාවන් සඳහා පර්යේෂණ දීමනා හිමි කාල පරිච්ඡේදයට අදාලව මෙම දීමනා ගෙවීම් සිදු කරනු ලබයි.

මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් 11/02/2014 දින නිකුත් කල 02/2014 යන චක්‍රලේඛය තුල විගණන විමසුමේ පරිදි මාස 06 ක් තුල ප්‍රගතිය ඇතුලත් අන්තර් පර්යේෂණ වාර්තාවක් ලබා ගත යුතු බව සඳහන් වුවද පසුව 28/05/2014 දින නිකුත් කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 05/2014(i) තුලින් පරීක්ෂණ දීමනා සඳහා අදාල වූ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2011 හා 01/2011(i) දරණ චක්‍රලේඛ දෙක 01/01/2014 දින සිට බලාත්මක කර ඇත. එනම්, වර්තමානය වන විට 02/2014 යන චක්‍රලේඛ වෙනුවට 01/2011 හා 01/2011(i) චක්‍රලේඛ බලාත්මක වන අතර එම චක්‍රලේඛ දෙකෙහි කිසිම තැනක මාස 06 තුල ප්‍රගතිය ඇතුලත් අන්තර් පර්යේෂණ වාර්තාවක් ලබා ගත යුතු බව සඳහන් නොවේ.

ඉහත පැහැදිලි කිරීමට අනුව මේ වන විට බලාත්මක සියලු චක්‍රලේඛ විධිවිධාන වලට අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පර්යේෂණ දීමනා ගෙවීමේ දී උපයෝගී කරගෙන නිවැරදි ආකාරයට පර්යේෂණ දීමනා ගෙවා ඇත.

**ii.** යාපනය හා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අදාල ගිණුම් ශේෂයන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය ඇතිව 2015 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු කර ඇත.

**iii.** යාපනය හා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අදාල ගිණුම් ශේෂයන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය ඇතිව 2015 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු කර ඇත.

**iv.** විගණන වාර්තාවේ සඳහන් පරිදි වාහන විස්තර සහ ශේෂය සැදුම්ලත් ආකාරය හා කාල පරිච්ඡේදය පහත සඳහන් පරිදි වේ. එසේම වාහන රක්ෂණ වියදමේ අගය රු.105,589.00 නොව රු.105,017.27 ක් බව ද සඳහන් කරමි.

| | **වාහන අංකය** | **වර්ගය** | **කාල සීමාව** | | **මුදල** |
|---|---|---|---|---|---|
| 01. | cpNB-7232 | වෑන් | 2014-03-07 | 2014-12-31 | 47,298.94 |
| 02. | cpNB-7643 | වෑන් | 2014-05-06 | 2014-12-31 | 47,375.93 |
| 03. | 40-4551 | කැබ් | 2014-03-28 | 2014-12-31 | 10,342.40 |
| **එකතුව** | | | | | **105,017.27** |

| | |
|---|---|
| **v.** | International Training Course on Elephant Health nutrition & Reproduction වැඩමුළුවේ ව්‍යාපෘති ඇස්තමේන්තුව සඳහා අදාල අනුමැතිය ලබා ගෙන ඇති අතර ඊට සහභාගි වූ බව තහවුරු කිරීමට අදාල ලේඛන මේ වන විට පශු වෛද්‍ය පීඨයේ අදාල ලිපිගොනුවේ ගොනු කර ඇත. |
| **vi.** | 2014 වසරට අදාලව තිබූ ශේෂය වන රු. මිලියන 5.3 වූ ශේෂයෙන් 2015.12.31 දිනට හඳුනා නොගත් ලැබීම් ලෙස ඉතිරිව ඇත්තේ රු.මිලියන 1.4 ශේෂයකි. 2015 ගිණුම් වර්ෂය තුල විදේශ සිසුන්ගේ සියලු අදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කර ඇත. |
| **vii.** | විද්‍යාපීඨයේ ගෑස් පිරිපහදු මධ්‍යස්ථානයේ වෙන්දේසි කරන ලද ගෑස් ටැංකිවල ගැණුම්කරුවන්ට ටෙන්ඩර් ප්‍රදානය කිරීම හා ගැනුම්කරුවන් තෝරා ගැනීම උපකුලපති අනුමැතියෙන් සිදුකොට ඒ සඳහා 2015.09.03 දින පැවති 346 වන මුදල් කමිටු අනුමැතිය ද ලබාගෙන ඇත. |
| **viii.** | 2010 වසරේදී ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර්රථ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය (Re - Valuvation) සිදුකර ඇති අතර, ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු දැනට කරමින් පවතී.<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ සඳහා පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් පරිගණක වත්කම් ලේඛණ සාදා නිමකර ඇත. මේ සියලු කටයුතු අවසන් වූ වහාම එම ලේඛණ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** | ශ්‍රී ලංකාවේ පශු වෛද්‍ය සිසුන්ගේ පශු අධ්‍යාපනය සඳහා සුරතල් සතුන්ගේ හා අලි ඇතුන්ගේ සෞඛ්‍ය කටයුතු පරීක්ෂා කිරීමට තිබෙන එකම දෙපාර්තමේන්තුව මෙය වන අතර නිර්වින්ධනය සඳහා වෛද්‍යවරුන් ඉල්ලා එවන ලිපි පීඨාධිපති මඟින් අංශ ප්‍රධාන/ පශු වෛද්‍ය සායනික විද්‍යා අංශය වෙත යොමු කරනු ලැබේ.<br>2.එම සෑම ලිපියක් සඳහාම වෛද්‍යවරුන් සහ සිසුන් ඉදිරිපත් කිරීම සිදුකරනු නොලැබේ. සෑම පෙරහැරක් සඳහාම වනජීවී දෙපාර්තමේන්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ සත්ව උද්‍යානයෙන් නිර්වින්දන කණ්ඩායම් පෙරහැර සංවිධායකයින් විසින් ගෙන්වා ගන්නා අතර සිසුන්ගේ සායනික පුහුණුව සඳහා අපට හැකි අවස්ථාවන්වලදී පමණක් වෛද්‍යවරුන් ඇතුළු සිසුන් කණ්ඩායමක් නිර්වින්දන කටයුතු සඳහා සහභාගි කරනු ලැබේ.<br>3.පෙරහැර සඳහා නිර්වින්ධන කණ්ඩායමක් යැවීම රාජකාරියක් නොවන අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට අනිවාර්ය අංගයක් වන අලි ඇතුන් කුලප්පු වු විට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබදව ඉගැන්වීම බව දන්වා සිටිමි.<br>4. ආදයම/ හා වියදම<br>පෙරහැරවලට සහභාගිවන නිර්වින්දන කණ්ඩායම් වලට ප්‍රවාහන පහසුකම් ආහාරපාන, තේ පැන් හා ඉඳුම් හිටුම් සැපයීම හා එදිනෙදා වියදම් එම පෙරහැර සංවිධායකයින් විසින් දැරීම නිසා ආදායම් හා වියදම් විස්තරයක් ඉදිරිපත් කළ නොහැක.<br>ඉදිරි කාලයේදී පෙරහැර සඳහා සහභාගී වු විට යම් ගෙවීමක් කිරීමට එම සංවිධායකයන් එකග වන්නේ නම් එම මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමටත් සහභාගීවුවන්ගේ වියදම් බිල්පත් ඉදිරිපත්කර ගෙවීම් සඳහා යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>5. සහභාගි වු නිලධාරින් හා වාහන ධාවනය පිළිබද විස්තර<br>2014 වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුමෙන් පසුව 2015 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ වාහන ඉල්ලීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත අනුව වාහන ඉල්ලා ඇති අතර, සහභාගි වන අයගේ විස්තරද ඒ සමඟම ලබා දීම සිදුකරන ලදි.<br>මින් ඉදිරියට පෙරහැර සම්බන්ධව එන සෑම ලිපියක්ම ලේඛනගත කිරීමටත් ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග ආදායම්, වියදම්, සහභාගීවුවන්ගේ විස්තර ආදියද ඇතුලත්ව ලිපිගොනුව නඩත්තු කිරීමට අදාල පීඨය දැනුවත් කර ඇත. |
| **(ඇ)** | |
| **I.** | සත්ව ගොවිපල නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සායනික සේවාවන් පවත්වාගෙන යනු ලබන්නේ හුදෙක්ම සිසුන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහාය.<br>එබැවින් මෙම සේවාව ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් පිරිසක් නොපැමිණෙන අතර ඉන් අය කර ගන්නා ගාස්තුව ද ඉතා සුළු බැවින් දෛනික ලැබෙන ආදායම සැලකිය යුතු තරම් ප්‍රමාණවත් ආදායමක් නොවේ. එබැවින් දෛනික මුදල් |

| | |
|---|---|
| | තැන්පත් කිරීමක් සිදු වී නොමැති අතර විගණන විමසුමේ සඳහන් කර ඇති අතපසු වීම මඟ හැර ගැනීමට දැනටමත් කටයුතු යොදා ඇත. |
| **II.** | බාහිර පාර්ශවයට ප්‍රතිකාර කරන විට ඒ සඳහා සහභාගී වන වෛද්‍යවරුන් විසින් ක්ෂේත්‍රයට බිල්පොත රැගෙන යන අතර එහි දී අදාල බිල්පොත ගොවියාට නිකුත් කෙරේ. මෙම ජංගම සායනය පවත්වා ගෙන යන්නේ හුදෙක් මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් නොව සිසුන්ට අවැසි ප්‍රායෝගික දැනුම වර්ධනය කරවීම සඳහායි.<br>මෙම ජංගම සේවයට අදාල විස්තර Ambulatory Cases යන පොතෙහි ලේඛනගත කොට ඇත. |
| **III.** | මෙම දෙපාර්තමේන්තුව විසින් සායනික සේවාවන් පවත්වාගෙන යනු ලබන්නේ මූලික වශයෙන්ම සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීම සඳහාය.<br>සායනික සේවාවන් ලබා ගැනීම සඳහා යොමු කරන සතුන් හට ප්‍රතිකාර කිරීමේ දී යොදා ගනු ලබන ප්‍රතිකාරක ක්‍රම එක් එක් සත්වයාගේ රෝගී තත්වය අනුව වෙනස් වේ.<br>එබැවින් ප්‍රතිකාර කිරීම වෙනුවෙන් කරනු ලබන අය කිරීම කලින් අනුමත කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතී.<br>එබැවින් මෙවන් සේවාවන් සිදු කිරීමේ දී ඒ සඳහා ඖෂධ වෙනුවෙන් දරන වියදම පමණක් අදාල වෛද්‍යවරයා විසින් නිශ්චය කොට අය කරනු ලබයි. |
| **IV.** | ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වන සිසුන්ට හා කථිකාචාර්යවරුන් පිළිබඳ විස්තර ලේඛන ගත කොට ඇත. තවද, අදාල වාහන වල ධාවන සටහන් මඟින් මෙම විස්තර තහවුරු කර ගත හැක, |
| **V.** | පරිත්‍යාග ලෙස ලැබෙන සතුන් Live Stock Register හි ඇතුලත් කොට ලියාපදිංචි කරනු ලබයි. |
| **VI.** | සතුන්ගේ උපත් හා මරණ ද දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන Live Stock Register හි යාවත්කාලීන කරගෙන යනු ලබයි. |
| **VII.** | මරණයට පත් වන සියළුම සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා නිසි ලෙස ගොනු කොට ඇත. |
| **VIII.** | මරණයට පත් වන සතුන්ගේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා පහසුකම් නොමැති බැවින්, අදාල විස්තර නිසි ලේඛනවල වාර්තා කොට දෙපාර්තමේන්තුවෙහිම බිම් කොටසක මරණයට පත් වූ දිනම වල දමනු ලබයි. |
| **2.3** | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්** |
| **(අ)** | 2015 වර්ෂයේ දි නිවැරදි කර ඇත. |
| **(ආ)** | 2015 වර්ෂයේ දි නිවැරදි කර ඇත. |
| **(ඇ)** | මෙය ජ'නල අංක J/REV/BV/16/02 මඟින් 2016 වර්ෂයේ ආදායමට ගෙන නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| **(ඈ)** | **බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලී - රු.263,780.00**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.263,780.00 ක මුදලින් මේ වනවිට රු.193,820.00 ක මුදලක් අය කර ගෙන ඇති අතර, ඉතිරි රු.69,960.00 ක මුදල අය කර ගැනීම සම්බන්ධව 2016 මැයි මස පැවැත්වීමට නියමිත මුදල් කමිටුව වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එහි තීරණය මත ඉදිරි පියවර ගනු ලැබේ.<br>**බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ජල ගාස්තු - රු. 1,431,399.00**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.1,431,399. 00 ක මුදලින් මේ වනවිට රු.1,346,729..00 ක මුදලක් අය කර ගෙන ඇති අතර, ඉතිරි රු.84,670.00 ක මුදල අය කර ගැනීම සම්බන්ධව 2016 මැයි මස පැවැත්වීමට නියමිත මුදල් කමිටුව වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එහි තීරණය මත ඉදිරි පියවර ගනු ලැබේ.<br>**බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු විදුලි ගාස්තු- රු. 1,162,547.00**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.1,162,547. 00 ක මුදලින් මේවනවිට රු.9,95,482..32 ක මුදලක් අය කර ගෙන ඇති අතර, ඉතිරි රු.167,064.68 ක මුදල අයකර ගැනීම සම්බන්ධව 2016 මැයි මස පැවැත්වීමට නියමිත මුදල් කමිටුව වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එහි තීරණය මත ඉදිරි පියවර තනු ලැබේ.<br>**නිලධාරීන්ගෙන් ලැබිය යුතු නිවාස කුලී - රු. 690,341.00**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.1,162,547. 00 ක මුදලින් මේවනවිට රු.9,95,482..32 ක මුදලක් අය කර ගෙන ඇති |

| | |
|---|---|
| | අතර, ඉතිරි රු.120,763.67 න් රු. 60,750.00 ක මුදලක් අදාළ නිවාස හිමියන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර රු. 1500.00 ක මුදලක් දැනට ඔවුන් සේවය කරන විශ්වවිද්‍යාල වලින් අයකර ගෙන්වා ගැනීම සඳහා අදාළ විශ්වවිද්‍යාල වලට දන්වා යවා ඇති අතර ඉතිරි රු. 58,513.67 ක මුදල 2016 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කර ඇත.<br><br>**<u>නිල නිවාසවලින් ලැබිය යුතු විදුලි ගාස්තු - රු. 1,254,649.00</u>**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.1,254,649.00 ක මුදලින් මේ වනවිට රු.1,217,913.46 ක මුදලක් අය කර ගෙන ඇති අතර, ඉතිරි රු.36,735.54 ක මුදලින් රු. 13,347.74 ක මුදලක් අදාළ නිවාස හිමියන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර රු. 292.51 ක මුදලක් දැනට ඔවුන් සේවය කරන විශ්වවිද්‍යාල වලින් අයකර ගෙන්වා ගැනීම සඳහා අදාළ විශ්වවිද්‍යාල වලට දන්වා යවා ඇති අතර ඉතිරි රු. 23,095.29 ක මුදල 2016 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කර ඇත.<br><br>**<u>නිල නිවාසවලින් ලැබිය යුතු ජල බිල්පත් ගාස්තු - රු. 481,536.00</u>**<br>2014.12.31 දිනට හිග මුදල වන රු.481,536.00 ක මුදලින් මේ වනවිට රු.431,676.64 ක මුදලක් අය කර ගෙන ඇති අතර, ඉතිරි රු.49,859.36 ක මුදලින් රු. 34,342.10 ක මුදලක් අදාළ නිවාස හිමියන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර රු. 1,650.00 ක මුදලක් දැනට ඔවුන් සේවය කරන විශ්වවිද්‍යාල වලින් අයකර ගෙන්වා ගැනීම සඳහා අදාළ විශ්වවිද්‍යාල වලට දන්වා යවා ඇති අතර ඉතිරි රු. 13,867.26 ක මුදල 2016 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| **(ඉ)** | ආචාර්යවරු තිදෙනාගෙන් අයවිය යුතු රු.70,000.00 ක වටිනාකමින් රු.45,000.00 ක වටිනාකමක් හැර අනෙක් සියලුම අත්තිකාරම් මේ වනවිට පියවා ඇත. ඉතිරි එක් ආචාර්යවරයෙකුට අයත් රු.45,000.00 ක අත්තිකාරම පියවා ගැනීමට නොහැකි වී ඇත්තේ ඔහු සේවය හැර ගොස් විදේශ ගත වී ඇති බැවිනි. කෙසේ නමුත් එම ආචාර්යවරයාගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දි ඉහත හිග අත්තිකාරම් මුදල අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| **(ඊ)** | විගණන වාර්තාවේ පෙන්වා ඇති නිළධාරින් 35 දෙනෙකු අතුරින් පහත සඳහන් නිළධාරින්ගේ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br><br>**<u>අර්ථසාධක අංකය</u>** — **<u>නම</u>** — **<u>ණය ශේෂය</u>**<br>00990 — එම් එම් තිලකරත්න — 56,734/-<br>03418 — ආර් එම් එස් කේ රත්නායක — 14,405/-<br>05510 — එස් කාරියවසම් — 16,104/-<br>09120 — එස් එල් එස් මැටිවලගෙදර — 31,996/-<br>11774 — අයි ජී අයි පී වීරසේන — 64,050/-<br>06151 — ජේ ඒ එස් ආනන්ද — 11,745/-<br><br>එසේම පහත සඳහන් නිළධාරින් සේවයේ නොමැති බැවින් ණය ශේෂයන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.<br><br>**<u>අර්ථසාධක අංකය</u>** — **<u>නම</u>** — **<u>ණය ශේෂය</u>** — **<u>අ.සා. අරමුදල් අංශයට භාරදුන් දිනය</u>**<br>04035 — වී සිවයෝගලිංගම් — 132,175/- — 26-10-2013<br>( බැඳුම්කර කමිටු තීරණය ලැබෙන තෙක් රඳවාගෙන ඇත. )<br>05769 — අයි එල් බී රත්නායක — 35,390/- — 29-01-2014<br>07677 — ඒ නගුලේශ්වරන් — 48,612/- — 02-10-2014 |

| | | | |
|---|---|---|---|
| 10016 | පී වී ජී ඩී අයි පී පීරිස් | 21,900/- | 07-02-2014 |
| 11975 | පී ජී එම් ගුණවර්ධන | 66,660/- | 20-01-2015 |

- තවද අර්ථසාධක අංක 07193, 14181 දරණ ආචාර්යවරු දෙදෙනා නැවත විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කර ඇති නිසා පිළිවෙලින් රු 93,312/- ක් වූ ණය ශේෂය 2015 මාර්තු මස සිට ද, රු 57,480/- වූ ණය ශේෂය 2015 ජූනි මස සිට ද වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.

- එසේම අර්ථසාධක අංක 05644 දරණ නිලධාරියා 2008 වර්ෂයේ බාහිර විභාග අංශය වෙත ස්ථාන මාරු වී ඇති අතර ඔහුගේ රු 22,200/- ක් වූ ණය ශේෂය එම අංශය වෙත පවරාගෙන 2008 නොවැම්බර් මස රිසිට්පත් අංක 1111851 මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මුදල් එවා ඇති අතර එය නිවැරදිව ගිණුම්ගත කර ඇති නමුත් අතපසු වීමකින් ණය උප ලේඛනයෙන් නම ඉවත් කර නොතිබුණි. එසේම අර්ථසාදක අංක 10229 දරණ නිලධාරියාගේ රු. 11,248/- ක් වූ ණය ශේෂය රිසිට්පත් අංක 1042613 මගින් 2012 නොවැම්බර් මස සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර තිබූ අතර එය ද නිවැරදිව ගිණුම්ගත කර ඇති නමුත් උප ලේඛනයෙන් නම ඉවත් කර නොතිබුණි. මේ වන විට ඉහත නිළධාරීන් දෙදෙනාගේම නම් ණය උප ලේඛනයෙන් ඉවත් කර නිවැරදි කර ඇත.
- කේ එච් ජයවර්ධන ( 01643 ) මහතාගේ සහ එම් ජී සී එස් අල්විස් ( 01894 ) මහතාගේ අර්ථසාධක අරමුදල් 2002 හා 2003 වර්ෂවලදී නිදහස් කර ඇති අතර පිළිවෙලින් රු 34,349/- ක් සහ රු 21,979/- ක් වූ ණය ශේෂයන් අර්ථසාධක අරමුදලින් අය කරගැනීමට එවකට කටයුතු කර ඇති නමුත් අදාල ණය මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත ප්‍රේෂණය කිරීම සම්බන්ධ ලිපි පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමට නොතිබූ බැවින් ණය උප ලේඛන තව දුරටත් පවත්වා ගනී. මේ පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීම් කර ඇති අතර එම තොරතුරු ලද විගස ගිණුම් පොත් වල නිවැරදි කිරීමට කටයුතු කරමි.
- අර්ථසාධක අංක 12118 හා අර්ථසිාදක අංක 11615 දරණ ආචාර්යවරුන් අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වී ඇති අතර නියමිත දිනට සේවයට වාර්තා කර නොමැති බැවින් පිළිවෙලින් රු 32, 645/- හා රු 121,810/- වු ණය ශේෂයන් අය කර ගැනීම හා අනෙකුත් අය කර ගැනීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.
- අර්ථසාධක අංක 11480 දරණ ආචාර්යවරයාගේ රු.8780.00 ක් වූ ණය ශේෂය පිළිබඳව දීර්ඝ වශයෙන් සොයා බැලීමේ දී අදාල ණය ශේෂය ඒ මහතාට අදාල එකක් නොවන බවත් උප ලේඛණ පිළියෙල කිරීමේ දී සිදු වූ දෝෂයක් නිසා ණය ලේඛනයේ ඇතුලත් වී තිබූ බැවින් 2015 උප ලේඛණ වලින් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
- අර්ථසාධක අංක 02424 දරණ ආචාර්යවරයාගේ රු.193,796.00ක් වූ ණය ශේෂය ඒ මහතාගේ නව අර්ථසාධක අංකය වන P 13950 යටතේ අය කරගෙන අවසන් කර ඇත.
- පහත සඳහන් නිළධාරීන් මේ වනවිට විශ්වවිද්‍යාල සේවයේ නොමැති අතර අර්ථසාධක අරමුදල් ද මෙතෙක් නිදහස් කර නොමැත. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අදාල ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

| අර්ථසාධක අංකය | නම | ණය ශේෂය |
|---|---|---|
| 00861 | එම් පී ධනපාල | 84,616/- |
| 01932 | ජී පී පීරිස් | 67,500/- |
| 03759 | එම් එන් එම් කම්ලසාද් | 41,758/- |
| 04249 | එස් යූ පී සමන්ත කුමාර | 32,705/- |
| 04545 | ආර් එම් ජී එස් රත්නායක | 55,179/- |
| 04796 | වයි එම් රණසිංහ බණ්ඩා | 21,902/- |
| 04986 | ඩී එම් බී ප්‍රේමදාස | 38,118/- |
| 06827 | ඩී ආර් කේ ඔබේසේකර | 23,051/- |
| 07047 | පී ඊ එම් ඩී සී බණ්ඩාර | 101,378/- |
| 09127 | ඩබ් පී සරත්චන්ද්‍ර | 34,664/- |

| | |
|---|---|
| | 10463 එච් එම් එන් ඩී රත්නායක 38,746/-<br>12322 ආර් එම් එස් රත්නායක 349,769/-<br>14203 එල් ඩබ් ජී ජී වීරසූරිය 42,750/- |
| (ළ) | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති භූමිය සම්බන්ධයෙන් ලැබීමට නියමිත හිඟ බදු කුලිය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇත. තවද දෙපාර්ශවය අතර හිඟ බදු මුදල් අයකර ගැනීමේදී මෙය රාජ්‍ය අංශ දෙකක් අතර පවතින ගැටළුවක් බැවින් මේ සම්බන්ධව තවදුරටත් නීතිපති විසින් සාකච්ඡා කරමින් පවතින අතර, එම භූමියේ හිස් භුක්තිය ලබා ගැනීම හා ඒ සම්බන්ධ අදාල අමාත්‍යාංශ සමග සාකච්ඡා කරමින් පවති. කෙසේ නමුදු අදාල බදු ගිවිසුම් 2017.12.30 දින අවසන් වූ පසු භුක්තිය භාර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ළු) | පේරාදෙණිය නගරයේ සතිපොල පැවැත්වීම සඳහා මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු බදු කුලී මුදල් දිගින් දිගටම නොගෙවීම හේතුවෙන් අදාළ මුදල් අය කර ගැනීම සඳහා පාලක සභා නිර්දේශය පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| **2.4** | **නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම** |
| (අ) | **<u>1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ මුදල් විධිවිධාන යටතේ වූ 99(I) වගන්තිය</u>**<br>මෙහි සඳහන් අරමුදල් 09 විශ්වවිද්‍යාල අරමුදලට අදාලව ගිණුම් ගතකර පවත්වාගෙන යන ලෙජර් ගිණුම් වේ. ගිණුම් පරිපාලනය හා ශේෂයන් පිළිබඳ අවබොධයක් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ අරමුදලට යටත්ව මෙම ලෙජර් ගිණුම් 09 ආරම්භකර ඇත. පශු වෛද්‍ය පීඨයේ වූ අධ්‍යයන දෙපාර්තමේන්තු මගින් සිදු කරන ඉපයීම් වලට අදාලව මෙම අරමුදල් ආරම්භ කර ඇති අතර එම අරමුදල් වල ශේෂයේ එකතුව වන රු.12,647,980.00 ක වටිනාකම විශ්වවිද්‍යාල අරමුදල තුළ නිරූපණය වන අතර එය අවසන් ගිණුම් ප්‍රකාශන මගින් ඉදිරිපත් කර ඇත. |
| ආ | **<u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය</u>** |
| (I) | **<u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ IXහි 2.1 හා 2.2 වගන්ති</u>**<br>**<u>සමසෞඛ්‍ය විද්‍යා පීඨය</u>**<br>මෙම පීඨයේ එක් එක් දෙපාර්තමේන්තු යටතේ එකිනෙකට වෙනස් උපාධි පාඨමාලා 05 ක සිදුකරනු ලබන විභාග කටයුතු සඳහා කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත දිනවල දී සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන්ට එම රාජකාරි කටයුතු වල නියැලීම වෙනුවෙන් හා පීඨයේ සති අන්ත දිනවල පැවැත්වෙන අනිවාර්ය වූ දේශන සහ ප්‍රයෝගික පරීක්ෂණ සඳහා සේවක මහත්ම මහත්මීන් අදාළ අංශ ප්‍රධානීන්ගේ නිර්දේශයට යටත්ව සේවයේ යෙදවීම වෙනුවෙන් මෙම අතිකාල ගෙවීම් සිදුකර ඇත.<br>එසේම සිසුන්ගේ සායනික කටයුතු සඳහා කුරුණෑගල හා අනෙකුත් රෝහල් වෙත සිසුන් රැගෙන යාම වෙනුවෙන් අනිවාර්යෙන්ම සේවක මහත්ම මහත්මීන් කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත දිනවල දී රාජකාරි ඉටු කිරිමට ද සිදු වන අතර ඒ සඳහා සම සෞඛ්‍ය පීඨයේ වූ රු. 927,092/- න් රු 204,390/- ක්ම වැය කිරිමට සිදු විය. එසේම මෙම අතිකාල නියමිත නීතිරීති රෙගුලාසි වලට අනුකූලව සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති සහ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගේ පූර්ව අනුමැතිය ලබාගෙන අදාළ සේවක මහත්ම මහත්මීන් සේවයෙහි යොදවා ඇති බව දන්වා සිටින අතර අතිකාල ගෙවීම් සිදු කරනු ලබන්නේ අත්‍යවශ්‍ය හා කාර්යාලිය වේලාවෙන් පරිභාහිර වූ රාජකාරීන් සඳහා වන බව බව දන්වා සිටිමි.<br>**<u>පශු වෛද්‍ය පීඨය</u>**<br>කේ.ජී.පි. දිසානායක හා එම්. සිරියලතා යන දෙදෙනා මෙම පීඨයේ කම්කරු තනතුරේ සේවය කරන්නන් වේ. ආර්.ඩී.සී.කේ මැටිවත්ත යන අය මෙම පීඨයට අයත් සේවකයෙකු නොවේ. මෙම පීඨය වසර දෙකක සිසුන් සඳහා දේශණ |

| | |
|---|---|
| | සහ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන බැවින්, සතියේ දිනවලදී ඔවුන්ගේ සේවය ඒ සඳහා පමණක් යොදා ගැනේ. එබැවින් දේශණ ශාලා ශුද්ධ පවිත්‍ර කළ යුත්තේද සති අන්ත දිනවලය. පශු වෛද්‍ය පීඨ රොහලේ නේවාසික රෝගී සතුන් සඳහා සති අන්ත දිනවලදීද ආහාර දියයුතු අතර, ඔවුන්ව ශුද්ධ පවිත්‍ර කිරීමද කළයුතු වේ. එමෙන්ම ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන අධික බැවින් ඒවා පිරිසිදු කිරීම කළයුත්තේද සති අන්ත දිනවලය. තවද මෙම පීඨයේ පැය 24ම ක්‍රියාත්මක වන පශු සායනික රෝහලක් පවතින බැවින් ශල්‍යාගාරය හා ශල්‍ය උපකරණ පිරිසිදු කිරීමද සති අන්ත දිනවලදී සිදු කෙරේ. කම්කරු තනතුරේ සේවය කරන්නන් ඉහත කටයුතු සති අන්තයේදී සිදු කරන අතර ඔවුන්ගේ වැඩ කටයුතු නිසියාකාරව සිදු කෙරේ දැයි නිරීක්ෂණය කිරීමත් නිසි පරිදි සිදුවේ. |
| **(II)** | **<u>I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 වගන්තිය සහ II කොටසේ IX පරිච්ඡේදයේ 2 .2 වගන්තිය</u>**<br>මේ වන විට නිවැරදි කර ඇත. |
| **(III)** | **<u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 02 කොටසේ 6.2 (ii) හා (iii) වගන්ති</u>**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 291 චක්‍රලේඛය පරිදි තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගත් ප්‍රමාණයෙන් 10% ක කොටසක් අය නොකර සිටීමට උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාට තීරණය කළ හැකිය. මේ අනුව පශ්චාත් උපාධි පාඨමාලාවල ඉගැන්වීමෙන් උපයන ආදායමෙන් 10% ක ප්‍රමාණයෙන් විශ්වවිද්‍යාලයට අයත් අරමුදල් වලට බැර කිරීමක් නොකරයි. |
| **(IV)** | **<u>I කොටසේ III පරිච්ඡේදයේ 26 වගන්තිය</u>**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 291 චක්‍රලේඛය පරිදි තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගත් ප්‍රමාණයෙන් 10% ක කොටසක් අය නොකර සිටීමට උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාට තීරණය කළ හැකිය. මේ අනුව පශ්චාත් උපාධි පාඨමාලාවල ඉගැන්වීමෙන් උපයන ආදායමෙන් 10% ක ප්‍රමාණයෙන් විශ්වවිද්‍යාලයට අයත් අරමුදල් වලට බැර කිරීමක් නොකරයි. |
| **(ඈ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** |
| **(I)** | **<u>මුදල් රෙගුලාසි 371(1)</u>**<br>**<u>විද්‍යා පීඨය</u>**<br>සෑම වසරක ආරම්භයේදීම විද්‍යා පීඨයේ ගෙවීම් කටයුතු සඳහා රු.150,000.00 ක උපරිමයකට යටත්ව සරප් වෙත සුළු මුදල් අග්‍රිමයක් ලබා දීම සිදු වේ. මෙම අග්‍රිමය උපයෝගී කරගෙන පීඨයට අදාළ විවිධ ගෙවීම් සිදුකරන අතර අදාළ විගණන විමසුමේ සඳහන් පරිදි අවස්ථා 21 කදී රු.182,800.00 ක ගෙවීමක් ගැන සඳහන් වන්නේ දෙපාර්තමේන්තු විසින් හදිසි අවශ්‍යතා සඳහා ඉල්ලුම් කරන මුදල් අත්තිකාරම් වලට අදාලව සකසන ලද වවුචර්පත් සඳහා සරප් විසින් කරන ලද ගෙවීම්ය. කෙසේ වෙතත් මෙවැනි තත්වයක් ඉදිරියේදී ඇති නොකරන ලෙසට විද්‍යා පීඨයේ නිලධාරීන්ට උපදෙස් දී ඇත.<br>**<u>දන්ත වෛද්‍ය පීඨය</u>**<br>අදාල අත්තිකාරම් මුදල් ගෙවීම සිදුකර ඇත්තේ සරප් වෙත ලබා දී ඇති සුළු මුදල් අග්‍රිමයෙනි. අදාල සුළු මුදල් අග්‍රිමය සරප් වෙත ලබා දී ඇත්තේ විශ්වවිද්‍යාලයේ විවිධ ගෙවීම් කිරීමේ අරමුණින්ම බව සඳහන් කරමි. ඒ කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි දෙයක් ඇති නොවීමට දන්ත වෛද්‍ය පීඨයේ නිළධාරීන් දැනුවත් කර ඇත. |
| **(II)** | **<u>මුදල් රෙගුලාසි 371(2)</u>** |
| **(i)** | 2015 වර්ෂයේ සිට නිවැරදි කර ඇත. |
| **(ii)** | 2015 වර්ෂයේ සිට නිවැරදි කර ඇත. |
| **(iii)** | 2015 වර්ෂයේ සිට නිවැරදි කර ඇත. කෙසේ නමුත් මෙම සීමාව මහා භාණ්ඩාගාරය විසින් සංශෝධනය කර ඇත. |

| | |
|---|---|
| **(III)** | **<u>මුදල් රෙගුලාසි 371(4)</u>**<br>මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| **(IV)** | **<u>මුදල් රෙගුලාසි 371(5)</u>**<br>නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| **(V)** | **<u>මුදල් රෙගුලාසි 570 හා 571</u>**<br>ජ'නල් අංක AJ0030 මඟින් 2014 සංශෝදිත ගිණුම් සමඟ නිවැරදිකර ඇත. |
| **(ඈ)** | **<u>2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය</u>**<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නීති රීති අනුව කටයුතු කරන ලෙස සියලුම නිළධාරීන් දැනුවත් කර ඇත. |
| **(ඉ)** | **<u>1990 පෙබරවාරි 06 දිනැති අංක 422 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය</u>**<br>**<u>රු.40,000.00</u>**<br>සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ කුරුණෑගල රෝහලේ සේවය කරන එස්. ලලිත් මයා, ඩබ්.එම්.පී. සත්කෝරාල, ආර්.එම්.යූ. රත්නායක, කුමාරදාස සහ පී.ආරියරත්න යන මහත්ම මහත්මීන් සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදී, හෙද, විකරණවේදී, භෞතචිකිත්සක සහ වෛද්‍ය රසායානාගාර විද්‍යා යනාදී දෙපාර්තමේන්තුවල ඉගෙනුම ලබන සිසුන් සඳහා කුරුණෑගල රෝහලේ සම්බන්ධිකාරකවරුන් ලෙස පත් කිරීම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සහ මුදල් කමිටුවේ අනුමැතිය යටතේ සිදු කර ඇත. එසේම මොවුන්ගේ සේවය ලබා නොගෙන කුරුණෑගල රෝහලේ සායනික කටයුතු සම්බන්ධීකරණය කළ නොහැකි බව වැඩි දුරටත් දන්වා සිටිමි.<br>**<u>රු.58,000.00</u>**<br>මෙම මධ්‍යස්ථානයේ ගිණුම් කටයුතු සඳහා ස්ථිර සහකාර මූල්‍යාධිකාරීවරයෙකු හා ගිණුම් ලිපිකරුවකු ස්ථිර වශයෙන් යොදවා ගැනීමට ප්‍රමාණවත් අනුමත සේවක සංඛ්‍යාවක් නොමැති බැවින් දැනට විශ්ව විද්‍යාලයේ සේවය කරනු ලබන සහකාර මූල්‍යාධිකාරීවරයෙකු සහ ගිණුම් ලිපිකරුවෙකු ඔවුන්ගේ රාජකාරි වේලාවෙන් බැහැරව යොදාගැනීමට සිදුවිය. ඒ සඳහා ඔවුන්ගේ අතිරේක රාජකාරි කාලය වෙනුවෙන් ඉහත ගෙවීම 326 වන මුදල් කමිටුව අනුමැතිය මත ගෞරවාන්විත දීමනාවක් වශයෙන් සහකාර මූල්‍යාධිකාරීට මසකට රු. 4,000.00 ක් හා ගිණුම් ලිපිකරුට මසකට රු. 2,500.00 බැගින් ගෙවීම් කරන බව දන්වමි. |
| **(ඊ)** | **<u>1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (2) ජේදය හා 2003 ජනවාරි 09 දිනැති අංක PE 1/174/1-2003 දරණ මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය</u>**<br>දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලේ පුහුණුව සඳහා දායක වන දන්ත වෛද්‍ය පීඨයේ වෛද්‍යවරු, කාර්මික නිලධාරි සහ හෙද නිලධාරින් සඳහා රාජකාරි වැඩ වලට බාධා නොවන පරිදි ඉඩ ලැබෙන අයුරින් කාර්යාලීය වේලාවන් තුලදී සිදුකරනු ලබන පුහුණුව සඳහා අදාල වන ගෙවීම් 2013 අගෝස්තු මස 08 වන දිනැති 324 වන මූල්‍ය කමිටු අනුමැතිය මත සිදු කර ඇත.<br>මෙහිදී පුහුණු කටයුතු සඳහා සහභාගී වන සියලුම වෛද්‍යවරු, කාර්මික නිලධාරි සහ හෙද නිලධාරින් නිසි පුහුණුවක් සහිත ස්ථිර සේවකයන් වන අතර මෙම කිසිදු නිලධාරියෙකු දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලේ සිදුකරනු ලබන මෙම පුහුණුව සඳහා වෙනත් කිසිම ගාස්තුවක් නොගෙවනු ලැබේ. පුහුණු කටයුතු සඳහා නිලධාරින් පත්කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලේ අධ්‍යක්ෂකගේ අනුදැනුම මත සිදුවේ.<br>තවද සෑම වර්ෂයකදීම දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලේ අයවැය වාර්තාව සඳහා මෙම නිලධාරින් වෙත ගෙවනු ලබන ගාස්තු ඇතුලත් කරනු ලබන අතර ඒ සඳහා මූල්‍ය කමිටු අනුමැතිය ලබාගෙන ඇත.<br>දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලට අදාල සියලුම ගෙවීම් 380 වන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුකූලව සිදුකෙරේ. |
| **(උ)** | **<u>2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්ගේ චක්‍රලේඛය</u>** |

| | |
|---|---|
| | විශ්වවිද්‍යාලයේ අනුමත රසායනාගාර පරීක්ෂණ නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව සිදු කරනු ලබන අතර ආදායම විශ්වවිද්‍යාල අරමුදල යටතේ වූ වෙනම වැය ශීර්ෂයක් යටතේ ගිණුම් ගත කර ඇත. කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් 446 වැනි පාලක සභාවේදී ගත් තීරණයක් මත විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ සඳහා වූ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් වන ආදායම් වියදම් පිළිබඳව කටයුතු කල යුතු ආකාරය නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. එම කමිටු නිර්දේශ මත ඉදිරියේදී කටයුතු කරනු ලබයි. |
| (ඌ) | **<u>2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.8 ඡේදය</u>**<br>විගණන විමසුම අනුව දක්වා ඇති සේවකයින් 131 අතුරින් සේවකයින් 100 දෙනෙකුගේ සහ දන්ත වෛද්‍ය පීඨයේ සියලුම සේවකයින්ගේ රැකියා විස්තර මේ වන විටත් ලබා දී ඇත. රැකියා විස්තර ලබා දීමට ප්‍රමාද වූ ඉතිරි සේවා කාණ්ඩයට අදාල වෘත්තීමය ගැටලු මේ වන විට නිරාකරණය කර ඇති බැවින් ඉතිරි සේවකයින් 31 දෙනාගේ රැකියා විස්තර ලබා දීමට මේ වන විට කටයුතු යොදා ඇත. |
| (එ) | **<u>1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2011 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය</u>**<br>2013.01.08 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1000 ට අනුව මෙම දායක මුදල් ගෙවීම සිදුකර ඇත. එම චක්‍රලේඛයේ 4 වන පරිච්ඡේදයට අනුව මහා භාණ්ඩාගාරයේ ලේකම් ලබා දුන් උපදෙස් පරිදි එම දායක මුදල් ගෙවීම 2013.01.01 දින සිට සිදු කරන ලෙස ද දන්වා ඇත. ඒ අනුව අදාල දායක මුදල් ගෙවීම අදාළ චක්‍රලේඛය පරිදි සිදුකර ඇති බව දන්වා සිටිමි. |
| **2.5** | **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** |
| (අ) | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ භෞතික චිකිත්සක දෙපාර්තමේන්තුව හා විකිරණවේද හා විකිරණ චිකිත්සක දෙපාර්තමේන්තු මඟින් එම දෙපාර්තමේන්තු තුළ සේවය කරන ආචාර්යවරුන් හා නිළධාරීන්ගේ සහභාගීත්වයෙන්, විශ්වවිද්‍යාල සේවකයින්, ශිෂ්‍යයින් හා බාහිර පුද්ගලයින් සඳහා අඩු මුදලකට සේවාවන් පවත්වාගෙන යාම සඳහා අදාල දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ගත්තාවූ ඒකකයක් වන අතර විශ්වවිද්‍යාලීය පනතේ 24 වගන්තිය සංශෝධිත 1995 අංක 01 දරණ විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) 02 වගන්තිය අනුව ක්‍රියාකළයුතුවූ දෙපාර්තමේන්තුවක් නොවන බව දන්වමි. එසේම ඉහත පනත අනුව කටයුතු කළයුත්තේ උසස් අධ්‍යාපනය සඳහාවූ අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් ආරම්භ කරන්නේ නම් පමණි. එසේම මෙම ඒකකය පිහිටුවීම සඳහා ඉහත පනත අනුව විශ්වවිද්‍යාලයීය පාලක සභාවට ලැබී ඇති බලතල අනුව ක්‍රියාකර ඇති අතර බැහැර සේවාවන් සැපයීමට අදාල ගාස්තු සඳහාද අදාල අනුමැතියන් ලබාගෙන ඇති බව දන්වමි. |
| (ආ) | 2014.07.17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2014අනුව මෙම අතිරේක දීමනාව විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් කර ඇත. |
| (ඇ) | දන්ත සහායක පුහුණු පාසල 2002 දී ආරම්භ කර ඇති 2002.11.23 දිනැති අංක 309 දරණ පාලක සභා තීරණය මත පවත්වාගෙන යන ලදී. එසේම 2015 වර්ෂයේදී කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| (ඈ) | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි පර්යේෂණ අරමුදල් වල දෝෂයන් යළි ඇති නොවීමට හා නිසි අනුමැතීන්ට යටත්ව වියදම් දැරීමට ගිණුම් නිසි පරිදි පවත්වා ගෙන යෑමට සියලුම පීඨයන්වල නිළධාරීන් හා සනාතන මන්දිරයේ සියලුම නිළධාරීන් දැනුවත් කර ඇත. |
| **3** | **මුල්‍ය සමාලෝචනය** |
| **3.1** | **මුල්‍ය ප්‍රතිඵල** |
| **4** | **මෙහෙයුම් සමාලෝචනය** |
| **4.1** | **කළමණාකරණ අකාර්යක්ෂමතා** |
| (අ) | අදාළ අබලි ද්‍රව්‍ය බැහැර කිරීමේ කමිටුවේ නිර්දේශ ප්‍රකාරව මේ වන විට ජාතික ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව තරඟකාරී ලෙස ජාතික තරඟකාරී මිල කැඳවීමේ ක්‍රමය (NCB) අනුව මිල කැඳවීම් කර ඇති අතර 2016.03.29 දින මිල කැඳවීම් |

<table>
<tr><td></td><td>පත්‍ර විවෘත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ඉතා ඉක්මනින් අබලි භාණ්ඩ බැහැර කිරීමට කටයුතු කරන්නෙමි.</td></tr>
<tr><td>(ආ)</td><td>විගණන වාර්තාවේ පෙන්වා ඇති පරිදි දේශීය හා විදේශියව ලැබුණු පර්යේෂණ අරමුදල් ඵලදායී ලෙස පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලෙස අදාළ පර්යේෂණලාභීන් දැනුවත් කර ඇත.</td></tr>
<tr><td>(ඇ)</td><td>මෙම අත්තිකාරම් මුදල් වලින් රු. 161,486.95 ක් වටිනාකමින් යුතු අත්තිකාරම් ලබා ඇති අචාර්යවරුන් මේ වන විට විශ්වවිද්‍යාල සේවයේ නොවන අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් එකී අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට යොමු කර ඇත. එසේම රු. 22,000 ක් වටිනාවූ අත්තිකාරම් මුදල අදාළ ආචාර්යවරයාගෙන් මේ වන විටත් අය කරගෙන ඇත.</td></tr>
<tr><td>(ඈ)</td><td>

- දක්වා ඇති නිළධාරීන් අතුරින් අර්ථසාධක අංක 06975 දරණ නිළධාරියාගේ ණය ශේෂය වන රු. 166,054.00 මුදල ඔහුගේ අර්ථසාධක අරමුදලින් අයකරගෙන ඇත. අර්ථසාධක අංක 08413 ආචාර්යවරයාගේ ණය ශේෂය වන රු. 56,640.00 වන මුදල යාපනය විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන පියවා ඇත.
- අර්ථසාධක අංක 05578 දරණ නිළධාරියාගේ සේවය අත්හිටුවා තිබූ අතර පරීක්ෂණ කටයුතු වලින් අනතුරුව නැවත සේවයේ පිහිටුවා තිබූ බැවින් රු. 19,589.00 ක් වූ ණය ශේෂය මේ වන විට අය කරගෙන ඇත.
- පහත සඳහන් නිළධාරීන්ගේ සේවය අත්හිටුවා ඇති අතර අදාල පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ණය ශේෂය අය කරගත නොහැකිය. පරීක්ෂණයේ නිර්දේශය මත ණය අයකර ගැනීමට කටයුතු කරමි.

<table>
<tr><th>අර්ථසාධක අංකය</th><th>නම</th><th>ණය ශේෂය</th></tr>
<tr><td>05378</td><td>කේ ජී එන් සී රණසිංහ</td><td>92,839.00</td></tr>
<tr><td>08305</td><td>ඒ ඩී ගාමිණී සරත්චන්ද්‍ර</td><td>72,592.00</td></tr>
<tr><td>14202</td><td>ආර් එච් ඩී සමරසේන</td><td>116,998.00</td></tr>
<tr><td>15962</td><td>බී එච් ඉන්දික</td><td>106,244.00</td></tr>
<tr><td>15981</td><td>යු පී එස් පෙරේරා</td><td>104,720.00</td></tr>
</table>

- අර්ථසාධක අංක 05809 දරණ මහාචාර්යවරයාගේ ණය ශේෂය වන රු 36,995/-ක මුදල මේ වන විට අය කරගෙන ඇත.
- අර්ථසාධක අංක 06162 හා අර්ථසාධක අංක 09126 යන නිළධාරීන් සේවයෙන් ඉල්ලා අස් වී ඇත. එසේම අර්ථසාධක අංක 11976 දරණ ආචාර්යවරයා අනුමත නොකල නිවාඩු ලබා ඇති බැවින් සේවයෙන් පහ කර ඇත. එසේම ඉහත අර්ථසාධක අංක දරණ අයගේ අර්ථසාදක අරමුදල් මේ දක්වා නිදහස් කර නොමැත. ඒ අනුව ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් පිළිවෙලින් ණය ශේෂයන් වන රු 18,317/- , රු 91,000/- , සහ රු 116,656/- ක මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

</td></tr>
<tr><td>(ඉ)</td><td>විශ්වවිද්‍යාලයේ ගබඩාවල ඇති සෙමින් චලනය වන තොග විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා වරින්වර අවශ්‍ය වන නිසා එම තොග දැනට ඉවත් කිරීමට හැකියාවක් නොමැත. ඉදිරියේදී මෙම තොග ඇනවුම් කිරීමේදී පවතින තොග මට්ටම බලා අවශ්‍ය පරිදි ඇනවුම් කිරීමට උපදෙස් ලබාදී ඇත. තවද මේ වනවිට සෙමින් චලනය වන තොග ලෙස හඳුනාගත් අයිතම් බොහොමයක් ගබඩාවලින් නිකුත් කර ඇති අතර නැවත ඇනවුම් කර නොමැත.</td></tr>
<tr><td>(ඊ)</td><td>බොහෝමයක් ශිෂ්‍යත්ව අදාල රෙගුලාසි වලට අනුව සුදුසුකම් ලබන සිසුන් නොමැති නිසා ශිෂ්‍යත්ව ප්‍රධාන කිරීම නොකර ඇත. එකී කොන්දේසි හා නීතිරීති ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නන්ගේ අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමටද හැකියාවක් නොමැත. කෙසේ වුවද සුදුසුකම් ලබන සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට මේ වන විට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(උ)</td><td>සමාලෝචිත වර්ෂය තුළ අය කරගත යුතුව තිබූ ලිපිගොනු 205න් 33 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන ලද බව දන්වා සිටිමි. ඒ අනුව එකී වර්ෂය තුළ එම මුදල්, අර්ථසාධක අරමුදලින් අයකර ගන්නා ප්‍රමාණය සහ කොටස් වශයෙන් ගෙවාගෙන යන ලද ප්‍රමාණයද ඇතුලුව රු.46,628,273.00 මුදලක් අය කරගෙන ඇත.<br><br>2015 වර්ෂය තුළ තවත් 25 දෙනෙකු බැඳුම්කර වටිනාකම් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන ලද බව දන්වා සිටිමි. ඒ අනුව 2015 වර්ෂය තුළ එම මුදල්, අර්ථසාධක අරමුදලින් අය කර ගන්නා ප්‍රමාණය සහ කොටස් වශයෙන් ගෙවාගෙන යන ලද ප්‍රමාණයද ඇතුලුව රු. 46,257,650.91 ක් සම්පූර්ණයෙන්ම එකී වර්ෂය තුළදී අය කරගෙන ඇති බව දන්වා සිටිමි.<br><br>ඒ අනුව 2014 සහ 2015 වර්ෂය තුළ බැඳුම්කර කඩ කළ ආචාර්යවරුන් 58 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම්</td></tr>
</table>

| | |
|---|---|
| | සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාලය වෙත අය කරගෙන ඇති බව දන්වා සිටින අතර එකී වර්ෂ දෙක තුළ අයකර ගන්නා ලද මුළු බැඳුම්කර වටිනාකම රු. 92, 885, 923. 91 කි.<br><br>තවද ඉතිරි ආචාර්යවරුන් 156 දෙනාගේ ලිපි ගොනු අතරින් 84 දෙනෙකුගේ ගිවිසුම් කඩ කල කාලය අවුරුදු 25 ඉක්මවා ගොස් ඇති බැවින් සහ නීතිමය වශයෙන් කටයුතු කල හැකි කාලය ඉක්මවා ගොස් ඇත. ඒ බැවින් ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීම ඉතා අපහසු තත්වයක පවතින බව දන්වා සිටින අතර මෙම 84 දෙනෙකුගේ ලිපිගොනු ගිණුම්කරණයේදී වෙනත් ගිණුමක සටහන් කර දැක්වීමටත් ඉතිරි ක්‍රියාකාරී ලිපිගොනු 72 තවත් ගිණුමක සටහන් කර දැක්වීමටත් කටයුතු කරමින් සිටියි.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඇති අර්ථසාධක අරමුදල් විශ්වවිද්‍යාලය වෙත අය කර ගැනීම ඔවුන්ගේ එකඟතාවය නොමැතිව කළ නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති බැවින්ද එම මුදල අයකර ගැනීම ඉතා අපහසු බැවින් අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව ගිණුම් වලින් කපා හැරීම සඳහා කටයුතු කළයුතු බවද දන්වා සිටිමි. |
| **(ඌ)** | 2013 වර්ෂය තුලදී බොහොමයක් පීඨයන් සඳහා Z-core ගැටළුව විසඳීමේ දී අතිරේක ශිෂ්‍යයන් සංඛ්‍යාවක් ඇතුලත් කිරීමට සිදුවිය. ඒ අනුව අදාළ පීඨවල ඉගැන්වීමේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා විගණන ඡේදයේ සඳහන් ස්ථාවර වත්කම් මිල දී ගැනීමට සිදුවිය. මේ සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කලත් 2013 වර්ෂයේදී එම අතිරේක ප්‍රතිපාදන යොදවා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් භාණ්ඩාගාරයෙන් නිදහස් නොකළ බැවින් සහ මිලදී ගැනීමට ඇනවුම් කළ බොහොමයක් වත්කම් සඳහා 2014 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට ගෙවීමට සිදුවීම හේතුවෙන් එම වර්ෂයේ වෙනත් ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම ගෙවීම් කිරීමට සිදුවිය. මේ හේතුවෙන් වත්කම් මිලදී ගැනීමට වෙන් කල මුදල ඉක්මවා වියදම් දැරීමට සිදු විය. කෙසේ වෙතත් මෙම තත්ත්වය යටතේ ප්‍රාග්ධන වියදම්වල හිලව් කිරීමක් සිදු වී නොමැති අතර ප්‍රාග්ධන මුළු ප්‍රතිපාදන මුදල වන රු. 1,099,000,000.00 ඉක්මවා වියදම් දරා නොමැත. මුළු ප්‍රාග්ධන වියදම රු. 1,086,000,000.00 ක් බව සඳහන් කරනු කැමැත්තෙමි. |
| **(එ)** | සියලුම ශිෂ්‍යත්ව නීති රීති හා රෙගුලාසි අනුව අදාල පීඨයන් විසින් ලබාදීමට කටයුතු කරනු ලැබේ. බොහෝමයක් ශිෂ්‍යත්ව සඳහා නීති රීති හා රෙගුලාසි වලට අනුව සුදුසුකම් ලබන සිසුන් නොමැති අවස්ථාවල ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු නොලබයි. මේ දක්වා සුදුසුකම් ලබා ඇති සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇති අතර 80% ක ප්‍රමාණය ශිෂ්‍යත්ව ප්‍රදානයට සැලසුම් කළත් අදාළ ශිෂ්‍යයන් නිර්ණායක අනුව සුදුසුකම් නොලැබීම මත එම ප්‍රමාණය ප්‍රදානය කිරීම කළ නොහැකි අවස්ථා ඇතිවේ. |
| **(ඒ)** | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලීය මුදල් චක්‍රලේඛ අංක 70 ට අනුව අප්‍රේල් හා දෙසැම්බර් මාස වලදී සේවක හා ආපදා ණය මුදල් වෙනුවෙන් වාරික අයකරගැනීම අත්හිටුවන අතර පොලිය පමණක් අයකරනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුලු සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේ ද අප්‍රේල් හා දෙසැම්බර් මාස වල අර්ථසාධක ණය වාරික හැර අනෙකුත් ණය වාරික අයකරනු නොලබයි.<br>එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛවලට අනුව විශ්වවිද්‍යාලය විසින් එකී මාසවල ණය වාරික අයකර නොගෙන සිටීම නීතියානුකූල බව දන්වමි. |
| **(ඔ)** | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන්ට සායනික කටයුතු සඳහා කුරුණෑගල මහා රෝහල වෙත යෑමට සිදුව ඇත්තේ පේරාදෙණිය හෝ මහනුවර රෝහල් වල කළමනාකාරිත්වය ඒ සඳහා අනුමැතිය ලබා නොදීමෙන් මිස, විශ්ව විද්‍යාලයේ කළමනාකාරිත්වය ඒ සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් නොවන බව සඳහන් කරමි.<br><br>කුරුණෑගල මහ රෝහල වෙත සායනික කටයුතු සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව පිළිබඳ දත්ත සියල්ලම පීඨාධිපති කාර්යාලයේ ගොනු කර ඇත. |
| **4.2** | **මතභේදයට තුඩුදෙන ගණුදෙනු** |
| **(අ)** | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු වලට අදාළව පවතින තාවකාලික කථිකාචාර්ය තනතුරු සඳහා වූ පුරප්පාඩු මත බඳවා ගැනීම් සිදුකර ඇත. පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු වලට පොරොත්තු ප්‍රතිඵල මත තාවකාලික |

| | |
|---|---|
| | කථිකාචාර්ය තනතුරු යන තනතුරු නාමයෙන් බඳවා ගනු ලැබුවද ඔවුන් වෙත වැටුප් වශයෙන් ගෙවා ඇත්තේ පීඨයේ පුරප්පාඩු වූ තාවකාලික ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා වූ වැටුපය. ප්‍රතිඵල නිකුත් වූ පසු අවශ්‍යය සුදුසුකම් සපුරා ඇති අයගෙන් පුරප්පාඩු මත තාවකාලික කථිකාචාර්ය තනතුරෙන් වූ වැටුප් තලයට අනුව පිහිටු වීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද මෙම බඳවා ගැනීම් සිදුකරනුයේ මාස 06 ක කාලයක් සඳහා පමණි. |
| **(ආ)** | උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (National centre for advance studies) මඟින් ප්‍රදානය කළ රු.1,602,630.00 ක මුදල කේ. කේ. ටී. ජේ. ද සිල්වා නැමැති කථිකාචාර්යවරියගෙන් තවමත් අය කරගෙන නොමැති බව සඳහන් කරන අතර එකී මුදල ඇතුළු මුළු බැඳුම්කර වටිනාකම වන රු. 5,714,072.81 ක මුදල අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුවට ලියකියවිලි යොමුකොට ඇති බවද දැනුම් දෙමි. නඩු මාර්ගයෙන් ඉහත මුදල අයකර ගත් පසු ඉහත රු.1,602,630.00 ක මුදල එන්. සි. ඒ. එස්. ආයතනයට ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. මෙම බැඳුම්කරයට අදාල සියලු පාර්ශවයන් වෙත දැනටමත් එන්තරවාසි යවා ඇත. |
| **(ඇ)** | (i) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පවතින පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේදී සෞඛ්‍ය අමාත්‍යංශයේ සේවය කරන ලද විකිරණ ශිල්පී යූ. එම්. යූ.ඩබ්ලිව්. ජයසේකර මියද ඉල්ලුම් පතක් ඉදිරිපත් කර ඇති අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත පාලක සභාවේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ කථිකාචාර්ය (පරිවාස) තනතුරට පත් කර ඇත.<br><br>ජයසේකර මියගේ පත්වීම් ලිපියට අනුව පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂකගේ 2010.11.09 දිනැති ලිපිය මගින් 2009-02-22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ XII පරිච්ඡේදය අනුව රජයේ නිලධාරියෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම සිදු කළ හැක්කේ වසර දෙකක කාලයක් බැවින් ඒ අනුව වසර 02 කාලයක් සඳහා ජයසේකර මියගේ සේවය විශ්වවිද්‍යාලයට ලබා ගත හැකි පරිදි ඇය සෞඛ්‍ය අමාත්‍යංශයේ සේවයෙන් නිදහස් කර ඇත. ඒ අනුව වසර දෙකක කාලයක් සඳහා සේවය කිරීමට ජයසේකර මිය කටයුතු කර ඇත. මෙම සේවා කාලය තුලදී ඇයගේ ඉල්ලීම අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 අනුව විශ්‍රාම ගැනීමට අනුමැතිය ලබා දී ඇත.<br><br>ඒ අනුව 2013.03.28 දින පැවති 417 වැනි පාලක සභාවේ 417.14.04 අනුව යූ.එම්.යූ.ඩබ්ලිව් ජයසේකර මිය විශ්වවිද්‍යාලයේ සේවය සඳහා වාර්තා කල දිනයේ සිට විශ්වවිද්‍යාල සේවයට අන්තර්ග්‍රහණය කිරීම ඉහත පාලක සභා තීරණය මගින් අනුමත කර ඇත.<br><br>ඉහත කරුණු අනුව ජයසේකර මහත්මිය විශ්වවිද්‍යාල සේවයට බඳවා ගැනීමත් එම බඳවා ගැනීමට අනුව වැටුප් ගෙවීමත් නිවැරදි ය. එමෙන්ම රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය පසු අර්ධ රාජ්‍ය ආයතනයක පත්වීමක් සඳහා බාධාවක් නොමැති බවට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියකින් දැනුම් දී ඇත. එහිදී ඔවුන් දන්වා ඇත්තේ යම් විශ්‍රාමිකයෙකුට වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක රැකියාවක් සඳහා යොමු වීමට බාධාවක් නොමැති බවත්ය.<br><br>(ii) ඉහත කරුණු අනුව ජයසේකර මහත්මියට ලබා දුන් පත්වීම නිවැරදි බවත් අධ්‍යයන නිවාඩු ලබා දීමත් අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල ගෙවීමත් නිවැරදි වේ. එයට අමතරව ජයසේකර මහත්මිය විසින් ඉහත කරුණු සියල්ල සම්පූර්ණ වීමෙන් පසු ඇයගේ පර්යේෂණ කටයුතු / පශ්චාත් උපාධිය සඳහා නිසියාකාරව ඉල්ලුම් කර ඇති අතර එම ඉල්ලුම් පත්‍රය සලකා බලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ජයසේකර මිය වෙත අදාල මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත. |
| **(ඈ)** | ඉතා මිල අධික බෙහෙත් වර්ග හා අලි ඇතුන් මෙල්ල කිරීමට යොදා ගන්නා වටිනා උපකරණ වැඩි ආරක්ෂාව සඳහා අංශ ප්‍රධානියාගේ කාමරයේ ගබඩා කොට ඇත. මේවා විශේෂයෙන් වායුසමීකරණ තත්ත්ව යටතේ ගබඩා කළ යුතු ඒවා වේ. තවද මෙම කාමරය උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන්ගේ වාචික පරීක්ෂණ සඳහා ද යොදා ගැනේ. එවැනි අවස්ථා වල අභ්‍යන්තර මෙන්ම බාහිර කථිකාචාර්යවරුන් විසින්ද මෙම කාමරය භාවිතයට ගැනේ. එමෙන්ම අංශ ප්‍රධානියාගේ කාමරයට ස්වභාවික වාතාශ්‍රය ලැබීමට ජනේල හෝ වා කවුළු නොමැත. එබැවින් එය ඉතා උෂ්ණාධික තත්ත්වයක පවතී. මෙම කරුණු සලකා බලා ඉහත සඳහන් වායුසමීකරණ යන්ත්‍රය අංශ ප්‍රධානියාගේ කාමරයට සවි කරන ලදි. |
| **(ඊ)** | ආර්.ජී.ඩී.එන්.එල්. රත්නායක මහතා (කාර්මික නිලධාරී) තම මාස 06 ක පුහුණුව අවසන් කර 2001.12.26 වන දින වැඩ |

| | |
|---|---|
| | බාරගත් පසුව 2010.09.27 වන දින තෙක් දන්ත සංරක්ෂණ අංශය වෙත තම සේවය ලබාදුන් අතර 2010 වසරේදී අපරික්ෂාකාරී බව නිසා දන්ත සංරක්ෂණ අංශයට වූ පාඩුව පිළිබඳ මූලික පරීක්ෂණයකට අනතුරුව රත්නායක මහතාගේ ඉල්ලීමක් අනුව අනධ්‍යයන ආයතන අංශය මගින් සමසෞඛ්‍ය පීඨය වෙත ස්ථාන මාරුවක් ලබාදෙන ලදී. පසුව රත්නායක මහතාගේ පුරප්පාඩුව සඳහා අමිත් සේනානායක මහතා දන්ත වෛද්‍ය පීඨය වෙත අනුයුක්ත කරන ලදී.<br>දන්ත වෛද්‍ය පීඨයේ දන්ත සංරක්ෂණ අංශයේ කාර්මික නිළධාරීන් දෙදෙනකු සේවය කරන අතර එම නිළධාරීන් දෙදෙනාගේ පුහුණු කාලය 2015 ජුලි මස සහ 2016 දී අවසන් වනු ඇත. මෙම නිළධාරීන් දෙදෙනා දැනට ක්‍රවුන් ඇන්ඩ් බ්‍රිජ් ඉල්ලුමෙන් අඩක් සපයනු ලබයි. දන්ත වෛද්‍ය රෝහල ඇරඹූ කාලයට වඩා ශිෂ්‍යයන් සංඛ්‍යාව වැඩි වී ඇති නිසා ක්‍රවුන් ඇන්ඩ් බ්‍රිජ් ඉල්ලුමද වැඩිවී ඇත. ඉහත සඳහන් කාර්මික නිළධාරීන් දෙදෙනාගේ පුහුණු කාලය අවසන් වූ පසුව ක්‍රවුන් ඇන්ඩ් බ්‍රිජ් සකස් කිරීම දැනට වඩා අංශය තුලදී කර ගත හැකි වනු ඇත.<br>ඉල්ලුමට අනුව ක්‍රවුන් ඇන්ඩ් බ්‍රිජ් සැපයීමට දන්ත වෛද්‍ය පීඨයට අවශ්‍ය ධාරිතාවය දැනට නොමැති බැවින් පීඨය හැමවිටම බාහිර අංශවල සේවය ඒවා පිළියෙල කිරීම සඳහා ලබා ගනී. මෙය සඳහා අදාල අනුමැතිය උපකුලපතිතුමා මෙන්ම මුදල් කමිටුව මගින් ද ලබා ගෙන ඇත. එහිදී සෑම දත් ඇන්දක්ම නිශ්පාදනය කිරීමට ගෙවන මුදලට වඩා වැඩි මුදලක් රෝගියාගෙන් අය කර ගන්නා අතර එම ලාභය පීඨය මගින් ලබා ගනී. මෙය බාහිරින් ලබා ගැනීම යන පිළිගත් ප්‍රතිපත්තිය යටතේ සිදුකරනු ලබයි. මෙය දැනට බොහෝ ආයතන වලින් යොදා ගන්නා ප්‍රායෝගික වැඩපිළිවෙලකි. තවද මේ මගින් අපගේ කාර්මික නිළධාරීන්ගේ සේවාවද පූර්ණ කාලීනව දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්, විශේෂඥ වෛද්‍යවරුන් මෙන්ම හමුදාවේ වෛද්‍ය බලකායේ නිලධාරීන් පුහුණුව සඳහා යොදවා ගත හැකිවේ. මේ මගින් අධ්‍යයන පාඨමාලාවේ ගුණාත්මක අගයද ඉහල දැමීමට හැකි වනු ඇත.<br>දන්ත සංරක්ෂණ අංශයේ කාර්මික නිළධාරීන්ගේ සේවය කරන මිනිස් පැය ගණනට අනුව මෙම ක්‍රවුන් ඇන්ඩ් බ්‍රිජ් සකස් කිරීම සඳහාවන ඉල්ලුම සැපයිය නොහැකි අතර අදාල අංශයෙන් මෙහි සේවයට තවත් අතිරේක කාර්මික නිළධාරීන් තිදෙනෙකු විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල සමාලෝචනය යටතේ ඉල්ලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉල්ලීමක් කර ඇත. |
| **4.3** | **අරමුදල් ඌණ උපයෝජනය** |
| **(අ)** | විගණන වාර්තාවේ පෙන්වා ඇති අරමුදල් 59 ට අදාළව අරමුදලේ අරමුණ අනුව කටයුතු කරන ලෙස අදාළ පීඨ වල නිළධාරීන් දැනුවත් කර ඇති අතර ඊට පරිබාහිරව අරමුදල් උපයෝගී කර නොගන්නා ලෙස උපදෙස් දී ඇත. |
| **(ආ)** | විගණන වාර්තාවේ පෙන්වා ඇති පරිදි නිෂ්කාර්යව ප්‍රයෝජනයට නොගෙන පවතින අරමුදල් සියල්ලම 2016 වර්ෂයේ සිට අදාළ අරමුදලේ අරමුණ පරිදි ප්‍රයෝජනවත් ඵලදායී කාර්යයන්ට යොදවන ලෙස සියලුම පීඨවල නිළධාරීන් වෙත උපදෙස් නිකුත් කර ඇත. |
| **4.4** | **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්** |
| | මෙම අයිතමයන් අතරින් MDF Board හා Golden Brown Emultion තීන්ත බාහිර උපාධි කේන්ද්‍රයේ අවශ්‍යතා සඳහා දැනටමත් භාවිතා කරන අතර අනෙකුත් අයිතමයන් සඳහා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ xxvi පරිච්ඡේදයේ ප්‍රතිපාදන අනුව අපහරණය කිරීමට අදාළ කටයුතු ඉදිරි මාස 02 තුළදී අවසන් කිරීමට තීරණය කර ඇත. |
| **4.5** | **හඳුනාගන්නා ලද අඩුපාඩු** |
| **(අ)** | වෛද්‍ය පීඨයේ තාක්‍ෂණික සම්පත් මධ්‍යස්ථානයෙහි තිබී Gestetner Toner 05 ක් අස්ථානගත වී නොමැති අතර, වාර්ෂික තොග සමීක්‍ෂණ කමිටු මගින් 2013 සහ 2014 වර්ෂවල සිට මෙම අයිතම ගබඩාවේ පවතින බව සඳහන් කර ඇත. එය තොග පොත් වලද නිසියාකාරව සඳහන් කර ඇත. |
| **(ආ)** | මෙම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර විමර්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. එම කමිටු නිර්දේශය මත ඉදිරියේදී කටයුතු කරනු ඇත. |
| **4.6** | **ප්‍රමාද වූ ව්‍යාපෘති** |
| | මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේදී ඇතිවූ දුෂ්කරතාවයන් පිළිබඳව සඳහන් කරමින් කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීම සලකා බැලූ විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරු මෙම කොන්ත්‍රාත් කාර්යයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම නිර්දේශ කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් මෙම කොන්ත්‍රාත් කාර්යයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන ඇති බව කරුණාවෙන් දන්වා සිටිමි. කෙසේ වෙතත් මේ වන විට මෙම කොන්ත්‍රාත් |

| | |
|---|---|
| | කාර්යය සතුටුදායක ලෙස අවසන් කර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. |
| **4.7** | **කාර්ය මණ්ඩල පරිපාලනය** |
| **(අ)** | <u>**රු.651,155.00**</u><br>දන්ත යෙදවුම්කරුවන්ගේ සේවය ආයතනයේ අවශ්‍යතාවය මත ලබා ගැනීම සිදුකරනු ලැබේ. මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 හි 2. 8 අනුව කාර්යය පැවරුම් හෝ කොන්ත්‍රාත් පදනම මත විශ්වවිද්‍යාලයේ පාලකසභා අනුමැතියට යටත්ව දෛනික වැටුප් ලබාදීමේ පදනම මත සේවකයන් සේවා අවශ්‍යතාවය මත පත්කිරීම සිදුකර ඇත. ඒ අනුව පාලක සභාවේ අනුමැතියට යටත්ව මධ්‍යස්ථානයේ ඉපැයීම්වලින් මුදල් ගෙවීමේ පදනම මත මෙම පත්වීම් සිදුකර ඇත.<br><u>**රු.106,000.00**</u><br>එස්.පී.ඒ. වාරුණි බණ්ඩාර, එම්.පී.බී.එන්. බණ්ඩාර, අයි.ඒ.ඩී.ඩී. ඩිෂාන් ඉලේපෙරුම යන අය සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති කාර්යාලයේ, ගිණුම් අංශයෙහි සහ විකිරණවේදී දෙපාර්තමේන්තුව සඳහා සේවයේ යෙදී ඇත්තේ ලිපිකරු තනතුර සඳහා නොව, පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර (Trainee Computer Application Assistant) ලෙසය. ඉහත බඳවා ගැනීම් සඳහා පූර්ව අනුමැතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයෙන් ලබා ගෙන එම අංශය මඟින් ඉහත පත්වීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත්තේ පීඨයේ පීඨාධිපති කාර්යාලයේ පවතින පරිගණක යෙදවුම් සහකාර සහ විකිරණවේදී දෙපාර්තමේන්තුවේ පවතින පරිගණක යෙදවුම් සහකාර තනතුරු පුරප්පාඩු පැවති බැවිනි. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂය තුළදී පශු වෛද්‍ය රෝහල නඩත්තු කිරීමේ අරමුදල සඳහා අනුමත නොවූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් පත්වීම් සිදුකර නොමැත. කෙසේ වුවද පශු වෛද්‍ය රෝහල නඩත්තු කිරීමේ අරමුදලේ ආදායම මත ගෙවීම් කිරීම පදනම් කරගෙන මුදල් කමිටුවේ අනුමැතිය මත පශු වෛද්‍ය රෝහල පවත්වා ගෙන යාම සඳහා තාවකාලික කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට සිදුවිය. එසේ නොකලේ නම් පශු වෛද්‍ය රෝහල වසා දැමීමට සිදුවේ. එසේම අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා දෙන ලෙස මේ වනවිට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර මේ දක්වා අනුමත කර විශ්වවිද්‍යාලය වෙත එවා නොමැත. |
| **(ඇ)** | විද්‍යා පීඨයේ විද්‍යා අධ්‍යාපන ඒකකය යටතේ පවතින සම්පත් මධ්‍යස්ථානයට මුල්‍ය කමිටුවේ අනුමැතිය මත කම්කරුවෙකු කොන්ත්‍රාත් පදනම යටතේ හා ලිපිකරුවෙකු කාර්යය පැවරුම් පදනම යටතේ බඳවා ගැනීමට කටයුතු කර ඇත. තවද විද්‍යා අධ්‍යාපන ඒකකයට 2013 වර්ෂයේ ස්ථිර ලිපිකරු තනතුරක් ලබා ගැනීමට අයදුම් කළත් මෙතෙක් එම තනතුර අනුමත වී නොමැත. විද්‍යා පීඨය මඟින් සිදුකරනු ලබන උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් සඳහා වැඩමුලු පැවැත්වීම අඛණ්ඩව සිදුකරන හෙයින් සම්පත් මධ්‍යස්ථානයේ වැඩකටයුතු කරගැනීම සඳහා ලිපිකරු තනතුරකට හා කම්කරු තනතුරකට පැවරුම් පදනම යටතේ මුදල් කමිටු අනුමැතියට අනුව බඳවා ගැනීම් සිදුකරන ලදී. |
| **(ඈ)** | විද්‍යා පීඨයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 146 දෙනෙක් සිටින අතර මෙයින් තනතුරු 47 ක පුරප්පාඩු පවතී**.** මෙම පුරප්පාඩු පිරවීම සඳහා වූ ඉල්ලීම් ලිපි අදාල දෙපාර්තුමේන්තුවේ අංශාධිපති මඟින් විද්‍යා පීඨ පීඨාධිපතිගේ නිර්දේශය මත අධ්‍යයන ආයතන අංශය වෙත යොමු කර ඇති අතර අධ්‍යයන ආයතන අංශය මඟින් පුවත්පත් වල දැන්වීම් පල කර බඳවාගැනීමේ කටයුතු 2014 හා 2015 වර්ෂවල දී සිදුකළත් එම වර්ෂවල සිදුකල සම්මුඛ පරීක්ෂණ වලදී සුදුසු අපේක්ෂකයින් නොමැති වීමෙන් බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත. 2015-12-06 දින පලකරන ලද පුවත්පත් දැන්වීමට අනුව රසායන විද්‍යා, භූ විද්‍යා, ගණිත, සංඛ්‍යාන හා පරිගණක, සත්ත්ව විද්‍යා, යන දෙපාර්තමේන්තු වලට අදාල අධ්‍යයන පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.<br><br>එසේම තනතුරු 8 ක පුරප්පාඩු 60 ක් හා තනතුරු 5 ක අතිරික්තතා 35 ක් දක්වා තිබුණද, පවතින තත්ත්වය මෙයට පරස්පර වන අතර අතිරික්තතා නොමැති බවද දන්වා සිටිමි. අනුමත තනතුරු වල පුරප්පාඩු පිරවීම පුවත්පත් දැන්වීම් මඟින් සිදුකිරීමේදී කාලයක් වැයවන නිසා තාවකාලික ප්‍රදර්ශකවරුන්ගේ සේවය ලබා ගැනීමෙන් අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට සිදුවී ඇති බව දන්වා සිටිමි. |
| **(ඉ)** | දන්ත වෛද්‍ය පීඨයේ දන්ත රෝහලට අයත් මල ප්‍රවාහන පිරිපහදු යන්ත්‍රයේ නඩත්තු කටයුතු සඳහා 2007 දී කරන ලද අළුත් වැඩියාවත් සමගම අදාල සමාගම මඟින් මේ සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද පිරිමි නඩත්තුකරුවෙකු යොදවන ලදී. එසේම පාලක සභාවේ අනුමැතිය යටතේ තාවකාලික පදනම මත ඉහත සමාගම විසින් පුහුණු කරන ලද |

සේවකයා නැවත සේවයේ පිහිටුවන ලදී. මෙම මල ප්‍රවාහන පිරිපහදු ඒකකය දන්ත රෝහල හා සම්බන්ධ බැවින් රෝගින් මගින් අය කර ගන්නා මුදලින් මෙම සේවකයාට ගෙවීම් සිදු කරනු ලබයි. තවද මේ සඳහා නිත්‍ය සේවකයෙකු විශ්වවිද්‍යාලය මගින් ලබා ගැනීමට කටයුතු කරමින් සිටි.

මෙවැනි ව්‍යාප්ති සඳහා අනුමත පුරප්පාඩු ගත තනතුරු නොමැති අතර එම කාර්යය ඉටු කිරීමේ දැඩි අවශ්‍යතාවය මත තාවකාලික පදනමින් දන්ත වෛද්‍ය පීඨයේ රෝගීන් මඟින් උපයා ගන්නා අරමුදල් පදනම් කරගෙන ගෙවීම් කිරීමේ පදනම යටතේ මෙම පත් කිරීම් සිදුකර ඇත.

**(ඊ)** මේ වන විට දන්ත වෛද්‍ය පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන පුරප්පාඩු වූ තනතුරු සියල්ලටම බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත

**(උ)** <u>විද්‍යා පීඨය</u>

විද්‍යා පීඨයේ දේශණ කටයුතු සඳහා සහභාගිවන බාහිර කථිකාචාර්යවරුන් පහත සඳහන් කර ඇති විෂයන් වලට පමණක් දේශණ පවත්වයි. මෙම විෂයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශේෂ කවුළුවක් මඟින් (Special Window) ශාස්ත්‍ර පීඨය සමග එක්ව අවුරුදු 4ක පාඨමාලාවක් ලෙස පරිගණනය හා කළමණාකරණ පාඨමාලාව, සංඛ්‍යාන හා සංකාර්ය පර්යේෂණ පාඨමාලාව සහ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාව යන නව B.Sc උපාධි පාඨමාලා වලට අයත් වු හෙයින් ද විද්‍යා පීඨයේ සිටින කථිකාචාර්යවරුන්ගේ විෂය පථයන්ට පරිබාහිර වූ හෙයින් ද පීඨයේ සිටින කථිකාචාර්යවරුන්ගේ සේවය මේ සඳහා යොදාගත නොහැක. තවද මෙම විෂයන්ගේ දේශණ කටයුතු සඳහා නව පත්වීම් සිදුකලහොත් මේ සඳහා විශාල වියදමක් විශ්වවිද්‍යාලයට දැරීටම සිදුවේ. මෙම බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය විද්‍යා පීඨයේ පුරප්පාඩු වූ හෝ නිවාඩු ලබා ඇති කථිකාචාර්යවරුන්ගේ විෂය පථයන් ඉගැන්වීම සඳහා සහභාගි නොවන බව තවදුරටත් අවධාරණයෙන් දන්වා සිටිමි.

| Name of the visiting Lecturers | Subjects |
|---|---|
| Dr. N.K.B.M.P. Nanayakkara | AS464- Workshop Practice |
| Dr. D. Randeniya | AS463- Energy Sources, Use and Conservation |
| Dr. G.B.B. Herath | As433-Industrial waste management |
| Dr. G.S. Gurusinghe | AS444-Industrial & Economic Minerals |
| Dr. D.G.G.P. Karunaratne | AS432-Cleaner Production for Industry |
| Ms. K.K.K. Sylva | AS400-Industrial Management |
| Ms. S. Illeperuma | AS402-Research Methodology & Scientific writing |
| Mr. N.Agilan- | Management |
| Mr. B.A.N. Eranda | Management |
| Mrs. S.Koditueakku | Management |
| Prof. N.D. Samarawickrama | Economics |
| Dr. D.A.A.C. Rathnaweera | CS402- Intelligent Systems in CIM |
| Mr. J. Heenkenda | CS414-Project Management |
| Dr. A.K.Kulathunga | CS402- Intelligent Systems in CIM |
| Dr. S.A.H.A. Suraweena | ST412- Mobile Pervasive Computing |
| Prof. S.B. Siyambalapitiya | MT409- Selected Tropic in Applied Operation Research |
| Dr. D.M. Samarathunga | MT402- Measure Theory |

<u>දන්ත වෛද්‍ය පීඨයට බාහිර කථිකාචාර්යවරු බඳවා ගැනීම</u>

දන්ත වෛද්‍ය පීඨය සහ දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල එකිනෙකට අනුබද්ධ ආයතන දෙකකි. දන්ත වෛද්‍යවරුන් බිහිකිරීම මෙන්ම මුඛය හා හණු ආශ්‍රිත රෝග සඳහා ප්‍රතිකාර කිරීම, අරමුණු කරගනිමින් මෙම ආයතන දෙක පිහිටුවා තිබේ.

දන්ත වෛද්‍ය සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මෙන්ම දන්ත වෛද්‍ය රෝහලේ පැවැත්ම සඳහා ද බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට සිදුව ඇති අතර මෙය අඛණ්ඩව සිදුව ඇති ක්‍රියා පිලිවෙතකි. මෙයට හේතු පහත අංශ යටතේ විස්තර කළ හැක.

**i. දන්ත වෛද්‍ය විද්‍යා පාඨමාලාවට අනුබද්ධව යම් යම් විශේෂිත විෂයයන්ට අදාල දේශන පැවැත්වීම**

පාඨමාලාවට අදාල General Medicine, General Pathology, General Surgery වැනි විෂයයන් ඉගැන්වීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයෝගය, දන්ත වෛද්‍ය පීඨය විසින්

අඛණ්ඩව ලබාගෙන ඇත.
දන්ත වෛද්‍ය විද්‍යා පාඨමාලාවට අදාල නමුදු, වෛද්‍ය විද්‍යා පාඨමාලාවට වඩාත් නැඹුරු මෙම විෂයයන් ඉගැන්වීම සඳහා වෛද්‍ය පීඨයේ සහාය ලබාගනුයේ එම විෂයයන් පිළිබඳ දැනුම ගුණාත්මක භාවයෙන් වඩාත් උසස් තත්ත්වයකින් සිසුන්ට ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙනය.
එමෙන්ම මෙම කාර්ය මණ්ඩලය විසින් පවත්වන්නේ සීමිත දේශන ප්‍රමාණයකි. සමහර ආචාර්යවරුන් පමණක් මේ සඳහා දීමනාවක් ලබාගෙන ඇති අතර, කිසිදු දීමනාවක් ලබානොගෙන, සේවය පමණක් පීඨයට ලබාදුන් ආචාර්යවරුද මේ අතර සිටී. තවද ඒ ඒ විශේෂිත වෛද්‍ය විද්‍යා විෂයන් ඉගැන්වීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන් (නිර්වින්දන ශෛල්‍ය වෛද්‍ය සහ කායික වෛද්‍ය ආදී වශයෙන්) දන්ත වෛද්‍ය පීඨය නිත්‍ය කාර්යය මණ්ඩලයේ නොමැති බැවින් ඔවුන් අනිවාර්යෙන්ම බාහිර කථිකාචාර්යවරුන් වශයෙන් කැඳවීමට සිදුවේ.

**ii.දන්ත වෛද්‍ය රෝහලේ පැවැත්ම**

ශල්‍යකර්ම වලට අදාල විශේෂඥ පුහුණුව ලබා ඇති වෛද්‍යවරුන්ගේ සේවය දන්ත වෛද්‍ය රෝහලට ලබාගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. පාඨමාලාවට අදාල විෂය දැනුම ලබාදීම මෙන්ම රෝහලේ නේවාසික රෝගීන්ගේ ප්‍රතිකාර උදෙසාද ඉමහත් කාර්යභාරයක් ඔවුන් විසින් සිදු කරනු ලබයි. මෙවැනි විශේෂඥ පුහුණුව ලත් වෛද්‍යවරුන්ගේ විශාල හිඟයක් රටතුල පවතී. එම නිසා විශේෂඥ පුහුණුව ලබා ඇති වෛද්‍ය පී පී නන්දදේව සහ වෛද්‍ය වී.පී.එච් රාජපක්ෂ ආචාර්යවරුන්ගේ සේවය දීර්ඝ කාලීනව පීඨයට ලබා ගැනීමට සිදුව ඇත. තවද, එම ආචාර්යවරුන්ගේ සේවය පීඨයට අඛණ්ඩව ලැබෙන්නේ පීඨයේ බලවත් ඉල්ලීම නිසා බවද සඳහන් කළ යුතුය. නොඑසේනම් මෙම විෂයන් ඉගැන්වීම කිසිසේත් කළ නොහැක.

**iii. ස්ථිර කාර්ය මණ්ඩලයේ ආචාර්යවරයකුගේ සේවය පීඨයට නොලැබෙන අවස්ථා**

පීඨයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ ආචාර්යවරයෙකු අධ්‍යයන, සප්ත වාර්ෂික හෝ අසනීප නිවාඩු ලබා ඇති අවස්ථාවක බාහිර කථිකාචාර්යවරයෙකුගේ සේවය පීඨයට ලබා ගැනීමට සිදුව ඇත. එය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය කරුණකි. සිසුන්ගේ අධ්‍යයන කටයුතු හා රෝගීන්ට ප්‍රතිකාර කිරීම බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා එවැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.
සමහර අවස්ථාවලදී බාහිර කථිකාචාර්යවරුන්ගේ අවශ්‍යතාව ක්ෂණිකව පැන නගිනු පෙනේ. තවත් විටෙක නිත්‍ය කථිකාචාර්යවරුන් අවුරුද්දේ විවිධ කාල වලදී විදේශ ගත වීම සහ සමහර අවස්ථාවලදී නොසිතන අවස්ථාවලදී විදේශගතවීම නිසා කලින් අවුරුද්ද අවසානයේ සියල්ල තීරණය කිරීම අපහසුවේ.
දන්ත වෛද්‍ය පීඨය නිරන්තරයෙන්ම උත්සාහ දරා ඇත්තේ දන්ත වෛද්‍ය විද්‍යා සිසුනට ප්‍රමාණාත්මක හා ගුණාත්මක විෂය දැනුමක් ලබාදීමටය. තවද බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට තවත් හේතුවක් වන්නේ පාඨමාලාවේ විවිධත්වයක් ඇති කිරීම සඳහා එක් එක් අංශයන් වල විශේෂ දැනුමක් ඇති පුද්ගලයන් ලවා සිසුන් හට ඉගැන්වීමේ කටයුතු සිදුකිරීමයි. දන්ත වෛද්‍ය පාඨමාලාවක මේ අවශ්‍යතාවය මූලිකව ම හඳුනාගෙන ඇත.
දන්ත වෛද්‍ය පාඨමාලාව අංග සම්පූර්ණව හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කාලෝචිතව නව පර්යේෂණ මගින් සොයා ගන්නා ලද නවීන තාක්ෂණික දැනුම ශිෂ්‍යයන් හට ලබා දීම සඳහා ඒ ඒ අවස්ථානුකූලව බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට සිදුවේ. එසේම මෙම බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාලයේ පවතින නීතිරීති වලට අනුකූලව අදාල වූ අනුමැතියන්ට යටත්ව සිදුකර ඇත.
**කෘෂිකර්ම පීඨය- රු. 467,488.00**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ශිෂ්‍යයින් සඳහා දෙමළ භාෂාව සහ සිංහල භාෂාව ඉගැන්වීම සඳහා හැකිතාක් දුරට කථිකාචාර්යවරුන් ලබාගන්නා ලද්දේ කලා පීඨයේ සිංහල දෙපාර්තමේන්තුව හා දෙමළ දෙපාර්තමේන්තුවෙනි. එහෙත් 2014 වර්ෂයේ එම දෙපාර්තමේන්තුවල ප්‍රමාණවත් කථිකාචාර්යවරුන් නොමැති බව දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැන්වූ බැවින් බාහිර කථිකාචාර්ය භවතුන්ගේ සේවය ලබා ගැනීමට සිදුවිය.
එමෙන්ම ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා පීඨයේ ELTU (English Language Teaching Unit) අංශයට අවශ්‍ය අමතර උපදේශකවරුන් වෙනුවෙන්ද ගෙවීම් කිරීමට සිදුවිය.

මීට අමතරව විවිධ අධ්‍යයන දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවය පරිදි විෂයානුබද්ධ විශේෂිත දේශන පැවැත්වීම සඳහාද බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන ඇත. අදාල ක්ෂේත්‍රවල පලපුරුද්දක් ඇති විවිධ ආයතන වල සේවයේ නියුතු පුද්ගලයින්ගේ දැනුම සහ පලපුරුද්දක් ශිෂ්‍යයින් වෙත ලබා දීම මෙයින් බලාපොරොත්තු වේ.

**<u>වෛද්‍ය පීඨය</u>**

වෛද්‍ය පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට හේතුවුයේ විශේෂ දැනුමක් සහ පුහුණුවක් ඇති විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගේ සේවය අධ්‍යාපන කටයුතු සඳහා ලබාගත යුතු බැවිනි.

එසේම සියලුම පීඨවල ඒ ඒ අධ්‍යයන කේෂ්ත්‍රවල ප්‍රවීණයන්ගේ දැනුම අධ්‍යයන කටයුතු සඳහා ලබා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් මෙන්ම එවැනි නිපුණතාවක් ඇති ප්‍රවීණයන්ගේ සේවය පූර්ණ කාලීන බඳවා ගැනීම් මත සිදු කල නොහැකි බැවින් ද කෙටි කාලීන අවශ්‍යතාවය මත ඒ ඒ විෂයන් සඳහා බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සිදු කෙරේ. මෙය හුදෙක්ම උපාධියේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා ඉවහල් වන බව පෙන්වා දෙමි.

**(ඌ)** පේරාදෙණිය විශ්වවිද්‍යාලය පසුගිය කාලසීමාව තුල ඉතා සීඝ්‍ර දියුණුවකට ලක්වෙමින් ඇති අතර නව පීඨ දෙපාර්තමේන්තු සහ ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් ඊට එකතුවී ඇත. ඒ අනුව ශිෂ්‍ය සංඛ්‍යාව, ආචාර්ය මණ්ඩලය, අනධ්‍යයන සේවකයන් මෙන්ම ගොඩනැගිලි සංකීර්ණ ද අලුතින් එකතුවී ඇති අතර, මෙම වර්ධනයට සාපේක්ෂව ආරක්ෂක වියදම් මෙන්ම අනෙකුත් පුනරාවර්තන වියදම් වැඩිවීම ද තර්කානුකුල වේ.

2010 වසරේ සිට වර්ධනය වූ පීඨ, දෙපාර්තමේන්තු සහ පශ්චාත් උපාධි ආයතනවල විස්තර පහත දැක්වේ.

| අංශය | ආරක්ෂක නියාමක සංඛ්‍යාව |
|---|---|
| සමසෞඛ්‍ය විද්‍යා පීඨය | 06 |
| නීති දෙපාර්තමේන්තුව | 02 |
| කළමනාකරණ පීඨය | 02 |
| පශු ශික්ෂණ රෝහල | 04 |
| කලා පශ්චාත් උපාධි ආයතනය | 02 |
| වැඩ දෙපාර්තමේන්තු කාර්යාල පරිශ්‍රය | 02 |
| **එකතුව** | **18** |

අලුතින් ඇතිවූ මෙම ආරක්ෂක සේවාවේ අතිරේක අවශ්‍යතාවලට අනුකූලව ප්‍රමාණවත් ආරක්ෂක නියාමක සංඛ්‍යාවක් අභ්‍යන්තර ආරක්ෂක අංශය සඳහා බඳවා ගැනීමට නොහැකිවී ඇත. මෙම තත්ත්වය යටතේ වුව ද, විශ්වවිද්‍යාලයීය ආරක්ෂක අංශය පුද්ගලික ආරක්ෂක සේවාවේ සහය නොමැතිව පහත සඳහන් රාජකාරි ඉටු කරනු ලබයි.

- විශ්වවිද්‍යාලයට අලුතින් බඳවා ගන්නා නවක සිසුන්ගේ ආරක්ෂාව සඳහා වැඩිපුර ආරක්ෂක නියාමකවරුන් සංඛ්‍යාවක් අදාළ පීඨවල රාජකාරියට යෙදවීම.
- නවක සිසුන් සඳහා නේවාසික පහසුකම් සපයා ඇති ශාලා තුළ සිදුවිය හැකි නවකවද ක්‍රියාවන් වැළැක්වීම සඳහා දිනපතාම එකී ශාලාවලට දිවා රාත්‍රි සේවය සඳහා වැඩිපුර ආරක්ෂක නියාමකවරුන් පිරිසක් යෙදවීම.
- විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ විවිධ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සොයා බලා පරිපාලනය වෙත වාර්තා කිරීම.
- විශ්වවිද්‍යාල භූමිය තුළ ඇතිවන හදිසි ගිනි ගැනීම් වළක්වාලීම.
- විශ්වවිද්‍යාල භූමියේ සිදුවන රිය අනතුරු සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගැනීම.
- විශ්වවිද්‍යාල භූමියේ සිදුකරන අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම හා එම පුද්ගලයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා පරිපාලනය වාර්තා ඉදිරිපත් කිරීම.
- විශ්වවිද්‍යාල භූමියේ ගැවසෙන සැකකටයුතු පුද්ගලයන් සම්බන්ධයෙන් සොයා බලා එම පිරිස් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පොලීසිය වෙත ඉදිරිපත් කිරීම.
- සේවක ආරවුල් විසඳීම හා ආරක්ෂක අංශයට ලැබෙන විවිධ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා පරිපාලනය වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- විශ්වවිද්‍යාලයේ පවත්වන විවිධ උත්සව සඳහා අවශ්‍ය ආරක්ෂාව සැලසීම
- සොරකම් වැළැක්වීම සඳහා ජංගම මුර සංචාර සිදුකිරීම.

  වැනි ක්‍රියාවන් ඒ අතර වේ.

විශ්වවිද්‍යාල ආරක්ෂක අංශය වෙත අවශ්‍ය කරන සේවක සංඛ්‍යාව සම්පූර්ණ කර ගැනීමට මෙතෙක් අපොහොසත්වී ඇති

| | |
|---|---|
| | බැවින් ආරක්ෂක අංශය විසින් අනිවාර්යයෙන්ම සේවා සැපයිය යුතු රාජකාරි සඳහා අභ්‍යන්තර ආරක්ෂක අංශයේ සේවක පිරිස් වැඩිපුර සේවයේ යොදවා ගැනීමට සිදුවීම මේ අනුව වැළැක්විය නොහැකි කරුණක්වී ඇත.<br>ඒ අනුව 2014 වසරේ අපේක්ෂිත වියදමට වඩා රු.12,034,599.00 ක මුදලක් අතිකාල වශයෙන් වැයවීම නිස්කාරණයේ සිදුවූවක් නොව, විශ්වවිද්‍යාලයේ මානව හා භෞතික සම්පත් නිසිලෙස ආරක්ෂා කර ගැනීම සඳහා සේවා අවශ්‍යතාවය මත වැයවී ඇති අත්‍යවශ්‍ය සහ අනිවාර්ය වියදමක් වේ. |
| **5.** | **ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය** |
| **5.1** | **විගණන කමිටු** |
| | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 7.4.1 ප්‍රකාරව විගණන කමිටුවේ විෂය පථය තීරණය කිරීමේ දී අවධානයට ලක් කළ යුතු කරුණු කිහිපයක් මඟ පෙන්වා දීමක් ලෙස ඉදිරිපත් කර ඇති අතර ආයතනයේ ස්වභාවය හා අවශ්‍යතාවය අනුව එකී කරුණු විටින් විට වෙනස් වීමේ හැකියාවක්ද ඇත.<br>**(i). අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.**<br>ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පවත්වන්නට යෙදුන විගණන කමිටුවලදී පහත කරුණු අවධානයට ලක් කර ඇත.<br>2014 වර්ෂය සඳහා විගණන සැලැස්ම 2013.12.02 දින පැවති 61 වැනි විගණන කමිටුවේ දී සාකච්ඡාවට භාජනය වූ අතර එකී විගණන සැලැස්මට අනුව සිදු කරනු ලැබූ අභ්‍යන්තර විගණන වාර්තා 2014.05.22 දින පැවති 64 වැනි විගණන කමිටුවේදී සාකච්ඡා කරන ලදි. එබැවින් වාර්ෂික විගණන සැලැස්ම විටින් විට සමාලෝචනය කර ඇති බව දන්වමි.<br>**(ii). ආයතන තුළ ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගයීම් කිරීම.**<br>අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා විගණන කමිටුව ක්‍රියාකර ඇත.<br><br>**(iii). වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුලත් වාර්තා**<br>සෑම වර්ෂයකම වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා විගණන කමිටු සභාපති විසින් පිළියෙල කරන වාර්තාව විගණන කමිටුවේ අවධාරණයට ලක් කර ඇත.<br>උදා :-2013 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඇතුලත් කිරීම සඳහා විගණන කමිටු සභාපති විසින් පිළියෙල කරන ලද වාර්තාව 2014.02.21 දින පැවති 62 වැනි විගණන කමිටුවට ඉදිරිපත් කර ඇත.<br>**(iv). රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මගපෙන්වීම් පිළිබඳ සමාලෝචනය**<br>COPE කමිටුවේ වාර්තාව එය ලැබුන විගස විගණන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර එහි නිර්දේශයන් පිළිබඳව විගණන කමිටුවේ දී සාකච්ඡා කර ඇත.<br>උදා :- 2013.08.15 දින පැවති 59 වැනි විගණන කමිටුව සඳහා 84 වැනි COPE කමිටු වාර්තාව සහ ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් සකස් කළ පිළිතුර ඉදිරිපත් කර ඇත.<br>**(v). අභ්‍යන්තර/ බාහිර විගණන වාර්තා කළමණාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනයක් හා ඉදිරි ක්‍රියා මාර්ග**<br>අභ්‍යන්තර විගණන වාර්තා විගණන කමිටුවේ දී සාකච්ඡා කර ඇත.<br>උදා :-2014 වර්ෂය මුල් කාර්තුව තුළ ඉදිරිපත් කරන ලද විගණන වාර්තා පිළිබඳව 2014.05.22 වැනි දින පැවති 64 වැනි විගණන කමිටුවේ දී සාකච්ඡා කර ඇත.<br>**(vi).ණයගැති ණයහිමි කාල විශ්ලේෂණය**<br>විශ්වවිද්‍යාල ව්‍යාපාරික කාර්යයන්හි නියැලී ලාභ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක ආයතන ගණයට ඇතුලත් නොවන බැවින් ණය ගැති ණය හිමි කාල විශ්ලේෂණයක් පිළියෙල නොකරයි.<br>**(vii). හඳුනාගත් පැරණි සෙමින් චලනය වන හා නිශ්ක්‍රීය තොග වෙනත් අයිතමයන් සම්බන්ධ ප්‍රකාශ**<br>වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව මෙකී තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා අදාළ නිළධාරීන් වෙත මේ වන විටත් යොමු කර ඇති අතර එකී වාර්තා ඉදිරි විගණන කමිටු වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

ඉහතින් දක්වා ඇති කරුණු වලට අමතරව කෙටුම්පත් හා අවසන් විගණන වාර්තා ද විගණන කමිටුවේ දී සාකච්ඡා කොට ඇත.

උදා :- 2012 වර්ෂය සඳහා පිළියෙල කළ අවසන් විගණකාධිපති වාර්තාව 2013.12.02 දින පැවති 61 වැනි විගණන කමිටුව සඳහා ඉදිරිපත් කර ඇති අතර 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015.08.10 දින පැවැත්වීමට නියමිත 67 වැනි කමිටුවේ දී සාකච්ඡා කිරීමට කටයුතු කර ඇත.

මේ අනුව මෙම චක්‍රලේඛනයෙන් පෙන්වා දී ඇති බොහෝමයක් කරුණු අවශ්‍යතාවය මත විගණන කමිටුවේ දී අවධානයට ලක් වී ඇත.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

**(අ)** 2014 ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ඇත්තේ 2013 වසරේදීය. එය 2014 වසරේදී ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ව්‍යාපෘති සහ එහි වටිනාකම් ඇතුලත් කර ඇත. එසේ වුවද 2014 ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තුවක් තුල නව ව්‍යාපෘති ඇතුලත් කර නොමැති අතර එහි කරගෙන යන ව්‍යාපෘති වටිනාකම පමණක් ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.

**(ආ)** ඉදිරියේදී ප්‍රාග්ධන අයවැය ලේඛනය හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම එකිනෙකට අනුරූපී අයුරින් පිළියෙල කිරීමට කටයුතු කරන ලෙස නිළධාරීන් දැනුවත් කර ඇති අතර ප්‍රාග්ධන අයවැය හා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රායෝගිව ක්‍රියාත්මක වීමේදී යම් යම් විචලනයන් සිදුවිය හැකි අතර ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සංශෝධනයට භාජනය කරමින් ප්‍රාග්ධන අයවැය සංශෝධනයද සමඟින් එකිනෙකට අනුරූපව කටයුතු කරන ලෙස සියලුම නිළධාරීන් දැනුවත් කර ඇත.

## 5.3 පාලකසභා රැස්වීම්

PED / 12 චක්‍රලේඛයේ 4.2.2 ප්‍රකාරව විශ්වවිද්‍යාලය මඟින් පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු අවශ්‍යය හා අදාළ ලේඛන 2014 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

__වියදම්__

විශ්වවිද්‍යාලය විසින් සිය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පවත්නා වියදම් පරිමාව හා ඉදිරි සැලසුම් හා මිල උච්ඡාවචනයන් මෙන්ම මහා භාණ්ඩාගාරයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අප වෙත ලබා දිය හැකි යැයි නිගමනය කරනු ලබන මුදල මත ගණනය කරනු ලබයි.

මෙම අරමුදල් වෙන් කිරීම හා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් අතර ප්‍රමාණාත්මක වෙනසක් සෑම වසරකම ඇති අතර විශ්වවිද්‍යාලය කටයුතු කරන්නේ සත්‍ය අරමුදල් ප්‍රතිපාදන මතය. මේ නිසා අයවැය ලේඛනය වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීම අසීරු කරුණක් වන අතර වියදම් පාලනයේදී අයවැය හා සත්‍ය වියදම් අතර නිරතුරුවම විචලනයන් දක්නට ලැබේ.

__අධි ඇස්තමේන්තු කිරීම__

| | ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීම | ප්‍රතිශතය(%) |
|---|---|---|
| __අධ්‍යයන වියදම්__ | | |
| සේවක අර්ථසාධක | 4,067,328.00 | 03.26 |
| අධ්‍යයන දීමනා | 48,816,250.00 | 12.53 |
| සම කිරීමේ දීමනා | 793,978.00 | 66.16 |
| ජීවන වියදම් දීමනා | 4,602,950.00 | 03.09 |
| පර්යේක්ෂණ දීමනා | 4,718,963.00 | 03.31 |
| විශේෂ දීමනා | 2,620,001.00 | 03.19 |
| __අනධ්‍යයන වියදම්__ | | |
| වැටුප් හා වේතන | 16,929,216.00 | 03.21 |
| සේවක අර්ථසාධක | 13,941,015.00 | 14.72 |
| විශ්‍රාම වැටුප් | 8,305,948.00 | 26.32 |

| | | |
|---|---|---|
| සේවා නියුක්ති අරමුදල | 3,492,413.00 | 14.28 |
| වැඩ බැලීමේ දීමනා | 46,170.00 | 23.08 |
| නිවාඩු දින වැටුප් | 1,519,887.00 | 50.66 |
| අනෙකුත් දීමනා | 2,983,680.00 | 66.30 |
| ජීවන වියදම් දීමනා | 7,476,331.00 | 03.81 |

ඉහත අධ්‍යයන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩල වියදම් ඇස්මේන්තු වාර්ෂිකව සකස් කිරීම පහත කරුණු මත තිරණය වේ. එනම්,

(1). සාමාන්‍යයෙන් ඉදිරි වර්ෂය සඳහා අයවැය පිලියල කිරීම සිදුවනුයේ ප්‍රවර්ථන වර්ෂයේ මැද භාගයේය.(මැයි/ජූනි) ඉදිරි මාස කිහිපය තුල සහ ඉදිරි වර්ෂයේ වැටුප් සම්බන්ධයෙන් ඇති විය හැකි වැඩිවීම් (රජයේ අයවැය ලේඛණයෙන් පසු) ඇතුලත් කර මෙම ඇස්මේන්තු පිලියෙල කරනු ලබයි.

උදා:ජීවන වියදම් දීමනා

02). සෑම සේවකයකු වෙනුවෙන්ම සිදුවන වාර්ෂික වැටුප් වර්ධක සහ උසස්වීම් සම්බන්ධ ගැලපිම් සැලකිල්ලට ගනු ලබයි.

03).වාර්ෂික බඳවා ගැනීම්.

ඉහත කරුණු මත පදනම්ව පිළියෙල කරනු ලබන ඇස්මේන්තු හේතුවෙන් ඒ සම්බන්ධ අනෙකුත් වියදම් ඇස්මේන්තු වටිනාකමද ඉහල අගයක් පෙන්නුම් කරයි.

ඒ අනුව සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඇස්තමේන්තු සැකසීමේදි වැටුප් හා වේතන මෙන්ම ජීවන වියදම් දීමනාවද සැලකිල්ලට ගනු ලැබේ.මීට අමතරව ඉහත පෙන්වාදෙන ලද ඇස්තමේන්තු සකස් කිරීමේ දී සලකා බලන කරුණු ද සලකා බැලූ විට අර්ථසාධක අරමුදලේ අධි ඇස්තමේන්තුවක් පෙන්නුම් කරන අතරම විශ්‍රාම වැටුප් සේවා නියුක්ති අරමුදල සඳහා ද මෙම වටිනාකම සෘජුවම බලපෑමක් ඇති කරයි.

**අනෙකුත් දීමනා**

වැටුප් සැකසිමේදි අනෙකුත් දීමනා යටතේ වර්ෂ ගණනවකට පෙර පැවති විවිධ දීමනා ඇතුලත්ව ඇත. පසුකාලීනව මෙම අනෙකුත් දීමනා යටතේ තිබු බොහෝ දීමනා සඳහා වෙනත් නම් වලින් හැඳින්වූ දීමනා ලෙස වැටුප් වල සඳහන් විය. නමුත් පැරණි සේවකයින්ගේ අනෙකුත් දීමනා තුල අන්තර්ගත දීමනා එලෙසම පැවතුණි. එම සේවකයින් විශ්‍රාම යාමත් තවද බොහෝ දීමනා වල හිග ගෙවීම් සිදුකිරීමේදි මෙම අනෙකුත් දීමනා යටතේ සිදුකරනු ඇත. ඒ අනුව ඇස්තමේන්තු සැකසීමේදි මෙම උච්ඡාවචනයන් දෙකම සලකා බැලෙන හෙයින් ඇස්තමේන්තු වැඩිවීමක් සිදුව ඇත.

**අධ්‍යයන දීමනා**

අධ්‍යයන දීමනා සඳහා ඇස්තමේන්තු සැකසීමේදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් වැඩි වීම්, වාර්ෂික වැටුප් වර්ධක සහ බඳවාගැනීම් පිලිබඳ සලකා බලා ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. මීට අමතරව කාලීනව ඇතිවිය හැකි අදාල දීමනාවේ ප්‍රතිශතක වෙනස්වීම්ද සලකා බැලේ. මේ නිසා ඉහත සඳහන් කරුණුවල ප්‍රමාණාත්මක බලපෑම මත අධි ඇස්තමේන්තු කිරීමක් ඇතිවිය හැක.

**සම කිරීමේ දීමනා**

පෙර වර්ෂයේ සත්‍ය වියදම් සහ ඇස්තමේන්තු සකස් කිරීමේදි කාර්ය මණ්ඩල ප්‍රමාණයේ වැඩිවීම් ආදිය පදනම් කරගෙන මෙම ඇස්තමේන්තු කිරීම සිදුකර ඇත. ඒ අනුව අධි ඇස්තමේන්තුවක් සිදුවී ඇත.

**පර්යේෂණ දීමනා**

පර්යේෂණ දීමනා සඳහා වාර්ෂික වැටුප් වැඩිවීම සහ වසරින් වසර ඒ සඳහා ඉල්ලුම් කරන අධ්‍යයන කාර්යමණ්ඩල ප්‍රමාණය සහ අනුමත වීම් මත තීරණය වන අතර වසරින් වසර එම ප්‍රමාණය වැඩිවීම තුල ඒ පිළිබඳව සලකා බලා ඇස්තමේන්තු සකසන ලදි. නමුත් පර්යේෂණ දීමනා සඳහා අනුමත කාර්යමණ්ඩල ප්‍රමාණයේ වැඩි නොවීමක් තුල ඇස්තමේන්තු සත්‍ය වියදම ඉක්මවා ගොස් ඇත.

**විශේෂ දීමනා**

මූලික වැටුපෙන් 20% වනසේ මෙම දීමනාව ගෙවනු ලබනු අතර වාර්ෂික වැටුප් වර්ධක සහ බඳවා ගැනීම් යන කරුණු සලකා බලා ඇස්තමේන්තු සකස් කරන අතර ඒ අනුව අධි ඇස්තමේන්තු වීමක් සිදුව ඇත.

**වැඩ බැලීමේ දීමනා**

ඉදිරි වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු සැකසීම පෙර වර්ෂයේ මැද භාගයේ සිදුකරන අතර පෙර වර්ෂයන් වල වැඩ බැලීම් සඳහා දීමනා ගෙවීම් වල උච්ඡාවචනයන් පදනම් කරගෙන ඉදිරි වර්ෂයේ ඇස්තමේන්තු සකස් කර ඇත.

**නිවාඩු දින වැටුප්**

මේ සඳහා ඇස්තමේන්තු සැකසීමේදී පෙර වර්ෂ 2 ක සත්‍ය වියදම මෙන්ම වැටුප් වර්ධකයක් සලකා බැලේ. කෙසේ වුවද මෙම ඇස්තමේන්තු නිවැරදි ලෙස කලින් පුරෝකථනය කිරීම ඉතා අපහසු වේ.

**සැපයුම්**

**කාර්මික හා විදුලි භාණ්ඩ**

ඉදිරි වර්ෂයේදී මෙම වියදම් අධි ඇස්තමේන්තු කිරීම පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

**ගිවිසුම්ගත සේවා වියදම්**

**විදුලිය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් ලබා ගනු ලබන තොග විදුලි සැපයුම් අය ක්‍රමය සංශෝධනය කර ගැනීම 2014 වර්ෂයේදී සිදුකරන ලදි. ඒ අනුව එම අය ක්‍රමය GP-2 සිට GV-2 දක්වා වෙනස් කරන ලදි. එම හේතුව නිසා මසක විශ්වවිද්‍යාල තොග විදුලි සැපයුමේ බිල්පත් ගාස්තු මසකට දළ වශයෙන් රුපියල් මිලියන දෙකක පමණ ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකි විය. තවද, 2014.11.23 දින ගැසට් නිවේදනය මගින් විදුලි ගාස්තු අඩුවීමක් සිදුවූ අතර එමගින්ද විශ්වවිද්‍යාලයේ විදුලි පරිභෝජනය සඳහා වන විදුලි වියදම අඩු විය.

ඒ අනුව 2014 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා විශ්වවිද්‍යාලය විදුලි පරිභෝජනය වෙනුවෙන් වැයවූ මුදල අඩු විය.

**ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීම**

**අතිකාල**

- පුනරාවර්තන කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් පසුගිය වසරවලට වඩා ප්‍රතිපාදන ලැබී ඇති බැවින් එම කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් අමතර ශ්‍රමිකයන් යෙදවීමට සිදුවීම.
- නව ශිෂ්‍ය නේවාසිකාගාර කිහිපයක් අලුතින් ඉදිවීම නිසා එහි අවට කටයුතු හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් අමතර අතිකාල ලබාදීමට සිදුවීම.
- පසුගිය වසර තුල සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලද කසල චක්‍රීයකරණ වැඩසටහන හේතුවෙන් අමතර අතිකාල ලබාදීමට සිදුවීම.
- මූලික වැටුප් වැඩිවීම නිසා අතිකාල පැය රේටය ඉහල යාම.

වැනි කරණු හේතුවෙන් අතිකාල සඳහා දැරූ වියදම් ඇස්තමේන්තු ගත වියදම් ඉක්මවා ඇත.

**සැපයුම්**

**ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා**

01. මිල උච්ඡාවචනයන් සිදුවීම.
02. කළමණාකරන පීඨය ස්ථාපිත කිරීමේ ආරම්භක කටයුතු හේතුවෙන් ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතාවයන් ඉහළ යෑම.
03.විශ්වවිද්‍යාලයේ සියලු විභාග සඳහා හා සියලු රැස්වීම් වාර්තා සඳහා ඡායා පිටපත් කඩදාසි භාවිතා කිරීමට 2014 දි ගනු ලැබූ තීරණය නිසා,
04.සිසුන් බඳවා ගැනීම් වාර්ෂිකව ඉහළ යෑම නිසා,

**රසායනික ද්‍රව්‍ය**

01. මිල උච්ඡාවචනයන් ,
02. පීඨවල අවශ්‍යතාවය මත රසායනික ද්‍රව්‍ය මිලට ගැනීම්,
03.සිසුන් බඳවා ගැනීම් වාර්ෂිකව ඉහළ යෑම නිසා,

**වෛද්‍ය සැපයුම්**

01.සිසුන් බඳවා ගැනීම් වාර්ෂිකව ඉහළ යෑම,
02. ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම කාර්ය මණ්ඩලයේ සේවකයන්ද වෛද්‍ය පහසුකම් ලබා ගැනීම ඉහළ යෑම,
03. ඖෂධ වල මිල උච්ඡාවචනයන් සිදුවීම,

04.වර්ෂය තුළදී සිසුන්ට වෛරස් උණ සහ ඩෙංගු වැනි රෝග වැළඳීම ඉහළ ගිය බැවින් වෛද්‍ය පහසුකම් සැපයීම ඉහළ යෑම,

**ඉන්ධන හා ලිහිසි තෙල්**

01. මිල උච්ඡාවචනයන්
02. නව වාහන මිලට ගැනීම් නිසා ඉන්ධන භාවිතය ඉහළ යෑම,
03. යන්ත්‍ර උපකරණ මිලට ගැනීම් නිසා ඉන්ධන භාවිතය ඉහළ යෑම.
04. කළමණාකරන පීඨය ස්ථාපිත කිරීමේ ආරම්භක කටයුතු හේතුවෙන් ප්‍රවාහන සේවා ලබා ගැනීම් ඉහළ යෑම නිසා ඉන්ධන හා ලිහිසි තෙල් භාවිතය ඉහළ යෑම.

**නිල ඇඳුම් හා මැහුම් කුලී**

01. මිල උච්ඡාවචනයන් සිදු වීම.
02. සේවක බඳවා ගැනීම් ඉහළ යෑම නිසා නිල ඇඳුම් ලබාදීම ඉහළ යෑම.

**අනෙකුත් සැපයුම්**

01.මිල උච්ඡාවචනයන්
02. කළමණාකරන පීඨය ස්ථාපිත කිරීමේ ආරම්භක කටයුතු නිසා අනෙකුත් සැපයුම් ඉහළ යෑම,
03. සේවක බඳවා ගැනීම් හා සිසුන් බඳවා ගැනීම් ඉහළ යෑම.

කෙසේ වුවද ඉදිරි වර්ෂයේදී මෙම වියදම් පාලනය කිරීමට හා අයවැය සැකසීමේදී වෙන්කිරීම් ඉහළ නැංවීමට කටයුතු සිදු කරනු ලබන බවට දන්වා සිටීමට කැමැත්තෙමි.

**නඩත්තු වියදම්**

**වාහන**

අළුත්වැඩියාවන් සිදුකිරීමේදී ඇස්තමේන්තුගත මුදලට වඩා අමතර කොටස් වෙනුවෙන් වැඩි වියදමක් දැරීමට සිදුවී ඇත.

**ගිවිසුම් ගත සේවා**

**ප්‍රවාහන**

රාජකාරි දුර ගමන් සේවා වෙනුවෙන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය රාජකාරි අවශ්‍යතා වෙනුවෙන් පෞද්ගලික අංශයෙන් ප්‍රවාහන සේවා අවශ්‍යතාවයන් ලබා ගැනීමට සිදුවීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවී ඇත.

**දුරකථන**

2014 වසරේදී LEARN ආයතනය මඟින් අන්තර්ජාල සේවාවන් ලබා ගැනීමේ ධාරිතාවයන් ඉහල දැමීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වෙත එම ආයතනය මගින් ලබා ගනු ලැබූ අන්තර්ජාල සැපයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් එම ආයතනය වෙත ගෙවනු ලැබූ මාසික ගාස්තුව ලක්ෂ නවයේ සිට මිලියන 2.7 දක්වා වැඩිවිය. ඒ අනුව ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීමට සිදුවිය.

**පිරිසිදු කිරීමේ සේවය**

2014 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාවන් වෙනුවෙන් ඇස්තමේන්තු කර මූල්‍යාධිකාරී වෙත පාලන අංශයෙන් ඉදිරිපත් කර ඇති මුදල රු. 35,391,338.00 කි. එයින් රු.1,168,762.50 ක මුදලක් සනීපාරක්ෂක සේවා සඳහා හා ඉතිරි රු.34,222,575.00 ක මුදල පවිත්‍රතා සේවාවන් සඳහා ඇස්තමේන්තු කර ඇත.

අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කරන වකවානුවේදී 2014 වර්ෂයේදී සනීපාරක්ෂක කම්කරු සේවාවන් ඉවත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබූ බැවින් සනීපාරක්ෂක සේවාවන් සඳහා 2013 වර්ෂයේ ගෙවූ මුදලින් 25% ක් පමණක් ඇස්තමේන්තුගත කර තිබිණි.

(4,675,050.00 x25 % = 1,168,762.50)

නමුත් 2014 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත සනීපාරක්ෂක සේවාවන් ඉවත් කිරීම සිදු නොවූ අතර, 2014

| | |
|---|---|
| | වර්ෂයේ සනීපාරක්ෂක කම්කරු සේවාව වෙනුවෙන් රු.2,412,246.00 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා ඇත. එම හේතුව නිසාවෙන් 2014 වර්ෂයේ පවිත්‍රතා සේවා සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි මුදලක් වැය වී ඇත.<br><br>**<u>අනෙකුත් පුනරාවර්තන වියදම්</u>**<br>**<u>විශේෂ සේවා</u>**<br>2014 වර්ෂය තුලදී අනෙකුත් පුනරාවර්තන වියදම් යටතේ ගැනෙන විශේෂ සේවා වියදම් අනපේක්ෂිත ලෙස වැඩි විය.<br>• නඩු ගාස්තු ගෙවීම ඉහල යාම.<br>• අදාල වර්ෂයේදි විශ්ව විද්‍යාල භූමියේ මැනුම් කටයුතු පෙර වර්ෂවලට සාපේක්ෂව වැඩි වශයෙන් කිරීමට සිදුවීම.<br>පෙර වර්ෂ වල සිට පැවති නඩු තීන්දු හා ආයතන නිලධාරීන්ගේ නිරීක්ෂණයන් අනුව ක්ෂණිකව මැනුම් කටයුතුලවට අදාලව රාජකාරි සඳහා බාහිර පාර්ශවයන්ට දීමනා ගෙවීම.<br>• වාර්ෂික තොග සත්‍යාපන කටයුතු කිරීමේදි පෙර වර්ෂ වලට සාපේක්ෂව අදාල වර්ෂයේදි තොග සත්‍යාපනයට භාජනය වූ දෙපාර්තමේන්තු ප්‍රමාණය හා දෙපාර්තමේන්තු වලට ඇතුලත් අංශ වැඩිවීම මත එම අංශ හා දෙපාර්තමේන්තු වල තොග සත්‍යාපන කටයුතු ඉටුකර ගැනීමට අමතර සේවක පිරිසක් යෙදවීමට සිදුවීම මත අමතර වියදම් වැඩිවීමට හේතු විය.<br>• විශ්ව විද්‍යාලය විසින් සිදුකරන ලද විනය පරීක්ෂණ ප්‍රමාණාත්මකව ඉහල යාම නිසා ඒ සඳහා පෙනී සිටින නිලධාරීන්ට කරන ගෙවීම් ඉහල යාම.<br><br>වැනි කරුණු හේතුවෙන් විශේෂ සේවා සඳහා දැරූ වියදම් ඇස්තමේන්තු ගත වියදම් ඉක්මවා ඇත.<br>**<u>නිවාඩු ගමන් බලපත්‍ර</u>**<br>• පසුගිය වසරේදි සුභසාධන සංගම් හා වෘත්තීය සංගම් මගින් කරන ලද ඉල්ලීම් මත සංවිධානය කල චාරිකා සඳහා ගිය වියදම් ඉහල යාම හේතු විය.<br><br>**<u>සංග්‍රහ වියදම්</u>**<br>විදේශ දූත කණ්ඩායම් විශ්ව විද්‍යාලයට පැමිණීම ඉහල යාම නිසා සංග්‍රහ වියදම් ඉහල යාම කලින් පුරෝකථනය කල නොහැකිවීම හේතුවෙන් සංග්‍රහ වියදම් සඳහා දැරූ වියදම් ඇස්තමේන්තු ගත වියදම් ඉක්මවා ඇත. |
| | අන්තර් දීමනා - 38,480<br>වැරදි වියදම් ගිණුමකට ඇතුළත් කර ඇත. අන්තර් දීමනා ලෙස සඳහන් මුදල මාසික අන්තර් දීමනාවට එකතු විය යුතුයි. නිවැරදි කිරීමට කටයුතු කර ඇත.<br><br>දේපළ ණය පොළී<br>අධ්‍යයන - 6,259,537<br>අනධ්‍යයන - 2,429,502<br>විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ මුදල් චක්‍රලේඛ අංක 10/2012ට අනුව දේපල ණය පොළී සඳහා රජයේ දායකත්ව මුදල මාසිකව ප්‍රතිපූර්ණය කර ගත යුතු බවට නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව කටයුතු කර ඇත. 2014 වර්ෂයට අය වැය ලේඛන ඉදිරිපත් කිරීමේ දී මේ සඳහා වැය ශීර්ෂ හඳුන්වා දී නොතිබුණු අතර ඒ සඳහා නව වැය ශීර්ෂ 2015 වර්ෂයේ සිට හඳුන්වා දී ඇත. මුදල් චක්‍රලේඛ ලිපි අංක 04/2014 අනුව කටයුතු කෙරේ.<br>අමතර මාසික දීමනා<br>අධ්‍යයන - 38,323,652<br>අනධ්‍යයන - 52,031,784<br>විශ්වවිද්‍යාල කොමිෂන් සභාව නිකුත් කරන ලද 2014.07.17 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2014 විධිවිධාන අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2014.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාසික අමතර දීමනාවක් ගෙවා ඇත. |

| | |
|---|---|
| | මෙම දීමනාව ගෙවීමට අදාල චක්‍රලේඛය 2014 වර්ෂයට ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විට (එනම්, 2013 වර්ෂයේ) මෙම විධිවිධාන ක්‍රියාත්මක නොවු බැවින් ඒ සඳහා වෙනම වැය ශීර්ෂ හඳුන්වා දී නොමැත.<br>2015 වර්ෂයේ සිට මේ සඳහා නව වැය ශීර්ෂ හඳුන්වා දී ඇත.<br>මාසික අන්තර් දීමනා<br>අධ්‍යයන - 7,019,712<br>අනධ්‍යයන - 11,749,116<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2014 නොවැම්බර් මස 13 දින නිකුත් කර තිබෙන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 12/2014ට අනුව 2014 නොවැම්බර් මස සිට රුː3,000.00 මාසික දීමනාවක් ගෙවා ඇත. මෙම චක්‍රලේඛ උපදෙස් 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වු බැවින් අය වැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විට මේ සඳහා වැය ශීර්ෂ හඳුන්වා දී නොතිබුණි.2015 වර්ෂය සඳහා නව වැය ශීර්ෂ හඳුන්වා දී ඇත.<br><br>**<u>අනධ්‍යයන වියදම්</u>**<br>භාෂා ප්‍රවීණතා දීමනා - 45,901<br>විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ ආයතනික චක්‍රලේඛ අංක 8/2013 මැයි මස සිට 2013.01.01 දිනට පෙර විශ්වවිද්‍යාලයට බැඳුනු සේවකයින් සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ගෙවීම් අත්හිටුවා ඇත. කෙසේ වුව ද ඉහත චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක වීමට පෙර කාල පරිච්ඡේද සඳහා නිළධාරීන් වෙත හිඟ වැටුප් හා දීමනා සඳහා ගෙවීම් සිදුකරන අවස්ථාවේ දි අදාල කාල පරිච්ඡේදය වෙනුවෙන් හිමි දීමනා ලෙස ගණනය කිරිම් සිදු කරයි. වර්තමානයේ මේ සඳහා වැය ශීර්ෂ ඇස්තමේන්තු වල පෙන්නුම් නොකළ ද පෙර කාල පරිච්ඡේද සඳහා අදාල ගෙවීම් සිදු කිරීම මගින් මෙවැනි තත්වයක් ඇතිවී තිබේ.<br>පර්යේෂණ දීමනා - 5,426,205<br>විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ 2014 මැයි 30 දින ආයතන චක්‍රලේඛ අංක 05/2014 (ii)ට අනුව විධායක නිළධාරීන් සඳහා පර්යේෂණ දීමනා 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී නැත.<br>කෙසේ වුව ද 2014 අයවැය ලේඛන, 2013 වර්ෂයේ පිළියෙළ කරන අවස්ථාව වන විට මෙම චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක නොවු බැවින් අය වැය තොරතුරු වලට ඇතුලත් නොවූ වැය ශීර්ෂ ලෙස පෙන්නුම් කෙරේ. 2015 වර්ෂයේ සිට මේ සඳහා නව වැය ශීර්ෂ හඳුන්වා දී ඇත. |
| **6.** | **පද්ධති හා පාලනයන්** |
| **(අ)** | **තොග පාලනය** |
| | ප්‍රධාන ගබඩා හතරට අදාල තොග පාලන කටයුතු නිවැරදි හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මේ වන විට තොග පාලන ක්‍රම හඳුන්වා දී ඇති අතර තොග සම්බන්ධ ලැබීම්, නිකුත් කිරිම් හා තොග පවත්වාගෙන යාමේදී පවතින බොහොමයක් දුර්වලතා හඳුනාගෙන ඇති අතර ඒවා නිවැරදි හා කාර්යක්ෂම කරගැනීම සඳහා අවශ්‍ය පියවරයන් මේ වන විට ගබඩා කළමණාකරන අංශය මඟින් ගෙන ඇත.<br>මේ වන විට ප්‍රධාන ගබඩාව තුල තොග පවත්වාගෙන යාමට අවශ්‍ය විවිධ තොග මට්ටම් හඳුන්වා දී ඇති අතර එහිදී ගබඩාව තුල තොග ඌනතාවයකින් තොරව තොග පවත්වාගෙන යාමට හැකි වී තිබේ. ආරක්ෂිත තොග මට්ටම,<br>අවම තොග මට්ටම, යළි ඇනවුම් මට්ටම, උපරිම තොග මට්ටම ආදි තොග මට්ටම් හඳුන්වා දී ඇති අතර මෙමගින් තොග සම්බන්ධ කටයුතු කාර්යක්ෂම වී ඇත.<br><br>එසේම ගබඩාවල තොග පාලනයන් නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා බින් කාඩ්පත් පවත්වාගෙන යාම අනිවාර්යය කරන ලදි. එහිදී ප්‍රධාන ගබඩාවලට අමතරව විශ්වවිද්‍යාලයේ තොග පවත්වාගෙන යන අනෙකුත් දෙපාර්තමේන්තු, අංශ හා ශිෂ්‍ය නේවාසිකාගාර ආදි අංශවලටද මෙම බින් කාඩ්පත් ක්‍රමය හඳුන්වා දෙන ලදි.<br>ප්‍රධාන ගබඩා හතරට අදාලව මාසික තොග ශේෂයන් ගබඩා කළමණාකරන අංශය වෙත ලබා ගන්නා අතර එහිදී තොග |

| | |
|---|---|
| | ඌනතාවයන් හඳුනාගෙන ඒ පිළිබඳව ගබඩාවලින් විමසා නිවැරදි තොග මට්ටම් පවත්වාගෙන යාම සිදුකරනු ලබයි. මේ වන විට ගබඩාවල භාවිතා කරන තොග ලෙජර නව ආකෘතියකට අනුව සකස් කර ඇති අතර තොග ලැබීම්, නිකුත් කිරීම් හා තොග ශේෂයන් වල සියලු තොරතුරු ඇතුලත්ව එනම් ප්‍රමාණය, ඒකක මිල හා මුළු වටිනාකම් ඇතුලත් වන අතර තොග පොත පරීක්ෂාවෙන් අදාල තොගය සම්බන්ධ සියලු තොරතුරු ලබා ගත හැක. මේ ආකාරයට තොග පවත්වාගෙන යාම සම්බන්ධව ගබඩා කළමණාකරන අංශය මඟින් නිරන්තර අවධානයකින් සිටින අතර ගබඩා භාරකරුවන් හා අනෙකුත් ගබඩා කටයුතු සම්බන්ධ සේවකයින් දැනුවත් කිරීම ගබඩා කළමණාකරන අංශයේ සහකාර මූල්‍යාධිකාරිවරයා විසින් නිරතුරුව සිදුකරයි. ඒ අනුව වර්තමානය වන විට තොග සම්බන්ධ කටයුතු සාර්ථකව සිදුවන අතර මින් ඉදිරියට දැනට පවතින අඩුපාඩු දුර්වලතා හඳුනාගෙන ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමුකරන බව දන්වනු කැමැත්තෙමි. |
| **(ආ)** | **වාහන පරිපාලනය** |
| | සෑම විටම විශ්වවිද්‍යාලයේ සියලුම වාහන ලියාපදිංචි කිරීම ඒ හා අදාල ලේඛන නිසිපරිදි පවත්වාගෙන යන අතර හානි වාර්තා කිරීමේ දී යම් යම් අවස්ථාවලදී ප්‍රමාදයන් සිදුවුණු සියලු හානි වාර්තා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වමි. කෙසේ වුවත් හානි වාර්තා කිරීම සම්බන්ධයෙන් නිළධාරීන්ගේ ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| **(ඇ)** | **අරමුදල් පාලනය** |
| | විශේෂයෙන්ම විවිධ දක්ෂතා ඇති සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා විවිධ දානපතියන්ගේ අනුග්‍රහයෙන් ශිෂ්‍යත්ව අරමුදල් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය සතුව පවතින අතර එම අරමුදල් උපයෝජනය කිරීමේදී සෑම විටම අරමුදල පිහිටුවීමේදී එකග වී ඇති නිර්ණායකයන්ට අනුකූලව මුදල් වියදම් කිරීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී. එබැවින් අපේක්ෂිත පරිදි අරමුදල් උපයෝජනය කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වුවත් එම අරමුදල් පිහිටු වීමේ දී එකග වී ඇති නිර්ණායකයන් පරිදිම උපයෝජනය කර ඇත. |
| **(ඈ)** | **කාර්ය මණ්ඩල පරිපාලනය** |
| | විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල Carder අනුකූලව හැකි සෑම විටම බඳවා ගැනීම් කළ අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පීඨයන්ගේ අවශ්‍යතාවය මත අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරන අතර සුදුසුකම්ලත් ආචාර්යවරුන්ගේ ඉල්ලුම්පත් නොලැබීම මත පමණක් යම් යම් ප්‍රමාදයන් සිදු වී ඇති බව දන්වමි. කෙසේ වුවද හැකිතරම් Carder එකට අනුකූලව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කර ඇත. |
| **(ඉ)** | **ප්‍රසම්පාදන** |
| | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛයන් පදනම් කර ගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත. |
| **(ඊ)** | **සේවක ණය පරිපාලනය** |
| | මහා භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛයන්ට අනුකූලව සේවක ණය ලබා දීමට කටයුතු කරන අතර ණය අයකර ගැනීමේදී යම් යම් ප්‍රායෝගික දුෂ්කරතා පැවතියද හැකි පමණ උපරිමයෙන් ණය අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| **(උ)** | **කොන්ත්‍රාත් පරිපාලනය** |
| | විශ්වවිද්‍යාලයේ විශාලත්වය අනුව එකවර කොන්ත්‍රාත් කාර්යයන් විශාල ගණනක් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වීම මත ඇතැම් කොන්ත්‍රාත් කාර්යයන්ගේ යම් ප්‍රමාදයන් ඇති වීම නිරීක්ෂණය වී ඇත. එබැවින් ඉදිරියේදී කොන්ත්‍රාත් පරිපාලන කාර්යයන් කෙරෙහි විශ්වවිද්‍යාල ක්‍රියාකාරීත්වයෙන් වැඩි අවධානය යොමු කිරීමට කටයුතු සලසා ඇත. |

**මහාචාර්ය උපුල් බී දිසානායක**
**උපකුලපති**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**